කුරුවිට සංවර්ධන සැලැස්ම
2023 - 2033

සිරිපා නිම්නයේ සුසැදි නවාතැන

නාගරික සංවර්ධන අධිකාරිය

කුරුවිට සංවර්ධන සැලැස්ම 2023 – 2033

"සිරිපා නිම්නයේ සුසැදි නවාතැන"

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය

කුරුවිට සංවර්ධන සැලැස්ම 2023-2033

©නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව -2023

සියලුම හිමිකම් ඇවිරිණි.

මෙම ප්‍රකාශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදාහැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශය
නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන 7 වන හා 9 වන මහල, සෙත්සිරිපාය අදියර I
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය - www.uda.gov.lk
විද්‍යුත් තැපැල - info@uda.gov.lk
දුරකථන අංක - +94112 873 637
ප්‍රකාශනය 2023

කුරුවිට සංවර්ධන සැලැස්ම (2023 – 2033), පළමු කොටස, දෙවන කොටස හා තුන්වන කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමුවන කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යනය, සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, ශඳුඅත (SWOT) විශ්ලේෂණය සහ සැලැස්ම යන කොටස් වලිනි. දෙවන කොටස සැලසුම් හා ගොඩනැගිලි සංවර්ධන නියමතා, කලාපිකරන නියමතා, යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා හා රක්ෂිත වලින් සමන්විත වේ. තුන්වන කොටස කලාප සීමා මායිම් ඛණ්ඩාංක සහ සියලි ඇමුණුම් වලින් සමන්විත වේ.

කුරුවිට සංවර්ධන සැලැස්ම (2023 -2033) සකස් කර ඇත්තේ සබරගමුව පළාත් කාර්යාලය සැලසුම් අංශය විසිනි.

අධීක්ෂණය
නිමේෂ් හේරත් සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය. නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ. රණවීර අධ්‍යක්ෂ ජනරාල්, නා.සං.අ. වරලත් වාස්තු විද්‍යාඥ මහින්ද විතානාරච්චි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නා.සං.අ. නගර නිර්මාණ ශිල්පී එම්.පී.රණතුංග නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් - කලාප 1) , නා.සං.අ. නීතිඥ ඩී. එම්. කිරිවත්තුඩුව අධ්‍යක්ෂ (නීති), නා.සං.අ. නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න,අධ්‍යක්ෂ (උපායමාර්ගික සැලසුම්), නා.සං.අ. විසිනි.

සැලසුම් කණ්ඩායම
අධීක්ෂණ කටයුතු හා මෙහෙයවීම : සුගත් ජේමසිරි අධ්‍යක්ෂ, සබරගමුව පළාත, නා.සං.අ. ඩි.පී.ආර්.කේ. ගුණතිලක නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ. එච්.එම්.පී.එච්. මැණිකේ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය, නා.සං.අ. අනුර මැදවල හිටපු අධ්‍යක්ෂ (සබරගමුව), තුෂානි ද අල්විස් හිටපු අධ්‍යක්ෂ (සබරගමුව)
සම්බන්ධීකරණය, සැලැස්ම සකස් කිරීම හා ලේඛනගත කිරීම : හසිනි ආටිගල නගර නිර්මාණ ශිල්පී, ඕ. බී. එච්. එම්. ඕළුගල නිර්මාණ ශිල්පී (පුහුණු)
සැලැස්ම සකස් කිරීම හා ලේඛනගත කිරීම සඳහා කණ්ඩායම් දායකත්වය ලබා දීම : එච්.කේ.ඩී.එම්.කේ. පතිරණ බලාත්මක සැලසුම් නිලධාරී, මහේෂ් ජිනදාස බලාත්මක සැලසුම් නිලධාරී, එච්.කේ.නිලිකා බලාත්මක සැලසුම් නිලධාරී, නදීකා ගුණවර්ධන සැලසුම් ශිල්පී, නුවන් අසේල දිසානායක බලාත්මක සැලසුම් නිලධාරී

සහය කණ්ඩායම්
උපායමාර්ගික සැලසුම් අංශය - නා.සං.අ. (අධීක්ෂණය, නියාමනය, සහ ගැසට් කිරීම)
පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අ. (PORS සැලසුම සකස් කිරීම සහ රෙගුලාසි සකස් කිරීම)
භූගෝලීය තොරතුරු පද්ධති අංශය - නා.සං.අ. (භූගෝලීය තොරතුරු හා දත්ත සැපයීම සහ තාක්ෂණික සහය සැපයීම)

පරිවර්තන කටයුතු
ඉංග්‍රීසි පරිවර්තනය - න.නි.ශි.එච්.එච්.ලීලානන්ද මහතා
දෙමළ පරිවර්තනය - ඒ.එම්.ඇන්ටන් සුදර්ශන් මහතා

මුල්පිටු සැකසුම් කටයුතු
සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.

පිටු සැකසුම් කටයුතු
සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.

ප්‍රණාමය

කුරුවිට නගර සංවර්ධන සැලැස්ම 2023-2033 සැකසීම, නාගරික සංවර්ධන අධිකාරියේ රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයේ මූලික අධීක්ෂණය යටතේ සිදු විය.

සබරගමුව පළාතේ සුන්දරත්වය විදහා පාන බෝපත් ඇල්ල ඇතුළු දිය ඇලි, ගංගා, ඓතිහාසික මෙන්ම ආගමික පසුබිම ඔප්නංවන සමනොළ සිරස , නිල හරිත වටපිටාවෙන් සමන්විත සංස්කෘතික හා පාරිසරික භූ දර්ශනය නැවත පුනර්ජීවනය කිරීම තුළින් සමාජීය සහජීවනය සහිත මනා කළමනාකරණයකින් යුතු භෞතික සංවර්ධනය තුළින් ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා ගමන් කිරීම මෙම සැලැස්මේ අරමුණයි. කුරුවිට නගර සංවර්ධන සැලැස්ම 2023-2033 රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව සකස් කර ඇත.

මෙහිදී 1982 අංක 04 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධි විධාන යටතේ කුරුවිට නගර සංවර්ධන සැලැස්ම 2023-2033 සඳහා අනුමැතිය ලබාදීම සිදු කරන ලද නාගරික සංවර්ධන හා නිවාස විෂයභාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමන්ට අධිකාරියේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිමු.

තවද මෙම ක්‍රියාවලියේ දී අවශ්‍ය මග පෙන්වීම හා සහය ලබාදුන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්.එස්. සත්‍යානන්ද මහතා වෙත අපගේ ස්තුතිය පුදකර සිටින්නෙමු.

කුරුවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීවරුන් හා නිලධාරීන්, කුරුවිට ප්‍රාදේශීය ලේකම් ඇතුළු සැලැස්මට දායකත්වය ලබා දුන් සියලුම රජයේ නිලධාරීන්ට සැලසුම් කණ්ඩායම හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කර සිටිමු.

විශේෂයෙන් මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්ය හා මග පෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති නිමේෂ් හේරත් මහතාට, අධ්‍යක්ෂ ජනරාල් නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ. රණවීර මහතාට, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරලත් වාස්තු විද්‍යාඥ මහින්ද විතානාරච්චි මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - කලාප 1 නගර නිර්මාණ ශිල්පී එම්.පී.රණතුංග මහතාට, අධ්‍යක්ෂ (සබරගමු පළාත) නගර නිර්මාණ ශිල්පී සුගත් ප්‍රේමසිරි මහතාට හා උපායමාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න මහත්මියට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

අවසාන වශයෙන් පාරිසරික හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ වරලත් භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පී සී.කේ.ඊ.කළුපහන මහත්මියට හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ නගර නිර්මාණ ශිල්පී ජේ . පී. එස් . සෝමසේකර මහත්මිය හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, නීති අංශයේ කාර්ය නියුතු අධ්‍යක්ෂ දයානි කිරිවත්තුඩුව මහත්මියටත්, සබරගමු පළාත් හිටපු අධ්‍යක්ෂවරුන් වන නගර නිර්මාණ ශිල්පී අනුර මැදවල මහතා සහ නගර නිර්මාණ ශිල්පී තුෂානි ද අල්විස් මහත්මියට මෙන්ම රත්නපුර කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන සියලුම සේවක මහත්ම මහත්මීන්ටත් අපගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමු.

ගරු අමාත්‍යතුමාගේ පෙරවදන

"කුරුවිට" නගර සංවර්ධනය යථාර්ථයක් කරා...

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව "වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම උදෙසා වන සියලු අරමුණු හා ඉලක්ක කාර්යක්ෂමව හා සඵලදායී ලෙස ඉටු කර ගැනීම පිණිස නිවැරදි දිශානතියක් කරා රාජ්‍ය යොමු කිරීම යටතේ නව සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යය".

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුළ පවතින අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික්ක අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතර පවතින පරතරය හා විෂමතාවයන් ද සැලකිල්ලට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම කරනු ලැබේ.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය හඳුනාගත් නගර 30 ක් සඳහා කඩිනම් නගර සංවර්ධන සැලැසුම් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබෙන අතර තවත් නගර 50 ක් සඳහා සංවර්ධන සැලසුම් මෙම වසර තුල සකස්කර නීතිගත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. "කුරුවිට" නගර සංවර්ධන සැලැස්ම ද එලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. 2024 වන විට මෙවැනි නගර සංවර්ධන සැලසුම් 130 කට වැඩි ප්‍රමාණයක් සැකසීම සඳහා සැලසුම්කර ඇත.

කුරුවිට නගර සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රමුඛත්වය හිමි වන්නේ කුරුවිට නගරයෙන් සේවා ලබාගන්නා සහ එහි නේවාසික ජනතාව සඳහා වන අතර එය තවදුරටත් සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතී. එසේම ප්‍රදේශයේ පවතින ස්වාභාවික පරිසර පද්ධතිය මෙන්ම ආර්ථික වටිනාකමක් සහිත ස්ථානද විධිමත් පරිදි නාගරික ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට මෙම සැලැස්ම මගින් හදුනාගෙන ඇත.

මෙම සැලැස්ම සකස් කිරීමේදී වෘත්තියවේදීන්, විශේෂඥයින්, පාර්ශවකරුවන් සහ ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබාගත් අතර එය නවීන විශ්ලේෂණ ක්‍රමෝපායන් හා තාක්ෂණික ක්‍රමවේදයන් හරහා මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රවේශයන් ලබාගන්නා ලදී.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්තව්‍ය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුළින් කුරුවිට සංවර්ධන සැලසුම (2023-2033) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

ප්‍රසන්න රණතුංග
ගරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

ගරු සභාපතිතුමගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනාකරණයට අදාලව සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමේ මූලික පරමාර්ථය වී ඇත්තේ එකී ප්‍රදේශවල සංවර්ධනයන් ප්‍රවර්ධනය හා නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමයි.

ඒ අනුව 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතේ (II අ කොටස) 8 (1) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කල නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලැසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව ප්‍රදේශයේ භෞතික , ආර්ථික, සාමාජයීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන කුරුවිට සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් කුරුවිට සංවර්ධන සැලැස්ම 2023-2033 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙල කර ඇත. කුරුවිට සංවර්ධන සැලැස්ම, සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු හඳුනා ගැනීම තුළින් ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීම හා ඒ හරහා උපාය මාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර තවදුරටත් සංවර්ධන සැලසුම තුළින් සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා නියාමනය කර ඇත. එබැවින් මහජන අවශ්‍යතා ඉටු කරනු වස් මෙම සැලැස්ම බලාත්මක කිරීම තුළින් එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන්ගෙන් සහ මහජනතාවගෙන් ඉල්ලා සිටිමි. කුරුවිට සංවර්ධන සැලැස්ම නියමිත කාලය තුළ සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. තවද මෙම කර්තව්‍යය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

නිමේෂ් හේරත්
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය

ගරු ප්‍රාදේශීය සභා සභාපතිතුමාගේ පෙරවදන

කුරුවිට නගරය ස්වභාවික, ඓතිහාසික වටිනාකම් මෙන්ම නේවාසිකයන් සඳහා සේවා සපයන රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති සුවිශේෂී උපග්‍රාහී නගරයකි. සුප්‍රසිද්ධ බෝපත් ඇල්ල, ශ්‍රී පාද ගමන් මාර්ගය, දෙල්ගමුව රජමහා විහාරය, බටදොඹ ලෙන, බටතොට ලෙන, දිවාගුහාව, කුරු ගඟ ආදී දෙස් විදෙස් ප්‍රසිද්ධියට පාත්‍ර වූ ආකර්ශනීය ස්ථාන රාශියකින් සමන්විත කුරුවිට නගරය වර්තමානයේදී නේවාසික නාගරික ප්‍රදේශයක් ලෙස සීඝ්‍ර සංවර්ධනයකට සුදානම් වෙමින් පවතී. එබැවින් නගරයේ පවත්නා යටිතල පහසුකම් හා අවශ්‍ය අනෙකුත් පහසුකම්, ප්‍රදේශයේ ජනතාවට මෙන්ම නගරයට සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාවට, සම්පාදනය කර දීම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මාගේ මහත් වූ කාර්යභාරයකි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ, නාගරික සංවර්ධන අධිකාරිය මගින් කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කර නිත්‍යානුකූලව ප්‍රකාශයට පත් කිරීම පිලිබඳව ප්‍රථමයෙන් මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි.

ප්‍රදේශයේ පවතින ගැටළු හා අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් ප්‍රදේශයේ ජනතාවගේ මෙන්ම රටේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා මෙවැනි සංවර්ධන සැලැස්මක් සකස් කිරීම විධිමත් සංවර්ධනයක් සඳහා ඉතාමත් යෝග්‍ය වේ. අපගේ අදහස් මෙන්ම ප්‍රදේශයේ සේවයේ යෙදෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල කාර්යමණ්ඩලය, ප්‍රදේශවාසීන් හා ආයෝජකයන් ආදී විවිධ අංශ නියෝජනය වන පරිදි පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීම අගය කල යුතුය.

ප්‍රදේශයේ සංවර්ධනය සවිමත් කරමින් ප්‍රදේශයේ ජනතාවගේ සුභසිද්ධිය උදෙසා මෙම සංවර්ධන සැලැස්ම සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ශක්තිය නොමඳව ලැබේවා යැයි ප්‍රර්ථනා කරමි.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති
කුරුවිට ප්‍රාදේශීය සභාව

පූර්විකාව

තිරසාර සංවර්ධන අරමුණු අතර එකොලොස්වන අරමුණ වන තිරසාර නගර නිර්මාණය කිරීම යන අරමුණ ඉටු කර ගැනීම ඉලක්ක කර ගනිමින් කුරුවිට නගර සංවර්ධන සැලැස්ම නිර්මාණය කර ඇති අතර කුරුවිට නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ ඉදිරි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශකත්වය මෙම සැලැස්ම හරහා ලබා දීමට අපේක්ෂිතය.

නාගරික සංවර්ධන අධිකාරියේ සබරගමු පළාත් කාර්යාලය මගින් කුරුවිට නාගරික සංවර්ධන බල ප්‍රදේශය ආවරණය වන ලෙස ආර්ථික, සමාජීයිය, භෞතික , පාරිසරික හා සංස්කෘතික යන සංරචකයන් සලකා 2019 වර්ෂයේ සකස් කිරීම ආරම්භ කරන ලද මෙම සැලැස්ම 2023-2033 කාල පරාසය සඳහා බලාත්මක කිරීමට නියමිතය.

කුරුවිට නගර සංවර්ධන සැලැස්ම කොටස් තුනකින් සමන්විත වන අතර පළමු කොටස යටතේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයනය, සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය, සංවර්ධන සැලසුම් රාමුව, ශ.දු.අ.ත. විශ්ලේෂණය හා සැලැස්ම යන පරිච්ඡේදයන්ගෙන් සමන්විතය. දෙවන කොටස යටතේ සැලසුම් ප්‍රදේශය සඳහා වන කලාපිකරණ නියමතා, අනුමත භාවිතයන් සහ විශේෂ නියමතා අන්තර්ගත වේ. තෙවන කොටස යටතේ භූ ගෝලීය ඛණ්ඩාංක සමග කලාපිය මායිම් සහ අනෙකුත් ඇමුණුම් ඇතුලත් කර ඇත.

පළමු කොටසේ පළමු පරිච්ඡේදය යටතේ සංවර්ධන සැලැස්ම, එහි නිත්‍යානුකූල රාමුව, සැලැස්මේ පාර්ශවකරුවන්, සැලසුම් සන්දර්භය හා සැලසුම් ක්‍රියාවලිය දක්වා ඇත. දෙවන හා තෙවන පරිච්ඡේදයන් යටතේ පිලිවෙලින් සැලසුම් ප්‍රදේශයේ සීමා නිර්ණය හා සැලැස්මේ අවශ්‍යතාවය විස්තරාත්මකව සඳහන් කොට ඇත. සිව්වන පරිච්ඡේදය යටතේ දැක්ම, අරමුණු හා පරමාර්ථ ද පස්වන පරිච්ඡේදය යටතේ එක් එක් අරමුණ සඳහා අවන ශ.දු.අ.ත. විශ්ලේෂණය අන්තර්ගත වේ. හයවන පරිච්ඡේදය යටතේ කුරුවිට නාගරික බලප්‍රදේශය සඳහා වන ප්‍රධාන උපායමාර්ගික සැලසුම් ලෙස ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, සමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගයන් සවිස්තරාත්මකව එක් එක් අංශ යටතේ දක්වා ඇත.

එමෙන්ම දෙවන කොටසේ හත්වන පරිච්ඡේදය සංවර්ධන කලාප හා කලාප නියමතා සඳහා වෙන් කොට ඇති අතර පරිච්ඡේදය අට යටතේ කලපිකරණ රෙගුලාසි විස්තර කෙරේ. පරිච්ඡේද අංක නවය යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා හා රක්ෂිත සඳහා වෙන් කොට ඇත.

අවසාන වශයෙන් මෙම අධිකාරියේ සහ ශ්‍රී ලංකා රජයේ අරමුණ වන්නේ මෙම කුරුවිට නගර සංවර්ධන සැලැස්ම 2023-2033 අදාළකාල වකවානුව සඳහා සාර්ථකව ක්‍රියාත්මක කිරීම වේ.

කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2023 ජනවාරි මස 19 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,

17 හා 18 මහල,

"සුහුරුපාය",

සුහුරුපාය පාර,

බත්තරමුල්ල.

2023 පෙබ. **මස** 20 **වන දින.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2321/69 - 2023 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2023 ජනවාරි මස 19 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 පෙබරවාරි මස 20 වන දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

1A - G 39006 — 46 (2023/03)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2A I කොටස: (I) ඡෙදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2023.03.02

කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම 2023 ක් වූ පෙබරවාරි මස 20 වන දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

ප්‍රසන්න රණතුංග (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 මාර්තු මස 01 වන දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තියේ බලපතල ප්‍රකාරව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 පෙබරවාරි මස 20 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

නිමේෂ් හේරත්,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2023 මාර්තු මස 01 වන දින.

EOG 03 - 0019

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

පටුන

ප්‍රණාමය	II
ගරු අමාත්‍යතුමාගේ පෙරවදන	III
ගරු සභාපතිතුමගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය	IV
ගරු ප්‍රාදේශීය සභා සභාපතිතුමාගේ පෙරවදන	V
පූර්විකාව	VI
ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය	VIII
ගැසට් නිවේදනය	IX
පටුන	XI

I වන කොටස - දත්ත විශ්ලේෂණය සහ සැලැස්ම

පරිච්ඡේදය 01 : සංවර්ධන සැලැස්මේ පසුබිම

1.1 හැඳින්වීම	02
1.2 සැලැස්මේ පාර්ශවකරුවන්	03
1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය	05
1.4 සැලසුම් ක්‍රියාවලිය	06

පරිච්ඡේදය 02 : මූලික අධ්‍යනය

2.1 අධ්‍යයන ප්‍රදේශය	10
2.2 සැලසුම් සීමාව නිර්ණය කිරීම	11
2.2.1. ක්‍රියාකාරී සීමාව	11
2.2.2. භූගෝලීය සීමාව	13
2.2.3. පරිපාලන සීමාව	16
2.2.4. සැලසුම් සීමාව	17
2.3 සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය	19

පරිච්ඡේදය 03 : සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

3.1 හැඳින්වීම	40
3.2 හඳුනාගත් ගැටළු	40
3.3 හඳුනාගත් විභවතා	43

පරිච්ඡේදය 04 : සංවර්ධන සැලසුම් රාමුව

4.1 දැක්ම	48
4.2 දැක්මේ ප්‍රකාශනය	48
4.3 අරමුණු	48
4.4 අභිමතාර්ථ	49

පරිච්ඡේදය 05 : ශක්‍යතා , දුබලතා , අවස්ථා සහ තර්ජන පිළිබඳ විශ්ලේෂණය

5.1 සංක්ෂිප්ත ශ.දු.අ.ත. විශ්ලේෂණය 52
5.2 විස්තරාත්මක ශ.දු.අ.ත. විශ්ලේෂණය 54

පරිච්ඡේදය 06 : සංවර්ධන සැලැස්ම

6.1 සංකල්පිත සැලැස්ම 90
6.2 යෝජිත භූමි පරිහරණ සැලැස්ම 92
6.3 සමාජීය හා භෞතික යටිතල පහසුකම් උපායමාර්ග 101
6.3.1 සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 101
6.3.1.1 නේවාසික සැලැස්ම 101
6.3.1.2 අධ්‍යාපන සේවා සැලැස්ම 108
6.3.1.3 සෞඛ්‍ය සේවා සැලැස්ම 111
6.3.1.4 සංස්කෘතික, ආගමික හා උරුම කළමනාකරණ සැලැස්ම 112
6.3.2 භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 120
6.3.2.1 ප්‍රවාහන සේවා සැලැස්ම 120
6.3.2.2 ජල සම්පාදන සැලැස්ම 127
6.3.2.3 විදුලිබල සැපයුම් සැලැස්ම 130
6.3.2.4 මලාපවාහන හා අපජල කළමනාකරණ සැලැස්ම 132
6.3.2.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම 134
6.4 ආර්ථික සංවර්ධන උපායමාර්ග 137
6.5 භෞතික සංවර්ධන උපායමාර්ග 150
6.6. තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ග 158
6.6.1 පරිසර සංරක්ෂණ සැලැස්ම 158
6.6.2 භූ දර්ශන සැලැස්ම 162
6.6.3 පොදු එළිමහන් විවේක විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 163
6.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග 166
6.7.1 උපායමාර්ගික ව්‍යාපෘති සහ අනෙකුත් ව්‍යාපෘති 166
6.7.2. ප්‍රමුඛ ව්‍යාපෘති 167
6.7.3 ව්‍යාපෘති පිළිබඳ විස්තර 168

II වන කොටස - භෞතික සංවර්ධන උපායමාර්ග සහ නියමතා

පරිච්ඡේදය 07 : සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

7.1 හැඳින්වීම 184
7.2. කලාපීකරණ සැලැස්ම (2023-2033) 185
7.3. සංවර්ධන කලාප සහ කලාප සංගුණකය 186
7.4. සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා 186

පරිච්ඡේදය 08 : කලාපිකරණ නියමතා
8.1 කලාපිකරණ නියමතා 196
8.1.1. කෘෂිකාර්මික කලාපය සඳහා අනුමත භාවිතයන් 204
8.1.2. කෘෂිකාර්මික කලාපය සඳහා අනුමත මාර්ගෝපදේශ 205
8.2. සංවර්ධන නියාමන ප්‍රදේශ 207
8.3 උපලේඛණ 208
උපලේඛණය I – “අ” ආකෘතිය -අවසරලත් ගෙබිම් අනුපාතයන් 208
උපලේඛණය II – “ආ” ආකෘතිය - මීටර් 3 සහ 4.5 සඳහා මහල් ප්‍රමාණයන් 212
උපලේඛණය III – “ඉ” ආකෘතිය - විවෘත අවකාශයන් 213
උපලේඛණය IV – “ඊ” ආකෘතිය - අනුමත භාවිතයන්ට අදාල අවම බිම් ප්‍රමාණයන් 214

පරිච්ඡේදය 09 : යෝජිත මාර්ග පළල , ගොඩනැගිලි සීමා සහ රක්ෂිත
9.1. ගොඩනැගිලි සීමා සහ යෝජිත මාර්ග පළල 226
9.1.1. ප්‍රධාන මාර්ග 226
9.1.2. පළාත් පාලන ආයතනයන්ට අයත් මාර්ග 226
9.1.3. යෝජිත මාර්ග සඳහා යෝජිත මාර්ග පළල සහ ගොඩනැගිලි සීමා 230
9.2. ඇළ මාර්ග, ගංගා හා ජලාශ සඳහා ගොඩනැගිලි සීමා \ ගඟ රක්ෂිත 230
9.3. කැණීම් සඳහා රක්ෂිත අවශ්‍යතා 231

III වන කොටස - ඇමුණුම්
රූප සටහන් ලැයිස්තුව 234
සිතියම් ලැයිස්තුව 236
වගු ලැයිස්තුව 237
කෙටි යෙදුම් 238
ඇමුණුම 01 : පවත්නා භූමි පරිහරණ රටාව - 2020 239
ඇමුණුම 02 : කුඹුරු ප්‍රදේශ වල ව්‍යාප්තිය 239
ඇමුණුම 03 : කුරුවිට, ඇඹිලිපිටිය සහ ගලිගමුව කර්මාන්ත කලාප අතර සංසන්දනාත්මක විශ්ලේෂණය 240
ඇමුණුම 04 : ප්‍රදේශයේ ඇති සංචාරක ස්ථාන හා පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව 241
ඇමුණුම 05 : නායයාම් අවධානම හඳුනාගත් ප්‍රදේශ 242
ඇමුණුම 06 : රුවන්පුර අධිවේගී මාර්ගය පිළිබඳ තොරතුරු 243
ඇමුණුම 07 : 2022-2032 කුරුවිට නාගරික බල ප්‍රදේශය සඳහා වන පොදු එළිමහන් විවේක විනෝද කටයුතු සපුරා ගැනීමට හැකි ස්ථාන (PORS) සඳහා වන සැලැස්ම පිළිබඳ තොරතුරු 244
ඇමුණුම 08 : පාර්ශවකරුවන්ගේ පළමු රැස්වීමේ විශ්ලේෂණ වාර්තාව (NVIVO Analysis) 246
ඇමුණුම 09 : කලාපිකරණ සංගුණකය සකස් කිරීම 254

ඇමුණුම 10 : කුරුවිට නාගරික සංවර්ධන බලප්‍රදේශය 260
ඇමුණුම 11 : ව්‍යාපෘති ප්‍රමුඛතාකරණය 261
ඇමුණුම 12 : කලාපීකරණ මායිම් 265

පරිශීලිත මූලාශ්‍ර 349

I වන කොටස

දත්ත විශ්ලේෂණය සහ සැලැස්ම

පරිච්ඡේදය 01

සංවර්ධන සැලැස්මේ පසුබිම

01 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

හැඳින්වීම

1.1 හැඳින්වීම

නාගරික සංවර්ධන ක්‍රියාවලියේදී 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද කිසියම් නාගරික ප්‍රදේශයක ආර්ථික, සාමාජීය, භෞතික හා පාරිසරික අංශයන් අතර, අන්‍යෝන්‍ය වශයෙන් ඒකාබද්ධ වූ තිරසාර සංවර්ධනයක් ඇති කිරීම අපේක්ෂා කෙරේ. ඒ අනුව, හඳුනාගත් ප්‍රදේශය ඇතුළත අනාගත සංවර්ධන විභවතාවයන් සැලකිල්ලටගෙන එයට අනුරූප වන පරිදි විධිමත් හා සැලසුම් සහගත සංවර්ධනයක් ඇති කිරීමට සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම අධිකාරියේ කාර්යභාරය වේ.

ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රමුඛතම ආයතනය වශයෙන් 1978 අංක 41 දරණ පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කරන ලදී. 1982 අංක 4 දරන අධිකාරියේ සංශෝධිත පනතේ 8 ඒ වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ නාගරික සංවර්ධනය තුළින් තිරසාර සංවර්ධනයක් ඇති කිරීමේ අභිමතාර්ථය ළඟාකර ගැනීම වෙනුවෙන් එක් එක් නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලැසුම් සකස් කිරීම සිය ප්‍රධානතම කාර්යය භාරය බවට පත්කරගෙන ඇත. ඒ අනුව, කුරුවිට නාගරික ප්‍රදේශය සඳහා පිළියෙල කරන මෙම සංවර්ධන සැලැස්ම මඟින් එම ප්‍රදේශය සඳහා පාදක කර ගන්නා ලද අරමුණු, පරමාර්ථ හා උපක්‍රම සමඟ සංවර්ධන සැලැස්මේ දර්ශනය මගින් ප්‍රදේශයෙන් ප්‍රතිලාභ ලබා ගන්නා වැසියන්ට උසස් ජීවන තත්ත්වයක් සාක්ෂාත් කර දීම අපේක්ෂා කෙරේ.

කුරුවිට නගරයේ පරිපාලන ව්‍යුහය පිළිබඳව විමර්ශනය කිරීමේදී 1980 වර්ෂයේදී ගම් සභාවක් වශයෙන්ද, 1981 අංක 35 දරණ සංවර්ධන සභා පනත යටතේ පිහිටුවන ලද දිස්ත්‍රික් සංවර්ධන සභාව යටතේ කුරුවිට උප කාර්යාලය වශයෙන් ද, 1988.01.01 දින සිට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ කුරුවිට ප්‍රාදේශීය සභා කොට්ඨාශය කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වශයෙන් ද ස්ථාපනය විය.

මෙම පරිපාලන බල ප්‍රදේශය තුළ ප්‍රධානතම සේවා මධ්‍යස්ථානය වශයෙන් කුරුවිට නගරය සංවර්ධනය වූ අතර, මෙම සංවර්ධන කටයුතු විධිමත් හා තිරසාර සංවර්ධනයක් කරා මෙහෙයවීමේ අරමුණින් හෙක්ටයාර් 39.198 ක බිම් ප්‍රමාණයක් අංක.821/23 හා 1994 මැයි මස 2 දිනැති ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

පසුව සංවර්ධන ප්‍රවණතාවය හා දිශානතිය අධ්‍යයනය කරමින් පුළුල් සංවර්ධනයකට යොමු කිරීමේ අරමුණෙන් අංක.1629/16 දරණ 2009.11.26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නාගරික ප්‍රදේශය ව.කි.මී. 22.64 ක වපසරියකින් යුතුව නැවත ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව, කුරුවිට නාගරික සංවර්ධන බල ප්‍රදේශය ප්‍රකාශ කිරීමත් සමඟ නාගරික සංවර්ධන අධිකාරියේ මෙහෙයවීම මත නගර සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කර ඇති අතර නගර මධ්‍ය ප්‍රදේශය තුළ ව්‍යුහාත්මක සංවර්ධනයක් එමගින් සිදු වී ඇත. කෙසේ නමුත්, 2033 වසර ඉලක්ක කරගනිමින් කුරුවිට නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව ඇති හෙයින් එම ක්‍රියාවලිය 2019 වසරේ ඔක්තෝම්බර් මස ආරම්භ කරන ලදී. ඒ අනුව, කුරුවිට නගරයේ කැපී පෙනෙන නාගරික ව්‍යුහය පිළිබඳව සැලකිළිමත් වෙමින් ඉදිරි දශකය තුළ භෞතික, පාරිසරික, ආර්ථික සහ සමාජ සුබසාධනය වැඩි දියුණු කිරීම පිළිබඳව මෙම සංවර්ධන සැලැස්ම මගින් අවධානය යොමුකර ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංවර්ධන උපාය මාර්ග හා මාර්ගෝපදේශයන් ද සංවර්ධන සැලැස්ම තුළින් හඳුන්වා දී ඇත.

1.2 සැලැස්මේ පාර්ශවකරුවන්

කුරුවිට නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් ලෙස පුළුල් පරාසයක් නියෝජනය කරන පහත සඳහන් පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ලබාගෙන ඇත.

1.2.1 ප්‍රධාන පාර්ශවකරු

- කුරුවිට ප්‍රාදේශීය සභාව

1.2.2 පරිපාලන කටයුතු සම්බන්ධ උපදේශක ආයතන

- සබරගමුව පළාත් සභාව
- රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
- කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- කුරුවිට ප්‍රාදේශීය ලේකම් කර්යාලයට අනුබද්ධ ග්‍රාම නිලධාරීවරුන්

1.2.3 ආර්ථික කටයුතු සම්බන්ධ උපදේශක ආයතන

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
- පළාත් සංචාරක අමාත්‍යාංශය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
- වෙළඳ සංගමය
- මැණික් වෙළඳ සංගමය

01 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

1.2.4 පරිසර කටයුතු සම්බන්ධ උපදේශක ආයතන

- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- මිනින්දෝරු දෙපාර්තමේන්තුව
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- මධ්‍යම පරිසර අධිකාරිය
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
- පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

1.2.5 යටිතල පහසුකම් සම්බන්ධ උපදේශක ආයතන

- මාර්ග සංවර්ධන අධිකාරිය
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
- රත්නපුර ඩිපෝව
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
- ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘතිය
- ලංකා විදුලිබල මණ්ඩලය
- ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
- පළාත් අධ්‍යාපන කාර්යාලය
- ශ්‍රී ලංකා පොලීසිය

1.2.6 සමාජ උපදේශක ආයතන

- ප්‍රදේශයේ ආගමික නායකයන්
- ප්‍රජා මූල සංවිධාන
- ෆේස්බුක් සමාජ මාධ්‍ය ජාලය
- විවිධ අංශයන්හි විශේෂඥ දැනුම සහිත පුද්ගලයන්
- සාමාන්‍ය ජනතාව (අහඹු ලෙස හා අරමුණක් සහිතව තෝරාගත්)

1.2.7 නාගරික සංවර්ධන අධිකාරියේ සබරගමුව පළාත් කාර්යාලයේ

රත්නපුර දිස්ත්‍රික් සැලසුම් කණ්ඩායම

සුගත් ප්‍රේමසිරි මහතා	- අධ්‍යක්ෂ, සබරගමුව පළාත
නගර නිර්මාණ ශිල්පි ආර්.ගුණතිලක මහත්මිය	- නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), රත්නපුර දිස්ත්‍රික්කය
නගර නිර්මාණ ශිල්පි හසිනි එන්. ආටිගල මෙනවිය	- නගර නිර්මාණ ශිල්පී
ඕ . බී . එච් . එම් . ඕළුගල මෙනවිය	- නගර නිර්මාණ ශිල්පි පුහුණු
එච්.කේ.ඩී.එම්.කේ. පතිරණ මහත්මිය	- බලාත්මක සැලසුම්කරු
මහේෂ් ජිනදාස මහත්මා	- බලාත්මක සැලසුම්කරු
එච්.කේ. නීලිකා මහත්මිය	- බලාත්මක සැලසුම්කරු
අසේල නුවන් දිසානායක මහත්මා	- බලාත්මක සැලසුම්කරු
නදීකා ගුණවර්ධන මහත්මිය	- සැලසුම් ශිල්පි

1.2.8 සහය ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ අනෙකුත් අංශ

- උපාය මාර්ගික සැලසුම් අංශය
- භූගෝලීය තොරතුරු පද්ධති අංශය
- පරිසර හා භූ දර්ශන අංශය

1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය

කුරුවිට නගර සංවර්ධන සැලැස්ම යනු කුරුවිට නගරයේ අනාගත සංවර්ධනය පිළිබඳ දැක්ම වේ. එමගින්, කුරුවිට නගරයේ වර්තමාන තත්ත්වය පිළිබඳව අදහසක් ලබා දෙන අතර නගරයෙහි අපේක්ෂිත ඉදිරි දර්ශනය කුමක්ද, එහි ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගන්නේ කෙසේද, අපේක්ෂිත වෙනස්කම් මොනවාද, අපේක්ෂිත වෙනස්කම් සිදු කිරීම සඳහා ගතයුතු විකල්පයන්, උපායමාර්ගයන් මෙන්ම මැදිහත්වීම් මොනවාද යන්න පිළිබඳව ද අදහසක් ලබා දෙයි. මෙහිදී අනාගත සංවර්ධනය උදෙසා වන ඉදිරි දැක්ම සඳහා කුරුවිට නගරයේ වර්තමාන සංවර්ධන තත්ත්වය, එය වෙනස් කළයුතු දිශාව සහ සුදුසුතම ඉදිරි දැක්ම නගර සංවර්ධන සැලැස්ම මගින් පෙන්නුම් කරයි. ඒ අනුව, කුරුවිට නගර සංවර්ධන සැලැස්ම මගින් වසර 2033 වනවිට කුරුවිට නගරය ආර්ථික වශයෙන් ඵලදායී, කාර්යක්ෂම සහ සියලුම සමාජ ස්ථරයන්ට ප්‍රතිචාර දක්වන නගරයක් බවට පත් කිරීම පිණිස උපායමාර්ගයන් යෝජනා කර ඇත.

භූමි ප්‍රමාණය වර්ග කි. මී. 22.64 ක වර්ග ප්‍රමාණයකින් සහ ග්‍රාම නිලධාරී වසම් 15 කින් සමන්විත වන කුරුවිට නාගරික බල සීමාව සඳහා කුරුවිට නගර සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

රත්නපුර නගර සීමාවේ පවතින ස්වභාවික ආපදා තත්ත්වයන් හේතුවෙන් රත්නපුර නගරයට ඉතා ආසන්නයෙන් පිහිටා ඇති ආපදා අවදානම අවම ප්‍රදේශයක් වන කුරුවිට නාගරික ප්‍රදේශය ආශ්‍රිතව නේවාසික ජනගහනය කේන්ද්‍ර වීමේ ප්‍රවනතාවයක් මෑත කාලීනව දක්නට ලැබේ. එම අවශ්‍යතාවය සඳහා විධිමත් ලෙස පහසුකම් සැපයීමත් කුරුවිට නාගරික ප්‍රදේශය තුළ සහ ඒ ආසන්නයේ පවතින ඓතිහාසික, පුරාවිද්‍යාත්මක සහ පාරිසරික වශයෙන් වැදගත් ස්ථානයන් මත පදනම්ව ගොඩනැගී ඇති සංචාරක කර්මාන්තයේ ආර්ථිකමය ප්‍රතිලාභය කුරුවිට නගරයට ලබාදීමත් කුරුවිට නගර සංවර්ධන සැලැස්මේ අභිමතාර්ථයන් වේ. මේ අනුව, කුරුවිට නගර සංවර්ධන සැලැස්මෙහි අවසන් ඉලක්කය වන්නේ ශක්තිමත් ආර්ථික, පාරිසරික සහ සංස්කෘතික වටිනාකමකින් යුතු වූ ජීවත් වීමට සුදුසු පරිසරයක් කුරුවිට නාගරික ප්‍රජාව සඳහා නිර්මාණය කිරීමයි.

සැලසුම් ක්‍රියාවලිය

1.4 සැලසුම් ක්‍රියාවලිය

රූප සටහන් අංක 1.1 : සැලසුම් ක්‍රියාවලිය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

සැලසුම් ක්‍රියාවලියේ පළමු අදියර යටතේ නාගරික ප්‍රදේශයේ පසුබිම පිළිබඳව අධ්‍යයනය කිරීම හා ඒ සම්බන්ධ තොරතුරු පහත කරුණුවලට අදාළව එක්රැස් කිරීම සිදු කරන ලදී.

01 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

- අධ්‍යයන ප්‍රදේශයට අදාළ මූලික තොරතුරු විමර්ශනය කිරීම.
- තොරතුරු පරාසය හඳුනා ගැනීම.
- ක්ෂේත්‍ර තොරතුරු හා ද්විතික මූලාශ්‍ර මඟින් ලබා ගන්නා තොරතුරු උපයෝගී කරගනිමින් දත්ත යාවත්කාලීන කිරීම.
- තොරතුරු විශ්ලේෂණයට අදාළ අනිකුත් දත්ත එක්රැස් කිරීම.

ඉහත දත්ත හා තොරතුරු ඒකරාශි කිරීමටත් භූගෝලීය දත්ත පද්ධතිය තුළ ගබඩා කිරීමටත්, එම තොරතුරු උපයෝගී කර ගනිමින් මූලික විශ්ලේෂණ කටයුතු සිදු කිරීමටත් 2020 වසරේ ඔක්තෝම්බර් මස සිට 2020 නොවැම්බර් මස දක්වා කාළ සීමාව වෙන් කරන ලදී.

දෙවන පියවර යටතේ කුරුවිට නාගරික ප්‍රදේශය සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ පවතින ප්‍රතිපත්ති හා නීතිමය රෙගුලාසි පිළිබඳව අධ්‍යයනය කරමින් නාගරික ප්‍රදේශයේ වර්ථමාන ක්‍රියාකාරීත්වය පිළිබඳව ගන්නා ලදී. ඒ අනුව ප්‍රදේශයේ අපරව්‍යුහ පහසුකම්වල ව්‍යාප්තිය අධ්‍යයනය කිරීම, ඉඩම් වටිනාකම් වෙනස්වීම සමාලෝචනය කිරීම, මාර්ග හා ගමනාගමනය කටයුතු පිළිබඳ අධ්‍යයනය, මේ වන විට ක්‍රියාත්මක කර ඇති සහ යෝජිත ව්‍යාපෘති පිළිබඳ ඇගයීම සඳහා 2020 වසරේ නොවැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා කාළ පරිච්ඡේදය වෙන් කරන ලදී.

තෙවන පියවරේ දී කුරුවිට නගරයට අනන්‍ය වූ ගැටලු හා විභවතා හඳුනාගත් අතර මෙම අදියරේ දී කුරුවිට නගර සංවර්ධන සැලැස්මට අදාල සියලු පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම ද සිදුකෙරිණි. මෙම සියලු අධ්‍යනයන් සහ අදහස් උපයෝගී කරගනිමින් දැක්ම, අභිමතාර්ථ සහ අරමුණු සැකසීම ඉන් පසුව සිදු කරන ලදි. එයට අනුකූලව සවිස්තරාත්මක දත්ත විශ්ලේශණය කිරීම ඉන් අනතුරුව සිදු වූ අතර මේ සඳහා පාරිසරික සංවේදීතා විශ්ලේෂණය (Environment Sensitivity Analysis), සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණය (Development Pressure Analysis), සම්බන්ධතා විශ්ලේෂණය (Connectivity Analysis), වාසයට සුදුසු පරිසර නිර්ණය කිරීමේ විශ්ලේශණය (Livability Analysis) ආදී විවිධ විශ්ලේෂණයන් සිදු කරන ලද අතර මේ සඳහා 2020 දෙසැම්බර් මස සිට 2021 පෙබරවාරි මාසය දක්වා කාලය වැය කරන ලදී.

ඉහත අධ්‍යයනයන් හා විශ්ලේෂණයන්ට අනුකූලව උපායමාර්ග සැකසීම අනතුරුව සිදුවිය. භූමි පරිහරණ සැලැස්ම, අපරව්‍යුහ පහසුකම් පිළිබඳ සැලැස්ම, ආර්ථික සංවර්ධන සැලැස්ම, පාරිසරික සැලැස්ම, උරුමයන් ආරක්ෂා කරගැනීම පිළිබඳ සැලැස්ම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සැලැස්ම ආදී සැලසුම් මෙහිදී සකස් කරන ලද අතර, එම සැලැසුම් බලාත්මක කිරීමට අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම ද මෙම අදියරේ දී සිදු කෙරිණි. මෙම ක්‍රියාවලිය 2021 වසරේ පෙබරවාරි මස සිට 2021 වසරේ අප්‍රේල් මස දක්වා සිදු කරන ලදි.

01 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

ඉහත සැලසුම් වලට අදාළව ව්‍යාපෘති සහ එම ව්‍යාපෘති සඳහා යෝග්‍ය භූමි ප්‍රදේශයන් හඳුනාගැනීම මීළඟ අදියරේ දී සිදු විය. එහිදී, කුරුවිට නගර සංවර්ධන සැලැස්මේ අනාගත දැක්ම සහ මූලික විශ්ලේෂණ කටයුතු මත එළඹී නිගමන මත පදනම්ව ප්‍රමුඛතාව ලබාදිය යුතු ව්‍යාපෘති ලැයිස්තුව සකස් කරන ලදි. මෙම සැලැස්මෙන් යෝජිත ඇතැම් ව්‍යාපෘති රත්නපුර නගරයේ පවතින ගැටලු සහ විභවතාවයන්ට සෘජුවම ප්‍රතිචාර දක්වන ආකාරයටත් ඇතැම් ව්‍යාපෘති වක්‍රව ප්‍රතිචාර දක්වන ආකාරයටත් පෙළගස්වා ඇත. ව්‍යාපෘති ප්‍රමුඛතාව තීරණය කිරීමේදී සමාජ, ආර්ථික, දේශපාලනික සංවේදීතාවයන් පිළිබඳව සළකා බලා පවත්නා විකල්ප අතරින් යෝග්‍යතම විකල්පය තෝරාගෙන ඇති අතර මෙම අදියර වෙනුවෙන් 2021 වසරේ මැයි මස සිට 2021 වසරේ ජූලි මස දක්වා කාලය වෙන්වන ලදි.

අවසන් අදියරේ දී සැලැස්ම පිළිබඳව මහජන අදහස් ලබා ගැනීම සිදු විය. මූලික අදියරයන්හි දී සිදු කරන ලද අධ්‍යයනයන් උදෙසා මහජන අදහස් ලබා ගැනීම වාචිකව හා ලිඛිතව සිදු වූ අතර මෙම අදියරේ දී ද එලෙසින්ම අදහස් ලබා ගන්නා ලදි. මේ සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව තුළ දින හැටක කාලයක් නගර සැලැස්ම තබා මහජන අදහස් ලබාගන්නා ලද අතර එම යෝජනාවන්ට අනුකූලව අවශ්‍ය වෙනස්කම් පසුව සිදු කරන ලදි. අනතුරුව සම්බන්ධීකරණ කටයුතු සහ සංශෝධන කටයුතු සිදු කෙරුණු අතර පාර්ශවකරුවන් හා සැලසුම් කමිටු සමග සම්බන්ධීකරණය හා උපදේශනය, අභ්‍යන්තර සමාලෝචන හා තත්ත්ව සහතික කිරීම, අදාල අනුමැතීන් ලබා ගැනීම හා ගැසට් නිවේදනයට අදාළ කටයුතු වැනි කටයුතු සම්බන්ධීකරණ කටයුතු සිදුවිය. එමෙන්ම, මෙම කාලය ඇතුළත දී කුරුවිට නගර සංවර්ධන සැලැස්ම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කිරීමත් පිටු සැකසුම් සිදු කිරීමත් සිදු කල අතර 2022 වසරේ අගෝස්තු මස සිට 2022 වසරේ ඔක්තෝම්බර් මස දක්වා මෙම කටයුතු සිදුකරන ලදි.

පරිච්ඡේදය 02

මූලික අධ්‍යයනය

02 වන පරිච්ඡේදය

මූලික අධ්‍යයනය

අධ්‍යයන ප්‍රදේශය

2.1 අධ්‍යයන ප්‍රදේශය

සබරගමුව පළාතේ ප්‍රධාන පරිපාලන හා වාණිජ නගරය වන රත්නපුර නගරයට ආසන්නතම නගරය හා වයඹ දෙසින් පිහිටි ජනාවාස සඳහා සේවා සපයන ප්‍රධාන උපග්‍රාහී නගරය ලෙස කුරුවිට නගරය ස්ථාපිතව ඇත. මෙම නගරය රත්නපුර - කොළඹ ප්‍රධාන මාර්ගයෙන් ප්‍රවේශය ලබන අතර, රත්නපුර නගරයේ සිට කි.මී.14 ක් දුරින් හා කොළඹ නගරයේ සිට කි.මී.84 දුරින් පිහිටා ඇත.

අතීතයේදී ශ්‍රී පාද වන්දනා කිරිමට රත්නපුර දිස්ත්‍රික්කය තුල ඇති පහසුම මාර්ගය ලෙස කුරුවිට එරත්න මාර්ගය භාවිතා කර ඇත. මෙම මාර්ගයේ ශ්‍රී පාද වන්දනාකරුවන් ගමන්කිරීමත් නිසා බිහිවූ කුඩා සේවා මධ්‍යස්ථානයක් ලෙසද මෙම නගරය ප්‍රසිද්ධියට පත්ව ඇති අතර කුරුවිට ප්‍රදේශයට එම නම ලැබී ඇති ආකාරය පුරාණයේ සිට පැවත එන ජනප්‍රවාද වලින් අනාවරණය වේ. ඒ අනුව " කුරු " යනු පුරාණයේ අලි ඇතුන් සඳහා භාවිතා වූ නමකි. මෙම කුරු ඇතුන් ලැගුම්ගත් ඔිවිටක් කුරුවිට- තැඹිලියන හා තෙප්පනාව ප්‍රදේශයේ තිබූ බවත් එම " කුරුන් ආ ඕවිට " කුරුවිට බවට පත් වූ බවත් ජනයා අතර ප්‍රචලිතය.

කුරුවිට නාගරික ප්‍රදේශය රත්නපුර දිස්ත්‍රික්කයේ පවතින අනෙකුත් නාගරික ප්‍රදේශ සමඟ සංසන්දනය කිරීමේදී වඩාත් සුවිශේෂී ලක්ෂණ ගණනාවකින් යුතු නාගරික ප්‍රදේශයක් වශයෙන් හඳුනාගත හැකිය. දිස්ත්‍රික්කය තුළ පිහිටි අනෙකුත් නගර මෙන්ම කුරුවිට නගරය තුළද මැණික් ඉල්ලම් සහිත ඉඩම් පැවතීම පොදු ලක්ෂණයක් වේ. රත්නපුර සහ ඇහැළියගොඩ නගරයන්ට පොදු තත්ත්වයක් වන අපදා බහුල බව කුරුවිට නගරය පිලිබඳව සලකා බැලීමේදී වියුක්තව පැවතීම අනන්‍ය ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකිය . පළාත් අගනගරය වන රත්නපුර නගරයට නුදුරින් පිහිටා තිබීම මත නේවාසික නාගරික ප්‍රදේශයක් වශයෙන් සීග්‍ර සංවර්ධනයකට කුරුවිට නගරය ගමන් කරමින් තිබේ. මේ යටතේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ නේවාසික භාවිතය සඳහා ඉඩම් කට්ටි කිරීම වැඩි වශයෙන්ම සිදුවන නාගරික ප්‍රදේශය බවට කුරුවිට නගර සීමාව මෑත කාලය තුළදී පත්ව තිබීම දක්නට ඇති අතර මෙම තත්ත්වය ප්‍රාදේශීය සභා වාර්තා අනුව තවදුරටත් පැහැදිලිවේ. ඒ අනුව නේවාසික භාවිතයන් සඳහාම ප්‍රමුඛ නගරයක් වීම යන ලක්ෂණයද මෙහිදී කුරුවිට නගරයට සුවිශේෂී ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකිය.

මෙම නේවාසික භාවිතයේ වර්ධනය සඳහා ප්‍රදේශයේ පවතින කාලගුණික හා දේශගුණික ලක්ෂණයන් ද ඉවහල්වී ඇත. පිහිටීම අනුව උතුරු අක්ෂාංශ 6.46 හා 6.48 අතරද, නැගෙනහිර දේශාංශ 80.71 හා 80.23 අතරද පිහිටා ඇති අතර, මුහුදු මට්ටමේ සිට අඩි 20 – 500 දක්වා පරාසයක් තුළ ස්ථාපිතව ඇත.

2019 කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ දත්ත අනුව කුරුවිට නගරයේ වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 29^0 ක් පමණ වන අතර, මධ්‍ය වාර්ෂික

වර්ෂාපතනය මි.මී.3000 ට වඩා වැඩිවේ. මේ හේතුවෙන් ස්වභාවික ආපදාවන් අවම වූ සෞම්‍ය දේශගුණික තත්ත්වයක් නිර්මාණය වී තිබීම විශේෂත්වයකි. මෙම දේශගුණික රටාව මත තේ, රබර්, කුරුඳු වැනි ආර්ථිකමය භෝග වගාවන්ට සුදුසු පරිසරයක් නිර්මාණය වී ඇත. ඒ යටතේ නාගරික ප්‍රදේශයේ බොහෝමයක් ගෙවතු වගා වශයෙන් ද විශාල පරිමාණයේ වැවිලි කර්මාන්ත වශයෙන් වතු වගාවන් සිදු කෙරෙන භෝග ව්‍යාප්තවී ඇත. එය නාගරික ප්‍රදේශයේ ආර්ථිකයට 60% ක පමණ විශාල දායකත්වයක් සලසයි.

නාගරික ප්‍රදේශයේ භූ විෂමතාවය අනුව, කඳුවැටි, ගංගා ,නිම්න හා තැනිතලා වැනි විවිධ භූ විෂමතා ලක්ෂණයන්ගෙන් යුක්තව පිහිටා ඇත. ඒ අතර, පාරිසරික වශයෙන් නාගරික ප්‍රදේශයට සම්පතක් බවට පත්ව නගරය මැදින් ගලා බස්නා කුරු ගඟ නාගරික ප්‍රදේශයේ උතුරු දෙසින් වර්ණගල ඇල්ල හා බෝපත් ඇල්ල ආදී දේශීය වශයෙන් කීර්තියට පත්ව ඇති දිය ඇළි නිර්මාණය කරමින් ගලා බැසීම මඟින් නාගරික ප්‍රදේශයේ දියුණුවට රුකුළක් වී ඇත. මෙම දියඇළි නගර මධ්‍යය ප්‍රදේශයට ඉතා ආසන්නව පිහිටා තිබීම හේතුවෙන් සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට ඉවහල්වී ඇත. එම දිය ඇළි නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන් හේතුවෙන් නාගරික ප්‍රදේශයේ පවතින අනිකුත් පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථාන හා සංචාරක ආකර්ෂණීය ස්ථාන රාශියක් ප්‍රවර්ධනය වීමට හැකියාව පවතින අතර එමඟින් නාගරික ආර්ථිකය ශක්තිමත් වීමට පෝෂණයට මංපෙත විවරවී ඇත.

2.2. සැලසුම් සීමාව නිර්ණය කිරීම

සැලසුම් සීමාව නිර්ණය කිරීම

පහත සඳහන් කරුණු ත්‍රිත්වයට අනුකූලව සැලසුම් මායිම නිර්ණය කරන ලදී.

2.2.1. ක්‍රියාකාරි සීමාව

කුරුවිට නගරයේ ක්‍රියාකාරිත්ව කලාපය පිළිබඳව සළකා බැලීමේදී උතුරු කලාපයෙන් ඇහැළියගොඩ සීමාවටද නැගෙනහිර කලාපයෙන් පලාබද්දල (එරත්න) සීමාවට ද දකුණු කලාපයෙන් රත්නපුර සීමාවටද බටහිර කලාපයෙන් ඉඩන්ගොඩ (කිරිඇල්ල) සීමාවටද නිරීක්ෂණයන් සිදු කරන ලදී.

රූප සටහන් අංක 2.1 : කුරුවිට ක්‍රියාකාරී සීමාව හඳුනාගැනීම - අදියර 01



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

ඒ අනුව, පරිපාලන අවශ්‍යතා, දෛනික අවශ්‍යතා සහ මැණික් ව්‍යාපාරික අවශ්‍යතා සඳහා මිනිසුන් නගරයට පැමිණෙන සීමාවන් හඳුනාගන්නා ලදී. නගරයෙන් පිටතට යන මිනිසුන් එම අවශ්‍යතා සඳහා රත්නපුර සහ කොළඹ දිශාවට යන බවද එහිදී අනාවරණය විය. මෙම කරුණු සළකා බැලීමෙන් අනතුරුව පළමුවෙන් හඳුනාගත් ක්‍රියාකාරී සීමාව ක්‍රමයෙන් අවම වූ අතර එම තොරතුරු අනුව පහත සීමාව නිර්ණය කරන ලදී.

රූප සටහන් අංක 2.2 : කුරුවිට ක්‍රියාකාරී සීමාව හඳුනාගැනීම - අදියර 02



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

රූප සටහන් අංක **2.3 :** කුරුවිට ක්‍රියාකාරී සීමාව හඳුනාගැනීම - අදියර **03**



මුලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

2.2.2 භූගෝලීය සීමාව

භූ විෂමතාවය අනුව කුරුවිට නගරය කුරුගඟ ගංගා නිම්නය ආශ්‍රිත පහත් බිම් හා තැනිතලා ලක්ෂණ වලින් යුක්තය. නගරය මුහුදු මට්ටමේ සිට මීටර්.20-100 ත් අතර, උන්නතාංශ මට්ටමක පවතින අතර, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උන්නතාංශ මට්ටම් සලකා බලන විට මුහුදු මට්ටමේ සිට මීටර් 20 – 500ත් දක්වා පරාශයක පිහිටයි. කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැගෙනහිර ප්‍රදේශය බෑවුම් සහිත වන අතර, බස්නාහිර ප්‍රදේශයට වන්නට පහත් බිම් සහිත භූ විෂමතාවයක් දක්නට ලැබේ. එම භූ විෂමතාවය මනාව පිළිඹිබු වන්නේ නගරය මධ්‍යයෙන් ගලා බස්නා කුරුගඟ මීටර් 500 ට වඩා උසින් පටන් ගන්නා සමනල අඩවියෙන් ආරම්භ වී වර්ණගල ඇල්ල හා බෝපත් ඇල්ල වැනි ස්වභාවික පරිසරයේ පිහිටීම් ද පරිසරයට එක් කරමිනි. මෙම පාරිසරික වත්කම් මෙම නගරයට මෙන්ම මුළු දිවයිනටම වටිනා සම්පත් වේ. එබැවින් කුරුවිට නගර සංවර්ධන සැලැස්මේදී මෙම භූගෝලීය ලක්ෂණ පිළිබඳව සළකා බලන ලදි. ඊට අමතරව, නාගරික ප්‍රවණතා විශ්ලේෂණය සිදුකර සංවර්ධනයේ දිශාවන් හඳුනාගන්නා ලදී.

02 වන පරිච්ඡේදය

මූලික අධ්‍යයනය

රූප සටහන් අංක 2.4 : කුරුවිට නගරයේ භූගෝලීය පසුබිම



මූලාශ්‍රය : මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ 2006/2010 සිසුන් කණ්ඩායම රත්නපුර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් 2009 වසරේදී සිදු කළ ප්‍රාදේශීය අධ්‍යයනය

සිතියම් අංක 2.1 : නාගරික ප්‍රවණතා විශ්ලේෂණය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

2.2.3 පරිපාලන සීමාව

නාගරික සංවර්ධන අධිකාරිය මගින් ස්වකීය නාගරික බල ප්‍රදේශය ලෙස කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාවෙන් කොටසක් ප්‍රකාශයට පත්කර ඇති අතර එම ප්‍රදේශය ග්‍රාම නිළධාරී වසම් 15 කින් සහ වර්ග කිලෝ මීටර් 22.64 ක භූමි ප්‍රමාණයකින් සමන්විත වේ. මේ අනුව, වසර 2019 වන විට කුරුවිට නාගරික බල ප්‍රදේශ සීමාව තුළ වාසය කරන 22,877 ක නේවාසික ජනගහනය ද විවිධ අවශ්‍යතා සඳහා දෛනිකව කුරුවිට නගරයට පැමිණෙන 20,000 ක සංසරණ ජනගහනය ද කුරුවිට නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇත.

වගු අංක **2.1** : සැලසුම් ප්‍රදේශය පිළිබඳ තොරතුරු සාරාංශය

	කුරුවිට ප්‍රාදේශීය සභා ප්‍රදේශය	**කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රදේශය**	**කුරුවිට නගර සංවර්ධන සැලැස්ම බලපැවැත්වෙන ප්‍රදේශය (නාගරික සංවර්ධන අධිකාරිය බලාත්මක කල ප්‍රදේශය)**
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන	02	01	01
ග්‍රාමසේවක කොට්ඨාශ ගණන	56	39	15
භූමි ප්‍රමාණය (වර්ග කිලෝ මීටර්)	263.10	172.82	22.64
2019 වසරේ දී නේවාසික ජනගහනය	133,080	99,211	22,877
2030 වසරේ දී අපේක්ෂිත ජනගහනය			29,080
2019 වසරේ දී ජනගහන වර්ධන අනුපාතය			1.1
2019 වසරේ දී සංසරණ ජනගහනය			20,000
2030 වසරේ දී අපේක්ෂිත සංසරණ ජනගහනය			30,000

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

කුරුවිට නගර සංවර්ධන සැලැස්ම මගින් අපේක්ෂිත ප්‍රතිලාභ උපරිම වන ආකාරයෙන් සැලසුම් සීමාව නිර්ණය කර ඇති අතර එම සැලසුම් සීමාවට ඍජු ප්‍රතිලාභ ලැබෙන ආකාරයටත් එයට බාහිරව පවතින ප්‍රදේශයට වක්‍ර ප්‍රතිලාභ හිමිවන ආකාරයටත් කුරුවිට නගර සංවර්ධන සැලැස්ම සකස් කොට ඇත.

2.2.4 සැලසුම් සීමාව

ක්‍රියාකාරී, භූගෝලීය හා පරිපාලන සීමාවන් පිළිබඳ අධ්‍යයනයට සහ නාගරික ප්‍රවණතා විශ්ලේෂණයට අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2009 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද නාගරික සීමාව තවදුරටත් පවත්වා ගෙන යාමටත් එම සීමාවට අදාළව කුරුවිට නාගරික සැලැස්ම සකස් කිරීමටත් කටයුතු කරන ලදී. මෙහිදී ඇතැම් ග්‍රාමසේවා වසම් සම්පූර්ණ වශයෙන්ද ඇතැම් ග්‍රාමසේවා වසම් කොටස් වශයෙන් ද නාගරික සීමාවට හසු වී ඇත. පරිපාලන සීමාවන්ට අමතරව භූගෝලීය පිහිටීම පිලිබඳව ද සැලකිළිමත් වෙමින් සැලසුම් සීමාව නිර්ණය කිරීම එයට හේතුවයි.

සිතියම් අංක 2.2 : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රදේශය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

2.3 සැලසුම් සහ අවස්ථානුකූල සන්දර්භය

කුරුවිට නගරය වර්තමානයේ සබරගමුව පළාත් නගර ධුරාවලිය අනුව පස්වන පෙළ නගරයක් ලෙස හඳුනාගෙන ඇත. 22,877 ක් වූ වර්තමාන නාගරික ජනගහනය ග්‍රාම නිලධාරි වසම් 15කින් ආවරණය වන අතර රත්නපුර නගරයේ පවත්නා ආපදා තත්වයන් හා එහි පිහිටීම නිසා එම ප්‍රදේශයේ පවත්නා සංවර්ධනයේ බලපෑම කුරුවිට ප්‍රදේශයට ව්‍යාප්ත වීම හඳුනා ගත හැක.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ සකස් කරන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ ජාතික භෞතික සැලැස්මට (2050) අදාළව හඳුනාගත් අධි සංවේදී මධ්‍යම පාරිසරික කලාපය තුළ කුරුවිට නගරය පිහිටා තිබේ. ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කරගැනීමටත් පාරිසරික සමතුලිතතාව රඳවා ගැනීමටත් මෙමගින් අපේක්ෂිත ය. එබැවින්, කුරුවිට නගරයේ අනාගත සංවර්ධනය සැලසුම් කිරීමේ දී මෙම ජාතික ප්‍රතිපත්ති සහ ඒ සඳහා මූලික වූ අවශ්‍යතාවයන් පිළිබඳව සැළකිලිමත් විය යුතු වේ. එමෙන්ම, එහි අනු සැලැස්මක් වන ජාතික ජෛව විවිධත්ව සැලැස්ම තුළ පවතින සංවේදී මධ්‍යම කලාපය තුළ කුරුවිට පිහිටා තිබීමත් ඛනිජ හා පතල් පදනම් කරගත් කර්මාන්ත අනු සැලැස්ම තුළ ඒ සඳහා හඳුනාගත් කලාපය තුළට කුරුවිට අන්තර්ගත වීමත් කුරුවිට නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු වේ. මීට අමතරව, ශ්‍රී ලංකා සංචාරක උපායමාර්ගික සැලැස්ම තුළ කොළඹ සිට බදුල්ල දක්වා රත්නපුර හරහා දිවෙන සංචාරක මාර්ගයක් යෝජිතව පවතින බැවින් එහි බලපෑම රත්නපුර ආසන්නයේ පවතින කුරුවිට වෙතට හිමිවීමේ විභවතාවයක් ද පවතී.

ශ්‍රී ලංකාවේ දකුණු කලාපීය අභ්‍යන්තර මාර්ග ජාලය තුල වැදගත් මාර්ගයක් වන කොළඹ (බටහිර වෙරළ තීරය) සහ මඩකලපුව (නැගෙනහිර වෙරළ තීරය) අතර දිවෙන A 004 මාර්ගයේ කුරුවිට නගරය පිහිටා ඇති අතර ජාතික භෞතික සැලැස්මෙන් යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ රත්නපුර අන්තර් හුවමාරුව හේතුවෙන් මෙම නගරයට ධනාත්මක බලපෑමක් සිදු වනු ඇත. එසේම කැලණිවැලි දුම්රිය මාර්ගයේ එක් ප්‍රධාන නැවතුම්පලක් ලෙස කුරුවිට නගරය හඳුනා ගෙන තිබීම නිසාවෙන් ප්‍රදේශීය වශයෙන් මෙන්ම කලාපීය වශයෙන් නව සංවර්ධන ප්‍රවණතාවයන් නිර්මාණය වීමට හැකියාවක් පවතී.

2019 වසර වනවිට කුරුවිට නගරයේ සංසරණ ජනගහනය 20,000 ක් පමණ වන අතර මෙහි පවත්නා සුවිශේෂිත්වය වන්නේ එම සංසරණ ජනගහනයෙන් 90%ක් පමණ මෙම ප්‍රදේශයේ වාසය කරන නේවාසික ජනතාවම වීමයි. එමෙන්ම, පහත සඳහන් කරුණු හේතුවෙන් මෙම සංසරණ ජනතාව කුරුවිට නගරය වෙත පැමිණෙන බව හඳුනාගත හැකි වේ.

- රැකියා අරමුණු
- සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම්
- මැණික් ව්‍යාපාරය වැනි ආර්ථික අරමුණු

- ප්‍රවාහන සේවා
- කෘෂිකාර්මික සේවා
- බැංකු සහ මූල්‍ය පහසුකම්

කුරුවිට නගරයේ ආර්ථික කටයුතුවල අවකාශීය ව්‍යාප්තිය දෛනික අවශ්‍යතා සපුරාලීම මත පදනම් වී ඇති අතර ඒ වටා පවත්නා ග්‍රාමීය ජනතාව අතර මෙම නගරය ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රචලිතව පැවතීම දැකිය හැකි වේ. මේ අනුව, සබරගමුව පළාතේ පස් වන පෙළ සේවා නගරයක් ලෙස සළකනු ලබන කුරුවිට නගරය යනු බොහෝ සමාජ හා ආර්ථික සේවාවන්වල කුඩා පරිමාණ කේන්ද්‍රස්ථානයකි.

2.3.1 ජනගහනය

කුරුවිට නාගරික බල ප්‍රදේශයේ වර්තමාන ජනගහනය 2011 සංගණන වර්ෂයේ සංඛ්‍යාලේඛන දත්ත අනුව 22,877කි. එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනගහනයෙන් 23% වන අතර එය දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 2.1% කි. එම සංගණන වර්ෂයේ ජනගහන තොරතුරු අනුව කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනගහන වර්ධනයක් පෙන්නුම් කරයි. එමෙන්ම ජනගහන වර්ධනය සම්බන්ධයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ අනිකුත් නගර හා සන්සන්ධනය කිරීමේදී වැඩිම ජනගහනයකින් යුත් නගර අතරට මෙම නගරයද එක්වන බව හඳුනා ගත හැකිය .

රූප සටහන් අංක 2.5 : නාගරික ප්‍රදේශ වල ජනගහනය 2018



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

වගු අංක **2.2 :** වසම් මට්ටමින් ජනගහනය සහ භූමි ප්‍රමාණය

අංකය	ග්‍රාම නිලධාරී වසම	වසම් අංකය	මුළු භූමි ප්‍රමාණය (හෙක්.)	නාගරික සීමාවට අයත් භූමි ප්‍රමාණයේ ප්‍රතිශතය(%)	නාගරික සීමාවට හසුවන භූමි ප්‍රමාණය(හෙක්)	නාගරික ජනගහනය **(2018)**
1	කුරුවිට (තැඹිලියන ගම, කුරුවිටගම)	155	576.18	80	460.37	3176
2	දෙල්ගමුව වසම	155 බී	120.73	100	120.73	2831
3	මිල්ලවිටිය වසම	158 එෆ්	296.98	31	93.67	1125
4	කදන්ගොඩ දකුණු වසම	157 ඒ	224.05	62	138.58	1509
5	කදන්ගොඩ වසම	157	158.74	50	78.97	1119
6	නඩුකාරදෙණිය වසම	154 බී	106.01	100	106.01	1920
7	වතුයාය වසම	159	109.48	100	109.48	1365
8	උඩකඩ වසම	159 ඒ	57.72	100	57.72	811
9	පුස්සැල්ල වසම	158	624.29	2	11.87	66
10	කාහේන්ගම වසම	154 ඒ	415.85	88	366.02	3623
11	එක්නැලිගොඩ වසම	159 සී	271.98	43	115.74	640
12	උතුරු එක්නැලිගොඩ	159 බී	298.40	53	159.58	721
13	වලදුර වසම	154	763.70	29	224.39	547
14	කොස්ගොඩ වසම	154 ඊ	166.99	71	118.25	2757
15	කීරගල වසම	159 ඩී	436.96	24	102.87	667
	එකතුව		4628.06		**2264**	**22877**

මූලාශ්‍රය: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - 2018

කුරුවිට නාගරික බල ප්‍රදේශයේ ජන සනත්වය ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් වගු අංක 2.3 යටතේ විස්තර කෙරේ.

වගු අංක 2.3 : ජන සනත්වය ග්‍රාම නිලධාරී වසම් අනුව කුරුවිට නාගරික බල ප්‍රදේශය

ග්‍රාම නිලධාරි වසම	භූමි ප්‍රමාණය හෙක්ටයාර්	නාගරික ජනගහනය	ජන සනත්වය හෙක්ටයාර් 1 කට පුද්ගලයින්
1. කුරුවිට	460.37	3176	7
2. දෙල්ගමුව	120.73	2831	24
3. මිල්ලවිටිය	93.67	1125	13
4. කදංගොඩ (දකුණ)	138.58	1509	11
5. කදංගොඩ වසම	78.97	1119	14
6. නඩුකාරදෙනිය වසම	106.01	1920	18
7. වතුයාය	109.48	1365	13
8. උඩකඩ වසම	57.72	811	14
9. පුස්සැල්ල	11.87	66	6
10. කාහේන්ගම	366.02	3623	10
11. එක්නැලිගොඩ	115.74	640	5
12. උතුරු එක්නැලිගොඩ	159.58	721	5
13. වලදුර වසම	214.9	547	2
14. කොස්ගොඩ	118.25	2757	23
15. කීරගල	102.87	667	7
එකතුව	**2264**	**22877**	**10**

මූලාශ්‍රය : ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කුරුවිට - 2018

නාගරික ප්‍රදේශයේ වැඩිම ජන සනත්වය පෙන්නුම් කරන්නේ දෙල්ගමුව, කොස්ගොඩ සහ නඩුකාරදෙණිය යන වසම් වල වන අතර ප්‍රදේශය තුල පිහිටි අඩුම ජනසනත්වය කීරගල, වලදුර, එක්නැලිගොඩ, පුස්සැල්ල සහ කුරුවිට යන වසම් තුල පෙන්නුම් කරයි. නගරය තුල ජන සනත්වයේ විශේෂ ලක්ෂණය වන්නේ නගර මධ්‍යයට ආසන්න ප්‍රදේශ වන කුරුවිට හා එක්නැලිගොඩ යන වසම් තුල අඩු ජන සනත්වයක් පෙන්නුම් කිරීම හා නගර මධ්‍යයෙන් ඔබ්බට ඇති ප්‍රදේශ වන දෙල්ගමුව, නඩුකාරදෙණිය සහ කොස්ගොඩ යන වසම් තුල වැඩි ජන සනත්වයක් පෙන්නුම් කරීමය. එයට හේතුවී ඇත්තේ නගර මධ්‍යට ආසන්නයේ ග්‍රාම නිලධාරී වසම් වල භූමි ප්‍රමාණය විශාල වීම හා වාණිජ සේවා නගර මධ්‍යයේ පමණක් ව්‍යාප්ත වීමත් දුම්රිය රක්ෂිත ඉඩම් නගර මධ්‍යයේ වැඩි ප්‍රමාණයක් ව්‍යාප්ත වීමත්ය.

නගරයෙන් ඔබ්බට ඇති ප්‍රදේශ වල ජනගහනය වර්ධනය වීමට හේතුවී ඇත්තේ ප්‍රධාන මාර්ගය හා ඒ ආසන්න ප්‍රදේශ වල ඉඩම් කට්ටි කර විකුණා නිවාස විශාල ප්‍රමාණයක්

ඉදිකිරීමත්, කොස්ගොඩ හා නඩුකාරදෙණිය වසම් තුල රජයේ ඉඩම් බහුල වීමත්, එම ඉඩම් වල විශාල ප්‍රමාණයක ජනයා නිවාස ඉදිකර පදිංචි වී සිටීමත්, පැරඩයිස් කර්මාන්ත පුරයේ සේවකයින් ඒ ආසන්නයේ නේවාසික පහසුකම් ලබාගැනීමත් යන කරුණු නිසාය.

වයස් මට්ටම් අනුව ජනගහනය සලකා බැලීමේදී 48% ප්‍රමාණයක් ළමා හා වයස්ගත ජනගහනය වන අතර 52% ප්‍රමාණයක් වැඩකළ හැකි වයසේ ජනගහනය වේ. ඒ අනුව යැපුම් මට්ටමේ ජනගහනය හා ශ්‍රම බලකාය අතර විශාල වෙනසක් පෙන්නුම් නොකලද වැඩ කළ හැකි වයසේ ජනගහනය ආර්ථික හා සමාජීය වශයෙන් ඵලදායි කාර්යයන් කරා යොමු කිරීමෙන් නාගරික ප්‍රදේශයේ සංවර්ධන- ප්‍රවණතාවය වැඩි වේ. තවද ළමා ජනගහනය 37% පෙන්වීමද සුවිශේෂී විභවතාවයකි. අධ්‍යාපන කටයුතු ඊට සරිලන ලෙස දියුණු කිරීම කෙරෙහි අවධානය යොමුකල යුතුය.

රූප සටහන් අංක 2.6 : වයස අනුව ජනගහනය 2018



මුලාශ්‍රය: ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- කුරුවිට 2018

කුරුවිට නාගරික බල ප්‍රදේශය තුල පුමිතිරි අනුපාතය සාපේක්ෂ වශයෙන් ස්ත්‍රීන් 100 කට පුරුෂයන් 98 ක් වේ. නාගරික බල ප්‍රදේශයේ ජාතීන් අනුව ජනගහන විස්තර පහත රූප සටහනෙන් විස්තර කෙරේ.

රූප සටහන් අංක 2.7: ජාතීන් අනුව ජනගහනය 2018



මූලාශ්‍රය: ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- කුරුවිට 2018

ඉහත රූප සටහන් අංක 2.7 ට අනුව කුරුවිට නාගරික බල ප්‍රදේශයේ 92%ක් සිංහල ජාතීන් වන අතර 8% ක ප්‍රතිශතයක් අනිකුත් ජාතීන් නියෝජනය වී ඇත. එමෙන්ම, 91% කට වැඩි ප්‍රතිශතයක් බෞද්ධාගම ප්‍රධාන කර ගත් බහු ආගමික ජනගහනයක් ජීවත්වන නගරයක් බවට ප්‍රත්‍යක්ෂ වේ.

ජනගහන පුරෝකතන පිළිබඳ විස්තර 2.4 වගුවෙන් දැක්වේ. සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන දත්ත වලට අනුව 2018 වර්ෂයේ 22,877 ක් වූ ජනගහනය පසුගිය දශක වල සිදුවූ ජනගහන වර්ධන වේගය සලකාබලා 1.2 % ක් ලෙස මෙම නගරයේ ජනගහනය වර්ධනය සිදු වෙතැයි යන නිගමනය මත මෙම පුරෝකථනය සිදු කර ඇත. ඒ අනුව වසර 2030 දී ජනගහනය 29,080 ක් වේ.

ඊට අමතරව සංචාරක කලාපයක පිහිටීම, හම්බන්තොට - කොළඹ ප්‍රධාන මාර්ගයේ කේන්ද්‍ර කොටගෙන ස්ථාපිත වී තිබීම, රත්නපුර නගරයෙන් වයඹ දෙසට ශීඝ්‍ර ලෙස සිදුවන නේවාසික සංවර්ධනය සහ සංවර්ධනයට සුදුසු ඉඩම් කැබලි වීම යනාදී සංවර්ධන ප්‍රවණතාද මෙම නගරයේ ජනගහන වර්ධනය සඳහා සැලකිල්ලට ගෙන ඇත.

වගු අංක 2.4: පුරෝකථන ජනගහනය (2018 – 2030)

වර්ෂය	මුළු ජනගහනය
2011	22877
2016	24291
2021	25793
2026	27387
2030	29080

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය 2018 - සමීක්ෂණ වාර්තා

2.3.2 ඉඩම් පරිහරණ රටාව

කුරුවිට නාගරික බල ප්‍රදේශයේ ඉඩම් පරිහරණ රටාව භෞතික, ආර්ථික, සමාජීය හා පාරිසරික සාධක මත තීරණය වී ඇති අතර, 2018 වසරේදී කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව භූමි භාවිතය පහත වගුවේ පරිදි විවිධ භාවිතාවන් සඳහා වෙන් වී ඇත. එසේම වගු අංක 2.5 මඟින් ප්‍රදේශයේ භූමි පරිභෝජන රටාව දක්වා ඇත.

වගු අංක 2.5: පවත්නා භූමි පරිභෝග රටාව -2018

අනු අංකය	භාවිතය	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්	භූමි ප්‍රතිශතය (%)
1	නේවාසික	968.7	42.8
2	වාණිජ	22.6	1.0
3	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය	46	2.0
4	කර්මාන්ත	46.2	2.0
5	කුඹුරු ඉඩම්	582	25.7
6	මිශ්‍ර භෝග	123.2	5.5
7	කෘෂිකාර්මික	342.2	15.1
8	ආගමික	4.5	0.2
9	උද්‍යාන හා ක්‍රීඩා පිටි	2.6	0.1
10	සුසාන භූමි	2.3	0.1
11	මාර්ග	74.7	3.5
12	ජල මූලාශ්‍ර	49	2.0
	එකතුව	**2264**	**100**

මූලාශ්‍රය-ක්ෂේත්‍ර සමීක්ෂණය- නාගරික සංවර්ධන අධිකාරිය 2018

ඉහත වගුව අනුව වැඩිම භූමි භාවිතය කෘෂිකාර්මික කටයුතු සඳහා වෙන්වී ඇත. එය 46% ක් වන අතර ඊට වගුවේ දක්වා ඇති කුඹුරු ඉඩම්, මිශ්‍ර භෝග හා කෘෂිකාර්මික යන භාවිතයන්ගේ එකතුව අන්තර්ගත වේ. නාගරික ප්‍රදේශය තුල එය කැපී පෙනෙන ලක්ෂණයකි. මුළු භූමියෙන් 1.0% ප්‍රතිශතයක් වාණිජ භාවිතය සඳහා වෙන් වී ඇත. පොදුවේ ගත්කල කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය දෙපස වැඩි වශයෙන් රේඛීය

ආකාරයට වාණිජ කටයුතු ව්‍යාප්ත වි ඇත. අභ්‍යන්තර ප්‍රදේශ කරා වාණිජ කටයුතු එතරම් පුළුල් වීමක් දක්නට නොලැබේ. නගර මධ්‍ය ප්‍රදේශයේදී ප්‍රධාන මාර්ගයට සමාන්තරව හා දුම්රිය රක්ෂිත හා දුම්රිය මාර්ගයට සමාන්තරව වාණිජ කටයුතු ව්‍යාප්තව ඇත.

නාගරික ප්‍රදේශය තුළ මුළු භූමි භාවිතයෙන් 2% ක ප්‍රමාණයක් කාර්මාන්ත භාවිතය සඳහා යෙදවී ඇති අතර, එය හෙක්ටයාර් 46 ක පමණ භූමි ප්‍රමාණයකි. පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්ත පුරය සඳහා පමණක් අක්කර 85 ක භූමි ප්‍රමාණයක් වෙන් කර ඇති අතර ලංකාවේ ප්‍රධාන ඇඟළුම් කම්හලක් වන හයිඩ්‍රාමනී කර්මාන්ත ආයතනය කර්මාන්තපුරය අසල පිහිටා ඇත. ඊට අමතරව තේ කර්මාන්ත ශාලා ඇතුළු වෙනත් ප්‍රාදේශීය කර්මාන්ත ශාලාද ඒ ආශ්‍රිත මෙන්ම නාගරික ප්‍රදේශය තුල ස්ථාපිතව ඇත. කෙසේ නමුත්, මෙම කර්මාන්තපුරය ආශ්‍රය කරගෙන බිහිවී ඇති රැකියා අවස්ථා ප්‍රමාණය 800 ක් පමණ වන අතර ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති බැවින් දැනට ස්ථාපිත කර්මාන්ත වල මන්දගාමී සංවර්ධනයක් මේ වනවිට දක්නට ලැබේ.

රාජ්‍ය ආයතන, පාසැල් ආදි සේවා ආයතන සඳහා වෙන් වී ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර් 46 පමණ වන අතර, එය මුළු භූමියෙන් 2% ක ප්‍රමාණයකි. නාගරික ප්‍රදේශය තුළ මෙම භාවිතාව සඳහා යෙදවී ඇති භූමි ප්‍රමාණය දැනටමත් උඩකඩ ප්‍රදේශයේ වෙනම කලාපයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය සභාව , ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යන ආයතන ස්ථාපිතව ඇත.

කුඹුරු ඉඩම් සඳහා මුළු භූමියෙන් හෙක්ටයාර් 582 ක් වෙන් වී ඇති අතර, එය ප්‍රතිශතයක් ලෙස 25.7% කි. නේවාසික භාවිතාව හැරුණු විට වැඩි භූමි ප්‍රමාණයක් වෙන්වී ඇත්තේ මෙම භාවිතාව සඳහාය. නාගරික බල ප්‍රදේශයෙන් මෙම භූමි ප්‍රමාණය ප්‍රදේශය පුරා සමබවරව ව්‍යාප්තව පවතී.

මිශ්‍රභෝග භාවිතාව සඳහා මුළු භූමියෙන් 5.5% ප්‍රමාණයක් වෙන් වී ඇති අතර, එය හෙක්ටයාර් 123.2 කි. මෙම භාවිතාව ඇතුළත භූමිය තුළ ගෙවතු ස්වරූපයෙන් තේ, පොල්, රබර්, ඇතුළු ප්‍රධාන භෝග වර්ග වලට අමතරව කෝපි, ගම්මිරිස් , සාදික්කා, කරාබුනැටි, පුවක් ආදී සුළු අපනයන භෝගද ව්‍යාප්තව පවතී. ඒ අතර, නේවාසික කටයුතුද ව්‍යාප්තව ඇත. කෘෂිකාර්මික භූමි භාවිතය සඳහා යෙදවී ඇත්තේ විශාල වශයෙන් වගා කර ඇති තේ, රබර්, පොල් යන ප්‍රධාන අපනයන වැවිලි භෝගය. නාගරික භූමි ප්‍රමාණයෙන් 15.1% ප්‍රමාණයක් මෙම භාවිතය සඳහා යෙදවී ඇති අතර, එය හෙක්ටයාර් 342කි. කෘෂිකාර්මික භෝග අතර මෙම ප්‍රදේශයේ දේශගුණික ලක්ෂණයන් අනුව තේ සහ රබර් වගාව සඳහා වඩාත් වැදගත් වන අතර, වතු සමාගම්, වතු කෘෂි කාර්මික බිම් වල විශාල වශයෙන් මෙම වගාවන් ව්‍යාප්තව ඇත.

නාගරික ප්‍රදේශයෙන් 0.2 % ප්‍රමාණයක් ආගමික කටයුතු සඳහා යෙදවී ඇති අතර, ඒ සඳහා හෙක්ටයාර් 4.5 ප්‍රමාණයක් වෙන් වී ඇත. ශ්‍රී දන්තධාතූන් වහන්සේ පූරා වසර 43 ක් සඟවා තැබූ ඓතිහාසික දෙල්ගමුව රජමහා විහාරයද මෙම බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අතර, අනෙකුත් ආගමික මධ්‍යස්ථානද ව්‍යාප්තව ඇත.

0.1% ක භූමි ප්‍රමාණයක් උද්‍යාන හා ක්‍රීඩා පිටි සඳහා යෙදවී ඇති අතර, එය හෙක්ටයාර් 2.6 කි. කුරුවිට නගර මධ්‍යයේ පිහිටි පොදු ක්‍රීඩාංගණය කේන්ද්‍රකොට පාසැල් ක්‍රීඩා භූමි කිහිපයක් ස්ථාපිතව ඇති අතර, එය ප්‍රශස්ථ භාවිතාවන්ට කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ. සුසානභූමි භාවිතාව සඳහා නාගරික බල ප්‍රදේශයෙන් හෙක්ටයාර් 2.3 ක් යෙදවී ඇති අතර, එය ප්‍රතිශතයක් ලෙස 0.1 %කි. ඒ අනුව ප්‍රාදේශීය සභාව මගින් ඉදිකරන ලද පුස්සැල්ල ආදාහනාගාරය ඇතුළු සුසාන භූමි මීට ඇතුළත් වේ. නව ආදාහනාගාරය නිසා එම පහසුකම් වර්තමානයේ ප්‍රමාණවත් මට්ටමක ඇත.

කුරුවිට ප්‍රකාශිත නාගරික බල ප්‍රදේශයෙන් 3.5 % භූමි ප්‍රමාණයක් හෙවත් හෙක්ටයාර් 74.7 මාර්ග කටයුතු සඳහා වෙන් වී ඇත. ප්‍රධාන මාර්ග, පළාත් මාර්ග, ප්‍රාදේශීය හා අනෙකුත් සියලුම මාර්ග සඳහා මෙම භූමිය භාවිත වන අතර මාර්ග ඉදිකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම ප්‍රධාන ගැටළුවකි.

මුළු භූමියෙන් හෙක්ටයාර් 49 ක් හා ප්‍රතිශතයක් ලෙස 2.2% භූමි ප්‍රමාණයක් ජල මූලාශ්‍ර සඳහා නාගරික ප්‍රදේශයෙන් වෙන් වී ඇත. එහි ප්‍රධාන මූලාශ්‍රය වන්නේ කුරු ගඟයි. අනෙකුත් ගංගා ඇල දොලද ප්‍රදේශය පුරා ව්‍යාප්ත වී පවතී.

ඉඩම් භාවිතයේ කාලීන වෙනස්කම් ලෙස,

- ප්‍රධාන මාර්ගය දෙපස වාණිජ භාවිතයේ වර්ධනය වීමත් සමඟ පැරඩයිස් හන්දිය, මිල්ලවිටිය හන්දිය වැනි ප්‍රදේශ වල උප වාණිජ කලාප බිහිවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබීම
- ප්‍රධාන මාර්ගය දෙපස නේවාසික කටයුතු ක්‍රමයෙන් වාණිජ බවට පරිවර්තනය වීම
- නාගරික ප්‍රදේශයෙන් ඔබ්බට මාර්ග සංවර්ධනය හේතුවෙන් නේවාසික භාවිතාවන් නගරයෙන් පිටතට ව්‍යාප්ත වීම
- වේගවත් නේවාසික සංවර්ධනයේ ප්‍රවණතාවයක් දක්නට ලැබීම
- ප්‍රධාන මාර්ගය ආසන්නයේ සුදුසු ඉඩම් බිම් කට්ටි කැබීමේ වැඩි නැඹුරුතාවයක් දක්නට ලැබීම
- වාණිජ කටයුතු සඳහා භාවිත ඉඩම් ප්‍රධාන මාර්ගය දෙපස රේඛීය ආකාරයෙන් සංවර්ධනය වීම යන කරුණු හඳුනාගත හැකි වේ.

සිතියම් අංක 2.3 : කුරුවිට නාගරික බල ප්‍රදේශය තුළ පවත්නා සංවේදී කලාප



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

2.3.3 ඉඩම් වටිනාකම

කුරුවිට නගරයේ වර්තමාන ඉඩම් වටිනාකම තීරණය වීමෙහිලා නගරයේ භෞතික පිහිටීම හා අපරව්‍යුහ පහසුකම් වල ව්‍යාප්තිය ප්‍රධාන වී ඇත. ඒ අනුව පහත වගුවේ පරිදි ඉඩම් වටිනාකම් තීරණය වී ඇත.

වගු අංක 2.6: ඉඩම් වටිනාකම් වල ව්‍යාප්තිය - 2018

ඉඩම් වටිනාකම් කලාපය	ඉඩම් වටිනාකම් පරාස පර්චස් 1 ක මිළ (රුපියල් වලින්)
1වන කලාපය (නගර මධ්‍ය ප්‍රදේශය)	1000,000 වැඩි
2 වන කලාපය (නගර මධ්‍යයෙන් පිටත ප්‍රධාන මාර්ගය දෙපස කි.මී.1 දක්වා)	1000,000-500,000
3 වන කලාපය (නාගරික ප්‍රදේශය අවට ප්‍රධාන මාර්ග දෙපස කි.මී.2-3 දක්වා)	500,000-250,000
4 වන කලාපය (අතුරු මාර්ග දෙපස)	250,000-100,000
5 වන කලාපය (ග්‍රාමීය ප්‍රදේශ වල)	100,000 අඩු

මූලාශ්‍රය :- තක්සේරු දෙපාර්තමේන්තුව-2018

නගරයේ උපරිම ඉඩම් වටිනාකම් තීරණය වී ඇත්තේ ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති ඉඩම් හා ඊට ආසන්න ඉඩම් සඳහාය. මීට අමතරව මධ්‍යස්ථ ප්‍රමාණයේ ඉඩම් වටිනාකම් ඉන් ඔබ්බට පිහිටි අතුරු මාර්ග හා සම්බන්ධ ඉඩම් ප්‍රදේශ වලට ව්‍යාප්ත වන අතර, අවම ඉඩම් වටිනාකම් තීරණය වී ඇත්තේ අපරව්‍යුහ පහසුකම් අවම පහත් බිම් හා මඩබැවුම් සහිත භූමි ප්‍රදේශ වන පාතගම, ගෝනපිටිය හා කීරගල යන ප්‍රදේශ වලයි.

2.3.4 නිවාස

නාගරික බල ප්‍රදේශය තුල පවතින නිවාසවල වර්ගීකරණය පහත රූප සටහනෙන් දැක්වේ. 2018 වසරේදී වාර්තාවූ 5176 ක් වූ නිවාස ප්‍රමාණයෙන් 89% ස්ථිර නිවාස වන අතර අර්ධ ස්ථිර නිවාස 6.7 %කි. එසේම තාවකාලික නිවාස 4.3 %ක ප්‍රමාණයක් ව්‍යාප්තව ඇත්තේ දුම්රිය රක්ෂිත ඉඩම් වල හා ගඟ රක්ෂිත ප්‍රදේශ තුලය. නිවාස ඝණත්වය වැඩිම වසම් ලෙස නඩුකාරදෙණිය, දෙල්ගමුව වසම් හැඳින්විය හැක. ඊට අමතරව කොස්ගොඩ, කඳංගොඩ, වතුයාය, උඩකඩ, මිල්ලවිටිය යන වසම් වල වැඩි නිවාස ඝණත්වයක් ඇත. මෙම ප්‍රදේශ වල වැඩි නිවාස ඝණත්වයට හේතුවී ඇත්තේ අපරව්‍යුහ පහසුකම් ව්‍යාප්ත වීම, රජයේ ඉඩම් කුඩා බිම් කට්ටි වශයෙන් දීර්ඝ කාලීන බදු පදනම මත පදිංචි වී සිටීම, ඉඩම් ආපදා වලින් තොර නේවාසික කටයුතු සඳහා සුදුසු ඉඩම් වීම හා රජයේ ඉඩම් බහුල වසම් ප්‍රමාණයෙන් කුඩා වීම යන කරුණුය.

රූප සටහන් අංක 2.8: නිවාස වර්ගීකරණය 2018



මූලාශ්‍රය:- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2018

2.3.5 ආර්ථික කටයුතු

නගරයේ ආර්ථික සංවර්ධනය අංශ කිපයකින් සිදුවේ. එනම්, නගර මධ්‍යයේ වෙළෙඳ හා වාණිජ කටයුතු වල ව්‍යාප්තිය, බැංකු හා රාජ්‍ය ආයතන ව්‍යාප්තිය, නගරය ආසන්නයේ කර්මාන්ත පුරය ස්ථාපිත වී තිබීම, සංචාරක කර්මාන්තය, කෘෂිකර්මාන්තය සහ මැණික් කර්මාන්තය වශයෙනි.

රූප සටහන් අංක 2.9: ආර්ථික ව්‍යුහය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

වෙළඳ හා වාණිජ කටයුතු සලකා බැලීමේ දී තොග හා සිල්ලර වෙළෙඳ සේවා මධ්‍යස්ථාන 385 ක් ද හෝටල් 11 ක් පමණ ද ප්‍රදේශය පුරා ව්‍යාපත්ව ඇත. එයිනුත් වැඩි ඒකක ප්‍රමාණයක් ව්‍යාප්තව ඇත්තේ සිල්ලර වෙළඳාම මත බව පැහැදිලි වේ. නගරයේ සති අන්තයේ පවතින පොල තොග හා සිල්ලර වෙළෙඳ කටයුතු වලදී ඉතා වැදගත් වේ. සැම සෙනසුරාදා දිනකම සති පොල පැවැත්වෙන අතර මෙමගින් කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුළත පාරිභෝගියකයින් සේවා ලබා ගනී. සිල්ලර වෙළඳුන් 500 කින් පමණ සමන්විත වන සතිපොල දිනයේ පාරිභෝගිකයින් 5000 ක් පමණ ප්‍රමාණයක් නගරයට පැමිණේ.

2.3.6 සංචාරක කටයුතු

කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ දේශීය හා විදේශීය සංචාරකයින් ආකර්ෂණය කර ගත් ස්වභාවික සුන්දරත්වය හා ඓතිහාසික වශයෙන් වැදගත් වන ස්ථාන ගණනාවක් පිහිටා ඇත. මෙම ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා පළාත් සභාව මඟින් යෝජනා කර ඇති අතර, මෙම ස්ථාන නැරඹීම සඳහා ප්‍රවේශ වීමට හැකියාව ලැබෙන්නේ කුරුවිට නගරය හරහාය.

අතීතයේ සිට ශ්‍රීපාද සමයේ කුරුවිට එරත්න මාර්ගයෙන් ශ්‍රීපාද වන්දනා කිරීමට ගමන් කිරීම නිසා කුරුවිට නගරය ප්‍රසිද්ධියට පත්ව ඇත. ඊට අමතරව බෝපත් ඇල්ල, බටදොඹ ලෙන හා බටතොටලෙන නැරඹීමට සංචාරකයින් නිරන්තරයෙන් නගරයට පැමිණීම සිදුවේ. දෙස් විදෙස් සංචාරකයන්ගේ ආගමනය නගරයේ ආර්ථිකයට වාර්ෂිකව දායක වන අතර මෙම නගරය හරහා යන සංචාරකයින්ගෙන් 50%ට වඩා ප්‍රමාණයක් කුරුවිට නගරය අවට සංචාරක ස්ථාන නැරඹීමට පැමිණෙන බව ක්ෂේත්‍ර සමීක්ෂණ වලදී අනාවරණය වී ඇත.

2.3.7 සේවා නියුක්තිය

නාගරික බල ප්‍රදේශය තුල සේවා නියුක්තිකයන්ගේ රටාව සලකා බැලීමේදී රජයේ විවිධ රැකියා, පෞද්ගලික අංශයේ රැකියා, ස්වයං රැකියා, කෘෂි කර්මාන්තය ආශ්‍රිත රැකියා, මැණික් කර්මාන්තය ආශ්‍රිත රැකියා, ව්‍යාපාරික අංශ, වතු කම්කරුවන්, කුලී වැඩවල යෙදෙන්නන්, ඌන සේවා නියුක්තිකයන් සහ විදේශ රැකියා වල නියැලෙන්නන් වැනි කේෂ්ත්‍ර වල නියැලී ඇත.

රූප සටහන් අංක 2.10: සේවා නියුක්තිය 2018



මූලාශ්‍රය:- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2018

2.3.8 මාර්ග පහසුකම් සහ ප්‍රවාහන සේවා

නගරය හරහා දිවෙන ඒ ශ්‍රේණියේ මාර්ගයක් වන කොළඹ- රත්නපුර මාර්ගය මගින් කුරුවිට නගරය ප්‍රධාන ප්‍රවේශය ලබයි. කුරුවිට - එරත්න, කුරුවිට- තෙප්පනාව, කුරුවිට- දෙවිපහල , "සී" ශ්‍රේණියේ මාර්ග වන අතර, අනෙකුත් මාර්ග ප්‍රාදේශීය සභා මාර්ග සහ අතුරු මාර්ග වේ. පවත්නා භූමි පරිභෝජනයෙන් 3.5% පමණ භූමි භාගයක් මේ සඳහා වෙන්වී ඇත. නගරයේ මුළු මාර්ග පද්ධතියේ දිග කිලෝ මීටර් 50 ක් පමණ වන අතර, ඉන් කිලෝ මීටර් 30 තාර දැමූ මාර්ග වේ. තාර දැමූ මාර්ග වලින් කිලෝ මීටර් 10 පමණ මාර්ග සංවර්ධනය අධිකාරිය මගින් නඩත්තු කරන අතර, කිලෝ මීටර් 20 ක් පමණ පළාත් සභාවෙන් ද අනෙකුත් මාර්ග වලින් 20% පමණ ප්‍රාදේශීය සභාව මගින්ද නඩත්තු කෙරේ. නගරයේ මගී ප්‍රවාහන සේවා කටයුතු ප්‍රධාන වශයෙන් සිදු වන්නේ පෞද්ගලික හා ජනතා සන්තක ප්‍රවාහන සේවා මගිනි.

2.3.9 විදුලිය භාවිතය

නාගරික බල ප්‍රදේශය තුළ විදුලි බල සම්පාදනය කිරීමේදී ප්‍රධානම දායකත්වය දෙනු ලබන්නේ ලංකා විදුලි බල මණ්ඩලය මගිනි. පහත රූප සටහන– මගින් නාගරික බල ප්‍රදේශයේ විදුලි පහසුකම් ව්‍යාප්ත වි ඇති ආකාරය හඳුනා ගත හැක.

රූප සටහන් අංක 2.11: විදුලි බල ව්‍යාප්තිය 2018



මූලාශ්‍රය:- විදුලි බල මණ්ඩලය 2018

2.3.10 ජල සම්පාදනය

නගරයේ නල ජලය සැපයීමේ ප්‍රධාන මූලාශ්‍රය වන්නේ කුරුගඟ ප්‍රධාන කරගත් කුඩා නගර ජල සම්පාදන ක්‍රමයයි. ඒ හැරුණුවිට ළිං ජලය හා ගංගා ඇල දොල අනෙකුත් ජල මූලාශ්‍ර ලෙස හඳුනාගෙන ඇත. නගර මධ්‍යයෙන් දුරස්ථ ප්‍රදේශ වලට ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති හා ළිං ජලය මඟින් ජලය සපයාගනී. කුඩා නගර ජල සම්පාදන ව්‍යාපෘතියේ ටැංකි ධාරිතාව ලීටර් 125,000 ක් පමණ වන අතර මුළු වර්තමාන ජල පරිභෝජනය දිනකට ලීටර් 2,745,240 පමණ වේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2018 වන විට පාරිභෝගිකයන් 1623 කට හා ව්‍යාපාරික ස්ථාන 213 ක්ද, පාසල් 18ක්ද, ආගමික ස්ථාන කිහිපයක් සඳහාද වර්තමානයේ ජල පහසුකම් සපයා ඇත. ඊට අමතරව වර්තමාන ජනගහනයෙන් 50 % කට මෙම ව්‍යාපෘතිය මඟින් ජලය සපයයි. ඒ අනුව වර්තමාන ජනගහනයෙන් ජල හිඟය 50%ක් වන අතර ඒ සඳහා දිනකට ජලගැලුම් ලක්ෂ 13 ක් අවශ්‍ය වේ. එම ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කුඩා නගර ජලසම්පාදන ව්‍යාපෘතිය මඟින් ජලගැලුම් 50,000 ක නව ජල ටැංකියක් ඉදිකිරීමට යෝජිතය. ඊට අමතරව දැනට මිල්ලවිටිය, නඩුකාරදෙණිය, වළඳුර, කොස්ගොඩ, කාහේන්ගම වැනි ප්‍රදේශ වල ක්‍රියාත්මක වන ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති මඟින් හා ළිං ජලය භාවිතය මඟින් ප්‍රදේශයේ ජල අවශ්‍යතාවය සපුරාගනී.

මීට අමතරව ජාතික ජලාප්‍රවාහන හා ජල සම්පාදන මණ්ඩලය මඟින් නව නගරයේ සිට මිල්ලවිටිය දක්වා නව ජල මාර්ගයක් එලීමේ ව්‍යාපෘතියක් ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිතය.

2.3.11 මලාපවාහන ක්‍රම

මෙම නගරය සඳහා මධ්‍යම මලාපවහන පද්ධතියක් නොමැති අතර, ප්‍රකාශිත නාගරික ප්‍රදේශයෙන් 72 % ක පමණ ජල මුද්‍රිත වැසිකිළි භාවිතා වේ. 28% ක් පමණ වෙනත් අනාරක්ෂිත ක්‍රම භාවිතා කරන අතර කුරුවිට නගර මධ්‍යයේ පොදු වැසිකිළි පද්ධතියක් ඉදිකර ඇත. දැනට ප්‍රාදේශීය සභාව හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය විසින් තාවකාලික වැසිකිළි ඉවත් කර නාගරික බලප්‍රදේශයෙන් පිට ප්‍රදේශ සඳහා ජල මුද්‍රිත වැසිකිලි ඉදිකිරීමට යෝජිත අතර, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් නගර මධ්‍ය ප්‍රදේශය සඳහා මලාපවාහන ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

වගු අංක 2.7: සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම භාවිතය- 2018

වැසිකිළි වර්ග	සංඛ්‍යාව	ප්‍රතිශතය %
ජලමුද්‍රිත වැසිකිළි	3726	72
වළ වැසිකිළි	1242	24
වෙනත්	208	4
එකතුව	**5176**	**100**

මූලාශ්‍රය:- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කුරුවිට 2018

2.3.12 ජලාපවාහනය හා කාණු පද්ධතිය

නගරය තුළ වැසි ජලය බැස යාම සඳහා ක්‍රමවත් කාණු පද්ධතියක් නොමැති අතර, කොළඹ-රත්නපුර ප්‍රධාන මාර්ගයෙහි පමණක් වැසි ජලය බැස යාමට සිමෙන්ති කාණු ඉදිකර ඇත. නගරයේ සිට ආරම්භ වන අනෙකුත් අතුරු මාර්ග සඳහා කාණු ඉදිකර නොමැත. එම මාර්ග වල පස් කාණු නඩත්තු කිරීම දුර්වල වීම නිසා ජලය බැසයාම සම්බන්ධයෙන් දුෂ්කරතා මතු වී තිබේ.

දැනට නාගරික ප්‍රදේශය තුල 20% පමණ සිමෙන්ති කාණු ඉදිකර ඇති අතර, කාණු නොමැති මාර්ග 70% ක් පමණ වේ. මෙම ජලය ස්වභාවික ජල මාර්ග වලට බැස යන අතර, නගරයේ අපවිත්‍ර ජලයද එම මාර්ග මඟින් කුරුගඟට හා අනෙකුත් ඇල මාර්ග වලට එකතුවීම පාරිසරික ගැටළුවකි.

2.3.13 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

කුරුවිට නාගරික බල ප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම හා පිරිසිදු කිරීම ප්‍රධාන වශයෙන් සිදුකරනු ලබන්නේ කුරුවිට ප්‍රාදේශීය සභාව මඟිනි. කසල එකතුවන ප්‍රධාන ස්ථාන වන්නේ සතිපොල හා නගරය ආශ්‍රිතවයි. එකතු වන ද්‍රව්‍ය වලින් වැඩි ප්‍රමාණයක් කාබනික ද්‍රව්‍ය වේ. එබැවින් ප්‍රතිචක්‍රීකරණය කිරීම පහසුය. මේ සඳහා ප්‍රාදේශීය සභාවේ ස්ථිර කම්කරුවන් 9 ක්

හා ආදේශක කම්කරුවන් 3 ක් දැනට සේවයේ යොදවා ඇත. ට්‍රැක්ටර් 2 ක් ඝන අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා යොදවා ඇති අතර නොදිරන ද්‍රව්‍ය එක් ට්‍රැක්ටරයකින් මුළු ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුලම එකතු කරනු ලබයි. එම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ භූමියක් වෙත ගෙන එනු ලබන අතර නොදිරන ඝන අපද්‍රව්‍ය එකතු කිරීම කරනු ලබන්නේ මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය මඟිනි. දිරාපත් වන ඝන අපද්‍රව්‍ය ට්‍රැක්ටරයක් මඟින් වරිපනම් ප්‍රදේශය තුල පමණක් එකතු කරනු ලබන අතර ට්‍රැක්ටර් ලෝඩ් 2 ක් දිනකට එකතු වේ. එම ඝණ අපද්‍රව්‍ය කුරුවිට බන්ධනාගාරයේ සිරකඳවුර තුල ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය වෙත රැගෙන යනු ලබයි. එහි කැලි කසල කළමනාකරණය සඳහා සිර කඳවුරේ සිටින රැඳවියන් යොදවනු ලබන අතර එහි නිපදවන කාබනික පොහොර ප්‍රාදේශීය සභා කාර්යාලයේ අලෙවි කරනු ලබයි. නොදිරන ද්‍රව්‍ය එකතු කිරීම තුලින්ද ප්‍රාදේශීය සභාව ආදායම් උපයයි.

බන්ධනාගාර කොම්පෝසට් ව්‍යාපෘතිය දීර්ඝ කාලීනව පවත්වා ගැනීමේ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන අතර රැස්කරන ලද කසල ගබඩා කිරීම සඳහාද පළාත් සභාව මඟින් මූල්‍යමය ප්‍රතිපාදන ලබාදීමට යෝජිතය. දැනට ප්‍රාදේශීය සභාවට කම්කරු හිඟය හා කුණු එකතු කිරීමේ වාහන හිඟය කසල එකතු කිරීමට බාධාවක් වී ඇත.

2.3.14 දුරකථන හා තැපැල් සේවා

දුරකථන සේවාවේ සීග්‍ර වර්ධනයක් මෑත කාලයේ දක්නට ලැබේ. ඒ අනුව, ප්‍රකාශිත කුරුවිට නාගරික ප්‍රදේශය තුළ දුරකථන භාවිතයන් පහත වගුවෙන් දැක්වේ.

වගු අංක 2.8: දුරකථන සම්බන්ධතා ව්‍යාප්තිය - 2018

භාවිත වර්ගය	සම්බන්ධතා සංඛ්‍යාව	
	ප්‍රමාණය	ප්‍රතිශතය%
නේවාසික	3168	61.2
වාණිජ	481	9.3
කාර්යාල	16	0.3
ආගමික	11	0.2
මුළු ප්‍රමාණය	**3676**	**71**

මූලාශ්‍රය:- ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය 2018

කුරුවිට නාගරික ප්‍රදේශය තුළ භාවිතා වන දුරකථන වලින් 61.2% නේවාසික භාවිතයන්ට යෙදවී ඇති අතර 10 % ක ප්‍රමාණයක් අනෙකුත් සේවා සඳහා යෙදවී ඇත. මෑතකදී නගරය ආසන්නයේ ජංගම දුරකථන පද්ධති සවිකිරිම හේතුවෙන් ප්‍රදේශය තුළ ජංගම දුරකථන භාවිතයද සීග්‍ර ලෙස වර්ධනය වී ඇති අතර මුළු නේවාසික දුරකථන ව්‍යාප්තියට අමතරව තනි

පුද්ගලයන් වශයෙන් ජංගම දුරකථන භාවිතය විශාල වර්ධනයක් සිදුවී ඇත. නාගරික ප්‍රදේශයෙන් 70% පමණ ජංගම දුරකථන භාවිතා කරයි.

2.3.15 තැපැල් සේවාව

නගරය තුළ ප්‍රධාන තැපැල් කාර්යාල 01 ක් උප තැපැල් කාර්යාල 08 ක් සහ පෞද්ගලික අංශය මඟින් පවත්වාගෙන යනු ලබන නියෝජිත තැපැල් කාර්යාල 5 ක් ව්‍යාප්තව ඇත. මෙමඟින් ප්‍රදේශයේ තැපැල් සේවා අවශ්‍යතාවය සපුරා ලයි.

2.3.16 අධ්‍යාපන පහසුකම්

කුරුවිට නාගරික ප්‍රදේශය තුල පාසැල් 13ක් ස්ථාපිත වී ඇති අතර, ඒ අතර මධ්‍ය මහා විද්‍යාලයක් හා මුස්ලිම් විද්‍යාලයක් නගර මධ්‍යයේ පිහිටා ඇත.

නාගරික ප්‍රදේශයේ පාසැල් වල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 7032 ක් පමණ වන අතර, ගුරුවරුන් 333ක් මෙම ක්ෂේත්‍රයේ නිරතව සිටියි. නාගරික කේන්ද්‍රය තුළ වාසය කරන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 6324 ක පමණි. ඒ අනුව පෙනී යන වැදගත් කරුණක් වන්නේ ප්‍රදේශයේ ජීවත් වන ශිෂ්‍ය සංඛ්‍යාවට අමතරව අවට ප්‍රදේශ වලින්ද නාගරික ප්‍රදේශයේ පාසැල් වල අධ්‍යාපනය ලැබීමට පැමිණෙන බවයි.

නාගරික බල ප්‍රදේශයේ අධ්‍යාපනය පිළිබද විමසීමේදී පෞද්ගලික අධ්‍යාපන ආයතන ගණනාවක්ද පෙරපාසැල් හා දහම් පාසැල් ස්ථාපිත වී ඇති අතර වෘත්තීමය අධ්‍යාපන අවශ්‍යතාවයන් ප්‍රමාණවත් පරිදි සපුරා නොතිබීම ගැටළුවකි. පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත වී ඇති අතර, සමාන්‍ය පෙළ මට්ටමෙන් ඉවත් වන බොහෝ සිසුන් සිය වෘත්තීමය පුහුණු ආයතන සපුරා ගන්නේ රත්නපුර නගරය ආශ්‍රිතවයි. ජාත්‍යන්තර පාසල් වල ව්‍යාප්තියක් නාගරික ප්‍රදේශයේ දක්නට නොලැබේ.

2.3.17 සෞඛ්‍ය පහසුකම්

ප්‍රදේශයේ සෞඛ්‍ය පහසුකම් ගැන සළකා බැලීමේ දී ප්‍රාදේශීය මට්ටමින් රජය මඟින් පවත්වාගෙන යනු ලබන කුරුවිට මධ්‍යම බෙහෙත් ශාලාව ප්‍රධාන වේ. මෙම ආරෝග්‍ය ශාලාවට අමතරව නගරය තුළ පෞද්ගලික බෙහෙත් ශාලා 10 ක් ද විශේෂඥ වෛද්‍ය සේවා ආයතනයක් ද, ආයුර්වේද වෛද්‍ය සායන 2 කින්ද සෞඛ්‍ය සේවාවන් සපයනු ලැබේ. මීට අමතරව නගරයට ආසන්නව පිහිටි රජයේ ප්‍රධාන රෝහල වන රත්නපුර මහ රෝහල මෙන්ම පුස්සැල්ල හා නව නගර ආයුර්වේද රෝහල සඳහා කි.මී.13 ක් වැනි අවම දුරකින් ලඟාවීමේ හැකියාව ඇති නිසා එම රෝහල් කරා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා යොමුවීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත.

2.3.18 ක්‍රීඩා හා විනෝද පහසුකම්

නගරයේ විවේක හා විනෝද කටයුතු සඳහා එක් පොදු ක්‍රීඩාංගණයක් ඇති අතර, එය අඩු පහසුකම් වලින් සමන්විත වේ. නගරයේ පිහිටි එකම සිනමා ශාලාවද අඩු පහසුකම් සහිත එකකි. තවද නගරය තුල පුස්තකාලයක් පැවතියද එය සක්‍රියව ක්‍රියාත්මක වීම අඩු බව පෙනී යයි. නගරයේ විනෝද හා ක්‍රීඩා පහසුකම් සඳහා අවශ්‍ය ඉඩකඩ ප්‍රමාණවත් නොමැති වුවද 46% ක ප්‍රදේශයක් කෘෂිකාර්මික පරිභෝජනයට නතුවීමෙන්ද ඉන් 15 % කුඹුරු ඉඩම් වීමද සංචාරක ස්ථාන හා ආගමික ස්ථාන වල පිහීටීමද හේතුවෙන් වක්‍රාකාර ලෙස එම පහසුකම් සැපයීමේ හැකියාව නගරය තුල පවතී.

කුරුවිට නගරය යනු කුඩා පරිමාණයේ සේවා මධ්‍යස්ථානයකි. එමෙන්ම, සුන්දරත්වයෙන් අනූන පරිසරයක පිහිටා ඇති විවේකී නගරයකි. එබැවින්, නේවාසික ප්‍රවනතාවයක් දැකිය හැකි වන සංචාරක සම්පත් සහිත මෙම නගරය සංවර්ධනය කිරීමේදී ඉහත අවධානය යොමු කරන ලද සියලු අංශයන්ගේ ප්‍රගතිය සහ ගුණාත්මක බව අපේක්ෂිතය වර්ධනය කිරීම වැදගත් වේ .

පරිච්ඡේදය 03

සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

03 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

3.1 හැඳින්වීම

හැඳින්වීම

අධ්‍යයන ප්‍රදේශය තුළ හඳුනාගත් ගැටළු විසඳීම සහ විභවතාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් කුරුවිට නගර සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. එහිදී වත්මන් සහ අනාගත සංවර්ධනය උදෙසා පවතින ගැටලු සහ විභවතා හඳුනාගෙන ඇත. එම ගැටලු සඳහා උපායමාර්ගික විසඳුම් සොයා ගැනීම සහ විභවතාවන් ඉස්මතු කරගැනීම මෙහි අරමුණයි. අධ්‍යයන ප්‍රදේශය තුළ පවත්නා ගැටලු පාර්ශවකරුවන්ගේ රැස්වීම් සහ නාභිගත කණ්ඩායම් සාකච්ඡාවන් හරහා හඳුනාගෙන ඇති අතර සැලසුම් කණ්ඩායමේ අදහස් පිළිබඳවද සැලකිලිමත් වෙමින් අවසාන ලැයිස්තුව සකස් කර ඇත. අදාළ ගැටළු සහ විභවතා මෙම පරිච්ඡේදයේ දී විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇති අතර ඒවායේ ස්වභාවය, විශාලත්වය සහ වැදගත්කම අනුව ප්‍රමුඛතා ලබා දී ඇත. ඒ අනුව කුරුවිට නගර සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය පහත සඳහන් පරිදි හඳුනා ගත හැකි වේ.

හඳුනාගත් ගැටළු

3.2. හඳුනාගත් ගැටළු

3.2.1. නගරයේ භෞතික පිහිටීම නගර ව්‍යාප්තියට බාධාවක් වීම

කුරුවිට නගරය A004 මාර්ගයේ ඇහැළියගොඩ සහ රත්නපුර නගර අතර පවත්නා රේඛීය නගරයක් ලෙස පිහිටා ඇත. කෙසේ නමුත්, නගර මධ්‍යයේ අක්කර 11 ක භූමි ප්‍රමාණයක් දුම්රිය දෙපාර්තමේන්තුව සතු වන බැවින් සංවර්ධන කටයුතු අවිධිමත් ආකාරයෙන් නගර මධ්‍යයේ විසිරී පවත්නා බව දැකිය හැකි වේ. මෙම අවකාශය තුල වාණිජ කටයුතු ව්‍යාප්ත විය නොහැකි බැවින් නගරය ඇහැළියගොඩ සහ රත්නපුර දෙසට රේඛීයව ව්‍යාප්ත වීම කුරුවිට නගරයට ගැටලුවකි.

රූප සටහන් අංක 3.1 : කුරුවිට නගරයේ වාණිජ ව්‍යාප්තිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2021

රූප සටහන් අංක 3.2 : කුරුවිට නගරයේ පවත්නා දුම්රිය ඉඩම්

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2021

3.2.2. නගර සීමාව තුළ විනෝදාත්මක අවකාශයන් අඩු වීම

නාගරික සංවර්ධන අධිකාරියේ 2023 වර්ෂයේ අධ්‍යයනයට අනුව කුරුවිට නගරයේ විනෝදාත්මක අවකාශ අවශ්‍යතාවය ව.කි.මී. 0.414 (හෙක්ටයාර 41.4) ක් වේ. නමුත් නගරය සතුව පවත්නා විනෝදාත්මක අවකාශය ව.කි.මී. 0.0178 (හෙක්ටයාර 1.78) කි. නේවාසික ජනගහන ව්‍යාප්තියක් දැකිය හැකි වන සංචාරක ආකර්ශනීය නාගරික ප්‍රදේශයක් වන බැවින් මෙම විනෝදාත්මක අවකාශයන්ගේ අඩු බව- කුරුවිට නගරය සංවර්ධනය කරා ළඟා වීමේදී ගැටලුවක් බවට පත් වේ. කෙසේ නමුත්, භූමි පරිහරණයෙන් 25% ක ප්‍රමාණයක් කුඹුරු ඉඩම් වන බැවින් ද නාගරික ප්‍රදේශය තුළ ඇළ, දොළ, ගංගා, වැව් සහ දියඇලි පිහිටා ඇති බැවින් ද විනෝදාත්මක අවකාශයන්ගේ අවශ්‍යතාවය වක්‍රාකාරව සපිරේ. එසේ නමුත් කුරුවිට නාගරික බල ප්‍රදේශය තුළ පවත්නා සැබෑ විනෝදාත්මක අවකාශ අවශ්‍යතාවය ව.කි.මී. 0.0178 (හෙක්ටයාර 1.78) ට වඩා වැඩි විය හැකි වුව ද එය විසින් සම්පූර්ණ අවශ්‍යතාවය සැපිරීමක් සිදු නොවන බැවින් නගර සංවර්ධනයට එය ගැටලුවක් වේ.

වගු අංක 3.1 : කුරුවිට නාගරික බල ප්‍රදේශය තුල පවතින ක්‍රීඩා පිටි, උද්‍යාන සහ පොදු එළිමහන් විනෝද පහසුකම් සහිත ස්ථාන

අංකය	නම	ප්‍රමාණය (හෙක්ටයාර්)	ප්‍රමාණය (ව.කි.මී)	ග්‍රාම නිලධාරී වසම	උද්‍යාන වර්ගය
01.	බටුහෙනවත්ත වොලිබෝල් ක්‍රීඩාංගනය	0.1	0.001	කොස්ගොඩ	ඉතා කුඩා උද්‍යාන
02.	කහේන්ගම ක්‍රීඩාංගනය	0.12	0.0012	කහේන්ගම	ඉතා කුඩා උද්‍යාන
03.	ලේක්සයිඩ් ළමා ක්‍රීඩාංගනය	0.14	0.0014	කහේන්ගම	ඉතා කුඩා උද්‍යාන
04.	කේ.පී.ඒ ජයතිස්ස ක්‍රීඩාංගනය	0.05	0.0005	කුරුවිට	ඉතා කුඩා උද්‍යාන
05.	නඩුකාරදෙණිය ළමා උද්‍යානය	0.06	0.0006	නඩුකාරදෙණිය	ඉතා කුඩා උද්‍යාන
06.	නඩුකාරදෙණිය ළමා උද්‍යානය	0.03	0.0003	නඩුකාරදෙණිය	ඉතා කුඩා උද්‍යාන
07.	නඩුකාරදෙණිය වොලිබෝල් ක්‍රීඩාංගනය	0.15	0.0015	නඩුකාරදෙණිය	ඉතා කුඩා උද්‍යාන
08.	විවෘත භූමි	0.07	0.0007	කන්දගොඩ දකුණ	ඉතා කුඩා උද්‍යාන
09.	පොදු ක්‍රීඩාංගනය	1.06	0.0106	දෙල්ගමුව	අසල උද්‍යාන
එකතුව		**1.78**	**0.0178**		

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2019

වගු අංක 3.2 : කුරුවිට නාගරික බල ප්‍රදේශය තුල පවතින වක්‍ර විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන

අනු අංකය	පහසුකම්	සංඛ්‍යාව
01.	ප්‍රජා ශාලා	35
02.	පුස්තකාල	03

මූලාශ්‍රය: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (සම්පත් පැතිකඩ) - 2018

සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

3.2.3. සංචාරක වෙළෙඳ පොළ සංවර්ධනය වී නොමැති වීම

කුරුවිට නාගරික සීමාව තුළ සහ සීමාවෙන් පිටත සංචාරක ආකර්ශනීය ස්ථාන කිහිපයක්ම පවත්නා අතර එකී ස්ථානයන් නැරඹීම සහ විනෝද වීම පිණිස මාසිකව 20,000 ක පමණ සංචාරකයන් පිරිසක් කුරුවිට නගරයට පැමිණෙන බව හඳුනාගෙන ඇත. එමෙන්ම, සිරිපා සමයේදී මෙම සංඛ්‍යාවට මාසිකව තවත් 5000 ක පමණ පිරිසක් එකතු වේ. කෙසේ නමුත් කුරුවිට නගරය පාදක කරගනිමින් මෙම පිරිසට පහසුකම් සැලසීමක් සිදු නොවන අතර සංචාරකයන් ඉලක්ක කරගත් භාණ්ඩ හෝ සේවා ලබා දීමක් දැකිය නොහැකි ය.

රූප සටහන් අංක 3.3 : සංචාරක කර්මාන්තය පදනම් කරගත් භාණ්ඩ හා සේවා

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2021

3.3. හඳුනාගත් විභවතා

හඳුනාගත් විභවතා

3.3.1. නගරයේ ආගමික, ඓතිහාසික සහ ස්වභාවික අනන්‍යතාවය

ශ්‍රී පාදස්ථාන පුදබිමට පිවිසෙන දොරටු ත්‍රිත්වයෙන් එකක් වීමත් වසර 43ක් පුරා ශ්‍රී දන්ත ධාතුව සුරැකි දෙල්ගමුව රජමහා විහාරය ප්‍රසිද්ධ සංචාරක ආකර්ශනයක් වන- බෝපත් ඇල්ල පිහිටා තිබීමත් හේතුවෙන් කුරුවිට නගරයට ජාතික වැදගත්කමක් හිමිවී ඇත. එමෙන්ම, බටදොඹලෙන සහ බටතොටලෙන (දිවාගුහාව) නාගරික සීමාවට ඉතා සමීපයෙන් (කි.මී. 2 ක් ඇතුලත) පිහිටා තිබීමත් මෙම නගරයට වාසිදායක වේ. මේ අනුව, කුරුවිට නගරය සතුව පවත්නා ආගමික, ඓතිහාසික සහ ස්වභාවික අනන්‍යතාව මගින් නගරය සංවර්ධනය කරගැනීමේ හැකියාවක් කුරුවිට නොමදව පවතී .

රූප සටහන් අංක 3.4 : ශ්‍රී පාදස්ථාන පුදබිමට පිවිසෙන ප්‍රධාන මාර්ග



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2021

රූප සටහන් අංක 3.5 : ඓතිහාසික දෙල්ගමු රජමහා විහාරය

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය, 2019

3.3.2. ජීවත් වීමට සුදුසු පරිසරය

රත්නපුර නගරය සබරගමුව පළාතේ අග නගරය වන අතර එයට ඉතාම ආසන්නයෙන් පිහිටා ඇති නගරය කුරුවිට නගරය වේ. මේ හේතුවෙන් කුරුවිට නාගරික ප්‍රජාවගේ බොහෝ සමාජයීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් රත්නපුර නගර සීමාවෙන් සංතෘප්ත කරගැනීම දැකිය හැකි වේ.

රූප සටහන් අංක 3.6 : පළාත් අග නගරයට (රත්නපුර) පවත්නා දුර



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2021

ගංවතුර සහ නායයාම් ආපදා සිදුවන ප්‍රදේශ පිළිබඳව සළකා බලන විට, නාගරික සීමාවේ මායිම් ආසන්නයෙන් ආපදා ප්‍රදේශ හඳුනාගත හැකි අතර ආපදා සිදුවන කාලසීමාවන් පිලිබඳව සලකා බලන විට, වාර්ෂිකව ආපදාවන්ට මුහුණ දීමක් දැකිය නොහැකි ය. එමෙන්ම, තත්ත්ව විශ්ලේෂණයේ දී හඳුනාගත් පරිදි භූමි ප්‍රමාණයෙන් 80% ක පමණ ප්‍රදේශය තැනිතලා ප්‍රදේශ වන අතර සංවර්ධනය කල හැකි ඉඩම් ප්‍රමාණය 70% ක් පමණ වේ. එමෙන්ම, එම ඉඩම් ප්‍රමාණයෙන් 15% ක පමණ ප්‍රමාණයක් රු. 700,000 - රු. 300,000 අතර ද තවත් 45% ක පමණ ප්‍රමාණයක් රු. 300,000 ට අඩු ඉඩම් වටිනාකමකින් ද යුක්ත වන බැවින් ප්‍රජාවගේ ක්‍රය ශක්තිය මත ඉඩම් ලබා ගැනීමේ හැකියාව පවතී.

තව ද, භූමි ප්‍රමාණයෙන් 25% ක පමණ ප්‍රදේශයක් කුඹුරු ඉඩම් වලින් සමන්විත වන බැවින් හා ජලවහන රටාව හේතුවෙන් ද කුරු ගඟ, බෝපත් ඇල්ල, පැරඩයිස් වැව වැනි විශේෂ පරිසර සාධක වලින් සමන්විත වන බැවින් ද කුරුවිට නාගරික බල ප්‍රදේශය ප්‍රජාවගේ වාසයට සුදුසු පරිසරයකින් යුක්ත වන අතර නගර සංවර්ධනයේදී මෙම තත්ත්වය වාසිදායක වේ.

3.3.3. නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය

සබරගමුව පළාත තුල ගලිගමුව, කුරුවිට සහ ඇඹිලිපිටිය ලෙස කර්මාන්තපුර 3ක් පවතින අතර ඉන් විශාලතම කර්මාන්තපුරය වන අක්කර 83 කින් සමන්විත නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය කුරුවිට නාගරික බල ප්‍රදේශය තුළ පිහිටා ඇත. ඇඹිලිපිටිය හා ගලිගමුව කර්මාන්තපුර සමග කුරුවිට කර්මාන්තපුරය සසඳා බැලීමේදී නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය සාර්ථක බව දැකිය හැකි වේ. නමුත් එම කලාපය ප්‍රශස්ත භාවිතයකට යොමු කර නගරයේ ආර්ථික හා සමාජයීය ප්‍රගමනය වෙනුවෙන් යොදා ගැනීම උදෙසා උපායමාර්ගික යොමුවීමක් අවශ්‍ය වේ.

මේ අනුව, ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද නගර සංවර්ධන සැලැස්මක් නගරයට නොතිබීමත්, නගරයේ භෞතික පිහිටීම බාධාවක් කර නොගෙන නගරය තවදුරටත් සංවර්ධනය කිරීමටත්, නගර මධ්‍යයේ ඌන උපයෝගිතා ඉඩම් භාවිත කරගනිමින් නගර අනන්‍යතාවය ප්‍රතිනිර්මාණය කර අලංකාර නගරයක් නිර්මාණය කරගැනීමටත්, ඌන

උපයෝගී සංචාරක විභවය භාවිත කරමින් සමෘද්ධිමත් නගරයක් ගොඩනැගීමටත්, වර්ධනය වෙමින් පවතින නේවාසික භාවිතයට අවශ්‍ය පහසුකම් සැලසීමටත්, කර්මාන්තපුරය මගින් නගරයේ ආර්ථිකයට ශක්තියක් ලබාදීමත් උදෙසා කුරුවිට නාගරික බල ප්‍රදේශයට නගර සංවර්ධන සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වේ.

පරිච්ඡේදය 04

සංවර්ධන සැලසුම් රාමුව

04 වන පරිච්ඡේදය

සංවර්ධන සැලසුම් රාමුව

දැක්ම

4.1 දැක්ම

"සිරිපා නිම්නයේ සුසැදි නවාතැන"

දැක්මේ ප්‍රකාශනය

4.2 දැක්මේ ප්‍රකාශනය

කුරුවිට නගරය සිරිපා අඩවියට පිවිසෙන එක් ප්‍රධාන දොරටුවක් වන අතර එය පිහිටා තිබෙනුයේ සිරිපා නිම්නයේ වේ. වර්තමානයේදී නේවාසික පහසුකම් උදෙසා කුරුවිට නගරයට පැමිණෙන ජනගහනය ඉහළ යමින් පවතින බැවින් අනාගතයේ දිනෙක සිරිපා නිම්නයේ පිහිටා ඇති නගර අතුරෙන් කුරුවිට නගරය, එකී ජනගහනයට සුවපහසු නවාතැනක් බවට පත් කළ යුතු වේ. එමෙන්ම, සංචාරකයන් උදෙසා කොළඹ - බලංගොඩ නගර අතර කෙටි විවේකයක් සඳහා පහසුකම් සපයනු ලබන නැවතුම් මධ්‍යස්ථානයක් වශයෙන් මෙන්ම අවැසි විටෙක නවාතැන් පහසුකම් ලබාගැනීමට ද ශක්‍යතාව ඇති නගරයක් බවට කුරුවිට නගරය නිර්මාණය කළ යුතු වේ. එබැවින්, කුරුවිට නගරය සිරිපා නිම්නයේ පිහිටා ඇති සුසැදි නවාතැනක් බවට පත් කිරීම කුරුවිට නගර සංවර්ධන සැලැස්මේ දැක්ම වේ.

අරමුණු

4.3 අරමුණු

අරමුණ 01 – රත්නපුර - අවිස්සාවේල්ල කොරිඩෝව තුළ නේවාසික පහසුකම් ලබාගැනීම සඳහා වඩාත් සුදුසු නගරය බවට කුරුවිට නිර්මාණය කිරීම.

අරමුණ 02 – මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීම.

4.4 අභිමතාර්ථ

අරමුණ 01 – රත්නපුර - අවිස්සාවේල්ල කොරිඩෝව තුළ නේවාසික පහසුකම් ලබාගැනීම සඳහා වඩාත් සුදුසු නගරය බවට කුරුවිට නිර්මාණය කිරීම.

අභිමතාර්ථ :

1. 2033 වර්ෂය වන විට සැලසුම් ප්‍රදේශය තුළ වාසයට සුදුසු හැකියාව වැඩි කිරීම.

උප අභිමතාර්ථ :

- නිවාස ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් පවතීද යන්න සහතික කිරීම (Affordable Housing)
- ඇස්තමේන්තුගත ජනගහනය සඳහා විනෝදාස්වාද අවශ්‍යතා සපුරාලීම
- නගර සීමාව තුළ ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සඳහා ප්‍රවේශය සහතික කිරීම
- කෘෂිකර්මාන්තයට සහ මැණික් කර්මාන්තයට අගය එකතු කිරීම මගින් නගර ආර්ථිකය ශක්තිමත් කිරීම
- ඌන උපයෝගි කරගත් ආර්ථික විභවයන් ආමන්ත්‍රණය කිරීමෙන් ආර්ථිකයට සහාය වීම
- කාර්මික කලාපය, පුහුණු මධ්‍යස්ථාන, බන්ධනාගාර සහ හමුදා කඳවුර ඇතුලත් ආධාරක ජාලයක් නිර්මාණය කිරීම
- ඇස්තමේන්තුගත අවශ්‍යතාවයට අනුව ප්‍රවාහනය සහ අනෙකුත් යටිතල පහසුකම් සැපයීම

අරමුණ 02 – මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීම.

අභිමතාර්ථ :

1. 2033 වර්ෂය වන විට කුරුවිට සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම තුළින් ආර්ථික අවස්ථා 10,000ක් නිර්මාණය කිරීම.
2. 2033 වර්ෂය වන විට පුද්ගලයින් 3,500කට සංචාරක ක්ෂේත්‍රයට අදාළව ජීවනෝපාය විවිධාංගීකරණ විකල්ප සැපයීම.
3. 2033 වර්ෂය වන විට සංචාරක අංශයේ ප්‍රතිලාභ වැඩි කිරීම සහ එම ප්‍රතිලාභයන්හි වාසිය දේශීය ප්‍රජාව වෙතට ලබාදීම.

පරිච්ඡේදය 05

ශක්‍යතා, දුබලතා, අවස්ථා සහ තර්ජන පිළිබඳ විශ්ලේෂණය

05 වන පරිච්ඡේදය

ශක්‍යතා, දුබලතා, අවස්ථා සහ තර්ජන පිළිබඳ විශ්ලේෂණය

සංක්ෂිප්ත ශ.දු.අ.ත. විශ්ලේෂණය

5.1 සංක්ෂිප්ත ශ. දු. අ. ත. විශ්ලේෂණය

උපාය මාර්ගික ශදුඅත (SWOT) විශ්ලේෂණය යනු දැක්ම පදනම් කරගත් මූලික ඇගයුමකි. එහිදී දැක්ම වෙත ළඟාවීමට කුරුවිට නගරය සතුව අභ්‍යන්තරව සහ බාහිරව පවත්නා අවස්ථා සහ තර්ජන පිළිබඳව සළකා බලා ඇත. මෙම පරිච්ඡේදයෙන් කුරුවිට නගරය සිරිපා නිම්නයේ සුසැදි නවාතැනක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඇති ශක්‍යතා, දුබලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය කර තිබේ.

අරමුණ 01 – රත්නපුර - අවිස්සාවේල්ල කොරිඩෝව තුළ නේවාසික පහසුකම් ලබාගැනීම සඳහා වඩාත් සුදුසු නගරය බවට කුරුවිට නිර්මාණය කිරීම

වගු අංක 5.1 : පළමු අරමුණ සඳහා වූ ශදුඅත විශ්ලේෂණය

ශක්‍යතා	➢ සංවර්ධනය කළ හැකි ඉඩම් දැරිය හැකි මිලකට ලබා ගැනීමට හැකිවීම ➢ ආපදා අවදානම අඩු ප්‍රදේශයක් වීම ➢ ජල සම්පත ලබා ගැනීමේ හැකියාව ➢ හරිත ප්‍රදේශ පැවතීම සහ ප්‍රදේශයේ වායු ගුණාත්වය ඉහළ මට්ටමක පැවතීම ➢ කෘෂිකාර්මික ඉඩම් පැවතීම ➢ මැණික් ඉඩම් පැවතීම සහ පතල් කැණීම් පාදක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික අවධානයක් හිමිව තිබීම ➢ නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය තුළින් ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබා ගනිමට හැකි වීම ➢ නගර මධ්‍යයේ දුම්රිය ඉඩම් පැවතීම ➢ අධ්‍යාපන පහසුකම් ප්‍රමාණවත් වීම
දුබලතා	➢ A004 මාර්ගය දිගේ අනපේක්ෂිත ලෙස නගරය ව්‍යාප්ත වීම ➢ නාගරික අවශ්‍යතා සපුරාලීමට විනෝදාස්වාද පහසුකම් ප්‍රමාණවත් නොවීම ➢ නාගරික අවශ්‍යතා සපුරාලීමට පවත්නා සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීම
අවස්ථා	➢ ජාතික ප්‍රතිපත්ති සමග සමපාත වීම ➢ පළාත් අගනගරයට ඉතාම ආසන්නයෙන් පිහිටා තිබීම ➢ පූර්ව සැලසුම් සහගත ව්‍යාපෘතීන් තිබීම ➢ යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය හා කැලණිවැලි දුම්රිය මාර්ගය

	➢ ආරක්ෂක සේවාවන් යුධ හමුදා කඳවුර සහ බන්ධනාගාරය තුළින් තහවුරු වීම
තර්ජන	➢ යාබද නගරවල සංවර්ධනය හේතුවෙන් නගරය නොපෙනී යා හැකි වීම

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

අරමුණ 02 – මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීම

වගු අංක 5.2 : දෙවන අරමුණ සඳහා වූ ශදුඅත විශ්ලේශණය

ශක්‍යතා	➢ සංචාරක ආකර්ෂණ ස්ථාන තිබීම ➢ මැණික් කැණීම් ක්ෂේත්‍ර තිබීම ➢ නගර මධ්‍යයේ විකල්ප භාවිතයන් සඳහා යොදා ගත හැකි දුම්රිය ගොඩනැගිලි තිබීම ➢ A004 මාර්ගය ඔස්සේ පිහිටා තිබීම
දුබලතා	➢ සංචාරකයින් සඳහා සංචාරක පහසුකම් ප්‍රමාණවත් නොවන අතර විවිධාංගීකරණය වී නොමැත ● නවාතැන් පහසුකම් නොමැති වීම ● නගර මධ්‍යයේ ආහාර අලෙවිසැල් සහ සනීපාරක්ෂක පහසුකම් නොමැත ● සිහිවටන සාප්පු නොමැත ● සංචාරක ප්‍රවර්ධනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් නොමැත ● සංචාරකයින් සඳහා ප්‍රවාහන පහසුකම් නොමැත ● සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට සාප්පු සවාරි ප්‍රමිතීන්ට අනුකූල නොවේ
අවස්ථා	➢ ශ්‍රී පාද අඩවිය ආශ්‍රිතව පාරිසරික සංවේදීතාවයෙන් ඉහළ ප්‍රදේශයට (Peak Wilderness) ඇතුල් වන ස්ථානයේ පිහිටීම ➢ මිණිපුර සංචාරක කලාපයට ඇතුල් වන ස්ථානය ➢ පුරාණ කාලයේ සිට හඳුනා ගත් නගරක් වීම ➢ ජාතික භෞතික සැලැස්ම හරහා සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ හඳුනා ගෙන තිබීම ➢ සංචාරක අමාත්‍යාංශය සහ රුවන්පුර අධිවේගී මාර්ගය මගින් සංවර්ධනය කිරීමට නියමිත සංචාරක මාර්ගය හඳුනාගෙන තිබීම ➢ බන්ධනාගාර රැඳවියන් ශ්‍රම බලකායක් ලෙස යොදා ගැනීමට හැකි වීම

05 වන පරිච්ඡේදය

ශක්‍යතා, දුබලතා, අවස්ථා සහ තර්ජන පිලිබද විශ්ලේෂණය

	➢ අලෙවිකරණ කටයුතු සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස හමුදා කඳවුරක් තිබීම
තර්ජන	➢ අනෙකුත් පිවිසුම් ස්ථාන වැඩි පහසුකම් සහිතව සංවර්ධනය කළ විට ශ්‍රී පාද සංචාරකයන්ගේ පැමිණීමට බලපෑමක් ඇති වීම ➢ කලාපය තුළ තවත් සංචාරක ගමනාන්තයක් ජනප්‍රිය වූ විට ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව අඩු වීමට ඇති හැකියාව

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

විස්තරාත්මක ශ.දු.අ.ත. විශ්ලේෂණය

5.2 විස්තරාත්මක ශ . දු .අ . ත. විශ්ලේෂණය

අරමුණ 01 – රත්නපුර - අවිස්සාවේල්ල කොරිඩෝව තුළ නේවාසික පහසුකම් ලබාගැනීම සඳහා වඩාත් සුදුසු නගරය බවට කුරුවිට නිර්මාණය කිරීම

- **ශක්‍යතා**

1. සංවර්ධනය කළ හැකි ඉඩම් දැරිය හැකි මිලකට ලබා ගැනීමට හැකිවීම

2019 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තු වාර්තාවලට අනුව නගර මධ්‍යයේ ඉඩමක පර්චසය ලක්ෂ 10 ට වැඩි වුවත් නගර මධ්‍යයෙන් පිටතට වන්නට පිහිටා ඇති ඉඩමක වටිනාකම පර්චසය ලක්ෂ 10 ට අඩු වේ. එමෙන්ම, බොහෝ ප්‍රදේශයන්හි ඉඩම් වටිනාකම රුපියල් 250,000 – 500,000 අතර පවතී. මේ හේතුවෙන් පළාත් අග නගරය ආසන්නයෙන් පිහිටා ඇති නගරයක් වන කුරුවිට නගරාසන්නයෙන් පර්චසය ලක්ෂ පහක පමණ වටිනාකමකින් නේවාසික ඉඩම් ලබාගැනීමේ හැකියාව මිනිසුන් වෙත පවතී.

සිතියම් අංක 5.1 : නේවාසික ප්‍රදේශවල ව්‍යාප්තිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

සිතියම් අංක 5.2 : ඉඩමේ වටිනාකම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

2. ආපදා අවදානම අඩු ප්‍රදේශයක් වීම

රත්නපුර දිස්ත්‍රික්කය ආපදා අවදානම බහුල ප්‍රදේශයක් ලෙස සිතියම්ගත වී ඇතත් මෙම දිස්ත්‍රික්කය තුළ ප්‍රකාශිත නාගරික ප්‍රදේශ පිළිබඳව සළකා බලන විට එම අවදානම ඉතා අවම ප්‍රදේශය වන්නේ කුරුවිට ප්‍රදේශයයි. ඒ අනුව, නේවාසික භාවිතයට සුදුසු පරිදි ස්වභාවික උවදුරු වලින් ආරක්ෂිත ඉඩම් වැඩි ප්‍රමාණයක් දක්නට ලැබෙනුයේ මෙම ප්‍රදේශය තුළ වේ.

සිතියම් අංක 5.3 : ගංවතුර පවතින ප්‍රදේශ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

3. ජල සම්පත ලබා ගැනීමේ හැකියාව

සිරිපා නිම්නයේ පිහිටා ඇති නගරයක් වන බැවින් පිරිසිදු ජල උල්පත් බොහොමයක් නාගරික ප්‍රදේශය තුළ පිහිටා ඇති අතර එම ජල මූලාශ්‍ර පදනම් කරගනිමින් ප්‍රජා ජල ව්‍යාපෘති ගම් මට්ටමින් ක්‍රියාත්මක වනු දැකිය හැකි වේ. එමෙන්ම, විසල් නගර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ද මෙම ප්‍රදේශය 2022 වන විට ආවරණය වෙමින් පවතී. මේ හේතුවෙන් අපේක්ෂිත නාගරික ජනගහනයට අවශ්‍ය ප්‍රමාණයට පිරිසිදු ජලය 2033 වනවිට ලබාගැනීමේ හැකියාව කුරුවිට නාගරික ප්‍රදේශය සතුව පවතී.

සිතියම් අංක 5.4 : ජල මූලාශ්‍ර වල ව්‍යාප්තිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

4. හරිත ප්‍රදේශ පැවතීම සහ වායු ගුණාත්වය ඉහළ මට්ටමක පැවතීම

කුරුවිට නගරය ශ්‍රී ලංකාවේ පාරිසරික අධි සංවේදී කලාපයක් තුල පිහිටා ඇති අතර ප්‍රදේශය කළු ගංගා මිටියාවතේ පිහිටා ඇති බැවින් නගර සීමාව තුලත් ඒ අවටත් හරිත ප්‍රදේශ බහුලව පවතී. ඒ අනුව, නගරය සහ ඒ අවට හුස්ම ගැනීමේ අවකාශයන්ගෙන් මනාව සමන්විත වේ.මෙම ශක්‍යතාව කුරුවිට නගරය නේවාසික පහසුකම් ලබාගැනීම සඳහා වඩාත් සුදුසු නගරයක් බවට නිර්මාණය කිරීමේදී වඩාත් උපකාරී වනු ඇත.

5. කෘෂිකාර්මික ඉඩම් පැවතීම

නගර සීමාව තුළ 25% ක ප්‍රදේශයක් පුරා කුඹුරු ඉඩම් පැතිරී ඇති බැවින් සහ එම ඉඩම් වගා කිරීම සෘතුමය වශයෙන් සිදුවන බැවින් නගර වැසියන්ට නිදහස්කාමී පරිසරයක් නිර්මාණය වී ඇති අතර එය නේවාසික පහසුකම් සහිත සුසැදි නගරයක් බවට කුරුවිට නගරය ප්‍රවර්ධනය කිරීමේදී වඩාත් ඉවහල් වනු ඇත.

සිතියම් අංක 5.5 : කෘෂිකාර්මික ප්‍රදේශ වල ව්‍යාප්තිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

6. මැණික් ඉඩම් පැවතීම සහ පතල් කැණීම් පාදක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික අවධානයක් හිමිව තිබීම

යෝජිත ජාතික භෞතික සැලැස්ම - 2050ට අනුව කුරුවිට නගරය ඛනිජ නිධි සහ කැණීම් ආශ්‍රිත කර්මාන්ත බහුල ප්‍රදේශයක් වේ. මේ අතරින් මැණික් ඉඩම් පැවතීම සහ පතල් කැණීම් පවතින නගරයක් ලෙස හඳුනාගැනීම කුරුවිට නගරයට සහ ඒ අවට ප්‍රදේශවලට ආවේනික වටිනාකම එකතු වී ඇත. ඒ අනුව, මැණික් ඉඩම් පැවතීම සහ පතල් කැණීම් පාදක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා කුරුවිට නගරය කෙරෙහි ජාතික අවධානයක් හිමිව ඇත. මෙය නගරය තුල නව රැකියා අවස්ථා බිහි කිරීමට හා සුසැදි නේවාසික නගරයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට බෙහෙවින් ඉවහල් වනු ඇත.

සිතියම් අංක 5.6 : මැණික් පතල් ප්‍රමාණය



මූලාශ්‍රය : ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය 2019

7. නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය තුළින් ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබා ගැනිමට හැකි වීම

කුරුවිට නගර සීමාව තුල පවතින තවත් ශක්‍යතාවක් වනුයේ අක්කර 83.3 ක් පුරාවට විහිදී ඇති ක්‍රියාකාරී කර්මාන්ත 42කින් සමන්විත නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය පිහිටා තිබීමයි. වර්තමානය වන විට රැකියා අවස්ථා 300කට අධික ප්‍රමාණයක් උත්පාදනය කර ඇති අතර 2033 වන විට මෙමගින් ජනනය වන රැකියා අවස්ථා 1,010 ක් දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. මෙම කර්මාන්තපුරය මගින් ජනනය වන සෘජු සහ වක්‍ර ප්‍රතිලාභ බොහොමයක් යෝජිත කුරුවිට නගර සැලැස්ම තුළින් අපේක්ෂා කෙරෙන සුසැදි නේවාසික නගරයක් ඇති කිරීමට උපකාරී වනු ඇත.

සිතියම් අංක 5.7 : කර්මාන්තපුරයේ පිහිටීම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

8. නගර මධ්‍යයේ දුම්රිය ඉඩම් පැවතීම

කැළණි වැලි දුම්රිය මාර්ගයේ අවසාන කොටස වන වර්තමානයේදී භාවිතයේ නොමැති අවිස්සාවේල්ල-ඕපනායක දුම්රිය මාර්ගය අතීතයේදී කුරුවිට නගරය හරහා වැටී තිබූ අතර අදටත් එහි දුම්රිය ඉඩම් නගර මධ්‍යයේ ඉතිරිව ඇත. මෙම ඉඩම් A004 මාර්ගයට මුහුණලා ඇති අතර පහසුවෙන් ප්‍රවේශ විය හැකි බැවින් ඒවායේ වටිනාකම වැඩි අතර වෙනත් ප්‍රයෝජනයක් සඳහා නැවත භාවිත කල හැකි වේ. ඒ අනුව රත්නපුර - අවිස්සාවේල්ල කොරිඩෝව තුළ නේවාසික පහසුකම් ලබාගැනීම සඳහා වඩාත් සුදුසු නගරය බවට කුරුවිට නිර්මාණය කිරීමේදී මෙම ඉතිරිව ඇති වටිනකමින් ඉහළ ඉඩම් ශක්‍යතාවක් වනු ඇත. එසේම අවිස්සාවේල්ල සිට හම්බන්තොට දක්වා දුම්රිය මාර්ගය නැවත ඇති කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වන අතර දැනටමත් අවිස්සාවේල්ල සිට ඇහැලියගොඩ දක්වා මැනුම් කටයුතු සිදු කර ඇත. දුම්රිය මාර්ගයේ ස්ථාපනය නගරයේ ආර්ථික , සමාජීය, පාරිසරික මෙන්ම භෞතික වෙනස්කම් වලට තුඩු දෙන්නක් වනු ඇත.

රූප සටහන් අංක 5.1 : දුම්රිය ඉඩම් වල ව්‍යාප්තිය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2021

9. අධ්‍යාපන පහසුකම් ප්‍රමාණවත් වීම

කුරුවිට නගරය සුසැදි නේවාසික නගරයක් ලෙස සංවර්ධනය කිරීමේදී ප්‍රමාණවත් අධ්‍යාපන පහසුකම්වලින් සමන්විත වීම මූලික සාධකයක් වේ. ඒ අනුව වර්තමානය වන විට කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පාසල් 39ක් පිහිටා ඇති අතර ඉන් නවයක්ම සැලසුම් ප්‍රදේශය තුල පිහිටා ඇත. එමෙන්ම පහත දැක්වෙන සිතියමට අනුව එම පාසල් සියල්ලම සැලසුම් ප්‍රදේශය ආවරණය වන ආකාරයට පිහිටා ඇත. මේ නිසා දැනටමත් කුරුවිට නගරය සුසැදි නේවාසික නගරයක් බවට සංවර්ධනය කිරීමේදී උපකාරී වන ආකාරයට ප්‍රමාණවත් අධ්‍යාපන පහසුකම්වලින් සමන්විත වේ.

සිතියම් අංක 5.8 : පවතින පාසල් වල ව්‍යාප්තිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

- දුබලතා

1. A004 මාර්ගය දිගේ අනපේක්ෂිත ලෙස නගරය ව්‍යාප්ත වීම

කුරුවිට නගරයේ අවකාශීය පිහිටීම සලකාබැලීමේදී එය බොහෝ දුරට A004 මාර්ගයට සමාන්තරව රේඛීය විහිදීමක් පෙන්වයි. මීට ප්‍රධානම හේතුන් වනුයේ නගරයට පිටුපසින් කෘෂිකාර්මික බිම් රැසක් පිහිටා තිබීම හා බොහෝ ප්‍රධාන නාගරික සේවාවන් සහ වෙළඳ කටයුතු රැසක් A004 මාර්ගයට යාබදව පිහිටා තිබීමයි. මේ නිසා නගරයේ අවකාශීය පිහිටීම සීමා වී ඇති අතර එය ප්‍රධාන මාර්ගය දිගේ සැලසුමකින් තොරව රේඛීයව විහිදී ඇත. මෙය නගරය තුළ නේවාසික පහසුකම් ප්‍රවර්ධනය කර සුසැදි නගරයක් බවට පත් කිරීමේදී දුබලතාවක් වේ.

රූප සටහන් අංක 5.2 : නගරයේ රේඛිය ව්‍යාප්තිය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2021

2. නාගරික අවශ්‍යතා සපුරාලීමට විනෝදාස්වාද පහසුකම් ප්‍රමාණවත් නොවීම

කුරුවිට නගරය සුසැදි නේවාසික නගරයක් ලෙස සංවර්ධනය කිරීමේදී එයට එරෙහිව බලපාන තවත් දුබලතාවක් වනුයේ නාගරික අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් තරම් විනෝදාස්වාදක පහසුකම් ප්‍රමාණවත් නොවීමයි. එනම්, වර්තමානය වන විට නගරය තුළ ජීවත් වන සහ නගරයට පැමිණෙන්නන් සඳහා හෙක්ටයාර 41.4 ක විනෝදාස්වාදක පහසුකම් අවශ්‍යතාවක් පැවතියද දැනට නගරය තුල පවතිනුයේ හෙක්ටයාර 1.78ක පමණ කුඩා බිම් ප්‍රමාණයකි. එමෙන්ම 2033 වන විට හෙක්ටයාර 52.5 අපේක්ෂිත විනෝදාස්වාදක පහසුකම් අවශ්‍යතාවක් ඇත. මේ අනුව සුසැදි නේවාසික නගරයක් සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන විනෝදාස්වාදක පහසුකම් ප්‍රමාණවත් නොවීම නගරය තුල පවතින තවත් දුබලතාවක් වේ.

3. නාගරික අවශ්‍යතා සපුරාලීමට පවත්නා සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීම

දැනටමත් කුරුවිට නගරය නේවාසික කටයුතු වලින් සමන්විත පස්වන පෙළ නගරයක් වුවද එහි ප්‍රමාණවත් තරම් සෞඛ්‍ය පහසුකම් නොමැත. නාගරික අවශ්‍යතා සපුරාලීමට එක් මධ්‍යම බෙහෙත් ශාලාවක් පමණක් පිහිටා ඇති අතර එහිද ප්‍රමාණවත් තරම් සම්පත් නොමැති අතර විශේෂඥ වෛද්‍ය හිඟයක් දැකිය හැක. මේ හේතුවෙන් බොහෝ වේලාවන්හීදී කුරුවිට නගරයේ නේවාසිකයින් තම සෞඛ්‍ය පහසුකම් සපුරා ගැනීමට රත්නපුර හෝ ඇහැලියගොඩ යන ප්‍රධාන නගර දෙකෙන් එකකට ගමන් කල යුතුය. මෙය කුරුවිට නගරය සුසැදි නේවාසික නගරයක් බවට පත් කිරීමට එරෙහි වන තවත් දුබලතාවක් වේ.

සිතියම් අංක 5.9 : සෞඛ්‍ය පහසුකම් වල ව්‍යාප්තිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

- **අවස්ථා**

1. ජාතික ප්‍රතිපත්ති සමග සමපාත වීම

කුරුවිට නගර සැලැස්ම සැකසීමේදී හඳුනාගත හැකි ප්‍රධානම අවස්ථාවක් වනුයේ ජාතික ප්‍රතිපත්ති සමග සමපාත වීමයි. ඒ අනුව එය රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය හා ජාතික භෞතික සැලැස්ම-2050 හි එන උපායමාර්ග තුලින් දක්වා ඇති දුම්රිය මාර්ග ස්ථාපනය සහ ඒ හා බැඳුණු සංවර්ධන උපාය මාර්ග හා මාර්ගෝපදේශයන් තුලින් කුරුවිට නගරය සුසැදි නේවාසික නගරයක් බවට පත් කිරීමේදී උපකාරී වේ.

රූප සටහන් අංක 5.3 : ජාතික භෞතික සැලැස්ම- 2050



මූලාශ්‍රය : ජාතික භෞතික සැලැස්ම 2050

2. පළාත් අගනගරයට ඉතාම ආසන්නයෙන් පිහිටා තිබීම

කුරුවිට නගරය යනු සබරගමු පළාතේ අගනගරය වන අතර කුරුවිට නගරය රත්නපුර නගරයේ සිට පළමු කි.මී. 15 තුල පිහිටි ප්‍රධානම සේවා සපයන නගරය වේ. එමෙන්ම, රත්නපුර නගරයට ආසන්නවම පිහිටි ප්‍රධාන නගරය කුරුවිට නගරය වන නිසා එහි නේවාසික පහසුකම් සඳහා ඉහල ඉල්ලුමක් පවතී. මේ හේතුව නිසා කුරුවිට නගරය සුසැදි නේවාසික නගරයක් බවට සංවර්ධනය කිරීමේදී රත්නපුර නගරයට ආසන්නව පිහිටා තිබීම වැදගත් අවස්තාවක් වේ.

සිතියම් අංක 5.10 : නගර අතර ඇති සම්බන්ධතාවය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

3. පූර්ව සැලසුම් සහගත ව්‍යාපෘතීන් තිබීම

පසුගිය වර්ෂවලදී යෝජිත සහ ක්‍රියාත්මක වුනු සංවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක්ම කුරුවිට නගරය තුල දැකිය හැකි අතර ඒවා රැසක් නාගරික වැසියන්ට සුව පහසු නගරයක් නිර්මාණය කිරීමට දායක වී ඇති ඇත. ඒ අතරින් 1992 වර්ෂයේදී ඉදිකරන ලද නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය, 2010 වර්ෂයේදී ඉදිකරන ලද වෙළඳ සංකීර්ණය හා 2012 වර්ෂයේදී ඉදිකරන ලද බස් නැවතුම්පළ වැනි සංවර්ධන ව්‍යාපෘතීන් වැදගත් වන අතර ඒවා තුලින් නගරය තුල සේවා පහසුකම්, රැකියා අවස්ථා ආදිය වර්ධනය වී ඇත.

සිතියම් අංක 5.11 කුරුවිට නගරයේ පෙර කරන ලද සැලසුම්



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

05 වන පරිච්ඡේදය

ශක්‍යතා, දුබලතා, අවස්ථා සහ තර්ජන පිලිබද විශ්ලේෂණය

4. යෝජිත රුවන්පුර මහා මාර්ගය සහ කැලණිවැලි දුම්රිය මාර්ගය

යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය කහතුඩුව අන්තර් හුවමාරුව සිට පැල්මඩුල්ල දක්වා කිලෝ මීටර් 73.9 ක් වන අතර එමගින් මාර්ග සම්බන්ධතාව වර්ධනය වීමෙන් මනා ප්‍රවේශකත්වයක් නගරයට ඇති වනු ඇත. නව අධිවේගී මාර්ගය හේතුවෙන් කොළඹ සහ රත්නපුර අතර කාලය විනාඩි 45 ක් දක්වා අඩුකරනු ඇතැයි අපේක්ෂා කරන අතර ව්‍යාපාරික ප්‍රජාව උදෙසා එය වැදගත් වනු ඇත. එසේම අවිස්සාවේල්ල සිට සුරියවැව හරහා හම්බන්තොට දක්වා දිවෙන දුම්රිය මාර්ගය නිසාවෙන් ප්‍රදේශයේ මගී ප්‍රවාහන සහ භාණ්ඩ ප්‍රවාහන කටයුතු විධිමත් වනු ඇත. එසේම ප්‍රදෙශියව මෙන්ම කලාපියව ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමටද මෙම දුම්රිය මාර්ගය නැවත ස්ථාපනය කිරීම හේතු වනු ඇත.

5. ආරක්ෂක සේවාවන් යුධ හමුදා කඳවුර සහ බන්ධනාගාරය තුළින් තහවුරු වීම

කුරුවිට නගරයට ආසන්නව ශ්‍රී ලංකා යුද හමුදාවේ ගැමුණු හේවා බලකායේ රෙජිමේන්තු මූලස්ථානය සහ කුරුවිට බන්ධනාගාරය පිහිටා ඇති අතර ඒ තුලින් හදිසි අවස්ථාවකදී අත්‍යවශ්‍ය වන ආරක්ෂක සේවාවන් තහවුරු වේ. මෙය කුරුවිට නගරය සුසැදි නේවාසික නගරයක් බවට සංවර්ධනය කිරීමේදී වැදගත් වේ.

සිතියම් අංක 5.12 කුරුවිට ප්‍රදේශයේ වැදගත් ස්ථාන



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

රූප සටහන් අංක 5.4 : යුධ හමුදා කඳවුර සහ බන්ධනාගාරය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2021

- **තර්ජන**

1. යාබද නගරවල සංවර්ධනය හේතුවෙන් නගරය නොපෙනී යා හැකි වීම

කුරුවිට නගරය පිහිටා ඇත්තේ ප්‍රධාන නගර දෙකක් වන රත්නපුර සහ ඇහැලියගොඩ නගර දෙකට අතරමැදිව වන අතර එම නගර දෙක වේගයෙන් සංවර්ධනය වේ. මෙම යාබද නගරවල සංවර්ධනය හේතුවෙන් නගරය නොපෙනී යා හැකි වීමේ අවධානමක් ඇති අතර ඒ තුලින් නගරයට ඇදී එන සංවර්ධන ව්‍යාපෘතීන් සහ නේවාසික ඉල්ලුම අඩු විය හැක.

සිතියම් අංක 5.13 : නේවාසික ප්‍රදේශ වල ව්‍යාප්තිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

සිතියම් අංක 5.14 : කලාපිය සම්බන්ධතාවය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

අරමුණ 02 – මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීම

- **ශක්‍යතා**

1. සංචාරක ආකර්ෂණ ස්ථාන තිබීම

කුරුවිට නගරය යනු සංචාරක ආකර්ශනීය ස්ථාන රාශියකින් සමන්විත නගරයකි. ඒ අතර බෝපත් ඇල්ල, බටතොට ලෙන, බටදොඹලෙන හා දෙල්ගමුව රජමහා විහාරය,වැනි දෙස් විදෙස් සංචාරක ආකර්ශනීය ස්ථානද බහුල වේ. මේ නිසා මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීමේදී මෙම දැනට පවතින ඓතිහාසික, පාරිසරික හා සංස්කෘතිකමය වටිනාකමකින් යුත් සංචාරක ආකර්ශනීය ස්ථාන බෙහෙවින් උපකාරී වේ.

2. මැණික් කැණීම් ක්ෂේත්‍ර තිබීම

ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තයට අදාළ කැනීම් සහ මැණික් වෙළඳ කටයුතු බොහොමයක් රත්නපුර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් සිදුවන අතර කුරුවිට නගරය යනු රත්නපුර දිස්ත්‍රික්කය තුල මැණික් කැනීම් ක්ෂේත්‍රය පිලිබඳ වැදගත් නගරයකි. සැලසුම් ප්‍රදේශයට අදාළ සෑම ග්‍රාමනිලධාරී කොට්ටාසයකම පාහේ මැණික් කැනීම් කටයුතු සිදුවන අතර ඉන් කාහේන්ගම, කුරුවිට, වලඳුර වැනි ග්‍රාමනිලධාරී කොට්ඨාස වැදගත් වේ. මෙසේ පවතින මැණික් කර්මාන්තය පහසුවෙන් දෙස් විදෙස් වෙළදුන්ගේ සහ සංචාරකයින්ගේ අවදානයට යොමු කල හැකි අතර එතුලින් මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීමේදී වැදගත් වනු ඇත.

3. නගර මධ්‍යයේ විකල්ප භාවිතයන් සඳහා ගත හැකි දුම්රිය ගොඩනැගිලි තිබීම

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ 1912 දී කොළඹ - අවිස්සාවේල්ල - රත්නපුර - ඕපනායක සම්බන්ධ කරමින් පටු දුම්රිය මාර්ගයක් ඉදි කරන ලද අතර කුරුවිට එහි එක් දුම්රිය නැවතුම්පොළක් ස්ථාපනය කර ඇත. ඓතිහාසික සහ සංස්කෘතික වටිනාකමකින් යුතු මෙම දුම්රිය නැවතුම්පල ගොඩනැගිල්ල වර්තමානයේදී භාවිතයේ නොමැති අදටත් එය නගර මධ්‍යයේ ඉතිරිව ඇත. මෙම ගොඩනැගිල්ල සහ පරිශ්‍රය A004 මාර්ගයට මුහුණලා ඇති අතර පහසුවෙන් ප්‍රවේශ විය හැකි බැවින් එහි වටිනාකම වැඩි අතර වෙනත් ප්‍රයෝජනයක් සඳහා නැවත භාවිත කල හැකි වේ. එසේම මෙම ගොඩනැගිල්ලේ ඓතිහාසික, සංස්කෘතිකමය සහ ආර්ථිකමය වටිනාකම සංරක්ෂණය වන ආකාරයට නැවත භාවිතයට ගැනීම තුලින් සංචාරක ආකර්ෂණය සහ වටිනාකමක් එකතු කල හැකි වනු ඇත.

රූප සටහන් අංක 5.5 නගර මධ්‍යයේ පිහිටි පැරණි ගොඩනැගිලි

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2021

4. A004 මාර්ගය ඔස්සේ පිහිටා තිබීම

කුරුවිට නගරය යනු A004 මාර්ගයේ පිහිටා ඇති නගරයකි. A004 මාර්ගය යනු බොහෝ ප්‍රදේශවලට ප්‍රවේශ විය හැකි මාර්ගයක වන අතර එබැවින් කුරුවිට නගරය හරහා දෛනිකව මගීන් විශාල ප්‍රමාණයක් නගරය හරහා ගමන් කරනු ලැබේ. මේ හේතුවෙන් කුරුවිට නගරය මගීන් සහ සංචාරකයින් සඳහා මුලිකත්වය දුන් රැඳවුම් නගරයක් ලෙස ප්‍රවර්ධනය කල හැකි අතර එතුලින් මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීමේදී වැදගත් වනු ඇත.

- **දුබලතා**

1. සංචාරකයින් සඳහා සංචාරක පහසුකම් ප්‍රමාණවත් නොවන අතර විවිධාංගීකරණය වී නොමැත.

කුරුවිට නගරය යනු පාරිසරික ඓතිහාසික සහ සංස්කෘතික වටිනාකමකින් යුත් සංචාරක ආකර්ශනීය ස්ථාන බොහොමයකින් සමන්විත නගරයක් වුවද නගරය තුල සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේදී සංචාරකයින් සඳහා පවතින සංචාරක පහසුකම් ප්‍රමාණවත් නොවන අතර විවිධාංගීකරණය වී නොමැත. එනම්,

- නවාතැන් පහසුකම් අවම වීම සහ දැනට පවතින පහසුකම්වල ගුණාත්මකභාවය අඩු වීම
- නගර මධ්‍යයේ ආහාර අලෙවිසැල් සහ සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම
- සිහිවටන සාප්පු නොමැති වීම
- සංචාරක ප්‍රවර්ධනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් නොමැති වීම
- සංචාරකයින් සඳහා ප්‍රවාහන පහසුකම් නොමැති වීම
- සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට සාප්පු සවාරි ප්‍රමිතීන්ට අනුකූල නොවීම වැනි හේතුන් නිසා මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නගරය නිර්මාණය කිරීමේදී පවතින දුබලතා වේ.

- **අවස්ථා**

1. ශ්‍රී පාද අඩවිය ආශ්‍රිතව පාරිසරික සංවේදීතාවය ඉහළ ප්‍රදේශයට (Peak Wilderness) ඇතුල් වීමේ ස්ථානය

කුරුවිට නගරය යනු ශ්‍රීපාද අඩවියට අදාළ පාරිසරික සංවේදීතාවය ඉහළ ප්‍රදේශයට (Peak Wilderness) ඇතුළු වන ප්‍රධාන ස්ථානයයි. මේ නිසා කුරුවිට නගරය පාරිසරික, ආගමික, හා සංස්කෘතිකමය වටිනාකමකින් සමන්විත වන අතර දෙස් විදෙස් සංචාරකයින්ගේ, පරිසරවේදීන්ගේ අවධානයට ලක්වුණු නගරයකි.

2. මිණිපුර සංචාරක කලාපයට ඇතුල් වන ස්ථානය

ශ්‍රී ලංකාවේ ඇති සංචාරක කලාප 5 අතුරින් මිණිපුර සංචාරක කලාපය යනු සබරගමු පළාතේ රත්නපුර සහ කුරුවිට නගර අයත් වන සංචාරක කලාපයයි. කොළඹ දෙස සිට පැමිණෙන විට කුරුවිට නගරය යනු මෙම මිණිපුර සංචාරක කලාපයට ඇතුළු වන ප්‍රධාන ස්ථානය වේ. කුරුවිට නගරයට ඇතුළු වීමට පෙර සැලකිය යුතු සංචාරක කෙන්ද්‍රස්ථානයක් නොමැති නිසා කුරුවිට නගරයේ සංචාරක කර්මාන්තය දියුණු කිරීමේදී සහ මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීමේදී වැදගත් වනු ඇත.

රූප සටහන් අංක 5.6: මිණිපුර සංචාරක කලාපය



මූලාශ්‍රය : සංචාරක අමාත්‍යංශය - සබරගමුව පළාත් සභාව (2020)

3. පුරාණ කාලයේ සිට හඳුනා ගත් නගරයක් වීම

කුරුවිට නගරය යනු අතීතයේ සිටම ප්‍රචලිත සහ හඳුනාගෙන ඇති පුරාවිද්‍යා වටිනාකමකින්ද සමන්විත ඓතිහාසික ස්ථාන රැසකින් යුතු නගරයකි. ඒ අනුව, පුරාවිද්‍යාඥයන් විසින් කුරුවිට බටදොඹලෙන හඳුනාගෙන ඇත්තේ වසර ගණනාවක් පුරා විකාශනය වූ නූතන ශ්‍රී ලාංකේය මිනිසාගේ නටබුන් නිවහනක් ලෙසයි. බටතොටලෙන ද පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙස හඳුනාගත හැකි නමුත් එහි විහාරස්ථානය ඊටත් වඩා ආගමික වශයෙන්

වැදගත් වන අතර එය දිවගුහාව ලෙස හැඳින්වේ. මීට අමතරව, වසර 43ක් නිරුපද්‍රිතව දළදා සමිඳුන් වැඩ සිටි දෙල්ගමුව රජමහා විහාරය පිහිටා ඇත්තේ ද මෙම ප්‍රදේශයේය. එසේම, කුරුවිට නගරය යනු එය ශ්‍රී පාදයට පිවිසෙන ප්‍රධාන පිවිසුම් ස්ථාන තුනෙන් එකක් වන අතර දෙස් විදෙස් ප්‍රචලිත බෝපත් ඇල්ල පිහිටා ඇත්තේද මෙම නගර සීමාව තුලය.

මේ නිසා කුරුවිට නගරයේ සංචාරක කර්මාන්තය දියුණු කිරීමේදී සහ මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නගරය නිර්මාණය කිරීමේදී වැදගත් වනු ඇත.

සිතියම් අංක 5.15 : සංචාරක ස්ථාන



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2022

4. ජාතික භෞතික සැලැස්ම හරහා සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ හඳුනා ගෙන තිබීම

කුරුවිට නගරය ශ්‍රී ලංකාවේ පාරිසකික අධි සංවේදී කලාපය තුල පිහිටා ඇති නිසාත් එය පාරිසරික වටිනාකමකින් හා ජෛව විවිධත්ව වටිනාකමකින් සමන්විත වන නිසාත් ජාතික භෞතික සැලැස්ම හරහා කුරුවිට නගරය සංරක්ෂණය කළ යුතු ප්‍රදේශයක් ලෙස හඳුනා ගෙන ඇත. මේ නිසා මෙය කුරුවිට නගරය තුල පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේදී උපකාරී වනු ඇති අතර ඒ හරහා මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නගරය නිර්මාණය කිරීමේදී වැදගත් වනු ඇත.

රූප සටහන් අංක 5.7 : සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ



මූලාශ්‍රය : ජාතික භෞතික සැලැස්ම- 2050

5. සංචාරක අමාත්‍යාංශය සහ රුවන්පුර අධිවේගී මාර්ගය මගින් සංවර්ධනය කිරීමට නියමිත සංචාරක මාර්ගය හඳුනාගෙන තිබීම

සංචාරක අමාත්‍යාංශය සහ රුවන්පුර අධිවේගී මාර්ගය මගින් සංවර්ධනය කිරීමට නියමිත සංචාරක මාර්ගය කුරුවිට නගරය හරහා යෝජිතව ඇති අතර ඒ තුලින් මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීමේදී වැදගත් වනු ඇත.

රූප සටහන් අංක 5.8: සංචාරක සැලැස්ම සහ රුවන්පුර අධිවේගී මාර්ග පිහිටීම

මූලාශ්‍රය : ජාතික භෞතික සැලැස්ම- 2050

6. බන්ධනාගාර රැඳවියන් ශ්‍රම බලකායක් ලෙස යොදා ගැනීමට හැකි වීම

කුරුවිට නගර සීමාව තුල ශ්‍රී ලංකාවේ ප්‍රධාන බන්ධනාගාරයක් වන කුරුවිට බන්ධනාගාරය පිහිටා ඇති අතර එහි රැඳවියන් අදෘශ්‍යමාන ශ්‍රම බලකායක් ලෙස හඳුනාගත හැක. මොවුන්ගේ ශ්‍රමය කුරුවිට නගරයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය වන සිහිවටන, අත්කම් ආදිය නිර්මාණය කිරීමට යොදාගත හැකි අතර ඒ තුලින්, නගරයේ ආර්ථික වර්ධනයට පිටුවහලක් වනු ඇති අතර රැඳවියන්ගේ ශ්‍රමය ඵලදායි ලෙස භාවිතා වනු ඇත.

- **තර්ජන**

1. අනෙකුත් පිවිසුම් ස්ථාන වැඩි පහසුකම් සහිතව සංවර්ධනය කළ විට ශ්‍රී පාද සංචාරකයන්ගේ පැමිණීමට බලපෑමක් ඇති වීම

කුරුවිට නගරයට ප්‍රවේශ වන සංචාරකයින් වැඩි ප්‍රතිශතයක් නගරය භාවිත කරනුයේ ශ්‍රීපාද පිවිසුම් මාර්ගයක් ලෙස වන අතර අනෙකුත් විකල්ප පිවිසුම් ස්ථාන වැඩි පහසුකම් සහිතව සංවර්ධනය කළ විට කුරුවිට නගරයට ඇතුළු වන ශ්‍රී පාද සංචාරකයන් සංඛ්‍යාව අඩු වීමේ තර්ජනයක් ඇති අතර එයින් මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීමේදී සෘණාත්මකව බලපානු ඇත.

2. කලාපය තුළ තවත් සංචාරක ගමනාන්තයක් ජනප්‍රිය වූ විට ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව අඩු වීමට ඇති හැකියාව

කුරුවිට නගරයද අයත් වන මිණිපුර සංචාරක කලාපය පාරිසරික, ඓතිහාසික, ආර්ථිකමය සහ සංස්කෘතිකමය වටිනාකමක් සහිත පසුබිමක් ඇති බැවින් මෙම කලාපය තුල තවත් උණුසුම් ස්ථානයක් ජනප්‍රිය වූ විට කුරුවිට නගරයට ආකර්ශනය වන සංචාරකයින් සංඛ්‍යාව

අඩු වීමේ තර්ජනයක් ඇති අතර එය මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නිර්මාණය කිරීමේදී සෘණාත්මකව බලපානු ඇත.

රූප සටහන් අංක 5.9 : මිණිපුර කලාපය



මූලාශ්‍රය : සංචාරක අමාත්‍යාංශය - සබරගමුව පළාත් සභාව (2020)

පරිච්ඡේදය 06

සැලැස්ම

06 වන පරිච්ඡේදය

සැලැස්ම

6.1 සංකල්පිත සැලැස්ම

සංකල්පිත සැලැස්ම

2033 වසරේදී කුරුවිට නගරය සිරිපා නිම්නයේ සුසැදි නවාතැන බවට පත් කිරීමේ දැක්ම පෙරදැරි කරගත් කුරුවිට නගර සංවර්ධන සැලැස්මේ සංකල්පය වන්නේ බෝ පත්‍රයයි . බෝ පත්‍රයේ ප්‍රධාන නාරටිය ලෙස කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය වෙත සංකේන්ද්‍රණය වන ආර්ථික , පරිපාලන, කර්මාන්ත, වැවිලි කටයුතු, මැණික් කර්මාන්තය,පාරිසරික, ආගමික, සංචාරක කටයුතු හා නේවාසික ආදී සංවර්ධන අවස්ථාවන්, හඳුනා ගන්නා ලද නගර මධ්‍ය කලාපය , හිග්ගස්හේන කලාපය, දෙල්ගමුව කලාපය හා පැරඩයිස් කලාපය යන කලාප හතර වෙත අවශෝෂණය කර ගනී . පසුව එම සංවර්ධන අවස්ථාවන් කුරුවිට නගරය ප්‍රධාන කොට ගෙන අවශේෂ නාරටි ලෙස හඳුනා ගන්නා ලද මාර්ග ජාලය හරහා අවට කුඩා නගර වන එරත්න , පාතගම, මිල්ලවිටිය , වළදූර ආදී නගර හරහා මුළු ප්‍රදේශයටම බෙදා හැරේ. එසේම සංවර්ධන සැලැස්මේ සංකල්පය සඳහා බෝ පත්‍රය එසේ සංකේතාත්මක වශයෙන් අනුකූල වන අතර සංවර්ධන ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රසිද්ධ බෝපත් ඇල්ල භෞතික වශයෙන් අනුකූල වේ .

රූප සටහන් අංක 6.1 : සංකල්පිත සැලැස්ම සහ බෝපත් ඇල්ල



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2021

අනාගතයේදී කුරුවිට නගරය රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරය වන රත්නපුර නගර පරිධියේ පිහිටි කුඩා නගරයක් ලෙස,

- ආරක්ෂිත නේවාසික ප්‍රදේශයක් බවට පත් කිරීමත්,
- ප්‍රාදේශීය වශයෙන් සේවා සපයන සේවා මධ්‍යස්ථානයක් බවට පත් කිරීමත්,
- සංචාරක කටයුතු සඳහා ප්‍රවේශ වීමේ මුවදොරක් ලෙසත් විවිධ තාක්ෂණික ක්‍රමෝපායන් උපයෝගී කොටගෙන සකසන ලද කලාපිකරණ සැලැස්මක් මගින් කුරුවිට නගරයේ අනාගත සංවර්ධනය නිසි ලෙස දිශානුගත කිරීමටත්,

- කුරුවිට නගර සංවර්ධනය සඳහා මුලිකව ස්ථර දෙකක් හඳුනා ගැනීම සහ එම ස්ථර දෙක ශක්තිමත් කිරීම තුලින් නාගරික වටිනාකම වැඩිදියුණු කිරීමත් මෙම සැලසුම් සංකල්පය ට පසුබිම් ව ඇත .

රූප සටහන් අංක 6.2 : සංකල්පිත සැලැස්ම උප නාගරික ප්‍රදේශ අනුව ක්‍රියා කරන ආකාරය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2021

කලාපිකරණ රෙගුලාසි සහ උපායමාර්ගික ඉඩම් පරිහරණ සැලසුම් මගින් 2033 වසර වන විට කුරුවිට නගර සංවර්ධනයේ දිශානතිය ප්‍රධාන කලාප හතකට යොමු වේ. ඒ සඳහා උපයෝගී වන උපායමාර්ගික ව්‍යාපෘති ද සැලසුමට අදාලව හඳුනා ගෙන තිබේ. වසර 2033 වන විට තිරසාර සංවර්ධනය අරමුණු කොට ගෙන වාණිජ, නේවාසික, පාරිසරික, පරිපාලන, සංරක්ෂණ ආදී කටයුතු වල ව්‍යාප්තියේ ප්‍රවණතාවය නගර මධ්‍යයේ සිට වඩාත් සුදුසු ප්‍රදේශ වලට යොමු කරනු ලැබේ. ඒ අනුව සැලසුම් ප්‍රදේශය පුරා විහිදී ඇති කුඹුරු හා නේවාසික ප්‍රදේශ මෙන්ම ගංගා, දිය ඇලි පාදක කර ගනිමින් නගර අභ්‍යන්තරය ගුණාංග හතක් යටතේ සුසැදි නවාතැනක් බවට පත් කිරීමට අපේක්ෂා කෙරේ. විවිධාංගිකරණය වූ ආර්ථික කටයුතු හරහා අදායම් ඉපයීමේ අවස්ථා වැඩිදියුණු කිරීමත්, රත්නපුර - අවිස්සාවේල්ල කොරිඩෝව තුළ පදිංචිකරුවන් සඳහා නේවාසික පහසුකම් වැඩි කිරීම තුළින් ජීවත් වීමට සුදුසු ගමනාන්තයක් නිර්මාණය කිරීමත් මෙන්ම මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් බවට පත් කිරීමත් යන අරමුණු මෙම සැලසුම මගින් ලභා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

06 වන පරිච්ඡේදය

සැලැස්ම

6.2 යෝජිත භූමි පරිහරණ සැලැස්ම

යෝජිත භූමි පරිහරණ සැලැස්ම

සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණය සහ සම්බන්ධතා විශ්ලේෂණයට අනුව කුරුවිට නගරයේ සංවර්ධනය කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය ඔස්සේ ව්‍යාප්ත වන බවක් පෙන්නුම් කරන අතර ජීවත්වීමට සුදුසු පරිසරය කුරුවිට නගරය කේන්ද්‍ර ව හදුනා ගත හැකිය. A 004 මාර්ගය පාදක කොටගෙන කලාපීය වශයෙන් පවතින සම්බන්ධතාවය මෙන්ම ප්‍රාදේශීය වශයෙන් කුඩා ගම්මාන අතර පවතින සම්බන්ධතාවය හරහා ගලා එන සංවර්ධන ප්‍රතිලාභ නගරයේ භෞතික සංවර්ධනය මෙන්ම සමාජීය, සංස්කෘතික, පාරිසරික මෙන්ම ආර්ථික සංවර්ධනයට අවස්ථාව උදා කරගෙන ඇත.

සිතියම් අංක 6.1 : පවත්නා භූමි පරිහරණ රටාව



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

06 වන පරිච්ඡේදය
සැලැස්ම

කුරුවිට නගරය ආශ්‍රිතව පවතින ස්වභාවික උපද්‍රව වල අවම බව, නේවාසික කටයුතු සඳහා වඩාත් සුදුසු පරිසරය, සංවර්ධනය කල හැකි ඉඩම් වල ව්‍යාප්තිය, ජනගහනය සහ බලපෑ හැකි අනෙකුත් සාධක යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කිරීමේදී සැලකිල්ලට ගන්නා ලදී. ඒ අනුව,

- පවතින සංවර්ධන ප්‍රවනතාවයන් සහ සම්පත් නිසි භාවිතයට ගැනීම තුළින් අනාගත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම උදෙසා නේවාසික අවශ්‍යතවයන් මූලික කොටගෙන මිණිපුර සංචාරක කලාපයේ මුවදොර නගරයක් ලෙස සංවර්ධනය කිරීම
- ප්‍රදේශයේ පාරිසරික විභවයන්ගේ නිසි භාවිතය හරහා ආර්ථිකමය ප්‍රතිලාභ ලබා කර ගනිමින් පවතින භූමිය හා සම්පත් ප්‍රශස්ත මට්ටමින් භාවිතයට ගැනීම සඳහා වර්ෂ 2033 ක සඳහා යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම පිළියෙළ කරන ලදී.

වර්තමානය වන විට විශේෂ මැදිහත් වීමකින් තොරව සැලකිය යුතු සංවර්ධන ප්‍රවණතාවයන් පෙන්නුම් කරන නගරයක් ලෙස හඳුනා ගත හැකි කුරුවිට නගරයේ සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී අනාගත කුරුවිට නගරය සහ අවට ප්‍රදේශය නේවාසිකයන්ට සුවපහසු, ආකර්ශනීය මෙන්ම සංවිධිත ඒකකයක් බවට පත් කිරීමට අපේක්ෂිතය. ඒ සඳහා යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම යටතේ උපක්‍රම කිහිපයක් හඳුනා ගන්නා ලදී.

උපක්‍රම 1 . පවත්නා භාවිතයන් හා ප්‍රවර්ධනය කරනු ලබන භාවිතයන්ට පහසුකම් සැලසීම හා පවත්වාගෙන යාමේ පහසුව උදෙසා එම ක්‍රියාකාරකම් එක් එක් කලාපයට වෙන් වෙන්ව කේන්ද්‍රගත කිරීම.

උපක්‍රම 2. නගර මධ්‍ය ප්‍රදේශය සංචාරක, මැණික් ආදී කර්මාන්ත කටයුතු ප්‍රවර්ධනයට මෙන්ම ප්‍රාදේශීය ආර්ථික කටයුතු සඳහා සුදුසු පරිසරයක් බවට පරිවර්තනය කිරීම.

උපක්‍රම 3. අධික නේවාසික ඉල්ලුමක් සහිත රත්නපුර, අවිස්සාවේල්ල හා කොළඹ ආදී ප්‍රදේශ වලින් බැහැර වන නේවාසික අවශ්‍යතාවයන් සපුරා ලීම.

උපක්‍රම 4. පවතින නීලහරිත ස්වභාවික පරිසරය සංරක්ෂණය කරමින් විභවතාවයන් ආර්ථිකයට දායක කර ගැනීම.

ඒ අනුව කුරුවිට නගරය, ප්‍රසන්න, සුවදායි පරිසරයකින් සමන්විත නේවාසිකයන්ට අවශ්‍ය නවාතැන් හා ප්‍රවාහන පහසුකම් සමග අනෙකුත් සේවා පහසුකම් ආදී සියළු පහසුකම් වලින් යුත් නගරයක් බවට පරිවර්තනය වන අතර සංචාරක කර්මාන්තය හා සම්බන්ධව බෝපත් ඇල්ල කේන්ද්‍ර කොට හඳුන්වා දෙන නව අවස්ථා මගින් ප්‍රදේශයට විවිධාංගිකරණයට ලක් වූ ආර්ථික ප්‍රවේශයක අත්දැකීම ලබා දීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව කුරුවිට නගර මධ්‍ය ප්‍රදේශය සංවර්ධිත පරිසරයක් බවට පත් කරමින් නේවාසිකයන්ට, ව්‍යාපාරිකයන්ට

මෙන්ම සංසරණය වන ජනතාවට ආර්ථික, බැංකු හා මුල්‍ය, සංචාරක හා මැණික් ආදී කර්මාන්ත මෙන්ම සේවා අවශ්‍යතා පහසුවෙන් සපුරා ගත හැකි නගරයක් ලෙස තව දුරටත් දියුණු කරන අතර එම සේවා ලබා ගන්නා ප්‍රජාව මෙන්ම සේවාවන් ලබා දෙන්නන් ගේ පහසුව උදෙසා ද අවශ්‍ය පහසුකම් ලබා දෙනු ඇත.

මෙම සංවර්ධන සැලැස්ම මගින් හදුන්වා දෙනු ලබන සමස්ත නාගරික ආකෘතිය තුළ හරිත පැහැයට නැඹුරු පසුබිම උද්‍යාන, කුඹුරු,තේ , රබර් වැනි කෘෂිකාර්මික වගාබිම් සහ වන ලැහැබ් මගින්ද නීල පැහැයට නැඹුරු පසුබිම ගංගා, ඇළ, දොළ, වැව්, දිය ඇලි මගින්ද ආවරණය කරමින් නිර්මාණය වූ නීලහරිත පරිසරයකින් සමන්විත නගර ප්‍රදේශයක් දැක ගත හැකි වේ. තවද එකී පරිසරය තුළ පවතින දර්ශනීය දෘෂ්ටි කෝණ (View Points) එලෙසම දර්ශනය වන ආකාරයට ඒ අවට ඉදිකිරීම් සිදු කොට ඇති ආකාරය දැක ගත හැකි වේ.

උතුරු පිවිසුමෙන් නගරයට ඇතුළු වන විට මූලික වශයෙන් නේවාසික පහසුකම් සමඟ ව්‍යාප්ත වූ අනෙකුත් සේවාවන් සහිත ප්‍රදේශයක් දිස්වන අතර එහි අඩු ගොඩනැගිලි ව්‍යාප්තියක් දක්නට ලැබේ. A 004 ප්‍රධාන මාර්ගය දෙපස නැගෙනහිර පෙදෙසෙන් පිහිටි කඳු වළල්ලට හා බටහිර පෙදෙසෙන් කුඹුරු ඉඩම් වලින් සීමා වී තීරයක් ආකාරයට සංවර්ධනය වූ ප්‍රදේශයක් දැක ගත හැකි වන අතරම ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්තව පවතින කුඹුරු ප්‍රදේශ හා වැව්ලි බිම් නේවාසිකයන්ට මෙන්ම සංසරණය වන ජනතාවට සුවදායි නිදහස් බවක් ඇති කිරීමට සමත් වේ. එම ප්‍රදේශය හරහා කුරුවිට මධ්‍ය විද්‍යාලය පසුකොට නගර මධ්‍ය දෙසට ගමන් කිරීමේ දී කෙමෙන් අවතීර්ණ වන්නේ ගොඩනැගිලි උසෙහි සහ ඝනත්වහි වැඩි වීමක් පෙන්නුම් කරන දෙල්ගමුව කලාපයටයි. එහිදී අධ්‍යාපන, රාජ්‍ය ආයතන, මුල්‍ය, ආරක්ෂක ආදී සේවාවන් රැසකට අදාල පරිපාලන ගොඩනැගිලි ගොමුවක් දැක ගත හැකි අතර ප්‍රධාන වශයෙන්ම සේවා සපයන කලාපයක් ලෙස ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. එසේම කුරුවිට මහජන පොළ පාදක කර ගත් ක්‍රියාකාරකම් රැසක් කඹුරුව මාර්ගය මූලික කොටගෙන ක්‍රියාත්මක වන අතර ප්‍රදේශයේ ජනතාවගේ කෘෂිකාර්මික නිෂ්පාදන පාදක කොටගත් අලෙවිය සහ මිලදී ගැනීම මත පදනම් වූ ප්‍රාදේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රධාන අංගයක් ලෙස මෙය හඳුනා ගත හැකිය. කුරු ගංගාව ආශ්‍රිත මනස්කාන්ත පරිසරයේ සිරි විඳීමට මෙන්ම නිදහසේ ගත කිරීමට අවශ්‍යවන උද්‍යාන පහසුකම් ද ශරීර සුවතා කටයුතු මෙන්ම විනෝදාස්වාදයන් ලබාගැනීමට ක්‍රීඩාංගන පහසුකම් ද සහිත ස්ථාන මෙම ප්‍රදේශය හරහා රත්නපුර දෙසට ගමන් කිරීමේදී දර්ශනය වේ.

රූප සටහන් අංක 6.3 : යෝජිත අහස් රේඛාව 2033 - දෙල්ගමුව කලාපය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගයේ සිට ඊසාන දෙසට වන්නට උඩකඩ මාර්ගයේ ගමන් කිරීමේදී ප්‍රදේශයට අවේණික කෘෂිකාර්මික බිම් වන තේ, රබර් හා අනෙකුත් සුළු බෝග වගාවන් මෙන්ම කුඩා වන ලැහැබ් සහිත ස්වභාවික පරිසරය දැක බලා ගනිමින්, එකී ආවේණිකත්වය මත හිඳිමින් ප්‍රදේශයට අවේණික ආහාර පාන, සංස්කෘතිය, කර්මාන්ත ආදිය වින්දනය කිරීමේ හැකියාව ලැබෙනු ඇත. මේ සමගම බෝපත් ඇල්ල කේන්ද්‍ර කොට පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රමුඛ කර ගනිමින් ඉදි වන හෝටල්, ලැගුම් හල්, කබානා ආදී ඉදි කිරීම් මෙන්ම පාරිසරික සහ ත්‍රාසජනක සංචාරක කටයුතු, කඳවුරු බිම් ආදී ස්වභාවික පරිසරය හා බද්ධ වූ අත්දැකීම් වලින් සමන්විත භූමියක් දක්නට ලැබේ. බෝපත් ඇල්ල හා සම්බන්ධව ජලාශ්‍රිත ක්‍රියාකාරකම් සහිත විනෝදාස්වාදයක් ලබා ගැනීමේ පහසුකම් සපිරි ප්‍රදේශයක් ද දර්ශනය වනු ඇති අතර නිල හරිත පරිසරයේ ස්වභාව සෞන්දර්යය වින්දනය කරමින් සංචාරය කිරීමට හැකි වනු ඇත.

රූප සටහන් අංක 6.4 : යෝජිත අහස් රේඛාව 2033 - බෝපත් ඇල්ල සංචාරක කලාපය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

දකුණු මුවදොර සිට කුරුවිට සැලසුම් ප්‍රදේශයට අවතීර්ණ වන විට නේවාසික භාවිතයන් ඉහළ, ගොඩනැගිලි ඝනත්වය වැඩි ප්‍රදේශයක් හඳුනා ගත හැකි වේ. සංවර්ධන ප්‍රදේශය තුළ විශේෂ අංගයක් ලෙස හඳුනා ගන්නා ලද හමුදා කඳවුර ඒදණ්ඩවල මාර්ගය ඔස්සේ කුඹුරු, තේ, රබර් වගා බිම් හා නේවාසික භාවිතයන් මිශ්‍රිත ප්‍රදේශයක දිස් වේ. A 004 මාර්ගයේ සිට

කුරුවිට නගරය දෙසට ගමන් කිරීමේදී මාර්ගයට දෙපසින් කුඹුරු යායවල්, රබර් හා තේ වතු මෙන්ම කුඩා ඇල මාර්ග ඉතා මනස්කන්තව දර්ශනය වන අතර ඒදණ්ඩවල, වැලිහිඳ, සියඹලාගහයට ආදී ප්‍රදේශ ආශ්‍රිතව අඩු උස මට්ටම් වලින් යුතු නේවාසික ගොඩනැගිලි වැඩි වශයෙන් දර්ශනය වේ.

පැරඩයිස් ප්‍රදේශයට ළඟා වන විට ප්‍රාදේශීය සෞඛ්‍ය අවශ්‍යතාවයන් සපුරා ලීමට උපකාරී වන ප්‍රාදේශීය රෝහල් පරිශ්‍රය හඳුනා ගත හැකි අතර දැනට පවතින ඇඟලුම්,තේ , පොහොර ආදී කර්මාන්ත ශාලා ද, ප්‍රධාන ඉන්ධන පිරවුම්හල,ගබඩා පහසුකම්, ආපනශාලා හා අනෙකුත් වෙළඳසැල් ආදී මිශ්‍ර සංවර්ධනයන් රැසක් දැක ගත හැකි වේ. ප්‍රාදේශීය වශයෙන් ගත් කළ පැරඩයිස් හන්දිය සැලසුම් ප්‍රදේශයේ එක් ප්‍රධාන ස්ථානයක් වන අතර ඝනත්වය වැඩි ගොඩනැගිලි පැතිරීමක් ඒ අවට හඳුනා ගත හැකි වේ. පැරඩයිස් හන්දියේ සිට බටහිර දෙසට මාර්ගය ඔස්සේ ගමන් කරන විට ස්වභාවික පරිසරය හා බද්ධ කොටගත් නේවාසිකයන්ට නිස්කලංක පරිසරයක් සමග විවේක හා විනෝද කටයුතු, ශරීර සුවතා කටයුතු ආදිය සඳහා පැරඩයිස් වැව අවට උද්‍යාන පහසුකම් සලසා දී තිබේ. එසේම වැඩි වන නේවාසික පහසුකම් වල ඉල්ලුම සපුරා ලීම සඳහා මධ්‍ය ඝනත්ව නේවාසික ව්‍යපෘති ප්‍රදේශය ඒ අවට ස්ථාපිත කර ඇත . ප්‍රදේශයේ අනන්‍යතාවයක් ලෙස ප්‍රදේශය පුරා විහිදී පවතින කුඹුරු, තේ, රබර් වගා බිම් වල ව්‍යාප්තිය දක්නට ලැබෙන අතර රත්නපුර - කොළඹ මාර්ගයේ තවදුරටත් කුරුවිට නගරය දෙසට ගමන් කිරීමේදී මාර්ගයේ වම්පසින් පිහිටි නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය හඳුනා ගත හැකි වේ. එසේම දූහලෝවත්ත නිවාස ව්‍යාපෘති ප්‍රදේශය ගොඩනැගිලි ඝනත්වය වැඩි ප්‍රදේශයක් ලෙස ප්‍රධාන මාර්ගයේ වම් පසින් දිස් වන අතර දකුණු පසින් මලව හන්දියේ සිට නැගෙනහිර දෙසට ගමන් කරන විට නේවාසික හා වගා භූමි මිශ්‍රිත ප්‍රදේශයක්ද ප්‍රදේශයේ තවත් විශේෂ අංගයක් වන කුරුවිට බන්ධනාගාර පරිශ්‍රයද හමු වේ.

රූප සටහන් අංක 6.5 : යෝජිත අහස් රේඛාව 2033 - පැරඩයිස් කලාපය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

එම ප්‍රදේශය පසු කරමින් ඉදිරියට ගමන් කිරීමේදී ඉහළ නාගරික ලක්ෂණ දැකගත හැකි වන අතර මලව හන්දිය පසුකොට කුරුවිට නගර සීමාවට ඇතුළුවත්ම ක්‍රමයෙන් ගොඩනැගිලි වල උස මට්ටමේ වැඩි වීමක් හා ගොඩනැගිලි ඝනත්වයේ වැඩි වීමක් හඳුනා ගත හැකි වේ. තව දුරටත් ඉදිරියට ගමන් කිරීමේදී සුඛෝපභෝගී සාප්පු සංකීර්ණ, බැංකු, මූල්‍ය ආයතන

ඇතුළු උප වාණිජ ගොඩනැගිලි මෙන්ම කුරුවිට බස් නැවතුම්පලද දක්නට ලැබේ. කුරුවිට බස් නැවතුම්පලට පිටුපසින් දුම්රිය නැවතුම්පල ආශ්‍රිත ප්‍රදේශය හඳුනා ගත හැකි අතර නගර මධ්‍යට පිවිසෙන විට සංවර්ධනය කරන ලද ඉපැරණි දුම්රිය ගොඩනැගිලි, මැණික් චතුරශ්‍ර ප්‍රදේශය සහ විවෘත අවකාශ ප්‍රදේශය ඇතුලත් සංවර්ධිත නාගරික අවකාශයක් හඳුනා ගත හැකි වේ. ප්‍රධාන මාර්ගයේ දකුණු පසින් බහු මහල් වාණිජ ගොඩනැගිල්ල සහිත ප්‍රදේශය මෙන්ම එරත්න දෙසට දිවෙන මාර්ගය දිස් වේ. ඒ ඔස්සේම ගමන් කරද්දී වාහන නැවතුම් පහසුකම් සහිත වාණිජ ප්‍රදේශයක් හඳුනා ගත හැකි අතර කුරු ගඟට මායිම්ව බෝට්ටු අංගනය සහිත ආපනශාලා පහසුකම් විඳිමින්, ගංගාවේ ස්වභාවික පරිසරයේ සුන්දරත්වය දැක බලා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ප්‍රධාන මාර්ගයේම වම් පස පෙදෙසෙහි වාහන නැවතීමේ පහසුකම් සහිත වාණිජ ගොඩනැගිල්ල මෙන්ම රංග ශාලා පහසුකම් නාගරිකයන් හට තම විවේක කාලය හරවත් ලෙස ගත කිරීමට අවස්ථාව සලසා දේ. එසේම තැඹිලියෙන මාර්ගයේ සිට පාතගම හරහා දිවෙන අතිරේක මාර්ගය නගරයේ තදබදය මග හරිමින් වාහන ගමනාගමනය සඳහා මලව හන්දිය අසලින් ප්‍රධාන මාර්ගයට එක් වේ. එසේම කුරු ගඟේ අතු ශාඛාවක් ලෙස දිවෙන වලඳුර ඇළ හා පවතින ඇවිදින මංතීරු ජනතාවට ස්වභාවික සුන්දරත්වය විඳිමින් තම සංචරණ කටයුතු ඉටු කර ගැනීමට හැකියාව සලසා දේ .

රූප සටහන් අංක 6.6 : යෝජිත අහස් රේඛාව 2033 - නගර මධ්‍ය කලාපය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

රත්නපුර - කොළඹ ප්‍රධාන මාර්ගය ආශ්‍රිතව ක්‍රියාකාරකම් බොහොමයක් පැවතියද අවහිරතාවය අඩු වන පරිදි පදික වේදිකා, ක්‍රමවත්ව සැකසුනු කානු පද්ධති, උද්‍යාන අලංකරණ වලින් යුතු ප්‍රියමනාප නගරයක් දැක ගත හැකි වේ.

දෙදිශාවෙන්ම ප්‍රදේශයට පිවිසීමේදී ප්‍රධාන මාර්ගය දෙපස හරිත ප්‍රදේශ ඇතුලත්ව නේවාසික ලක්ෂණ වලින් සමන්විත වීම ප්‍රදේශයේ ආවේණිකත්වය දනවන අතර ක්‍රමයෙන් නගර මධ්‍යට ඇතුළු වීමේදී නගර මධ්‍යයේ සිදු වන ක්‍රියාකාරකම් වල විවිධත්වය තුළින් නාගරික ආකෘතියේ සුවිශේෂී බව හඳුනා ගත හැක. ඒ අනුව කෘෂිකර්මාන්තය, නිල හරිත ප්‍රදේශ වලින් සමන්විත වූ නේවාසික සහ වාණිජමය වශයෙන් සක්‍රිය නගරයක් ලෙස දිස්වනු නොඅනුමානය. නගරයේ ආකෘතිය පැරඩයිස්, හිග්ගස්හේන, දෙල්ගමුව ආදී කලාප අනුව

වෙන් වෙන් වශයෙන් ආවේණිකත්වයක් දක්වන අතර එකී ප්‍රදේශ ආශ්‍රිතව ගොනු වූ ගොඩනැගිලි, ක්‍රියාකාරකම් සහ අවකාශීය ලක්ෂණද හඳුනා ගත හැකි වේ.

ඒ අනුව ඉහත දැක්වූ සියළු විස්තරයන් ගෙන් දක්වනුයේ කුරුවිට නගරයේ සංවර්ධනය තුළින් බලපොරොත්තු වන 'සිරිපා නිම්නයේ සුසැදි නවාතැන' යන නාගරික දැක්ම දර්ශනය කරන නාගරික ආකෘතියක් රස වින්දනය කිරීමේ හැකියාව වර්ෂ 2033 වන විට යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම තුළින් හැකි වන බවයි.

සිතියම් අංක 6.2 : යෝජිත භූමි පරිහරණ රටාව



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.3 සමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග

සමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග

6.3.1 සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

6.3.1.1 නේවාසික සැලැස්ම

කුරුවිට නගර සංවර්ධනයට අයත් ඉතාමත් වැදගත් අංගයක් වන්නේ නේවාසිකයන් සඳහා වාසයට සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම සහ සුදුසු නේවාසික ව්‍යාපෘති හඳුනා ගැනීමයි. මූලික වශයෙන් රත්නපුර අවට ප්‍රදේශ වලට ගොනු වන නේවාසික ජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් කුරුවිට නගරය ආශ්‍රිත නේවාසික ප්‍රදේශ වලට යොමු කිරීම ප්‍රධාන අරමුණක් වේ. කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල දත්ත උපයෝගී කොටගෙන නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද විශ්ලේෂණයන්ට අනුව 2021 වර්ෂය වන විට පවත්නා මුළු නිවාස සංඛ්‍යාව 4467 කි. ඒවායින් 89% ක් ස්ථිර නිවාස වන අතර 7% ක් අර්ධ ස්ථිර නිවාස ද, 4% ක් තාවකාලික නිවාස වේ.

අපරව්‍යුහ පහසුකම් සඳහා ළඟා වීමට ඇති පහසුව හේතුවෙන් කුරුවිට නගර මධ්‍ය ආශ්‍රිත ප්‍රදේශය ආසන්නයේ ඉහළ ජන ඝනත්වයක් පෙන්නුම් කරන අතර එලෙසම නිවාස වලද ඉහළ ඝනත්වයක් පෙන්නුම් කරයි. එසේම නඩුකාරදෙණිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය ද දෙල්ගමුව ග්‍රාමනිලධාරී කොට්ඨාසය මෙන්ම ඉහළ නිවාස ඝනත්වයක් පෙන්නුම් කරන අතර එම ප්‍රදේශයේ පවතින ස්වභාවික උපද්‍රව වල අවම බව, අපරව්‍යුහ පහසුකම් වලට ළඟා වීමට ඇති පහසුව මෙන්ම ඉඩම් කැබලි වල මිල ගණන් වල අඩු බව ඊට හේතු වී ඇති බව පෙනී යයි.

නිවාස පහසුකම් වල හිඟය ගණනය කිරීමේදී,

- ජනගහන වර්ධන අනුපාතය
- පවුලක ජීවත් වන සාමාජිකයන් සංඛ්‍යාව
- වාර්ෂික නිවාස වර්ධන අනුපාතය
- වාර්ෂික නිවාස ක්ෂය වීමේ අනුපාතය

යන නිර්ණායකයන් යොදා ගන්නා ලදී.

2033 වර්ෂය වන විට අපේක්ෂිත 38,304 ක් වූ ජනගහනය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ දත්ත විශ්ලේෂණයන්ට අනුව අපේක්ෂිත නිවාස සංඛ්‍යාව 8,256 ක් වන අතර නිවාස හිඟය ලෙස හඳුනා ගෙන ඇත්තේ නිවාස 256 ක් පමණි. ඒ අනුව මූලික සේවාවන් සමග ප්‍රමාණවත්, ආරක්ෂිත සහ දැරිය හැකි මිලකට අනාගත නිවාස අවශ්‍යතාවය සඳහා සැමට ප්‍රවේශය සහතික කිරීමත් පුරෝකථනය කරන ලද ජනගහනයට නිවාස සැපයීමත් නේවාසිකයන් වැඩි වශයෙන් ආකර්ෂණය කොට ඔවුන්ට වඩාත් සුදුසු නේවාසික පරිසරයක්

06 වන පරිච්ඡේදය සැලැස්ම

නිර්මාණය කිරීමත් අනාගත නිවාස සංවර්ධන කටයුතු සඳහා සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීමත් අරමුණු කොට ගෙන නිවාස පහසුකම් සඳහා සුදුසු ව්‍යාපෘති හඳුනා ගන්නා ලදී.

සිතියම් අංක 6.3 : නිවාස ඝනත්වය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

පැරඩයිස් වැව ආශ්‍රිත ප්‍රදේශය ද නේවාසිකයන් බහුලව ජීවත් වන ප්‍රදේශයක් වන අතර යෝජිත මධ්‍ය අදායම් නිවාස ව්‍යාපෘතිය සඳහා හඳුනා ගන්නා ලද ස්ථානය ද ඒ අවට වේ. ප්‍රදේශයේ පිහිටි එක් සංකේතාත්මක ජල මුලාශ්‍රයක් ලෙස පැරඩයිස් වැව හඳුනා ගත හැකිය. එය අවට ප්‍රදේශයේ විනෝදාස්වාදය, අලංකරණය සහ පාරිසරික සමතුලිත බව රැක ගැන්මට උදව් වන අතර වැව වටා ඇවිදින මං තීරුවක් නිර්මාණය කිරීමට යෝජිතය. එයින් ප්‍රදේශයේ නේවාසිකයන් හට ශාරීරික මෙන්ම මානසික සුවත්වය ළඟා කර ගනිමින් සුව පහසු නේවාසික අත්දැකීමක් මෙන්ම වැව අවට පරිසරය ආරක්ෂා වීම වක්‍ර ප්‍රතිලාභයක්ද වේ.

එසේම නේවාසික ප්‍රවර්ධන ප්‍රදේශ හඳුනා ගැනීම සහ කලාපකරණ මාර්ගෝපදේශ හඳුන්වා දීම හරහා ද ප්‍රදේශයට ආකර්ෂණය වන නේවාසික ජනතාව සඳහා පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ. මෙහිදී කලාපිකරණය තුළින් නේවාසික ප්‍රජාව සඳහාම විශේෂ වූ කලාප දෙකක් නේවාසික කලාපය මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය සහ අඩු ඝනත්ව නේවාසික කලාපය ලෙස අනාගත නේවාසික ප්‍රවණතාවය, ව්‍යාප්තිය ආදී කරුණු මත පදනම් ව හඳුනා ගන්නා ලද අතර භාවිතයන් සහ නියමතා නේවාසික පහසුකම ප්‍රවර්ධනය වන ආකාරයටත්, නේවාසිකයන්ගේ එදිනෙදා ජීවිතය සුමට කරවන ලෙසටත් හඳුනා ගන්නා ලදී.

සිතියම් අංක 6.4 : වාසයට වඩාත් සුදුසු ප්‍රදේශ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

උපායමාර්ගය 1

නේවාසික ජනතාව සඳහා හඳුනා ගත් නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා නිවාස ව්‍යාපෘති හඳුනා ගැනීම

උපක්‍රම 1.1

1. පැරඩයිස් - යෝජිත මධ්‍ය අදායම් නිවාස ව්‍යාපෘතිය
2. දුහලෝ වත්ත - යෝජිත නිවාස ව්‍යාපෘතිය (නැවත පදිංචි කිරීම/ අඩු අදායම් නිවාස)

උපක්‍රම 1.2

1. පැරඩයිස් වැව වටා ඇවිදින මං තීරුවක් නිර්මාණය කිරීම

උපායමාර්ගය 2

නේවාසික ප්‍රවර්ධන ප්‍රදේශ හඳුනා ගැනීම සහ ඒ සඳහා කලාපකරණ මාර්ගෝපදේශ හඳුන්වා දීම

සිතියම් අංක 6.5 : යෝජිත නිවාස සංවර්ධනය සඳහා හඳුනා ගත් ස්ථාන



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.3.1.2 අධ්‍යාපන සේවා සැලැස්ම

කුරුවිට ප්‍රදේශය තුළ විහිදී ඇති පාසල් සංඛ්‍යාව 13ක් වන අතර මුළු සිසුන් සංඛ්‍යාව 7032 ක් පමණ වේ. නාගරික කේන්ද්‍රයේ ජීවත් වන සිසුන්ට අමතරව 708 ක් පමණ වූ සිසුන් ප්‍රමාණයක් අවට ප්‍රදේශ වලින් පාසල් වලට පැමිණෙන සිසුන් වීම සැලකිය යුතු කරුණකි. කුරුවිට මධ්‍ය විද්‍යාලය ද්විතියික අධ්‍යාපනය ලබා දෙන ප්‍රධානම පාසල වන අතර එය කි. මී. තුනක පමණ වපසරියකට ද්විතියක අධ්‍යාපන පහසුකම් සැලසීම නිසා සංවර්ධන ප්‍රදේශයේ සැලකිය යුතු කලාපයක් ආවරණය කෙරේ.

කි. මී. එකක වපසරියක් තුල ප්‍රථමික අධ්‍යාපනය ලබා ගැනීමට පාසල් නොමැති නම් හා කි. මී. තුනක වපසරිය තුළ ද්විතියික අධ්‍යාපනය ලබා ගැනීමට පාසල් නොමැති නම් එම ප්‍රදේශයට නව පාසල් ගොඩ නැගිය යුතු වන අතර පහසුකම් අඩු පාසල් සඳහා පහසුකම් ලබා දී සංවර්ධනය කිරීම සිදු කල යුතුය. ඒ අනුව මෙම ප්‍රදේශයේ පවතින පාසල් වල පහසුකම් සහ ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යන කිරීමේදී පවතින පාසල් ප්‍රමාණය ප්‍රමාණවත් බව හඳුනා ගන්නා ලදී. කෙසේ නමුත් නව පාසලක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවයක් අනාගතයේදී ඇති වුවහොත් එම අවශ්‍යතාවය සපුරාලීමට සුදුසු ප්‍රදේශය ලෙස නඩුකාරදෙනිය සහ එක්නැලිගොඩ, කීරගල, උඩකඩ ආශ්‍රිත ප්‍රදේශවල ස්වභාවික උපද්‍රව අවම බව සහ ගමනාගමන පහසුකම් වල පිහිටීම මත පදනම්ව හඳුනා ගන්නා ලදී.

6.3.1.2.1. තෘතියික අධ්‍යාපනය

කුරුවිට නගරයේ අනාගත දැක්ම ළගා කර ගැනීමේදී තෘතියික අධ්‍යාපන පහසුකම් දියුණු කිරීම ඉතාමත් වැදගත් වේ. ආර්ථික වර්ධනයට උරදෙන ප්‍රධාන සාධකයක් ලෙස තෘතියික අධ්‍යාපන පහසුකම් හඳුනා ගත හැකි අතර සංවර්ධන ප්‍රදේශය සැලකිල්ලට ගැනීමේ දී උසස්පෙළ විභාගයෙන් පසුව තෘතියික අධ්‍යාපනය වෙත යොමු වන ප්‍රමාණය ඉතාමත් අඩු බව පෙනී යයි. දැනට කුරුවිට ප්‍රදේශය මුල්කරගෙන පාසල් හැරගිය සිසුනට තෘතියික අධ්‍යාපනය ලබා දීම සඳහා දෙල්ගමුව උණ ලී කර්මාන්ත පුහුණු මධ්‍යස්ථානය, බටුහේන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සහ තෘතියික අධ්‍යාපනය ලබා දෙන අනෙකුත් මධ්‍යස්ථාන ස්ථාපනය කර ඇත.

කෘෂිකර්මාන්තය සහ සංචාරක කර්මාන්තය ට විධිමත් අධ්‍යාපනයක් සහිතව පිවිසීමට කැමති ආධුනිකයන් හට ඒ සඳහා දැනට පිහිටා ඇති පුහුණු මධ්‍යස්ථාන තුළ ඵලදායි ලෙස නව පාඨමාලා හඳුන්වා දෙමින් ආර්ථිකයට දායක වන නව පරපුරක් බිහි කිරීමට සංවර්ධන සැලැස්ම තුලින් යෝජිතය. එහිදී වෘත්තීය පුහුණුව බන්ධනාගාරය සහ හමුදා කඳවුර පාදක කොටගෙන එම මධ්‍යස්ථාන වල පවතින මානව සහ භෞතික සම්පත් උපයෝගී කරගනිමින් ගම්මාන වල සිටින ආධුනිකයන් හට දැනුම ලබා දීමට හැකියාව පවතී. ඒ තුලින් කුරුවිට නගරයට, බෝපත් ඇල්ල ආශ්‍රිතව පවතින සංචාරක කලාපයට, කර්මන්තපුරයට මෙන්ම අවට පිහිටා ඇති වෙනත් නගර වෙතට ද ආර්ථික මෙන්ම සමාජීය ප්‍රතිලාභ ජාලයක් ලෙස සම්ප්‍රේෂණය වනු ඇත.

රූප සටහන් අංක 6.7 : අධ්‍යාපන මට්ටම අනුව ජනගහනය



මූලාශ්‍රය : කුරුවිට සම්පත් පැතිකඩ (2019)

වගු අංක 6.1 : පුහුණු මධ්‍යස්ථාන සහ පාඨමාලා විස්තර

ග්‍රාම නිලධාරි වසම	මධ්‍යස්ථානයේ නම	මධ්‍යස්ථානය	පවත්වන පාඨමාලා	සිසුන් සංඛ්‍යාව
දෙල්ගමුව	උණ ලී කර්මාන්ත පුහුණු මධ්‍යස්ථානය	ජතික ශිල්ප සභාව කුරුවිට	විසිතුරු උණ ලී පුහුණු පාඨමාලාව	10
			බතික් පුහුණුව	24
බටුහේන	වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය	බටුහේන කොස්ගොඩ	මෝස්තර නිර්මාණ ශිල්පී පාඨමාලාව	19
			මෝටර් එතුම් ශිල්පී	21
			ගුවන්විදුලි හා රූපවාහිනී අළුත්වැඩියාව	11
			විදුලි කාර්මික ශිල්පී	17
			ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී	21

මූලාශ්‍රය : කුරුවිට සම්පත් පැතිකඩ (2019)

සිතියම් අංක 6.6 : පවත්නා සහ යෝජිත පාසල් මගින් ආවරණය වන ප්‍රදේශ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.3.1.3 සෞඛ්‍ය සේවා සැලැස්ම

සංවර්ධන ප්‍රදේශයේ සෞඛ්‍ය පහසුකම් පිලිබදව සලකා බැලීමේදී ප්‍රාදේශීය වශයෙන් උඩකඩ මධ්‍යම බෙහෙත් ශාලාව පහසුකම් ප්‍රධාන වන අතර දිනකට ප්‍රතිකාර ලැබීමට රෝගීන් 250 ක් පමණ පැමිණෙන අතර වෛද්‍යවරුන්ගේ සහ සම්පත් හිගය නිසාවෙන් ගැටලුකාරී තත්වයන් මතුව ඇත.

වගු අංක 6.2 : මධ්‍යම බෙහෙත් ශාලාව කුරුවිට - පහසුකම් හා කාර්ය මණ්ඩලය

දිනකට ප්‍රතිකාර කරන ලෙඩුන් සංඛ්‍යාව	සේවක සංඛ්‍යාව	මසකට පැවැත්වෙන සායන ගණන	සායන වලට පැමිණෙන ලෙඩුන් සංඛ්‍යාව
200	04 වෛද්‍යවරු 1 අන්වීක්ෂක 1 බෙහෙත් දෙන නිලධාරින් 1 උපස්ථායක 1 සායන සඳහා පමණක් පිටින් පැමිණෙන පවුල් සෞඛ්‍ය සේවිකාවන් 3	ළමා සායන 2 ගර්භනී සායන පවුල් සෞඛ්‍ය සායන 1	300 35-40 40-50

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2021

කෙසේ වුවත් රත්නපුර ශික්ෂණ රෝහල සහ ඇහැලියගොඩ මුලික රෝහල මගින් ප්‍රාදේශීය මෙන්ම කලාපිය වශයෙන් සෞඛ්‍ය සේවාවන් ආවරණය කරන අතර සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා මෙම ප්‍රධාන මධ්‍යස්ථාන වෙත නේවාසිකයන් යොමු වේ.

2033 වන විට පවතින සහ අපේක්ෂිත ජනගහනය සඳහා ප්‍රමාණවත් සහ ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සුරක්ෂිත කිරීම සඳහා ප්‍රාදේශීය රෝහලක් ඉදි කිරීමට නඩුකාරදෙණිය ප්‍රදේශයේ ස්ථානයක් හදුනා ගන්නා ලදී. එහිදී නේවාසිකයන් කේන්ද්‍ර කරගත් ප්‍රදේශයක් ලෙස කුරුවිට නගරයේ සෞඛ්‍ය අවශ්‍යතාවය සපුරා ගැනීමට රත්නපුර හෝ ඇහැලියගොඩ ප්‍රදේශ වලට සංචරණය නොවී තම ජිවත්වන ප්‍රදේශය අවටින්ම එම අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකි වනු ඇත. එසේම එළිමහන් විනෝදාස්වාදයට අදාළ ප්‍රමාණවත් පහසුකම් ලබා දීමෙන් මිනිසුන්ගේ මානසික සෞඛ්‍යය හිතකර මට්ටමක ඉහළ නැංවීම සඳහා වඩා හොඳ පරිසරයක් නිර්මාණය කිරීමට මෙම සංවර්ධන සැලැස්ම හරහා බලාපොරොත්තු වේ. ශාරීරික මෙන්ම මානසික සෞඛ්‍ය යන අංශ ද්විත්වයම තුලිත වූ ජනතාවක් බිහි කිරීම තුළින් ප්‍රදේශයේ සංවර්ධනයට ඍජු මෙන්ම වක්‍ර ප්‍රතිලාභ රැසක් හිමි වනු ඇත.

උපාය මාර්ගය 1

සෞඛ්‍ය පහසුකම් සුරක්ෂිත කිරීම සඳහා මූලික රෝහල පරිශ්‍රය සංවර්ධනයට නඩුකාරදෙණිය ප්‍රදේශයේ ඉඩම් හඳුනා ගැනීම.

උපාය මාර්ගය 1

එළිමහන් විනෝදාස්වාදයට අදාළ ප්‍රමාණවත් පහසුකම් ලබා දීමෙන් මිනිසුන්ගේ මානසික සෞඛ්‍යය හිතකර මට්ටමක ඉහළ නැංවීම සඳහා වඩා හොඳ පරිසරයක් නිර්මාණය කිරීම.

උපක්‍රම 1 .1

1 සෞඛ්‍ය පහසුකම් සුරක්ෂිත කිරීම සඳහා නඩුකාරදෙණිය - නව රෝහල් පරිශ්‍රයක් ඉදි කිරීම. (අක්කර 2)

6.3.1.4 සංස්කෘතික, ආගමික සහ උරුම කළමනාකරණ සැලැස්ම

6.3.1.4.1 ආගමික ස්ථාන

බහු ආගමික ජන කොට්ඨාසයක් ජීවත් වන කුරුවිට ප්‍රදේශයේ තම ආගමික කටයුතු සිදු කරගෙන යාමට සුදුසු පරිසරය සහ පහසුකම් ප්‍රමාණවත් පරිදි ව්‍යාප්තව පවතින බවට පෙනී යයි. 91% ට වැඩි ප්‍රතිශතයක් බෞද්ධාගම අදහන පිරිස ප්‍රධාන කරගත් සියළු ආගම් වලට අයත් ජනතාව එක් ව වාසය කරන ප්‍රදේශයක් ලෙස කුරුවිට සැලසුම් ප්‍රදේශය හඳුනා ගත හැකිය. ආගමික ස්ථාන වල ව්‍යාප්තිය පිළිබඳව සලකා බැලීමේදී ප්‍රමාණාත්මකව ගත් කළ බෞද්ධ විහාරස්ථාන 6 ක් පමණ ප්‍රදේශය පුරා පිහිටා ඇති අතර අනෙකුත් ආගමික ස්ථාන එක බැගින් පිහිටා ඇති බව කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2021 වර්ෂයේ දත්ත අනුව දැක්වේ.

සිතියම් අංක 6.7 : ආගමික ස්ථාන



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශය, 2022

6.3.1.4.2 උරුමයන්ට අයත් වන ස්ථාන

1. දෙල්ගමුව රජ මහා විහාරය

කුරුවිට නගර මධ්‍ය ආශ්‍රිතව පිහිටි දෙල්ගමුව රජ මහා විහාරයට දෙල්ගමුව මාර්ගය හරහා ප්‍රවේශ විය හැකි අතර මෙම රජ මහා විහාරය අවුරුදු 400 ක පමණ පැරණි ඉතිහාසයකට හිමිකම් කියයි. මෙම රජ මහා විහාරය පිලිබඳව ඓතිහාසික වටිනාකම ලෙස සඳහන් වනුයේ ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ අවුරුදු 43 ක කාලයක් (වර්ෂ 1549 - 1592) සතුරන් ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා විශාල කුරහන් ගලක් තුල සඟවා තබා ආරක්ෂා කර ගත් බවයි. මේ වනවිට රජමහා විහාරය ප්‍රතිසංස්කරණයන් සහ සංරක්ෂණ කටයුතු වලට ලක් වෙමින් වන්දනීය ස්ථානයක් ලෙස ජනතාව අතර ප්‍රචලිතය. මෙම විහාරස්ථානය 2002.11.20 වන දින ආරක්ෂිත පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

රූප සටහන් අංක 6.8 : දෙල්ගමුව රජ මහා විහාරය හා කුරහන් ගල

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි, 2014

2. එක්නැලිගොඩ වලව්ව

කුරුවිට - එරත්න මාර්ගයේ පිහිටා ඇති මෙම ඓතිහාසික ගොඩනැගිල්ල වර්ෂ 1974 ජනවාරි 18 වන දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පුරා විද්‍යා ආරක්ෂක ස්මාරකයක් ලෙස නම් කර ඇත. වාස්තු විද්‍යාත්මක වශයෙන් ද අතිශය වැදගත් ස්මාරකයක් වන මෙය දශක දෙකකට ආසන්න කාලයක් පැවත එන ස්මාරකයක් වන අතර I වන පැරකුම්බා රජු විසින් ප්‍රථමයෙන් ඉදි කරන ලද පඬුවස් නුවර රජ ගෙදර ආකෘතියට මෙම වලව්වේ සැලැස්ම බොහෝ සෙයින් සමාන බවට පුරාවිද්‍යාඥයින් පවසයි. එරත්න මාර්ගයට මායිම්ව ඉදි කර ඇති මැටි පවුර ද එක්නැලිගොඩ වලව්වේ සොහොන් භූමිය ද පුරාවිද්‍යා පනත යටතේ ස්මාරකයක් ලෙස නම් කර ඇති අතර එක්නැලිගොඩ වලව්ව පිහිටි ඉඩම ස්වාභාවික වනාන්තරයක් ලෙස වගා කොට ඇත. මෙම වලව්ව 1829 දී ඉදි කරන ලද අතර එහි අයිතිය පෞද්ගලික හිමිකාරිත්වයක් දරන අතර . මෙම ගොඩනැගිල්ල පැවති වලව්ව ආකාරයටම පවතින අතර පෞරාණික තත්ත්වය ආරක්ෂා කල යුතු ව පවතී .

රූප සටහන් අංක 6.9 : එක්නැලිගොඩ වලව්ව

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි, 2021

3. කටුතියඹරාව විහාරය

එරත්න - කුරුවිට මාර්ගයේ කුරුවිට නගරයේ සිට මීටර 300 කට ආසන්න දුරකින් පිහිටා ඇති මෙම බෞද්ධ පුදබිම මෙහි ඇති පැරණි මූර්ති සහ චිත්‍ර සහිත විහාර ගෙය නිසාවෙන් පෞරාණික වටිනාකමින් යුතු ස්ථානයක් ලෙස හඳුනා ගෙන ඇත. 2002 ජනවාරි 22 වන දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ආරක්ෂිත පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

4. කුරුවිට දුම්රිය ස්ථානය

කුරුවිට නගර මධ්‍යයේ තිබෙන වසර 110 ට වඩා පැරණි කුරුවිට දුම්රිය ස්ථානය, පුංචි කෝච්චිය ගමන් කළ සමයේ එක් නැවතුම්පලක් වූ බව සඳහන් වේ. මෙම පුර විද්‍යාත්මක ස්ථානය වර්ෂ 1908 දී ඉදී කරන්නට ඇතැයි සැලකෙන අතර අදටත් දුම්රියට ජලය ලබා දුන් ජල ටැංකිය සහිත ගොඩනැගිල්ල, විශ්‍රාම ශාලාව හා ගබඩාව එහි දක්නට ඇත. වර්තමානය වන විට එම ගොඩනැගිලි වලින් එක් ගොඩනැගිල්ලක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එහි පැරණි ස්වරූපය රැකෙන පරිදි ප්‍රතිසංස්කරණය කොට නාගරික ජනතාවට දායාද කොට තිබේ.

සංචාරක කර්මාන්තය සංවර්ධනය කරමින් ආදායම් උත්පාදනයට සමගාමීව එම ස්ථානයන්හි ඓතිහාසික, සංස්කෘතික සහ අධ්‍යාපනික වටිනාකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සංස්කෘතික උරුම කළමනාකරණය හරහා සිදු වේ. භෞතික ස්මාරක භාණ්ඩයට අයත් වන ඓතිහාසික හා ස්වභාවික වටිනාකම්වලින් යුත් ස්ථාන මෙන්ම ගොඩනැගිලි සංකීර්ණ ද යුනෙස්කෝ සංවිධානය විසින් උරුමයන් යටතට හඳුනා ගනු ලබන අතර මීට අමතරව මුඛ සම්ප්‍රදායෙන් පවත එන ජන සංගීතය, නැටුම් වැනි ලක්ෂණ ද අදාළ වේ. මෙම ප්‍රදේශයේ සංස්කෘතිය සමන් දෙවියන්, මැණික් කර්මාන්තය සහ ප්‍රාදේශීය ඇදහිලි මත පදනම්ව ඇති අතර සංවර්ධන කටයුතු වලදී මෙම පුරාවිද්‍යා සහ සංරක්ෂණ වටිනාකම් ආරක්ෂා කිරීමටත්, නාගරික ජනතවගේ ජීවන තත්වය ඉහල නැංවීම උදෙසා සමාජීය හා සංස්කෘතික වටිනාකම් වැඩිදියුණු කරමින් ආර්ථික අවස්ථා සහ වාසි ආකර්ෂණය කර

ගැනීමට යෝජිතය. තවද හඳුනාගත් පුරාවිද්‍යා හා සංස්කෘතික අවකාශ නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම අඛණ්ඩව සිදු කිරීම තුළින් අනාගත පරපුරට එම උරුමයන් දායාද කිරීමටත් කුරුවිට නගර සංවර්ධන සැලැස්මෙහි සංස්කෘතික සහ උරුමයන් පිළිබඳ උපායමාර්ගයන් මූලිකවම සකසා ඇත.

මෙම සැලැස්මේ ප්‍රධාන අරමුණු ද්විත්වය වන නේවාසිකයන්ට ජීවත්වීමට වඩාත් සුදුසු ගමනාන්තය බවට පත් කිරීම සහ මිණිපුර සංචාරක කලාපය තුල සංචාරකයන්ට සේවා සපයන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම යන්න මත පදනම්ව සංස්කෘතික සහ උරුමයන් පිළිබඳ උපායමාර්ගය සැලසුම් කර ඇත.

උපායමාර්ගය 1

පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි හා ස්ථාන වල ස්වරූපය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය

උපායමාර්ගය 1.1

දැනට හඳුනාගෙන ඇති සංස්කෘතික හා උරුම ස්ථාන සඳහා නියමතා සහ අනුමත භාවිතයන් හඳුන්වා දීම තුළින් සැලසුම් ප්‍රදේශයේ පුරාවිද්‍යා සහ සංරක්ෂණ වටිනාකම් ආරක්ෂා කිරීම

උපායමාර්ගය 1.2

කුරුවිට නගරයේ හඳුනාගත් පුරාවිද්‍යා හා සංස්කෘතික අවකාශ නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම අඛණ්ඩව සිදු කිරීම

ශ්‍රී පාදය සහ සමන් දෙවියන් අශ්‍රිතව පවතින සංස්කෘතිය, මැණික් කර්මාන්තය මෙන්ම ඓතිහාසික ගොඩනැගිලි අශ්‍රිතව පවතින සංස්කෘතිය එකිනෙකට අනන්‍ය වන අතර එම වටිනාකම් හඳුනා ගනිමින් එම ස්වරූපය තවදුරටත් ආරක්ෂා කර ගැනීම සංවර්ධන සැලැස්මෙන් බලාපොරොත්තු වේ. මෙහිදී අදාළ සංවර්ධන කටයුතු මෙම ස්වරූපයන්ගේ වටිනාකමට හානි නොවන ලෙස හා වටිනාකම ඉස්මතු වන ලෙස සිදු කිරීමට යෝජිතය. එසේම සංරක්ෂණයට අදාළ ස්ථානයන්හි කිසිදු වෙනස්කමක් සිදු කිරීමට නොහැකි අතර මේ යටතට ගැනෙන ස්ථානයන්හි වෙනස්කම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණයට යටත්ව සිදු විය යුතුය. කෙසේ වෙතත් මෙම ආගමික, සංස්කෘතික සහ පුරාවිද්‍යාත්මක උරුමයන් යෝග්‍ය පරිදි සංරක්ෂණය කිරීම මගින් නාගරිකයන්ගේ ආර්ථිකයට ප්‍රතිලාභ හිමි වෙන අතර සංචාරක ආකර්ෂණය ද වැඩි වනු ඇත. එසේම කුරුවිට ප්‍රදේශයේ නේවාසිකයන්ගේ අනන්‍යතාව හා අභිමානය ද ආරක්ෂා වනු ඇත.

එක්නැලිගොඩ වලව්ව, දෙල්ගමුව රජ මහා විහාරය, පැරණි දුම්රිය ගොඩනැගිල්ල වැනි ස්ථාන ස්වරූපය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය යන උපායමාර්ගය යටතේ ස්වරූපයන්ගේ වටිනාකම් වලට හානි නොවන ආකාරයට සංවර්ධනය කල හැකි වේ. මේ වන විටත් සියක් නගර ව්‍යාපෘතිය හරහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් පැරණි දුම්රිය ගොඩනැගිල්ල

සංවර්ධනය කරන ලදී. එසේම සිරිපා අඩවිය ආශ්‍රිත යුනෙස්කෝ ලෝක උරුමයක් ලෙස නම් කර ඇති බට දොඹ ලෙන, බට තොට ලෙන, ශ්‍රී පාද පද්මය ආදී ස්ථාන සැලසුම් ප්‍රදේශයෙන් පිටත පිහිටියද ඒවායේද සංරක්ෂණ සහ ස්වරූපය ආරක්ෂා කිරීම ප්‍රාදේශීය වශයෙන් පමණක් නොව කලාපීය වශයෙන්ද බලපෑම් ඇති කරවනු ඇත.

සිතියම් අංක 6.8 : යෝජිත සහ පවතින සංචාරක ස්ථාන



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

උපායමාර්ගය 2
පුරාවිද්‍යාත්මක ස්ථාන හා ගොඩනැගිලි ඒවායේ වටිනාකම් ආරක්ෂා වන පරිදි වෙනත් භාවිතයන් සඳහා යොදා ගැනීම

උපායමාර්ගය 2.1
කුරුවිට ප්‍රදේශයට සමාජීය හා සංස්කෘතික වටිනාකම් වැඩිදියුණු කරමින් ආර්ථික අවස්ථා සහ වාසි ආකර්ෂණය කර ගැනීම

කුරුවිට ප්‍රදේශය සතු ඓතිහාසික ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් නොවුණද පවතින ගොඩනැගිලි කිහිපය ආර්ථික, පරිපාලන හෝ සංචාරක භාවිතයන් සඳහා අනුවර්තනය කොට නැවත භාවිතය මගින් ප්‍රතිලාභ රැසක් නාගරිකයන් හට ලගා කර දීමට ඉහළ ශක්‍යත්වයක් පවතී . දැනට හඳුනා ගත් එම ගොඩනැගිලි නිසි භාවිතයකට නොගන්නා අතර කිසිදු අමතර ආර්ථික ප්‍රතිලාභයක්ද නගරයට උපයා නොදෙයි. එබැවින් එම ගොඩනැගිලි සංවර්ධනය කොට භාවිතයට ගැනීමෙන් නගරය තුළ හා ඒ අවට ඓතිහාසික වටිනාකම රැකගැනීමත් නගරයට ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ උදා කර දීමත් අපේක්ෂාව වේ.

උපක්‍රම 2.1

දුම්රිය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද සියක් නගර ව්‍යාපෘතිය හරහා කුරුවිට ඔරලෝසු කනුව අසළ ප්‍රධාන මාර්ගය ට මුහුණලා ඉදි කර ඇති පැරණි දුම්රිය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කරන ලදී. ප්‍රතිසංස්කරණ කටයුත්තේ දී ගොඩනැගිල්ල පමණක් නොව ගොඩනැගිල්ලට යාබද අවකාශයද ආකර්ෂණීය භූමි දර්ශන නිර්මාණ වලින් සංවර්ධනය කරන ලද අතර එය ආපනශාලා සහ වාණිජ කටයුතු සඳහා වෙන් කිරීමට යෝජිතය. එසේම කුරුවිට බෝධින් වහන්සේ අසල පිහිටා ඇති දුම්රිය ගොඩනැගිල්ලද ප්‍රතිසංස්කරණය කොට පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානය සහ මැණික් ආශ්‍රිත ක්‍රියාකාරකම් මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමට යෝජිතය. මේ තුළින් සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අරමුණක් වන මිණිපුර සංචාරක කලාපයේ ප්‍රධාන සංචාරක සේවා මධ්‍යස්ථානයක් බවට පත් කර ප්‍රදේශයට ඉහළ සංචාරක ආකර්ෂණයක් ඇති කිරීමෙන් නාගරිකයන්ගේ ආර්ථික ප්‍රතිලාභ ඉහළ නැංවීමට මෙහිදී බලාපොරොත්තු වේ.

රූප සටහන් අංක 6.10: නැවත ප්‍රතිසංස්කරණය කරන ලද පැරණි දුම්රිය ගොඩනැගිල්ල

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.3.2 භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

6.3.2.1. ප්‍රවාහන සේවා සැලැස්ම

කුරුවිට නාගරික බලප්‍රදේශය තුළ විසිරුණු මාර්ග පද්ධතියක් හඳුනා ගත හැකි අතර ප්‍රධාන නගරය වන කුරුවිට නගරය හරහා A 004 කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය දිවේ . ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වූ අප්‍රධාන මාර්ග සෙසු මාර්ග ජාලයකට සම්බන්ධ වන අතර මූලිකවම මෙම සෙසු මාර්ග ජාලය ගමනාගමන හා ප්‍රවාහන කටයුතු වලදී ප්‍රධාන , අප්‍රධාන මාර්ග මෙන්ම විශාල දායකත්වයක් ලබා දේ . නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද මාර්ග සම්බන්ධතා විශ්ලේෂණයට අනුව A 004 කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය, දෙවිපහල මාර්ගය, උඩකඩ මාර්ගය සහ පැරඩයිස් මාර්ගය ඉහළ සම්බන්ධතාවයක් පෙන්නුම් කරන අතර මූලිකවම ප්‍රධාන මාර්ගයේ සිට ඉවතට දිවෙන සෙසු මාර්ග වල අවම සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි.

යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය රත්නපුර හරහා දිවෙන අතර කුරුවිට නගර සැලසුම් ප්‍රදේශයට එයින් සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත. යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ බලපෑම නිසාවෙන් දැනට පවතින මාර්ග ජාලයේ දක්නට ඇති සම්බන්ධතාවයේ සහ සේවා ගලා යාමේ තිව්‍රතාවයේ වර්ධනයක් බලාපොරොත්තු විය හැකිය. කුරුවිට නගර සැලසුම් ප්‍රදේශයට අධිවේගී මාර්ගයේ කි. මී. 6 ක දුරින් සැලසුම් ප්‍රදේශය තුළම කුරුවිට අන්තර් හුවමාරුව යෝජනා කොට ඇති අතර කි. මී. 9 ක දුරින් පිහිටන වෙරළුප අන්තර් හුවමාරුව හැරුනුකොට කි. මී. 30 ක දුරින් පිහිටන කිරිඇල්ල අන්තර් හුවමාරුව අධිවේගී මාර්ගයේ ස්ථාපනයත් සමග සේවා සපයනු ඇත.

රූප සටහන් අංක 6.11: . යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

කුරුවිට නගරය තුළ සාමාන්‍ය දෛනික මගී ගමනාගමනය පිළිබඳව සළකා බැලීමේදී පෞද්ගලික බස් රථ සේවා සහ ජනතා සන්තක ප්‍රවාහන සේවාව ප්‍රධාන වේ. මධ්‍යම බස් නැවතුම්පල දත්ත වලට අනුව පෞද්ගලික බස් රථ සේවාව දෛනික මගී ගමනාගමන සේවාවෙන් 70% ක් ද ජනතා සන්තක ප්‍රවාහන සේවාව 30% ක් ලෙස ගමනාගමන පහසුකම් ආවරණය කරයි.

අවිස්සාවේල්ල සිට සූරියවැව හරහා හම්බන්තොට දක්වා දුම්රිය මාර්ගය නැවත පිහිටුවීමට සැලසුම් කර ඇති අතර කුරුවිට නගරය එක ප්‍රධාන නැවතුම්පලක් ලෙස හඳුනා ගෙන ඇත. දැනට හඳුනා ගත් දුම්රිය මාර්ගයේ අවිස්සාවේල්ල නගරයේ සිට ඇහැලියගොඩ නගරය දක්වා මැනුම් කටයුතු සිදු කර අවසන් කර තිබේ. කුරුවිට නගර සංවර්ධන සැලැස්ම යටතේ අක්කර 3.7 කට ආසන්න ඉඩම් ප්‍රදේශයක් යෝජිත දුම්රිය පොළ පිහිටුවීමට හඳුනා ගෙන ඇති අතර දැනට පවතින බස් නැවතුම්පල සහ දුම්රිය පොළ අතර සම්බන්ධතාවය ඇති කිරීමට මාර්ග (alleyways) හඳුනා ගන්නා ලදී. අධිවේගී මාර්ගය මෙන්ම කුරුවිට නගරය හරහා ගමන් කිරීමට නියමිත මෙම දුම්රිය මාර්ගයද කුරුවිට නගරයට පමණක් නොව මුළු සංවර්ධන ප්‍රදේශයටම සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත.

රූප සටහන් අංක 6.12 : යෝජිත දුම්රිය මාර්ගය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

වගු අංක **6.3 :** නගරය තුළ සාමාන්‍ය දෛනික මගී ගමනාගමනය

ප්‍රවාහන ක්‍රමය	ගමන් කරන මාර්ග ගණන	යොදවන මුළු බස් රථ සංඛ්‍යාව	දිනකට ගමන් කරන වාර ගණන	මගී සංඛ්‍යාව	ප්‍රතිශතය %
පෞද්ගලික බස් රථ සේවා	8	22	78	4680	70%
ජනතා සන්තක ප්‍රවාහන සේවාව	9	12	29	1740	30%
එකතුව		43	475	6420	100

මූලාශ්‍රය : කුරුවිට නගරයේ මධ්‍යම බස් නැවතුම්පල 2020

කුරුවිට නගරයේ ගමනාගමනය සම්බන්ධ ප්‍රධාන ගැටළුවක් වනුයේ විකල්ප මාර්ග නොමැති කමයි. දැනට පවතින විකල්ප මාර්ග වල සම්බන්ධතවයක් නොමැති වීම, සංවර්ධනය වී නොතිබීම සහ ධාරිතාවය අවම වීම වැනි ගැටලු නිසාවෙන් නගරය මග හැර යාමට අපහසු තත්වයක් උදා වී ඇත. අනාගතයේදී සංවර්ධන ප්‍රවණතාවය මත අනවශ්‍ය තදබදයක් නගරය තුළ නිර්මාණය වීමට හැකියාව පවතී. මෙම ගැටලුව විසදීම අරමුණු කර ගනිමින් විකල්ප මාර්ගයක් හදුන්වා දීමට යෝජිත අතර එම මාර්ගය දෙල්ගමුව සිට පාතගම හරහා මලව හන්දිය තෙක් ගමන් කෙරේ. එසේම හදුනා ගන්නා ලද මාර්ග කිහිපයක් මෙම නගර සැලසුම තුළින් පුළුල් කිරීමට ද යෝජිතය.

උපායමාර්ගය 1

මාර්ග සංවර්ධනය විධිමත් කිරීම තුළින් නගර මධ්‍යයේ පවතින වාහන තදබදය අවම කර සේවා අවශ්‍යතා ලබා ගැනීමට පැමිණෙන ජනතාවට පහසුකම් සැලසීම.

උපායමාර්ගය 2

හදුනාගත් මාර්ගවල මංතීරු පුළුල් කර පහසුකම් සැපයීම මගින් සැලසුම් ප්‍රදේශය තුළ සම්බන්ධතාවය වර්ධනය කිරීම.

උපක්‍රම 1.1

1. නව මාර්ග ඉදි කිරීම - දෙල්ගමුව සිට පාතගම හරහා මලව හන්දිය දක්වා දිවෙන නව විකල්ප මාර්ගයක් ඉදි කිරීම

උපක්‍රම 1.2

1. පවතින මාර්ග පුළුල් කර සංවර්ධනය කිරීම
    1. ලෙල්ලගොඩ පාර
    2. කුරුවිට - කදන්ගොඩ පාර
    3. කුරුවිට - පාතගම පාර
    4. පැරඩයිස් පාර
    5. කුරුවිට - එරත්න පාර
    6. කඹුරුව පාර
    7. උඩකඩ පාර
    8. දෙවිපහල පාර
    9. තැඹිලියෙන පාර

සිතියම් අංක 6.9 : මාර්ග පද්ධතිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

සිතියම් අංක 6.10 : සංවර්ධනය කිරීමට හඳුනා ගත් මාර්ග



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.3.2.2 ජල සම්පාදන සැලැස්ම

කුරුවිට සැලසුම් ප්‍රදේශය කුරු ගග ප්‍රධාන කර ගත් කුඩා නගර ජල සම්පාදන ක්‍රමයකින් ජල සැපයීමේ කටයුතු සපුරා ගනී. නගර මධ්‍යයේ සිට දුරස්ථ ප්‍රදේශ වලට ප්‍රජා ජල ව්‍යාපෘති හා ගංගා, ඇළ මාර්ග වලින් ජල පහසුකම සැපයේ. කුඩා නගර ජල සම්පාදන ක්‍රමය තුළින් වර්තමාන ජනගහනයෙන් 50% කට ජලය සපයන අතර ඒ අනුව ජල හිගය ද 50% ක් වේ. කෙසේ නමුත් අනාගත නේවාසික ජනගහනයට සරිලන ජල අවශ්‍යතාවය ලීටර 3,447,360 ක් ලෙසද දෛනික මගී ජනතාවගේ ජල අවශ්‍යතාවය ලීටර 396,000 ක් ලෙසද ගණනය කල හැකිය. එසේම අනාගතදී ප්‍රදේශයට පැමිණෙන සංචාරකයන් ප්‍රමාණයට ලීටර 15,840 ක ජල අවශ්‍යතාවයක්ද සපුරාලීමට සිදු වනු ඇත. ඒ අනුව අනාගත මුළු ජල ඉල්ලුම ලීටර 3,859,200 ක් පමණ වන බවට ඇස්තමේන්තු කල හැක.

වගු අංක 6.4 : ජල අවශ්‍යතාවය

2022	ප්‍රමාණය	ජල අවශ්‍යතාවය ලීටර	ප්‍රමාණය	ජල අවශ්‍යතාවය ලීටර
නේවාසික ජනගහනය	29,610	2,664,900	38,304	3,447,360
දෛනික මගී ජනතාව	22,000	396,000	22,000	396,000
සංචාරකයන්	800	19,440	800	15,840
මුළු ජල අවශ්‍යතාවය		30,80,340		3,859,200

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

උපාය මාර්ගය 1

පුරෝකථනය කරන ලද පදිංචිකරුවන්ට සහ දෛනික ගමනාගමන ජනගහනයට අඛණ්ඩ ජල සැපයුම, ප්‍රමාණවත් ධාරිතාව සහ ගුණාත්මකභාවය සහතික කිරීම.

උපාය මාර්ගය 2

ගුණාත්මක කුඩා ජල මූලාශ්‍ර යොදා ගනිමින් නව ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

දැනට පවතින ජල සැපයුම ප්‍රමාණවත් නොවන නිසා කුඩා නගර ජල ව්‍යාපෘති , ප්‍රජා ජල ව්‍යාපෘති සහ විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් වසර 2033 වන විට අපේක්ෂිත ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට නියමිතය . විශේෂයෙන්ම විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් මුළු සංවර්ධන ප්‍රදේශයම වසර 2025 වන විට ආවරණය වන පරිදි ජල සැපයුම ලබා දීමට නියමිතය.

ඉහළ යන ජල ඉල්ලුම සඳහා පහත නිර්දේශයන් හඳුනා ගෙන ඇත .

- කුඩා නගර ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් ගැලුම් 50,000 ක නව ජල ටැංකියක් ඉදි කර නගර මධ්‍යට ආසන්න ප්‍රදේශ වලට ජල පහසුකම සැපයීම

- මිල්ලවිටිය, නඩුකාරදෙණිය, වළදූර, කොස්ගොඩ, කාහේන්ගම ආදී ගම්බද ප්‍රදේශ වල ජල අවශ්‍යතාවය සැපිරීමට ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති හඳුනා ගැනීම
- විසල් රත්නපුර ජල සැපයුම් ව්‍යාපෘතිය මගින් මුළු නාගරික බල ප්‍රදේශයම ආවරණය කිරීම

සිතියම් අංක 6.11 : යෝජිත ජල සැපයුම් පද්ධතියෙන් ආවරණය වන කලාපය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.3.2.3 විදුලිබල සැපයුම් සැලැස්ම

නාගරික කටයුතු විධිමත්ව සහ පසුවෙන් කරගෙන යාම සඳහා අඛණ්ඩ විදුලි සැපයුමක් අනිවාර්යය වේ. විදුලිබල මණ්ඩල තොරතුරු වලට අනුව ප්‍රද්ශයේ විදුලිය සහිත නිවාස ප්‍රමාණය මුළු නිවාස ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් 95% කි. එසේම වැඩිම විදුලි පරිභෝජනය නේවාසික අවශ්‍යතා සඳහා වන අතර නේවාසික අවශ්‍යතා වලට පසුව වාණිජ කටයුතු සඳහා වැඩම විදුලි පරිභෝජනයක් නාගරික බල ප්‍රදේශය තුළ විදුලිය භාවිතයේදී හදුනා ගත හැකි බව විදුලිබල මණ්ඩලය 2019 දත්ත වල දක්වා ඇත.

වගු අංක 6.5: විදුලි පරිභෝජනය

භාවිතය	ප්‍රමාණය	ප්‍රතිශතය
විදුලිය සහිත නිවාස	4953	95.7%
විදුලිය රහිත නිවාස	223	4.3%
එකතුව	5176	100%

මූලාශ්‍රය : ලංකා විදුලිබල මණ්ඩලය (2019)

කෙසේ නමුත් දැනට පවතින විදුලිබල සැපයුම ප්‍රදේශයේ අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමාණවත් බව හදුනා ගන්නා ලදී. ඒ අනුව විදුලිබල මණ්ඩලයේ පර්යේෂණ දත්ත සහ නිර්දේශයන්ට අනුකූලව ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී හා ව්‍යපෘති සිදු කිරීමේදී අධිබලැති විදුලි රැහැන් ස්ථාපනය පිලිබඳව නගර සැලසුම මගින් දක්වා ඇත.

සිතියම් අංක 6.12 : පවත්නා විදුලිබල සැපයුම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.3.2.4 මලාපවහන හා අපජල කළමනාකරණ සැලැස්ම

6.3.2.4.1. ජලාපවාහනය සහ කාණු පද්ධතිය

අපද්‍රව්‍ය මුසු ජලය එකතු කිරීම හා බැහැර කිරීම සඳහා ජලාපවහන උමං හෙවත් කානු පද්ධති නිර්මාණය කෙරේ . එහිදී ප්‍රධාන වශයෙන් වැසි ජලය කළමනාකරණයට සහ අපජලය කළමනාකරණය සඳහා කාණු යොදා ගැනේ .

රූප සටහන් අංක 6.13 : නාගරික ප්‍රදේශ වල බැහැර වන ජල කළමනාකරණය - කාණු පද්ධතිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

කුරුවිට සැලසුම් ප්‍රදේශයේ අප ජලය කළමනාකරණය යන අංශය කොටස් කිහිපයක් අනුව සැලසුම් කල හැකිය.

- නගර මධ්‍ය අප ජල කළමනාකරණය
- සංචාරක ප්‍රවර්ධන කලාපය ආශ්‍රිතව අප ජල කළමනාකරණය
- කර්මාන්තපුරය ආශ්‍රිතව අප ජල කළමනාකරණය

නගර මධ්‍ය අප ජල කළමනාකරණය පිලිබඳව අවධානය යොමු කිරීමේදී අනවසර අප ජල බැහැරකිරීම් සහ සම්බන්ධතා නිසාවෙන් කුරු ගඟ, වලදුර ඇළ ආදී ජල මූලාශ්‍ර අපවිත්‍ර වී ඇත. ඒ අනුව නාගරික ප්‍රදේශයෙන් බැහැර වන අප ජලය පිරිපහදු කොට බැහැර කිරීම සඳහා කුඩා ජාලයක් සහිත ප්‍රාථමික පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයක අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී. ඒ අනුව කුරු ගඟ පාලම අසල බටහිර කෝණයට වන්නට සුදුසු ස්ථානයක් හඳුනා ගන්නා ලදී. එසේම හඳුනා ගත් සංචාරක ප්‍රවර්ධන කලාපය ආශ්‍රිතවද නගර මධ්‍යයේ මෙන්ම කුඩා ජාලයක් සමග පිරිපහදු මධ්‍යස්ථානයක් පිහිටුවීමට හඳුනා ගන්නා ලදී. අනාගතයේදී සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ඇති වෙතයි බලාපොරොත්තු වන ක්‍රියාකාරකම් හේතුවෙන් ප්‍රදේශයේ අප ජල බැහැර කිරීම ඉහළ යනු ඇති අතර එය කළමනාකරණය කරමින් පරිසරයට වන හානිය අවම කිරීම මෙහි බලාපොරොත්තුවයි.

කුරුවිට සැලසුම් ප්‍රදේශයේ වැදගත් පිහිටීමක් ලෙස හඳුනා ගත හැකි නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය ආශ්‍රිතව ද අප ජල කළමනාකරණය කිරීමේ දී ගෘහාශ්‍රිත අප ජලය කළමනාකරණය කිරීම සඳහා අපජල ටැංකි (Septic Tanks) වැනි ක්‍රමවේද ප්‍රාථමික වශයෙන්

ද කාර්මික අප ජලය කළමනාකරණය කිරීමට කර්මාන්ත අනුව තනි තනි වශයෙන් පිරිපහදු ඒකක ස්ථාපිත කිරීමට නිර්දේශ කල හැකිය.

වැසි ජලය පිලිබඳව සලකා බැලීමේදී ප්‍රාදේශීයව ගත් කල දැඩි ගංවතුර තත්වයක් පසුගිය වසර 30 කට ආසන්න කාලය තුලදී වාර්තා වී නොමැති අතර සැලසුම් ප්‍රදේශය භූ ගෝලීය වශයෙන් ගත් කල ක්‍රම ක්‍රමයෙන් බටහිර දෙසට ආනතියක් පෙන්නුම් කරන නිසාවෙන් ස්වභාවික ජල බැස්ම හඳුනා ගත හැකිය. මේ තත්වය මත ස්වභාවික මාර්ගයන් ඔස්සේ වැසි ජලය බැස යාම සිදු වන අතර ප්‍රධාන වැසි ජල වාහකයා වන්නේ කුරු ගංගාව වන අතර ප්‍රදේශය පුරා විහිදුනු උප ජලවහන කාණු සහ ඇළ පෝෂක මාර්ගයන් ද හඳුනා ගත හැකිය.

මේ වන විට කුරුවිට නගරය තුළ වැසි ජලය බැස යාම සඳහා ක්‍රමවත් කාණු පද්ධතියක් නොමැති අතර කුරුවිට නගර මාධ්‍යය කේන්ද්‍ර කොටගෙන කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගය දෙපස පමණක් සිමෙන්ති කාණු පද්ධතියක් වැසි ජලය බැස යාම සඳහා ඉදි කර ඇත.

වගු අංක 6.6: වැසිදිය බැසයන කාණු පද්ධතිය

කාණු වර්ගය	දිග (කි.මී.)	ප්‍රතිශතය%
සිමෙන්ති/ කොන්ක්‍රීට් කාණු	10	20
පස් කාණු	5	10
කාණු නොමැති	35	70
එකතුව	50	100

මූලාශ්‍රය : කුරුවිට ප්‍රාදේශීය සභාව (2020)

දැනට නාගරික ප්‍රදේශය තුළ කාණු වලින් 20% ක් කොන්ක්‍රීට් කර ඇති අතර කාණු නොමැති ප්‍රමාණය 70% ක් ලෙස කුරුවිට ප්‍රාදේශීය සභා දත්ත අනුව හඳුනා ගත හැකිය.

මෙම ගැටළු තත්වය මත ප්‍රදේශයේ කාණු පද්ධතියේ ධාරිතාවය අවම බව පෙනී ගියද ජල අවශෝෂණය ඉතා ඉහළ බව හඳුනා ගත හැකිය. මන්ද යත් ප්‍රදේශය පුරා විහිදී ඇති බොහොමයක් කාණු භෞමික ඒවා වේ. එය ගලා යන ජලය කළමනාකරණය කර ගැනීමට ප්‍රමාණවත් වේ.

ඉහත ගැටලුකාරී තත්වයන් මග හරිමින් විධිමත් ලෙස වැසි ජලය බැස යාම සඳහා කාණු පද්ධතියක් නගර මධ්‍යයේ මාර්ගය දෙපස ඉදි කිරීම සහ නඩත්තු කිරීම අත්‍යාවශ්‍ය වේ .එසේම නගර සංවර්ධන සැලැස්ම තුළ හඳුනා ගන්නා ලද නාගරික කලාප සඳහා පිරිපහදු කිරීමේ ස්ථානයන් හඳුන්වා දීම මගින් ජල මූලාශ්‍ර වලට අපවිත්‍ර ජලය එකතු වීමෙන් සිදුවන පාරිසරික ගැටලු මග හරවා ගත හැක .

උපාය මර්ගය 1

හඳුනාගත් සංවර්ධන තිව්‍රතාවය ඉහළ නගර මධ්‍ය සහ සංචාරක ක්‍රියාකාරකම් බහුල ප්‍රදේශය තුළ ජල දූෂණය අවම කිරීම හා සහතික කිරීම

උපාය මර්ගය 2

නගර මධ්‍ය ප්‍රදේශයේ වැසි ජල අපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම සහ වැසි ජලය ගලා බැසීම සඳහා ස්වභාවික ජල බැස්ම කළමනාකරණය කිරීම

උපක්‍රම 2.1

කුරුවිට නගර මධ්‍යයේ සහ සංචාරක කලාපයේ අපජල කළමනාකරණය සඳහා කුඩා අපජල ප්‍රවාහන පද්ධතියක් සහ ප්‍රාථමික පිරිපහදු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.

රූප සටහන් අංක 6.14 : යෝජිත පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානය - නගර මධ්‍ය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.3.2.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

නාගරික බල ප්‍රදේශයේ දිනකට එකතු වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් තුනකි. එම අපද්‍රව්‍ය වලින් නොදිරන අපද්‍රව්‍ය මූලිකවම ප්‍රාදේශීය සභාව විසින් එකතු කරන අතර දිර්ඝකාලින ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන බන්ධනාගාර කොම්පෝස්ට් ව්‍යාපෘතිය මගින් කාබනික පොහොර සකසනු ලැබේ. ප්‍රදේශයේ කැලිකසල කළමනාකරණය සම්බන්ධයෙන් කුරුවිට ප්‍රාදේශීය සභාව, මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය සහ බන්ධනාගාරය මූලික ව කටයුතු කරයි.

කුරුවිට නගර සංවර්ධන සැලැස්මේ අරමුණු වලට අනුකූලව අනාගතයේදී ආකර්ෂණය කර ගැනීමට බලාපොරොත්තුවන නේවාසිකයන් සහ පහසුකම් වල වැඩිවීමත් සමග ඉහළ යන දෛනික කසල බැහැර කිරීම් වලට විසඳුමක් ලෙස පවතින බැහැර කිරීමේ ස්ථාන වලට අමතරව පොහොරබාව ප්‍රදේශයේ ස්ථානයක් හඳුනා ගන්නා ලදී. මෙම හඳුනා ගන්නා ලද ස්ථානය කුරුවිට නගරයේ සිට කි.මී. 17 ක් පමණ දුරකින් පිහිටා තිබෙන අතර කැළිකසල බැහැර කිරීමේ ස්ථානය සැලසුම් ප්‍රදේශයෙන් පිටත ස්ථානගත කර ඇත. සැලසුම් ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශයක් මේ සඳහා හඳුනා ගන්නා ලද්දේ කැළිකසල බැහැර කිරීමේ ක්‍රියාවලියට සුදුසු ඉඩකඩ සහිත, පාරිසරික මෙන්ම නේවාසිකයන් ට වන බලපෑම් අවම ප්‍රදේශයක් සැලසුම් ප්‍රදේශය තුළ හඳුනා ගැනීමට නොමැති නිසාවෙනි. මීට අමතරව සැලසුම් ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තුළින්,

- අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම
- සම්පත් ප්‍රතිසාධනය උපරිම කිරීම
- දිරාපත් නොවන සියලුම අපද්‍රව්‍ය පිරිපහදු කිරීම සඳහා පරිසර හිතකාමී, ආර්ථික වශයෙන් ශක්‍යතාවයෙන් යුත් සුදුසු අපද්‍රව්‍ය පිරිපහදු තාක්ෂණයන් සඳහා පහසුකම් සැලසීම
- ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් ඇති කිරීම ආදිය ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

උපායමාර්ගය 1

නාගරික ප්‍රදේශය තුළ දිරාපත් නොවන අපද්‍රව්‍ය විධිමත් ලෙස එකතු කිරීම, කළමනාකරණය කිරීම සහ බැහැර කිරීම

උපායමාර්ගය 2

සියළු කෙටිකාලීනව දිරායන අපද්‍රව්‍ය කොම්පෝස්ට් පොහොර බවට පරිවර්තනය කිරීම ප්‍රවර්ධනය කිරීම සහ නගර මධ්‍යයෙන් බැහැර ප්‍රදේශ වල තිරසාර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සහතික කිරීම සඳහා ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීම

උපායමාර්ගය 3

නගර මධ්‍යයේ සහ අනෙකුත් වැඩි නාගරිකරණයක් සහිත ප්‍රදේශවල අපද්‍රව්‍ය එකතු කිරීම සහ ප්‍රවාහනය වැඩිදියුණු කිරීම

උපක්‍රම 1.1

1. කසළ බැහැර කිරීම සඳහා ස්ථානයක් හඳුනා ගැනීම - පොහොරබාව ප්‍රදේශය

සිතියම් අංක 6.13 : කසළ බැහැර කිරීම සඳහා හඳුනා ගන්නා ලද ස්ථානය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.4 ආර්ථික සංවර්ධන උපායමාර්ග

ආර්ථික සංවර්ධන උපායමාර්ග

කුරුවිට සංවර්ධන ප්‍රදේශයේ ආර්ථිකය මූලික වශයෙන්ම සැකසී ඇත්තේ කුරුවිට නගරය පාදක කොට ගෙනයි. නගරයේ ආර්ථික තත්වය මූලික වශයෙන් කෘෂිකර්මාන්තය, සංචාරක කර්මාන්තය, මැණික් කර්මාන්තය, තොග සහ සිල්ලර වෙළදාම, කර්මාන්ත, බැංකු සහ මූල්‍ය කටයුතු මත පදනම් වේ. මාර්ග ජාලය සහ මංසන්ධි මගින් මෙම ආර්ථික කටයුතු නගරයේ මෙන්ම නගරයෙන් පිටත සිටින නේවාසිකයන්, ව්‍යාපාරිකයන් සහ සංසරණය වන ජනතාව වෙත බෙදා හැරේ. ඒ තුලින් කුරුවිට නගරයටම අවේනික වූ ආර්ථික ක්‍රියාකාරකම් රාමුවක් නිර්මාණය වී තිබීම විශේෂ වේ. (වැඩි විස්තර සඳහා පරිච්ඡේද 3 හා 5 වෙත යොමු වන්න)

රූප සටහන් අංක 6.15 : කුරුවිට නගරයේ ආර්ථික ව්‍යුහය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

සිතියම් අංක 6.14 : වාණිජ කටයුතු වල ව්‍යාප්තිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

නගරය තුළ සහ අවට වාසය කරන මිනිසුන් සතු පාරිසරික, සංස්කෘතික සහ සාමාජික අනන්‍යතාවයන් ආර්ථිකමය ශක්‍යතාවයන් බවට හරවා ඒ තුලින් ප්‍රතිලාභ සමස්ත ප්‍රදේශයට ළගා කර දීම සංවර්ධන සැලැස්මේ උපාය මාර්ග තුළින් අපේක්ෂිතය.

නගරයේ ආර්ථිකයෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් මූලික කොටස් තුනකි. එනම් නේවාසිකයන්, ව්‍යාපාරිකයන් සහ සංසරණය වන ජනතාව ලෙසය. එසේම දේශීය මෙන්ම විදේශීය වශයෙන් ප්‍රදේශයට පැමිණෙන සංචාරකයන් ද ආර්ථිකයෙන් ප්‍රතිලාභ ලබන කොටසක් ලෙස හඳුනා ගත හැක. ඒ අනුව 2033 වසරට අදාල සංවර්ධන සැලැස්ම හරහා ඉහත සඳහන් සිව් පාර්ශවයන්ට පහසුකම් සැලසෙන ආර්ථිකමය පරිසරයක් නිර්මාණය කෙරෙනු ඇති අතර ආර්ථික සංවර්ධන උපායමාර්ග යටතේ කුරුවිට නගරයේ ආර්ථිකය අංශ තුනක් යටතේ සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

උපායමාර්ගය 1

මැණික් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

සංවර්ධන සැලැස්මේ එක් අභිලාශයක් වන ආර්ථික සංවර්ධනයෙහිලා සැලකිය යුතු පරිමාවකින් මැණික් කර්මාන්තය දායක වේ. දැනට සුළු පරිමාණයෙන් වුවද ප්‍රාදේශීයව සිදු වන මෙම කර්මාන්තය සඳහා පහසුකම් සැලසීම තුලින් එම කර්මාන්තය වර්ධනය කිරීම බලාපොරොත්තු වේ. රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් පතල් කැනීම් ප්‍රමාණය පිලිබඳව සලකා බැලීමේදී පැල්මඩුල්ල - කහවත්ත ප්‍රදේශය හරුනු කොට 15% ක් ලෙස මීළගට වැඩිම පතල් කැනීම් ප්‍රමාණයක් වාර්තා වනුයේ කුරුවිට ප්‍රදේශයෙනි. ප්‍රදේශයේ ජනතාවගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පතල් කටයුතු වල රැකියාව වශයෙන් නිරත වේ. මැණික් වෙලදාම් කටයුතු නගරය තුල විශාල වශයෙන් සිදු නොවුනද දිස්ත්‍රික්කයේ මැණික් කර්මාන්තයට ලැබෙන දායකත්වය මත මෙම කර්මාන්තය වර්ධනය කිරීම ප්‍රදේශයේ ආර්ථිකයට වැදගත් වේ. ඒ අනුව මැණික් කර්මාන්තයට අදාල භෞතික පහසුකම් මෙන්ම මැණික් වෙලදාම් කටයුතු සඳහා ආකර්ශනීය පරිසරයක් නිර්මාණය කිරීමට සංවර්ධන සැලැස්ම හරහා සැලසුම් කර ඇත.

උපායමාර්ගය 1.1

කලාපිකරණය තුළින් හඳුනාගත් විශේෂතා අනුව ප්‍රදේශයේ මැණික් කැනීම් කටයුතු විධිමත් කිරීම සඳහා රෙගුලාසි හඳුන්වා දීම.

උපායමාර්ගය 1.2

කුරුවිට නගර මධ්‍ය පවත්නා විවෘත මැණික් වෙළෙඳ ප්‍රදේශ සඳහා ප්‍රමාණවත් ඉඩක් ලබා දෙමින් වෙළෙඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම.

06 වන පරිච්ඡේදය සැලැස්ම

උපක්‍රම 1.1

බෝධීන් වහන්සේ අසල මැණික් වෙළෙඳ කටයුතු සඳහා අවකාශයක් නිර්මාණය කරමින් ආසන පහසුකම් ඉදිකිරීම

දැනට මැණික් වෙළඳ කටයුතු සිදු කරනුයේ කුරුවිට නගර මධ්‍යයේ පිහිටා ඇති බෝධීන් වහන්සේ අසලය. එම ස්ථානයට මැණික් වෙළඳ ප්‍රජාව එක රැස් වී වෙළඳ කටයුතු සිදු කලද රැස්වන පිරිසට අවශ්‍ය පහසුකම් නොමැති බව අධ්‍යනය කරන ලදී. එබැවින් බෝධීන් වහන්සේ අසල පැරණි දුම්රිය දෙපාර්තමේන්තු ගබඩා ගොඩනැගිල්ල සහ ප්‍රතිසංස්කරණය කරන ලද පැරණි කුරුවිට දුම්රියපල ගොඩනැගිල්ල අතර පර්චස් 10ක් පමණ වූ අවකාශය ආසන පහසුකම් සහිත විවෘත මැණික් වෙළඳ ස්ථානයක් බවට පත් කිරීමට යෝජිතය. එසේම මැණික් වෙළඳාම් සිදු නොවන අවස්ථා වලදී මහජනතාවට එය ගිමන් නිවන ස්ථානයක් හෝ රැඳී සිටීමේ ස්ථානයක් ලෙස ද භාවිතයට ගත හැකි වනු ඇත.

උපාය මාර්ගය 2

සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම

කුරුවිට නගර සංවර්ධන සැලැස්මේ දෙවන අරමුණ වන්නේ මිණිපුර සංචාරක කලාපය තුළ ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් බවට කුරුවිට ප්‍රදේශය පත් කිරීමයි. එහිදී කුරුවිට නගරය තුළ පැය 2 සිට 8 ක් වැනි කාල පරාසයක් රැඳී සිටිමින් සංචාරක කටයුතු මෙන්ම අනෙකුත් සේවා පහසුකම් සපුරා ගැනීමට සුදුසු පරිසරයක් සැකසීම තුලින් ආර්ථිකයට ඉහල දායකත්වයක් ලබා ගැනීම මෙහි ප්‍රධාන අරමුණයි . බෝපත් ඇල්ල, කුරු ගග, සිරිපා අඩවිය ආදී වූ ජලාශ්‍රිත, පාරිසරික නැවුම් අත්දැකීම් රැසක් අත්විදිය හැකි ප්‍රදේශයක් ලෙසත් ආගමික හා ඓතිහාසික ස්ථාන හා බැදුණු අත්දැකීම් ද වින්දනය කල හැකි ප්‍රදේශයක් ලෙසත් සංචාරකයන් අතර තව දුරටත් ප්‍රකට කිරීම සහ ඒ හරහා ආර්ථිකයට ධනාත්මක බලපෑමක් ඇති කිරීම ට මෙමගින් බලාපොරොත්තු වේ. 2033 වසර වන විට ආකර්ශනීය සංචාරක සේවා මධ්‍යස්ථානයක් බවට කුරුවිට ප්‍රදේශය පත් කිරීම තුළින් වසරකට සංචාරකයන් 300,000 ක් පමණ පිරිසක් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම සංචාරක කර්මාන්තය ආශ්‍රිතව බිහි වන ඍජු හා වක්‍ර රැකියා ප්‍රමාණය හේතුවෙන් නාගරිකයන් ගේ ආර්ථිකය වැඩි දියුණු කිරීම මෙමෙගින් ළඟාකර ගැනීමට අපේක්ෂිත වක්‍ර අරමුණකි. එසේම සංචාරක කටයුතු වර්ධනය අරමුණු කොටගෙන සිදුවන පරිවර්තනයන් නිසාවෙන් සංචාරකයන්ට මෙන්ම නගර වැසියන්ටද කුරුවිට ආකර්ෂණිය ප්‍රදේශයක් බවට පත් වනවා සේම දිවා රාත්‍රී වශයෙන් වැඩි වන ක්‍රියාකාරකම් නිසාවෙන් ආරක්ෂිත, සුවපහසු මෙන්ම සජීවී පරිසරයක් නිර්මාණය වනු ඇත.

උපාය මාර්ගය 2.1

බෝපත් ඇල්ල හා අවට ප්‍රදේශය සංචාරක ප්‍රවර්ධන කලාපයක් ලෙස වෙන්කර සංචාරක සේවා පහසුකම් වැඩිදියුණු කිරීම මගින් සංචාරක ආකර්ෂණය වර්ධනය කිරීම.

මෙහිදී දේශීය හා විදේශීය වශයෙන් සංචාරක ආකර්ෂණය පවතින බෝපත් ඇල්ල හා අවට ස්වභාවික පරිසරය සංචාරක කටයුතු සඳහාම වෙන් කරන ලද කලාපයක් ලෙස හඳුනා ගෙන

එම කටයුතු සඳහා පහසුකම් සලසමින් නගර ආර්ථිකයට සෘජු සහ වක්‍ර ප්‍රතිලාභ ලබා කර ගැනීමට බලාපොරොත්තු වේ. මෙහිදී ප්‍රධාන වශයෙන් කලාපිකරණ සැලැස්ම තුළ අදාළ ප්‍රදේශය අඩු ඝනත්ව සංචාරක කලාපය ලෙස නම් කරන ලද අතර කලාපයට අවේණික ලක්ෂණ සහ පරිසරය පිළිබඳව සලකා බලා විශේෂ නියමතා මෙන්ම යෝජිත භාවිතයන් හඳුනා ගන්නා ලදී. එහිදී සංචාරකයන් හරිත සංචාරක කර්මාන්තය වෙත ආකර්ෂණය කර ගනිමින් පාරිසරික සුන්දරත්වය අත් විඳීමට මෙන්ම භෞතික, ආර්ථික හා පාරිසරික අංගයන් ප්‍රදේශය පුරා ව්‍යාප්ත කරමින් ජනතාවගේ ආර්ථික මට්ටම වැඩි දියුණු කිරීමේ ක්‍රමෝපායන් නිර්මාණය වනු ඇත. නැරඹුම් මැදිරි, ත්‍රාසජනක සංචාරක කටයුතු, කඛානා , ජලාශ්‍රිත විනෝද කටයුතු ආදී පරිසරය හා බද්ධ වූ ආර්ථිකමය ප්‍රතිලාභ සහිත අංග රැසකට ඉඩ හසර මෙම කලාපය හරහා විවෘත වේ. සංචාරකයන් සඳහා ප්‍රවේශ වීමට මාර්ග, නවාතැන්, විනෝද කටයුතු ආදී පහසුකම් මෙම කලාපයේ විශේෂ ලෙස හඳුනා ගෙන සංවර්ධනය කෙරේ.

උපක්‍රම 2.1.1

සංචාරක කටයුතු සඳහා ඉලක්කගත ස්ථානයක් ලෙස බෝපත් ඇල්ල සංවර්ධනය කිරීම

සංචාරක කටයුතු සඳහා වර්තමානයේදීද ඉහළ ආකර්ශනයක් පවතින බෝපත් ඇල්ල කේන්ද්‍ර කොටගත් ප්‍රදේශය තවදුරටත් සංවර්ධනය කරමින් නව ක්‍රියාකාරකම් හඳුන්වා දීමට සංවර්ධන සැලැස්ම තුලින් බලාපොරොත්තු වේ. එමගින් දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීම අරමුණයි. මෙහිදී,

- බෝපත් ඇල්ල වටා මංපෙතක් නිර්මාණය කිරීම
- ජලය පදනම් කරගත් ක්‍රියාකාරකම් හඳුන්වා දීම
- බෝපත් ඇල්ල සහ නගර මධ්‍ය අතර බෝට්ටු සේවාවක් හඳුන්වා දීම
- බෝපත් ඇල්ල පරිශ්‍රයේ සිහිවටන වෙළඳසැල් හඳුන්වාදීම
- බෝපත් ඇල්ල පරිශ්‍රයේ ළමා උද්‍යානයක් පිහිටුවීම
- අබාධිත පුද්ගලයන් හට ප්‍රවේශයක් හඳුන්වා දීම
- අඩු පිරිවැයක් යොදවන තනිව සංචාරයේ යෙදෙන සංචාරකයන් කොටස් (Backpackers) ඉලක්ක කර ගනිමින් මැණික් කැණීම් කටයුතු හා සම්බන්ධ ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරය හඳුන්වා දීම
- NAITA වෙතින් ප්‍රජා සංචාරක ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන හඳුන්වා දීම
- හොඳින් නඩත්තු කරන ලද කුලී රථ සේවාවක් ස්ථාපිත කිරීම සඳහා පුද්ගලයින් සහ ත්‍රිරෝද රථ රියදුරන් සඳහා NAITA වෙතින් සංචාරක මාර්ගෝපදේශ පුහුණු වැඩසටහනක් හඳුන්වා දීම. ආදිය හඳුන්වාදීමට යෝජිතය.

රූප සටහන් අංක 6.16 : සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි, 2019

උපක්‍රම 2.1.2

කුරු ගංගාව ඔස්සේ බෝපත් ඇල්ල සහ කුරුවිට නගරය අතර සංචාරක ගමන්මගක් ආරම්භ කිරීම

ප්‍රධාන සංචාරක ආකර්ෂණය ලෙස බෝපත් ඇල්ල සහ සංවර්ධන ප්‍රදේශයේ ප්‍රධාන නගරය වන කුරුවිට නගරය යා කරමින් සංචාරක ගමන් මගක් ආරම්භ කිරීම සංචාරකයන්ට නැවුම් අත්දැකීම් රාශියක් ලඟා කර දෙනු ඇත. මේ සඳහා හදුනා ගන්නා ලද මාර්ගය කුරු ගඟ දිගේ කි. මී. 3.5 ක් පමණ වේ. කුරු ගංගාව ඔස්සේ හදුනා ගන්නා ලද සංචාරක ගමන් මාර්ගය පාදක කොට ගෙන බෝට්ටු සේවා, පාවෙන අවන්හල්, සම්ප්‍රදායික උණ ලී පාරු ගමන් අවස්ථා ආදී නවමු අත්දැකීම් රැසක් අත් විදීමට හැකි වනු ඇත. මෙමගින් සංචාරක ආකර්ෂණය වැඩි කොට ආර්ථික ප්‍රතිලාභ වැඩි කිරීම ඍජු අරමුණක් වන අතර රැකියා අවස්ථා උත්පාදනය වක්‍ර ප්‍රතිලාභයක් වනු ඇත.

රූප සටහන් අංක 6.17 : යෝජිත සංචාරක ගමන් මාර්ගය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

උපක්‍රම 2.1.3

බෝපත් ඇල්ල ආරම්භක ස්ථානය නැරඹීම සඳහා නැරඹුම් මැදිරියක් ඉදි කිරීම

බෝපත් ඇල්ල ආරම්භක ස්ථානය මේ වන විට ප්‍රචලිතව ඇත්තේ බෝපත් ඇල්ල අවට වාසය කරන පිරිස අතර පමණක් වන අතර එම ස්ථානයට ලඟා වීම දැනට දුෂ්කර කටයුත්තක් වේ. දර්ශනීය ස්වභාවික පරිසරය සහ බෝපත් ඇල්ල වඩාත් සමීපව වින්දනය කිරීමටත් දිඟු පාගමන් වාර සහිතව නව අත්දැකීමක් ලෙසත් මෙය හඳුනා ගත හැකිය. සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේ උපායමාර්ගයන් යටතේ බෝපත් ඇල්ල ප්‍රධානතම ඉලක්ක ස්ථානයක් වේ. සංවර්ධන සැලැස්මේ ආර්ථික අභිලාෂයන් සාර්ථක කර ගැනීමේ දී හඳුනා ගත් මෙම උපක්‍රමය දෙස් විදෙස් සංචාරකයන් බෝපත් ඇල්ල ආශ්‍රිත සංචාරක කලාපයට ආකර්ෂණය කොට ප්‍රදේශයට ආර්ථික ප්‍රතිලාභ වැඩි වශයෙන් ළඟා කරවීමට යෝජිතය. දැනට නිශ්චිත මාර්ගයක් හඳුනා ගෙන නොමැති නිසාවෙන් බෝපත් ඇල්ල ආරම්භක ස්ථානයට ළඟා වීමට පහසු මාර්ගයක් සැලසුම් කණ්ඩායම විසින් හඳුනා ගන්නා ලදී. එය ගමනාගමනයට සුදුසු මාර්ගයක් බවට පත් කොට බෝපත් ඇල්ල ආරම්භක ස්ථානයට මංපෙතක් හරහා ළඟා වීමට පහසුකම් සැලසීමට යෝජිතය.

රූප සටහන් අංක 6.18 : යෝජිත නැරඹුම් මැදිරිය

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි, 2022

උපාය මාර්ගය 2.2

නාගරික අනන්‍යතාවය ඉස්මතු කරමින් නගර මධ්‍ය අලංකරණය සහ සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් නගර ආර්ථිකය ශක්තිමත් කිරීම.

සැලසුම් ප්‍රදේශයේ හදවත බඳු වූ කුරුවිට නගර මධ්‍යයේ සංචාරකයන් ආකර්ෂණය කර ගනිමින් ඔවුන් සැලකිය යුතු කාල පරාසයක් රඳවා ගනිමින් ඔවුන්ගේ සේවා අවශ්‍යතාවයන් සපුරා ලීමටත් , ඔවුන් ප්‍රදේශයේ සංචාරක විභාවතාවයන් පිළිබඳව දැනුවත් කිරීමටත්, ඔවුන් ගමන් කරන ගමනාන්තයට ලඟා වන තෙක් ඔවුන්ගේ උවමනාවන් සන්තර්පණය කොට ඊලග ගමනාන්තය තෙක් සූදානම් කිරීමටත් සුදුසු වන ආකර්ශනීය අවකාශ කිහිපයක් නගර මධ්‍යයේ හඳුනා ගන්නා ලදී. එහිදී සංචාරකයන් දැනුවත් කිරීමට සංචාරක හෝ පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයක්, ගිමන් නිවමින් රැඳී සිටීමට නගර චතුරශ්‍රය මෙන්ම ආපනශාලා අවන්හල් සහිත සංචාරක වෙළඳ කුටි පවතින නැවත සංවර්ධනය කරන ලද දුම්රිය ගොඩනැගිල්ල ආදී භෞතික සංවර්ධනයන් හමු වනු ඇත. එමෙන්ම වෙනස්ම අත්දැකීමක්

ලබා ගැනීමට නම් කුරු ගඟ ආශ්‍රිතව යෝජිත සංචාරක මංපෙත හා සම්බන්ධ ක්‍රියාකාරකම් මගින් කුරු ගංගාවේ අසිරිය මෙන්ම එහි දිගුවක් ලෙස බෝපත් ඇල්ල දක්වා සංචාරකයන්ගේ සංචාරක අත්දැකීම ව්‍යාප්ත කිරීමට අවකාශය සංවර්ධන සැලැස්ම තුළින් සකසා ඇත.

උපක්‍රම 2.2.1

කුරු ගංගාව ආශ්‍රිතව සංචාරක බෝට්ටු අංගනයක් සමග බෝට්ටු සේවාවක් ආරම්භ කිරීම

දැනට කුරුවිට නගරයේ පිහිටා ඇති නාන තොටුපළ තිබෙන ස්ථානය බෝට්ටු අංගනය ලෙස සංවර්ධනය කිරීමට නගර සැලසුම තුළ හඳුනා ගන්නා ලදී. දැනට එම ස්ථානයේ අබලන් තත්වයේ පවතින ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කොට ආපනශාලා පහසුකම් සහිතව බෝට්ටු අංගනය ඉදි කිරීමට යෝජිතය. මෙයින් නගරයට ළඟා වීමට බලාපොරොත්තු වන සහ නගරයෙන් බෝපත් ඇල්ල දෙසට ගමන් කිරීමට බලාපොරොත්තු වන සංචාරක ප්‍රජාවට සේවය ලබා ගත හැකි වනු ඇත.

එසේම නගර මධ්‍ය තුළ ස්ථාපනය කරන ලද සහ ස්ථාපනය කිරීමට යෝජිත ව්‍යාපෘති හරහාද සංචාරකයන් ආකර්ෂණය කොට ආර්ථික ප්‍රතිලාභ සංවර්ධන ප්‍රදේශයට ළඟා කර දීමට බලාපොරොත්තු වේ. නාගරික සංවර්ධන අධිකාරියේ සියක් නගර ව්‍යාපෘතිය මගින් කුරුවිට පැරණි දුම්රිය ගොඩනැගිල්ල ප්‍රතිසංවර්ධනය කරන ලද අතර දුම්රියපොල ගබඩා ගොඩනැගිල්ල ද සංචාරකයන් ඉලක්ක කර විකල්ප භාවිතයන් සඳහා හඳුන්වා දීමට යෝජිතය. එම ගොඩනැගිලි තුළ වාණිජ කටයුතු සමග සංචාරකයන් පාදක කර ගත් භාණ්ඩ අලෙවිසැල්, සමුපකාර සේවා, කුඩා කෞතුකාගාරය, මැණික් සහ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ආදී භාවිතයන් ස්ථාපනයට හඳුනා ගන්නා ලදී. එසේම බෝධීන් වහන්සේ අසල මැණික් වෙළෙඳ කටයුතු සඳහා අවකාශයක් නිර්මාණය කරමින් ආසන පහසුකම් ඉදිකිරීම මෙන්ම භූමි අලංකරණ කටයුතුද සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමට උපයෝගී වනු ඇත. නාගරිකයන්ට මෙන්ම සංචාරකයන්ටද සුවපහසු, ආරක්ෂිත මෙන්ම ආකර්ෂණිය නගරයක් මේ තුළින් නිර්මාණය වන අතර එමගින් වැඩි වෙලාවක් නගරය තුළ ජනතාව සංසරණය වීමෙන් ප්‍රාදේශීය ආර්ථිකය වර්ධනය වනු ඇත.

උපායමාර්ගය 2.3

සංචාරක ස්ථාන සම්බන්ධ කරමින් ස්වභාවික මංපෙත් සහ සංස්කෘතික මංපෙත් සංවර්ධනය කිරීම

සැලසුම් ප්‍රදේශය තුළ සහ පිටත පිහිටා තිබෙන සංචාරක ස්ථාන යා කරමින් මංපෙත් සංවර්ධනය කිරීම සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමේ තවත් උපක්‍රමයකි. එහිදී සැලසුම් ප්‍රදේශය තුළ දෙල්ගමුව, කුරුවිට පැරණි දුම්රිය ස්ථානය, කටුතියඹරාව විහාරය, එක්නැලිගොඩ වලව්ව යන ස්ථාන ද බට තොට ලෙන, බට දොඹ ලෙන, වර්ණගල ඇල්ල, ශ්‍රී පාදය යන සැලසුම් ප්‍රදේශයෙන් පිටත පිහිටා ඇති ස්ථාන ද මෙම මංපෙත සඳහා අයත් වේ. දෙල්ගමුව විහාරය,කුරුවිට පැරණි දුම්රිය ස්ථානය, කටුතිඹිරියාව විහාරය, එක්නැලිගොඩ

වලව්ව යන සංචාරක ස්ථාන සංස්කෘතික මංපෙතට අයත් වන අතර එම ස්ථාන වල පවතින ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම සංචාරක ආකර්ෂණය වර්ධනය වීමට හේතු වේ. බෝපත් ඇල්ල, ශ්‍රී පාද අඩවිය, වර්ණගල ඇල්ල පාරිසරික වටිනාකම් සහිත ස්ථානද මෙම මංපෙත ට ඇතුළත් කොට මිනිසා සහ පරිසරය අතර සම්බන්ධතාවය ගොඩ නගමින් ආර්ථිකයට දායක වන අකාරයේ සැලැස්මක් හඳුන්වා දීමත් ඊට අදාළ අපරව්‍යුහ පහසුකම් සැලසීමටත් යෝජිතය.

සිතියම් අංක 6.15 : යෝජිත හා පවතින සංචාරක ස්ථාන



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

උපාය මාර්ගය 2.4

නගර ආර්ථික සංවර්ධනය සඳහා සංචාරක සම්පත් (ස්වාභාවික/ඓතිහාසික) භාවිතා කිරීම

ප්‍රදේශය පුරා විසිරි පවතින ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථාන මෙන්ම ස්වභාවික වටිනාකම ඉහළ සංචාරක ස්ථාන ප්‍රදේශයේ ආර්ථිකය නංවාලීමට දායක කර ගැනීමට ඉතා ඉහළ හැකියාවක් පවතී. දේශීය වශයෙන් ප්‍රචලිත බෝපත් ඇල්ල වැනි ස්වභාවික සංචාරක සම්පත් වර්තමානයේදී පවා කුරුවිට ප්‍රදේශයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට දායක වනු හඳුනා ගත හැකිය. එසේම දෙස් විදෙස් සංචාරකයන්ගේ මෙන්ම වන්දනාකරුවන් අතර ප්‍රචලිත ස්ථානයක් වන ශ්‍රී පාදස්ථානයට ලඟා වීමට පවතින එක් ප්‍රධාන ගමන් මාර්ගයක්ද නිර්මාණය වී ඇත්තේ කුරුවිට නගරය හරහා වීම නිසාවෙන් ශ්‍රී පාද සමයේ ඉහළ යන සංචාරක ආකර්ෂණය නගර ආර්ථිකය දියුණු කිරීමට දක්වන දායකත්වය තව දුරටත් වර්ධනය කරලීමට සංවර්ධන සැලැස්ම හරහා සැලසුම් හඳුනා ගෙන පවතී. එක්නැලිගොඩ වලව්ව, දෙල්ගමුව ආදී ඓතිහාසික වටිනාකම් සහිත ස්ථාන තවදුරටත් සංචාරකයන්ට ආකර්ශනීය ස්ථාන බවට පත් කොට එම ස්ථාන වල පවතින පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකම ආර්ථික වටිනාකමකට පෙරළා ගැනීම සංවර්ධන සැලැස්මේ ආර්ථික උපායමාර්ගයන්හි අරමුණ වේ.

උපාය මාර්ගය 3

දේශීය ආර්ථිකය ප්‍රශස්තකරණ වැඩපිළිවෙල සකස් කිරීම

කුරුවිට නගරයේ ආර්ථිකය නාගරික සීමාවට අයත් ප්‍රජාවට මෙන්ම අවට ප්‍රදේශ වල ප්‍රජාව මත පදනම්ව ඇති අතර කුරුවිට නගරය ප්‍රධාන වෙළඳ නගරය ලෙස නගරය අවට පිහිටි ගම් ප්‍රදේශ සමග සම්බන්ධ වී ඇත.එහෙයින් එම ප්‍රාදේශීය ආර්ථිකයට පහසුකම් සැපයෙන ආකාරයේ අනාගත සැලැස්මක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වන අතර හඳුනා ගත් උපායමාර්ග මගින් ප්‍රාදේශීය ආර්ථිකය සඳහා වැඩි අවකාශයක් වෙන් කොට අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් ලබා දෙමින් නව රැකියා අවස්ථා උත්පාදනය කරමින් ව්‍යාපාරික කටයුතු සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවකාශයක් නිර්මාණය කිරීමට අපේක්ෂිතය.

උපායමාර්ගය 3.1

හඳුනා ගන්නා ලද විශේෂතා අනුව (කලාපිකරණය) නාගරික කලාප වල හඳුනාගත් වාණිජ ක්‍රියාකාරකම් සහ ප්‍රවණතා සඳහා පහසුකම් සැලසීම

උපායමාර්ගය 3.2

මැණික් සහ පහතරට කෘෂිකර්මාන්තය අත්විඳීමට ප්‍රජා පාදක සංචාරක කටයුතු හඳුන්වා දීම

කුරුවිට නගරය මැණික් කැනීම් කටයුතු වලට පවතින නැඹුරුතාවය මත සංචාරකයන් ආකර්ෂණය කර ගන්නා එක් අංගයක් ලෙස එය ප්‍රචලිත කිරීමේ හැකියාව පවතින අතර මැණික් පතල් ආශ්‍රිතව සිදු කරන ක්‍රියාකාරකම් නැරඹීම සහ ප්‍රයෝගිකව සහභාගී වීමට අවස්ථාව සංචාරකයන් හට ලබා දීමෙන් දේශීය ආර්ථිකය වර්ධනය සඳහා දායක කර ගනිමට ඉඩ ප්‍රස්ථාව සැලසේ. පහතරට කෘෂිකර්මාන්තය ආශ්‍රිත වී, තේ , රබර් ආදී වගාවන් සම්බන්ධ

ක්‍රියාකාරකම් අත්විදීමට ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරය ඉවහල් වනු ඇත. ප්‍රජා පාදක සංචාරක ව්‍යාපාරය වින්දනය කිරීමට පැමිණෙන සංචාරකයන්ට අව්‍යාජ සංස්කෘතික හුවමාරුවක් අත්විදීමට අවස්ථාව ලබා දීම සිදු වේ. එසේම එය ප්‍රාදේශීය ප්‍රජාවට මෙන්ම සංචාරකයින්ට සෘජු ප්‍රතිලාභයක් ඇති දේශීයව මෙහෙයවන ව්‍යාපෘතිවලට සහාය වීම පදනම් කර ගත්තක් වන ඊට ඉලක්ක කරන කණ්ඩායම වන්නේ අඩු පිරිවැයක් යොදවන තනිව සංචාරයේ යෙදෙන සංචාරකයන් (Backpackers) වේ.

උපායමාර්ගය 3.3

ආයතන ජාලකරණය තුළින් ග්‍රාමීය ජනතාවට ආර්ථික අවස්ථා නිර්මාණය කිරීම

කුරුවිට නගරය අවට ගම්මාන වල ග්‍රාමීය ජනතාව පාදක කොටගෙන ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් දැනුම ලබා දෙන අතර බෝපත් ඇල්ල ආශ්‍රිත ගම්මාන, කර්මාන්තපුරය හා නගර මධ්‍ය අවට ගම්මාන සමග සම්බන්ධ වී ඇත. ඒ නිසාවෙන් ග්‍රාමීය ජනතාව ලබා ගත් දැනුමෙන් තම ආර්ථික කටයුතු වර්ධනය කොටගෙන එහි ප්‍රතිලාභ ව්‍යාප්ත කරනු ඇත. කුරුවිට බන්ධනාගාරය, කර්මාන්තපුරය සහ හමුදා කඳවුර විසින් නගර මධ්‍යට සේවාවන් යොමු කරමින් ග්‍රාමීය ජනතාව විසින් නිර්මාණය කරන ලද ආර්ථික අවස්ථා වල බලපෑම ප්‍රදේශය පුරා යොමු කරවීම මෙම උපක්‍රමය හරහා යෝජිතය.

රූප සටහන් අංක 6.19 : ආයතන ජාලකරණය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

උපායමාර්ගය 3.4

කලාපීය වශයෙන් හඳුනා ගත් නිෂ්පාදන සංවර්ධනය සහ අගය එකතු කළ කර්මාන්ත සමඟ නාලන්ද එල්ලාවල කර්මාන්ත කලාපය ශක්තිමත් කිරීම

නාලන්ද එල්ලාවල කර්මාන්ත කලාපය ශක්තිමත් කිරීමෙහිලා නව නිෂ්පාදන හඳුනාගෙන ඒවා ස්ථාපනය කරවීම මගින් දේශීය ආර්ථිකය ප්‍රශස්ත කිරීමට බලාපොරොත්තු වේ. මේ

සඳහා කලාපීය වශයෙන් විශේෂිතව හඳුනා ගත් නිෂ්පාදන උදා. රාගා - කිතුල් පාදක නිෂ්පාදන පෙළ ආදී අගය එකතු කරන ලද නිෂ්පාදන කර්මාන්තපුරය තුල ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වේ. ඒ තුළින් දේශීය කර්මාන්ත සහ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමත්, නව ආර්ථික වපසරියක් නිර්මාණය කිරීමත්, දේශීය ආර්ථිකය ශක්තිමත් කර ප්‍රාදේශීය ජනතාවට ප්‍රතිලාභ ලැබීමට සැලැස්වීමත් මෙහි අරමුණු වේ.

රූප සටහන් අංක 6.20 : රාගා නිෂ්පාදනය

මූලාශ්‍රය : අන්තර්ජාලය ඇසුරිනි, 2021

2019 කුරුවිට සම්පත් පැතිකඩ රැකියා පිළිබඳ දත්ත පාදක කොට ගෙන සිදු කරන ලද උපකල්පනයන් කිහිපයකට අනුව ජීවනෝපාය විවිධාංගීකරණය සිදු වන ආකාරය ගණනය කරන ලදී. එහිදී කෘෂිකාර්මික අංශයේ පුද්ගලයන්ගෙන් 20% කට කෘෂිකාර්මික කටයුතු වලින් බැහැරව සිටින කාලය තුළ ඔවුන්ගේ ජීවනෝපාය විවිධාංගීකරණය කළ හැකි බව උපකල්පනය කොට 2033 වසර වන විට 1021 ක පිරිසක් ඊට යොමු කල හැකි බව හඳුනා ගන්නා ලදී. එමෙන්ම ස්වයං රැකියා කරන පුද්ගලයින්ගෙන් 5%කට පහසුකම් සැලසිය හැකිය යන උපකල්පනය මත 2033 වසර වන විට පුද්ගලයන් 1915 දෙනෙකු ඊට යොමු කල හැකි බවට ගණනය කරන ලදී. තවත් උපකල්පනයක් ලෙස කෘෂිකාර්මික පවුල්වල කාන්තාවන් 50% කට ඔවුන්ගේ ජීවනෝපාය විවිධාංගීකරණය කළ හැකි බව හඳුනා ගන්නා ලද අතර 2033 වසරේදී 2553ක් වූ කාන්තාවන් පිරිසකගේ ජීවනෝපාය විවිධාංගීකරණය තුළින් ආර්ථික මට්ටම නගා සිටුවීමට හැකියාව පවතින බවට හඳුනා ගන්නා ලදී. කෘෂිකාර්මික පවුල්වල පාසල් හැර යන අයවලුන්ගෙන් 25%ක් වෘත්තීය කර්මාන්තයට ඇතුළත් කළ හැකිය යන උපකල්පනය මත 5745 දෙනෙකු ඊට යොමු කල හැකි අතර වෘත්තීය කර්මාන්තයට පිවිසිය හැකි යැයි පුරෝකථනය කළ මුළු ජනගහනය 11,234ක් වේ. පුරෝකථනය කරන ලද මුළු ජීවනෝපාය විවිධාංගීකරණය 3574 කි. මෙය අනාගත ආර්ථික සංවර්ධනයෙහිලා ඉතා වැදගත් යොමුවක් වන අතර කුරුවිට සංවර්ධන සැලැස්ම මගින් ඉදිරිපත් කරන ආර්ථික සංවර්ධන උපායමාර්ග යටතේ ඉතා වැදගත් උපක්‍රමයක් ලෙස මෙය හඳුනා ගෙන ඇත.

06 වන පරිච්ඡේදය
සැලැස්ම

උපායමාර්ගය 3.5

කෘෂිකර්මාන්තය සහ සංචාරක කර්මාන්තය කෙරෙහි අවධානය යොමු කරමින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල නව පාඨමාලා හඳුන්වා දීම

භෞතික සංවර්ධන උපාය මාර්ග

6.5 භෞතික සංවර්ධන උපාය මාර්ග

කුරුවිට නගරය ප්‍රධාන කොටගත් සැලසුම් ප්‍රදේශය නාගරික ලක්ෂණ මෙන්ම ග්‍රාමීය ලක්ෂණ මුසු වූ ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැක. ප්‍රදේශයේ විසිරි පවතින ආර්ථික, කර්මාන්ත, නේවාසික, කෘෂිකාර්මික, සංස්කෘතික ආදී වූ ක්‍රියාකාරකම් මෙම ප්‍රදේශයේ සංවර්ධනයට බෙහෙවින් බලපායි. කුරුවිට නගර සංවර්ධන සැලැස්මේ තවත් එක් ප්‍රධාන උපායමාර්ගයක් ලෙස භෞතික සංවර්ධනය හඳුනා ගත හැකිය. එහිදී නාගරික කලාප, නගර මධ්‍ය සහ ග්‍රාමීය ප්‍රදේශ වශයෙන් සංවර්ධන උපායමාර්ග හඳුනා ගන්නා ලදී. මෙහිදී හඳුනා ගන්නා ලද නාගරික කලාපයන් වල පවතින සේවාවන් සහ ක්‍රියාකාරකම් හරහා එකිනෙකට පහසුකම් සලසන ආකාරයට සංවර්ධන උපක්‍රම නාගරික සැලසුම ඔස්සේ දක්වා ඇත. කුරුවිට නගර මධ්‍ය, සංවර්ධන ප්‍රදේශයේ හදවත බඳු වන අතර භෞතික සංවර්ධන උපායමාර්ග හරහා නාගරික ප්‍රදේශයේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට සැලසුම් කර ඇත. එහිදී නගර මධ්‍ය සංවර්ධනය අවට ප්‍රදේශ සමග එකිනෙක සම්බන්ධ වෙමින් සේවා සලසන ආකාරයට උපක්‍රම හඳුනා ගන්නා ලදී. භෞතික සංවර්ධන උපායමාර්ග යටතේ ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය පිලිබඳව ද අවධානය යොමු කරන ලද අතර කුරුවිට නගරය හැරුණු කොට වැඩි වශයෙන් ව්‍යාප්තව ඇති ග්‍රාමීය ප්‍රදේශ වලට හඳුන්වා දෙන සංවර්ධන උපක්‍රම හරහා ප්‍රතිලාභ ලබා ගනිමින් සංවර්ධන ප්‍රදේශයේ අනාගත සැලසුම් ඉලක්ක සපුරා දීමට යෝජිතය.

උපාය මාර්ගය 1

නගර මධ්‍ය සංවර්ධනය

කුරුවිට නගර මධ්‍ය ප්‍රදේශය සංවර්ධන සැලසුම් ප්‍රදේශයේ කේන්ද්‍රස්ථානය වන්නේය. වාණිජ, ප්‍රවාහන, සේවා ආදී ආර්ථිකයට මෙන්ම භෞතික සංවර්ධනයට පාදක වන අංග රැසක් ගොනු වී ඇති අතර නාගරිකයන් මෙන්ම විවිධ ප්‍රදේශ වලින් විවිධ කටයුතු සඳහා පැමිණෙන දෙස් විදෙස් ජනතාව තම අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කරයි. නගර මධ්‍ය අවට ගම්මාන සමග එකිනෙකට සම්බන්ධව සංවර්ධන ප්‍රතිලාභ හුවමාරු කර ගන්නා ආකාරයට සංවර්ධන උපක්‍රම මෙම සැලැස්ම හරහා හඳුනා ගන්නා ලදී. ප්‍රධාන වශයෙන් නගර මධ්‍ය සඳහා මාර්ගෝපදේශ සැලැස්මක් යටතේ විධිමත් සැලැස්මක් හඳුන්වා දෙමින් නගර මධ්‍ය ප්‍රදේශයේ අක්කර 11 කට ආසන්න භූමි ප්‍රමාණයක ව්‍යාප්තව පවතින දුම්රිය දෙපාර්තමේන්තු ඉඩම් ක්‍රමවත් භාවිතයන්ට යොදා ගැනීමටත් නගරයේ ආකර්ශනීය බව වැඩි දියුණු කිරීමටත් බලාපොරොත්තු වේ. එසේම අනාගතයේදී කුරුවිට නගරය හරහා ගමන් කිරීමට නියමිත කැලණිවැලි දුම්රිය මාර්ගයේ බලපෑමත් ආරෝපණය කර ගන්නා ආකාරයට නගර මධ්‍ය සංවර්ධන වෙත අවධානය යොමු කර ඇත. එහිදී භෞතික සංවර්ධනය

සඳහා හඳුනා ගන්නා ලද ව්‍යාපෘති ස්ථාපනය කොට සංවර්ධන අභිලාෂයන් සපුරා ගනිමින් කුරුවිට නගර සංවර්ධන ප්‍රදේශයට අදාළ අනාගත ඉලක්ක සපුරා ගැනීම අරමුනයි.

උපායමාර්ගය 1.1

දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට නගරයට පැමිණෙන ජනතාවට පහසුකම් සැලසීම සඳහා මූලික සේවා පහසුකම් ඒකාබද්ධ කිරීම.

රූප සටහන් අංක 6.21: නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘති



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

උපාය මාර්ගය 1. 2

නගර මධ්‍යයේ ඌන උපයෝගී ඉඩම් ඵලදායි භාවිතයන් බවට පත් කිරීමෙන් වාණිජ සේවා ප්‍රශස්ත කිරීම.

උපාය මාර්ගය 1.3

නගර මධ්‍ය ප්‍රදේශය සඳහා මාර්ගෝපදේශ සැලැස්මක් හඳුන්වා දීමෙන් නගරයේ අලංකරණය සහ නගරයේ විධිමත් බව වැඩි දියුණු කිරීම

මෙහිදී හඳුනා ගත් ව්‍යපෘති එකොළහ සමගින් දුම්රිය පොළ ස්ථාපනයද ඇතුළුව දක්වන ලද ව්‍යපෘති ප්‍රදේශය මාර්ගෝපදේශ සැලැස්මක් හරහා නාගරික ව්‍යුහය හා සම්බන්ධතාවය වර්ධනය කරමින් සකස් කිරීමට බලාපොරොත්තු වේ.

රූප සටහන් අංක 6.22 : මාර්ගෝපදේශ සැලැස්ම සඳහා හඳුනා ගන්නා ලද ප්‍රදේශය



1. දුම්රිය මාර්ගය
2. පොළ සංවර්ධනය
3. බෝට්ටු අංගනය
4. වාණිජ සංවර්ධනය
5. මිශ්‍ර සංවර්ධනය
6. නගර චතුරශ්‍රය, දුම්රිය ගොඩනැගිල්ල සහ බෝධිය ආශ්‍රිත මැණික් වෙළෙඳ ප්‍රදේශය
7. කුරුවිට බස් නැවතුම
8. දුම්රිය නැවතුම්පල ස්ථාපනය කිරීමට හඳුනා ගත් ඉඩම
9. වාණිජ සංවර්ධනය
10. ප්‍රාථමික අපජල පිරිපහදු මධ්‍යස්ථානය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

උපායමාර්ගය 2.1

දැනට හඳුනාගෙන ඇති නාගරික කලාප තුළ පවතින භාවිතයන් හා ප්‍රවනතාවයන්ට අනුකූල වන පරිදි කලාපිකරණය හා අනුමත භාවිතයන් හඳුන්වා දීම

කුරුවිට නගර සැලැස්මේ භෞතික සංවර්ධන උපායමාර්ග අතර හදුනා ගත් එකිනෙකට වෙනස් වූ ලක්ෂණ සහිත නාගරික කලාප හතරකි. හිග්ගස්හේන, දෙල්ගමුව, කුරුවිට සහ පැරඩයිස් ලෙස එම කලාප හතර හදුනා ගත් අතර එක් එක් කලාපයේ විශේෂ වූ ලක්ෂණයන් ව්‍යාප්ත වී ඇති ආකාරය අනුව කලාප වෙන් කරන ලදී. එහිදී හිග්ගස්හේන කලාපය නැගී එන කලාපයක් ලෙසත්, දෙල්ගමුව කලාපය සේවා සැපයීම මූලික වූ කලාපය ලෙසත්, කුරුවිට නගර මධ්‍ය කලාපය ලෙසත් පැරඩයිස් කලාපය ආගන්තුක සත්කාර සහ කර්මාන්ත මූලික කර ගත් කලාපය ලෙසත් හදුනා ගන්නා ලදී. සංවර්ධන සැලැස්මේ කලාපකරණය සහ ව්‍යාපෘති හරහා මෙම කලාප වෙතට පහසුකම් සැලසීමට යෝජිතය. කලාප අතර පවතින ක්‍රියාකාරකම් සහ සේවාවන් මත පදනම්ව කලාප එකිනෙක සම්බන්ධ වෙමින් පහසුකම් සලසා ගනිමින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1. හිග්ගස්හේන කලාපය

මෙම කලාපයේ කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය දෙපස කුඩා පරිමාණ වාණිජ කටයුතු වල ව්‍යාප්තියක් හදුනා ගත හැකි අතර ප්‍රසිද්ධ පෙත්තාවිල බෝධිය වැනි ආගමික ස්ථාන ද ස්ථාපනය වී ඇත. උත්සව ශාලා, ලැගුම් හල්, බෙහෙත් ශාලා සහ ෆාමසි ආදී නේවාසිකයන් ඒකරාශී වන, ප්‍රජාව පදනම් වූ ස්ථාන හදුනා ගත හැකි අතරම නේවාසික කටයුතු වලට අමතරව වාණිජ කටයුතු වල ව්‍යාප්තියක් කලාපය තුළ පෙන්නුම් කෙරේ.

රූප සටහන් අංක 6.23 : හිග්ගස්හේන කලාපය තුළ විවිධ ක්‍රියාකාරකම් ව්‍යාප්තව ඇති ආකාරය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

2. දෙල්ගමුව කලාපය

දෙල්ගමුව කලාපය මූලික වශයෙන්ම සේවා සපයන කලාපය ලෙස හඳුනා ගත හැකිය. කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගයේ එක් පසකට වන්නට පමණක් මෙම සියලු සේවාවන් ව්‍යාප්තව තිබීම විශේෂ ලක්ෂණයකි. කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගයේ අනෙක් පස වාණිජ කටයුතු වල ව්‍යාප්තිය දක්නට ලැබේ. කුරුවිට මධ්‍ය විද්‍යාලය හා හිග්ගස්වත්ත ප්‍රථමික විද්‍යාලය වැනි අධ්‍යාපන සේවාවන්, කුරුවිට ප්‍රා. ලේ. කාර්යාලය, කුරුවිට ප්‍රාදේශීය සභාව, පොලිසිය ආදී රාජ්‍ය ආයතන, ලංකා සතොස, මහජන පොළ, සිල්ලර වෙළඳසැල්, බෙහෙත් ශාලාව සහ ෆාමසි ආදී වූ සේවාවන් ද ලංකා බැංකුව, මහජන බැංකුව වැනි මූල්‍ය පහසුකම් සපයන ආයතන, තැපැල් සේවා මෙන්ම විනෝදාස්වාද කටයුතු සඳහා පොදු ක්‍රීඩාංගනය වැනි භාවිතයන් කලාපය තුළ හඳුනා ගත හැකිය. දෙල්ගමුව කලාපය තුළ ව්‍යාප්තව පවතින මෙම සේවා පහසුකම් වැඩිදියුණු කරමින් නේවාසිකයන් හට වඩා කාර්යක්ෂම සේවාවක් සැපයීමට උපක්‍රම කුරුවිට සංවර්ධන සැලැස්ම හරහා යෝජිතය.

රූප සටහන් අංක 6.24 : දෙල්ගමුව කලාපය තුළ විවිධ ක්‍රියාකාරකම් ව්‍යාප්තව ඇති ආකාරය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

3. කුරුවිට නගර මධ්‍ය කලාපය

කුරුවිට නගර මධ්‍යය, නගරයක පවතින විවිධ සේවාවන්ගේ එකතුවකි. විවිධාංගිකරණය වූ වාණිජ කටයුතු රැසක් මෙම කලාපය තුළ හඳුනා ගත හැකි අතර පුරාවිද්‍යාත්මක වටිනාකම් වලින් යුතු පැරණි දුම්රිය ගොඩනැගිල්ල වැනි ඓතිහාසික ගොඩනැගිලි ද නගරය තුළ හඳුනා ගත හැකිය. ප්‍රදේශයේ ප්‍රධානම ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස කුරුවිට බස් නැවතුම්පළ කුරුවිට නගර මධ්‍යයේ සිට ග්‍රාමීය මෙන්ම නාගරික ප්‍රදේශ වලටද ප්‍රවාහන පහසුකම් සලසයි. සංවර්ධන සැලැස්ම ඔස්සේ ව්‍යාපෘති රැසක් නගර මධ්‍ය කලාපය ඉලක්ක කොට හඳුනා ගන්නා ලදී.

රූප සටහන් අංක 6.25 : කුරුවිට නගර මධ්‍ය කලාපය තුළ විවිධ ක්‍රියාකාරකම් ව්‍යාප්තව ඇති ආකාරය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

4. පැරඩයිස් කලාපය

පැරඩයිස් කලාපයේ ආගන්තුක සත්කාරය සහ කර්මාන්ත ආශ්‍රිත කටයුතු වැඩි වශයෙන් හඳුනා ගත හැකි අතර නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය ප්‍රදේශයේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දේ. නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ කර්මාන්තයන්ට අමතරව හයිඩ්‍රාමනි ඇගලුම් කර්මාන්ත ශාලාව, ලංකා පොහොර සංස්ථාව, ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇඟලුම් ආයතනය වැනි නිෂ්පාදන කර්මාන්ත ව්‍යාප්තව පවතී. එසේම ආපනශාලා, හෝටල්, ලැගුම් හල් වැනි ආගන්තුක සත්කාර සේවාව සම්බන්ධ ස්ථාන ද හඳුනා ගත හැකි වේ. කුරුවිට නාගරික සංවර්ධන සැලසුම හරහා ප්‍රදේශයේ ආර්ථිකයට උර දෙන කර්මාන්ත, ආගන්තුක සත්කාර මෙන්ම නේවාසික භාවිතයන් සඳහා අවස්ථාව ලබා දීමට යෝජිතය.

රූප සටහන් අංක 6.26 : පැරඩයිස් කලාපය තුළ විවිධ ක්‍රියාකාරකම් ව්‍යාප්තව ඇති ආකාරය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

උපායමාර්ගය 3

පර්යන්ත ප්‍රදේශ සංවර්ධනය

උපායමාර්ගය 3.1

නගර මධ්‍ය හා අනෙකුත් ප්‍රධාන සේවා කලාප සමග සම්බන්ධ වීමට පවතින ප්‍රධාන මාර්ග සංවර්ධනය තුළින් පර්යන්ත ප්‍රදේශ හා පවතින සම්බන්ධතාවය වැඩි කිරිම

උපායමාර්ගය 3.2

පර්යන්ත ප්‍රදේශ වල පවතින සංචාරක විභාවතාවයන් සහ අනෙකුත් විභාවතාවයන් අනුව කලාපිකරණය හා භාවිතයන් හඳුන්වා දීම.

හඳුනා ගන්නා ලද නාගරික කලාප වන හිඟ්ගස්හේන, දෙල්ගමුව, කුරුවිට සහ පැරඩයිස් යන කලාප වටා ගම්මාන රැසක් ව්‍යාප්තව පවති. මෙම පර්යන්ත ප්‍රදේශ සංවර්ධනය භෞතික සංවර්ධන උපායමර්ගයේ ප්‍රධාන අංශයක්ද වන අතර මෙම නාගරික කලාප අවට පවතින ගම්මාන සෑම නාගරික කලාපයකින්ම ප්‍රතිලාභ ලබයි. එසේම එම ගම්මාන සංවර්ධන සැලැස්ම මගින් හඳුනා ගන්නා ලද ව්‍යපෘති හරහා සංවර්ධන අභිලාෂයන් සාක්ෂාත් කර ගනු ඇත.මෙහිදී නාගරික වශයෙන් ගොනු වී පවතින භෞතික සංවර්ධනය ග්‍රාමීය වශයෙන්ද ව්‍යාප්ත කොට පවතින සංවර්ධනයේ ප්‍රතිලාභ වල ව්‍යාප්තියේ අසමතුලිතබව අවම කොට මුළු සංවර්ධන ප්‍රදේශය පුරා එම ප්‍රතිලාභ ව්‍යාප්ත කිරීම අරමුණ වේ.

06 වන පරිච්ඡේදය

සැලැස්ම

6.6 තිරසර පාරිසරික සංවර්ධන උපායමාර්ග

තිරසර පාරිසරික සංවර්ධන උපායමාර්ග

කුරු ගග ආශ්‍රිතව නිර්මාණය වී ඇති කුරුවිට නගරය, ස්වභාවික පරිසර ප්‍රදේශ වලින් හා කුඹුරු කලාපයන්ගෙන් සමන්විත වූ නගරයක් වන අතර ජාතික භෞතික සැලැස්මට අනුව මෙම කලාපය සංවේදී මධ්‍යම පරිසර කලාපයට අයත් සීමාව තුළ පැවතීම හේතුවෙන් ප්‍රදේශයේ පාරිසරික සමතුලිත බව පවත්වා ගැනීම උදෙසා කුරුවිට නගරය තම අනන්‍ය පාරිසරික තත්වයන් ආරක්ෂා කර ගත යුතු වේ. කුරු ගග, පැරඩයිස් වැව, බෝපත් ඇල්ල ඇතුළු විවිධ ජල මූලාශ්‍රයන් ද ශ්‍රී පාද රක්ෂිතයේ පිහිටීම ද වැඩි වශයෙන් ව්‍යාප්තව පවතින කුඹුරු ප්‍රදේශ ද කුරුවිට ප්‍රදේශයට ආවේණික ශාක හා සත්ත්ව වර්ගයා ඇතුළත් ජෛව විවිධත්වයක් සහිත මෙම සැලසුම් ප්‍රදේශය පරිසර කළමනාකරණ උපායමාර්ග මගින් හානියට පත් පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය කිරීමටත්, ප්‍රදේශයට ආවේනික පරිසර පද්ධති තව දුරටත් ශක්තිමත් කිරිමටත් සංවර්ධන සැලැස්ම තුලින් අපේක්ෂිතය.

අනාගතයේ කුරුවිට නගරය නේවාසිකයන් වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමට බලාපොරොත්තු වන නගරයක් නිසාවෙන් පරිසරය සහ මානව ජනාවාස අතර අරගලයක් දැකිය හැකි වනු ඇත. මානව සහ වාණිජ අවශ්‍යතාවය මත පරිසරයට ඇති විය හැකි බලපෑම අවම කරමින් මෙම අංශ ද්විත්වය අතර සමබරතාවයක් ඇති කිරීම වැදගත් වේ. එම පාරිසරික සුරක්ෂිත බව ඇති කිරීම තුළින් හිමිවන ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභය ප්‍රජාවට හිමි කර දිම සංවර්ධන සැලැස්මේ පරිසර කළමනාකරණ උපායමාර්ග මගින් අරමුණු කෙරේ. මෙම උපායමාර්ගය යටතේ පරිසර සංරක්ෂණය, භූ දර්ශන කළමනාකරණය හා පොදු විවෘත අවකාශයන් සම්බන්ධයෙන් මූලික අවධානය යොමු කර ඇති අතර සංවර්ධන සැලැස්මට අනුව ප්‍රජාවගේ වාසයට සුදුසු නගරයක් බවට පත් කිරීම යන ප්‍රමුඛ අරමුණ ලඟා කර ගැනීම උදෙසා මෙම තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග සෘජුවම දායක වේ.

6.6.1 පරිසර සංරක්ෂණ සැලැස්ම

උපායමාර්ගය 1

කුඹුරු ඉඩම්, කුරු ගඟ ආදී පාරිසරික සංවේදී ප්‍රදේශයන්හි පවතින ස්වභාවික ලක්‍ෂණ සහ ඒවායේ සංවේදීතා මට්ටම මත ආරක්‍ෂා කිරීම.

උපායමාර්ගය 2

කුරු ගඟ සහ අනෙකුත් ජල මූලාශ්‍ර සඳහා රක්ෂිත සීමාවන් ලබා දීම හරහා ජල මූලාශ්‍ර අවට පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම.

ව. කි. මී. 5 කට ආසන්න ප්‍රදේශයක් පුරා විහිදී පවතින කුඹුරු, අතහැර දමන ලද කුඹුරු ආදිය ප්‍රදේශයේ කෘෂිකාර්මික නිෂ්පාදනයන් සඳහා දායක වන අතර ජල රැදවුම් ප්‍රදේශ ලෙසද ක්‍රියා කරයි. සුළු වශයෙන් ඇති වන ජලගැලීම් වලින් සිදු වන හානිය අවම කිරීම සඳහා මෙම

ප්‍රදේශ ක්‍රියා කිරීම නිසා එය සංරක්ෂණය කිරීම පිළිබඳව අවධානය යොමු කිරීමට සැලසුමෙන් යෝජනා කර ඇත. එසේම අනාගතයේදී නේවාසික ආකර්ෂණය මත වැඩිවන ඉල්ලුම අනුව මෙම කුඹුරු ඉඩම් සඳහා ඇති වන බලපෑම අවම කිරීමද මෙම සංරක්ෂණ සැලැස්ම හරහා බලාපොරොත්තු වේ. එහිදී කලපිකරණ කටයුතු වලදී දක්වා ඇති කුඹුරු හා තෙත්බිම් බාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇති කිසියම් ප්‍රදේශයක් අනෙකුත් සංවර්ධන කලාප වල ඇතුලත්ව පවතින විටදී එවැනි ප්‍රදේශ සඳහා කෘෂිකර්ම කලාපයේ ඇතුලත් භාවිතයන්, මාර්ගෝපදේශ හා කොන්දේසි බලපැවැත් වේ. එසේම ජල මූලාශ්‍ර ලෙස පවතින කුරු ගග, පැරඩයිස් වැව ප්‍රධාන අනෙකුත් මූලාශ්‍ර සංරක්ෂණය ද වැදගත් වන අතර භෞතික සංවර්ධනය නිසා ඇති විය හැකි හානිය අවම කිරීමට මෙම සංරක්ෂණ සැලැස්ම මගින් යෝජිතය. ඒ අනුව කුඹුරු, අතහැර දමන ලද කුඹුරු ඉඩම් කෘෂිකර්ම කලාපය යටතට ගැනෙන අතර කලාපිකරණ සැලසුමට අදාළව අනුමත භාවිතයන් හඳුනා ගන්නා ලදී. මෙහිදී ගොවිජන සේවා පනත පිලිබඳව සැලකිලිමත් විය යුතු අතර සංවර්ධන කටයුතු සඳහා අදාළ වන නියමතා වලට අනුකුල විය යුතුය. කුරුගඟ සහ එහි රක්ෂිත, ස්වභාවික ඇළ මාර්ග හා අනෙකුත් මිරිදිය ජල මාර්ග මෙන්ම පැරඩයිස් වැව සඳහා කලාපකරණ සැලසුම හරහා අදාළ රක්ෂිත සීමාවන් දක්වා ඇති අතර සංවර්ධන කටයුතු වලදී අදාළ නියමතා සහ අදාළ ආයතනවල නිර්දේශ අනුව කටයුතු කල යුතු වේ.

සිතියම් අංක 6.16 : ජල සංරක්ෂණ කලාප සිතියම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

සිතියම් අංක 6.17 : කුඹුරු හා තෙත් බිම් කලාප සිතියම

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.6.2 භූ දර්ශන සැලැස්ම

රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි කුඩා නගරයක් ලෙස ප්‍රාදේශීය වශයෙන් කුරුවිට නගරයේ අනන්‍යතාවය සුරක්ෂිත කර ගැනීමට මෙන්ම සංචාරකයන්ගේ ආකර්ෂණය වර්ධනය කර ගැනීම උදෙසාද නගරයේ සුන්දරත්වය වැඩි කිරීම අත්‍යවශ්‍ය වේ. එසේම සංවර්ධන සැලැස්මෙහි දෙවැනි අරමුණට අනුව අනාගත කුරුවිට නගරය පාදක කරගත් සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට අවශ්‍ය පරිසරය සැකසිය යුතු අතර ප්‍රජාවට පහසුවෙන් හැසිරීමටත් ජනතාව අතර මතකයේ රැදෙන නගරයක් බවට පත් කිරිමටත් භූ දර්ශන කළමනාකරණ සැලැස්ම හරහා බලාපොරොත්තු වේ.

උපක්‍රම 1.1

හඳුනාගත් නාගරික කලාප වල භූ දර්ශන කළමනාකරණය සිදු කිරීම

සංවර්ධන සැලැස්ම හරහා හඳුනා ගන්නා ලද නාගරික කලාප වල වෙන් වෙන් වශයෙන් ව්‍යාපෘති සහ සැලසුම් අනුව භූ දර්ශන කළමනාකරණය සිදු කිරීමට යෝජිතය. ඒ අනුව ප්‍රධාන වශයෙන් කුරුවිට නගර මධ්‍යය ආශ්‍රිතව ක්‍රමවත් බව ඇති කරමින් ප්‍රජාවගේ ක්‍රියාකාරකම් සහ ජන ජීවිතය සමග ඍජුවම සම්බන්ධ කරමින් යෝග්‍ය පරිදි භූ දර්ශන කටයුතු සිදු කිරීම අවශ්‍ය වේ. පැරණි දුම්රිය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම, නගර චතුරශ්‍රය, බෝට්ටු අංගනය, මැණික් වෙළඳපොල අවකාශය, වළඳුර ඇළ මංතීරුව වැනි නගර මධ්‍ය සංවර්ධනය සම්බන්ධ ව්‍යාපෘති හරහා නාගරික අලංකරණය සහ භූ දර්ශනය වැඩි දියුණු කිරීමට යෝජිතය. එසේම පැරඩයිස් වැව ආශ්‍රිතව සිදු කරන භූ දර්ශන කළමනාකරණ ක්‍රියාකාරකම් සංවර්ධන සැලැස්ම හරහා කුරුවිට නගරයට හඳුන්වා දී තිබේ.

උපක්‍රම 1.2

ගංගා ඉවුරුවල සහ විකල්ප මාර්ගය අසල භූ දර්ශන කළමනාකරණය

කුරු ගග ඉවුර කුරුවිට නගරයේ වැදගත් කොටසක් වන අතර මෙම නිශ්චිත තිරය කුරු ගග රක්ෂිතයට අයත් වේ. එබැවින් රක්ෂික කොටසෙහි අවකාශය සුදුසු පරිවර්තනයන් ලෙස රේඛිය උද්‍යාන, දිය දිසි සංවර්ධනය ආදී ක්‍රියාකාරකම් දියත් කිරීම වැදගත් වේ . එසේම ගඟ රක්ෂිතයට අදාළ නියමතා නිසි පරිදි ක්‍රියාත්මක කරමින් පවත්නා ස්වාභාවික භූ දර්ශනයට හානි නොවන පරිදි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම වැදගත් වේ . යෝජිත දෙල්ගමුව සිට මලව හන්දිය දක්වා දිවෙන විකල්ප මාර්ගය වැනි මාර්ග දෙපස හරිත තීරු සංකල්පයට අනුව අලංකරණය කිරීම මෙන්ම මාර්ග ජාලය තුළ සංසරණය වන පදිකයන්ට මිත්‍රශීලි වටපිටාවක් ඇති කිරීමද භූ දර්ශන සැලැස්මේ එක් අරමුණක් වේ.

උපක්‍රම 1.3

පැරඩයිස් වැවෙහි භූ දර්ශන කළමනාකරණය

උපක්‍රම 1.4

වලඳුර ඇළ ඉවුරුවල භූ දර්ශන කළමනාකරණය (හඳුනාගත් අංශය)

6.6.3 පොදු එළිමහන් විවේක විනෝද කටයුතු පිළිබද අවකාශීය සැලැස්ම

නාගරික උද්‍යාන, ක්‍රීඩා පිටි සහ සකසන ලද එළිමහන් ප්‍රදේශ පිහිටුවීම හා නඩත්තුව මගින් ප්‍රතිලාභ රාශියක් ලඟා කර ගත හැක. නගරයේ උෂ්ණත්වය අවම කිරීමට, කාබන් පිය සටහන කළමනාකරණය කිරීම, නාගරිකයන්ගේ ශාරීරික සෞඛ්‍ය තත්වය වැඩි කිරීමට රුකුලක් ලබා දීම, සොබහදම සමග ජනතාවගේ පවතින සම්බන්ධතාවය වැඩි කිරීම, නිරන්තර නගරය අවට සංසරණය වන නාගරිකයන් හට සොබාදහම වින්දනය කිරීමට අවස්ථා ලබා දීම, නාගරිකයන් අතර සුරක්ෂිත බව ඇති වීම හේතුවෙන් අපරධ අවම කිරීම මෙන්ම ව්‍යාපාරික අවස්ථා වැඩි කිරීම ආදී ප්‍රතිලාභ රැසක් හිමිකර දීම උදෙසා නාගරික උද්‍යාන වැදගත් කර්යභාරයක් ඉටු කරන බැවින් හදුනා ගත් විවෘත ප්‍රදේශ වල යෝග්‍ය භූමි අලංකරණයක් සහිතව මෙම පොදු අවකාශ නිර්මාණය කිරීමට නිර්දේශ කරනු ලැබේ. සංවර්ධන සැලැස්මේ එක් ප්‍රධාන අරමුණක් වන කුරුවිට නගරය නේවාසිකයන් හට ජීවත් වීමට වඩාත් සුදුසු නගරයක් බවට පත් කිරීම යන්න ළඟා කර ගැනීමේදී නේවාසිකයන් හට පොදු විවෘත භූමි පරිහරණය කිරීමටත්, තම විවේක කාලය, සෞඛ්‍යය යහපත් ලෙස පවත්වාගෙන යමින් සමබර ජීවිතයක් ගත කිරීමට ඇති හැකියාව වර්ධනය කිරීමත් එක සමාන ලෙස වැදගත් වේ. දැනට කුරුවිට නගරයේ නාගරික උද්‍යාන, ක්‍රීඩා පිටි සහ සකසන ලද එළිමහන් ප්‍රදේශවල පැතිරීම හෙක්ටයාර 1.78 ක් පමණ වන අතර පවතින අවශ්‍යතාවය හෙක්ටයාර 41.4 ක් පමණ වේ.කෙසේ වුවත් පවතින තත්වයට අනුව අවශ්‍යතාවය සංසන්දනය කරන කල විශාල අවශ්‍යතාවයක් පෙන්නුම් කළද කුරුවිට ප්‍රදේශයේ පවතින බෝපත් ඇල්ල, කුරු ගග ආදී මූලාශ්‍ර සමග පිහිටා ඇති ස්වභාවික පරිසරය විසින් එම අවශ්‍යතාවය සපුරා ලීමට දායකත්වයක් දක්වනු ලැබේ .එසේම සංවර්ධන සැලැස්ම හරහා බෝපත් ඇල්ල, පැරඩයිස් වැව සහ නගර මධ්‍ය ප්‍රදේශයට සංවර්ධන උපක්‍රම හදුනා ගන්නා ලද අතර එම උපක්‍රම පොදු විවෘත භූ දර්ශන නිර්මාණය කිරීමට දායක වනු ඇත.

උපායමාර්ගය 3

දැනට පවතින සියලුම ක්‍රීඩා පිටි, ක්‍රීඩා කළ හැකි සහ පොදු විවෘත අවකාශයන් ක්‍රීඩා සහ ඍජු විනෝදාස්වාද පහසුකම් සඳහා භාවිතා කිරීම, වර්ගීකරණය කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම.

1. යෝජිත බෝපත් ඇල්ල ආශ්‍රිත සංවර්ධනය
2. යෝජිත නගර මධ්‍ය ආශ්‍රිත සංවර්ධනය
3. යෝජිත පැරඩයිස් වැව අවට උද්‍යාන සංවර්ධනය
4. දැනට පවතින සියලුම ක්‍රීඩා පිටි සහ ක්‍රීඩා කළ හැකි ප්‍රදේශ නැවත සංවර්ධනය කිරීම - පැරඩයිස් ළමා උද්‍යානය, පැරඩයිස් ක්‍රීඩා පිටිය, රණවිරුගම ක්‍රීඩා පිටිය
5. නාගරික උද්‍යාන සහ විවෘත අවකාශයන් සංවර්ධනය කිරීම - පැරඩයිස් වැව අවට උද්‍යාන සංවර්ධනය, යෝජිත වාණිජ පරිශ්‍රය සහ මහජන රැස්වීම් පරිශ්‍රය, යෝජිත නාගරික චතුරශ්‍රය, යෝජිත ළමා උද්‍යානය

සිතියම් අංක 6.18 : පවතින උද්‍යාන සහ ක්‍රීඩා පිටි



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශය කණ්ඩායම, 2022

සිතියම් අංක 6.19 : යෝජිත විනෝදාත්මක කටයුතු

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම, 2022

6.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

6.7.1 උපායමාර්ගික ව්‍යාපෘති සහ අනෙකුත් ව්‍යාපෘති

කෙටි කාලින ව්‍යපෘති		
අංකය	ව්‍යාපෘතිය	ස්ථානය
1	ආසන පහසුකම් සහිත නාගරික උද්‍යානය සංවර්ධනය	කුරුවිට නගර මධ්‍ය (වර්තමාන පොළ පරිශ්‍රය)
2	මැණික් වෙළෙඳ කටයුතු සඳහා ඉඩකඩක් නිර්මාණය කිරීම සහ ආසන පහසුකම් ඉදිකිරීම	කුරුවිට නගර මධ්‍ය
3	නැරඹුම් මැදිරි ඉදි කිරීම	බෝපත් ඇල්ල
4	නගර චතුරශ්‍රයක් ඉදි කිරීම	කුරුවිට නගර මධ්‍ය
5	බෝට්ටු අංගනය ඉදි කිරීම	කුරුවිට නගර මධ්‍ය (කුරු ගඟ)
6	දුම්රිය ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම	පැරණි දුම්රිය ගොඩනැගිල්ල
7	සංචාරක කටයුතු සඳහා ඉලක්කගත ස්ථානයක් ලෙස බෝපත් ඇල්ල සංවර්ධනය	බෝපත් ඇල්ල

මධ්‍ය කාලින ව්‍යපෘති		
අංකය	ව්‍යාපෘතිය	ස්ථානය
1	මහජන පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	කුරුවිට නගර මධ්‍ය (කඹුරාව පාර අසළ)
2	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	කුරුවිට නගර මධ්‍ය
3	රථගාල් පහසුකම් සහිතව වාණිජ අවකාශය නැවත සංවර්ධනය කිරීම	කුරුවිට නගර මධ්‍ය (තැඹිලියෙන මාර්ගය අසළ)
4	වාණිජ ප්‍රදේශය නැවත සංවර්ධනය කිරීම	කුරුවිට නගර මධ්‍ය (තොටුපල අසල)
5	අපජල පිරිපහදු මධ්‍යස්ථානයක් හඳුන්වා දීමේ ව්‍යාපෘතිය	කුරුවිට නගර මධ්‍ය
6	යෝජිත බෝට්ටු සේවාව	බෝපත් ඇල්ල - කුරු ගඟ
7	පුරාවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානයක් සහ මැණික් ආශ්‍රිත ක්‍රියාකාරකම් මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීම	පැරණි දුම්රිය ගබඩා ගොඩනැගිල්ල
8	ඇවිදීමේ මාර්ගයක් නිර්මාණය කිරීම	වලඳුර ඇළ
9	උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය	පැරඩයිස් වැව

දීර්ඝ කාලින ව්‍යපෘති		
අංකය	ව්‍යාපෘතිය	ස්ථානය
1	මධ්‍ය අදායම් නිවාස ව්‍යාපෘතිය	පැරඩයිස්
2	හඳුනාගත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය	කුරුවිට
3	රෝහල් පරිශ්‍රය ඉදි කිරීමේ ව්‍යාපෘතිය	නඩුකාරදෙණිය
4	නිවාස ව්‍යාපෘතිය	දූහලෝ වත්ත
5	යෝජිත මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය	කුරුවිට - මලව හන්දිය

6.7.2 ප්‍රමුඛ ව්‍යාපෘති

ව්‍යාපෘතීන් වල ස්වභාවය අනුව නිමා කිරීමට ගතවන කාලය සලකා බැලීමෙන් අනතුරුව හඳුනාගත් ව්‍යාපෘතීන් කෙටි කාලින, මධ්‍ය කාලින සහ දිගු කාලින ලෙස වර්ග කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතීන් පිලිබඳව සිදු කරන ලද විශ්ලේෂණයකින් සහ පාර්ශව කරුවන්ගේ දෙවන වැඩමුළුවේ දී පාර්ශවකරුවන් විසින් දැක්වූ අදහස් හරහා ව්‍යපෘති ප්‍රමුඛතා ලැයිස්තුවක් හඳුනා ගන්නා ලදී. මෙම ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීමේදී නගර සැලැස්මේ දැක්ම ලඟා කර ගැනීම පිණිස වැඩි බර තැබීමක් සිදු කරන ලදී. විශේෂයෙන්ම ව්‍යපෘති සම්බන්ධයෙන් නාගරිකයන්ගේ පිළිගනිම සහ විවිධ පාර්ශවකරුවන්ගේ ආර්ථික, සමාජීය ආදී ශක්‍යත්වයන් සලකා බලන ලදී. ඒ අනුව හඳුනා ගත් ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති 10 ක් ප්‍රමුඛතා ලැයිස්තුවට තෝරා ගන්නා ලද අතර එම ව්‍යපෘති වෙනුවෙන් සංක්ෂිප්ත ව්‍යාපෘති සැලසුම් වාර්තා සකස් කර ඇත.

- මහජන පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය
- රථගාල් පහසුකම් සහිතව වාණිජ අවකාශය නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (තැඹිලියෙන මාර්ගය අසල)
- පැරඩයිස් මධ්‍ය අදායම් නිවාස ව්‍යාපෘතිය
- ආසන පහසුකම් සහිත නාගරික උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- වාණිජ ප්‍රදේශය නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- බෝට්ටු අංගනය ඉදි කිරීමේ ව්‍යාපෘතිය
- දූහලෝවත්ත නිවාස ව්‍යාපෘතිය
- සංචාරක කටයුතු සඳහා ඉලක්කගත ස්ථානයක් ලෙස බෝපත් ඇල්ල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- බෝපත් ඇල්ල ආරම්භක ස්ථානය ආශ්‍රිතව නැරඹුම් මැදිරි ඉදි කිරීමේ ව්‍යාපෘතිය

6.7.3 ව්‍යාපෘති පිළිබද විස්තර

ව්‍යාපෘතිය 01

<table>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="4">මහජන පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">ප්‍රදේශයේ ජනතාවට සහ වෙළඳ ප්‍රජාවට තම ආර්ථික, භාණ්ඩ හා සේවා අවශ්‍යතා සපුරා ගැනීමට පහසු අවකාශයක් නිර්මාණය කිරීම</td></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>දිස්ත්‍රික්කය</td><td>ප්‍රා. ලේ. කොට්ඨාසය</td><td>පළාත් පාලන ආයතනය</td></tr>
<tr><td>සබරගමුව</td><td>රත්නපුර</td><td>කුරුවිට</td><td>කුරුවිට නගර සභාව</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">ප්‍රාදේශීය සභා මාර්ගය (කඹුරාව පාර)</td></tr>
<tr><td>පිහිටීම් සිතියම</td><td colspan="4">
</td></tr>
<tr><td>දැනට පවතින භාවිතය</td><td colspan="4">පුරන් වූ කුඹුරු ප්‍රදේශයක් වේ.</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය</td><td colspan="4">පෞද්ගලික</td></tr>
<tr><td>භූමි ප්‍රමාණය</td><td colspan="4">අක්. 1 .4</td></tr>
</table>

ව්‍යාපෘතියේ අදාළත්වය

දැනට පවත්වාගෙන යන මහජන පොළ ප්‍රදේශයේ පවතින අඩු ඉඩ පහසුකම, රථගාල් පහසුකම් නොමැති වීම, වැසි සමයේ ගංවතුර බලපෑමට ලක් වීම, ජල සහ වැසිකිලි පහසුකම් නොමැති වීම වැනි ගැටළු රාශියක් පවතින අතර එය මහජන පොළ භාවිත කරන මහජනතාවට මෙන්ම වෙළඳ ප්‍රජාවට ද තම අවශ්‍යතා සපුරා ගැනීමට බාධා ඇති කරයි. 500ක් පමණ වූ වෙළඳ ප්‍රජාවට සුදුසු වෙළඳ බිම්කඩ මෙන්ම තම නිෂ්පාදන රැගෙන ඒමට භාවිත කරන රථ වාහන ආදිය ගාල් කිරීමට පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවේ. එහෙයින් රථ වාහන තදබදයටද නගරයේ අවිධිමත් බවට ද මෙම තත්ත්වය හේතු වී ඇත.

මෙම දුර්වලතා මත ප්‍රාදේශීය ආර්ථික තත්වයට ඍජු සහ වක්‍ර ආකාරයට බලපෑම් ඇති කරන මහජන පොළ පරිශ්‍රය වෙළඳ මෙන්ම සාමාන්‍ය ප්‍රජාවට ප්‍රමාණවත් පහසුකම් ලබා දෙමින් නාගරික ආකෘතිය විධිමත් කිරීම සඳහා මහජන පොළ පරිශ්‍රය සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

කුරුවිට නගරයේ මහජන පොළ ඉදි කිරීම තුළින් මූලික කෘෂිකාර්මික නිෂ්පාදන හා ප්‍රාදේශීය වෙළඳ කටයුතු ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම හා ඒ තුළින් නාගරික ජනතාවට හා අවට ගම්මාන වල ජනගහනයට අවශ්‍ය වෙළඳ, වාණිජ පහසුකම් විධිමත් අයුරින් සපුරා දීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- වාහන නැවතීමේ රථ ගාල් පහසුකම් සහිත පොළ පරිශ්‍රය සංවර්ධනය කිරීම
- පොළ පරිශ්‍රයේ ජල සහ සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම
- විධිමත් කාණු පද්ධතිය සහ කසළ බැහැර කිරීමේ ක්‍රමවේදය හරහා කැලිකසල හා අපජලය කළමනාකරණය කිරීම.
- වෙළඳ කටයුතු සිදු කිරීම සඳහා වෙළෙන්දන්ට විධිමත්ව සැකසූ ඉඩකඩ ලබා දීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	රු. මිලියන
කුරුවිට මහජන පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	100

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව සහ පවත්වාගෙන යාම කුරුවිට නගර සභාව විසින් සිදු කෙරේ.

ව්‍යාපෘතිය 02

ව්‍යාපෘති මාතෘකාව	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	නාගරික ජනතාවට අවශ්‍ය වාණිජමය අවශ්‍යතා එකම ස්ථානයකින් සපුරාලීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	කුරුවිට	කුරුවිට නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය) එරත්න මාර්ගය			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	ඉදි කිරීම් කිහිපයක් සහිත හිස් ඉඩම			
ඉඩමේ අයිතිය	දුම්රිය දෙපාර්තමේන්තුව			
භූමි ප්‍රමාණය	පර්. 30			

ව්‍යාපෘතියේ අදාළත්වය

කුරුවිට නගරය තුළ පවතින වාණිජ කටයුතු වල සංවර්ධන ප්‍රවණතාවය අනුව නගරයේ ජනතාවට අවශ්‍ය එම පහසුකම් සැලසීම මෙන්ම නගරයට අවශ්‍ය ශ්‍රවනාගාර පහසුකම්, පුස්තකාල පහසුකම් ආදී වාණිජ නොවන පහසුකම් වල අඩු බව පූර්ණය කිරීමට මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත. ප්‍රදේශයට ප්‍රමාණවත් අසන පහසුකම් සහිත ශ්‍රවනාගාරයක මෙන්ම පහසුකම් සහිත පුස්තකාලයකට සුදුසු අවකාශයක අවශ්‍යතාවය ද පවතින හෙයින්

මෙම අවශ්‍යතා සියල්ල ම එක් පරිශ්‍රයකට වෙන් කොට ඒ සඳහා මෙම මිශ්‍ර සංවර්ධන ගොඩනැගිල්ල ඉදි කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

එසේම නගරයට පැමිණෙන්නන්ට රථ වාහන නවතා තැබීමට ඉඩ පහසුකම් නිසි ආකාරයට නගරය තුළ නොමැති අතර මෙම ව්‍යාපෘතිය හරහා රථ වාහන නවතා තැබීමේ පහසුකම් ද ආපනශාලා, කායවර්ධන මධ්‍යස්ථාන, අසන පහසුකම්, හා වෙනත් වාණිජ ක්‍රියාකාරකම් මෙන්ම සනීපාරක්ෂක පහසුකම් ද සලසනු ඇත. දැනට ඉදි කර ඇති වාණිජ ගොඩනැගිල්ලට ආසන්නයෙන් මෙමෙ මිශ්‍ර සංවර්ධන ගොඩනැගිල්ල ඉදි කිරීමට යෝජිත බැවින් එම ගොඩනැගිලි දෙක මගී පාලමක් ආධාරයෙන් එකිනෙකට සම්බන්ධ කොට නාගරිකයන්ට මෙම පරිශ්‍රයන් දෙකෙහි සේවාවන් ලබා ගැනීම පහසු කරවීමට අපේක්ෂිතය. එයින් වෙළඳ ප්‍රජාවට තම වෙළඳ කටයුතු වර්ධනය කර ගැනීමට මෙන්ම පරිශ්‍රයන් දෙකෙහිම සජීවී බව ආරක්ෂා වීම අමතර වාසිදායක තත්වයන් වේ.

ව්‍යාපෘති අරමුණු

නාගරික ජනතාවට අවශ්‍ය සියලු සාප්පු සවාරි අවශ්‍යතා එක් ස්ථානයකට ඒකරාශී කරමින් ලබාදීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- වාහන නැවතීම සඳහා විධිමත් රථ ගාල් පහසුකම් ඇති කිරීම
- නාගරික ජනතාවගේ අලෙවි හා අනෙකුත් වාණිජ අවශ්‍යතා බොහොමයක් එක් ස්ථානයක් තුළ පහසුවෙන් සපයාගත හැකි වීම
- නාගරිකයන් හට රැඳී සිටීම සඳහා ආසන පහසුකම් සමඟ විවේකිව කාලය ගත කිරීමේ පහසුව
- ශ්‍රවණාගාර හා පුස්තකාල පරිශ්‍ර පහසුකම් ඇති වීම
- නගරයේ ආර්ථික වර්ධනයට දායක වීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	රු. මිලියන
මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	250

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව සහ පවත්වාගෙන යාම කුරුවිට නගර සභාව විසින් සිදු කෙරේ.

06 වන පරිච්ඡේදය සැලැස්ම

ව්‍යාපෘතිය 03

ව්‍යාපෘති මාතෘකාව	රථගාල් පහසුකම් සහිතව වාණිජ අවකාශය නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	නාගරික ජනතාවට අවශ්‍ය වාණිජ සහ ශ්‍රවනාගාර පහසුකම් එකම ස්ථානයකින් සපුරාලීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	කුරුවිට	කුරුවිට නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය) තැඹිලියන මාර්ගය			
පිහිටීම සිතියම				
දැනට පවතින භාවිතය	වාණිජ භාවිතයන් කිහිපයක් සහිත හිස් ඉඩම			
ඉඩමේ අයිතිය	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, පෞද්ගලික සහ කුරුවිට ප්‍රා. සභාව			
භූමි ප්‍රමාණය	පර්. 100			

ව්‍යාපෘතියේ අදාළත්වය

කුරුවිට නගරය තුළ පවතින වාණිජ ව්‍යාප්තිය හා සංවර්ධන ප්‍රවණතාවය තුළ නගරයේ ජනතාවට අවශ්‍ය වාණිජ අවශ්‍යතා ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩ සපුරාදීම සඳහා මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත. වර්ෂ 2032 සඳහා යෝජිත කලාපීකරණයට අනුව මෙම

ව්‍යාපෘතිය සඳහා යෝජිත භූමිය වාණිජ කලාපයට අයත්වන අතර වාණිජ භාවිතයන් සඳහා යොදා ගැනීමෙන් ඉඩම් වටිනාකම ඉහළ නැංවීමටද අවස්ථාව සැලසේ.

තවද ප්‍රදේශ වාසීන්ට ආකර්ශණීය නගරයක් ලෙස සංවර්ධනයේදී නගරයට පැමිණෙන වැසියන්ගේ අවශ්‍යතා උපරිම ආකාරයෙන් සපයා දීමටද උපකාරී වන ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත. කුරුවිට නගරයේ ප්‍රධාන පිවිසුම් මාර්ගය වන කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයට මුහුණලා නගර මධ්‍ය ප්‍රදේශය තුළ පවතින භාවිතයන් සමඟ මෙම ව්‍යාපෘතිය සඳහා වඩාත් සුදුසු භූමියක් ලෙස මෙම ඉඩම හඳුනාගෙන ඇත. කුරුවිට නගර මධ්‍යය ක්‍රමවත් කිරීමේදී හඳුනා ගත් මෙම පරිශ්‍රය ද සංවර්ධනය කිරීමට හඳුනා ගන්නා ලදී. ප්‍රදේශයේ වාණිජ අවශ්‍යතාවයන්, රථ ගාල් පහසුකම් මෙන්ම ශ්‍රවනාගාර පහසුකම්, රැස්වීමේ ස්ථාන ආදී විනෝදාස්වාද කටයුතු වලට අදාල පරිශ්‍රයන් ස්ථාපනය කිරීමට හඳුනාගෙන ඇත. මෙම වාණිජ ප්‍රදේශය සමඟ යෝජිත රථගාල තුළින් තවදුරටත් ජනතාවගේ සේවා කටයුතු පහසු කිරීමට කටයුතු කර ඇත.

ව්‍යාපෘති අරමුණු

නාගරික ජනතාවට අවශ්‍ය වාණිජ සේවාවන් ලබා ගැනීමට විධිමත් අවකාශයක් නිර්මාණය කිරීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- වෙළඳ කටයුතු සඳහා වාණිජ අවකාශ විධිමත්ව සංවර්ධනය කිරීම.
- සේවා අවශ්‍යතා සඳහා පැමිණෙන්නන් හට රථ ගාල් පහසුකම් සැපයීම.
- නාගරිකයන් හට විවේක හා විනෝද කටයුතු සඳහා රංග ශාලා හා ශ්‍රවනාගාර පහසුකම් ලබා දීම.
- විධිමත් කාණු පද්ධතිය
- පරිශ්‍රය තුළ නගර අලංකරණ කටයුතු ඇති කිරීම

මුල්‍ය සැලැස්ම

අන්තර්ගතය	රු. මිලියන
රථගාල් පහසුකම් සහිතව වාණිජ අවකාශය නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	350

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව සහ පවත්වාගෙන යාම කුරුවිට නගර සභාව විසින් සිදු කෙරේ.

ව්‍යාපෘතිය 04

ව්‍යාපෘති මාතෘකාව	මධ්‍ය අදායම් නිවාස ව්‍යාපෘතිය - පැරඩයිස්			
ව්‍යාපෘති යෝජනාව	මධ්‍ය අදායම් ලාභීන් ගේ නිවාස අවශ්‍යතාවය සපුරා ලමින් නේවාසිකයන්ට අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය කිරීම.			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	කුරුවිට	කුරුවිට නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය) පැරඩයිස් මාර්ගය			
පිහිටීම සිතියම				
දැනට පවතින භාවිතය	රබර් වගාවන් සහිත ප්‍රදේශයකි			
ඉඩමේ අයිතිය	වතු සමාගම			
භූමි ප්‍රමාණය	අක්කර 5.5			

ව්‍යාපෘතියේ අදාළත්වය

කුරුවිට ප්‍රදේශය නේවාසිකයන්ට ආකර්ශනීය ප්‍රදේශයක් බවට පත් කිරීමේ අරමුණ ඇතිව මධ්‍ය අදායම් ලාභී ජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපුරා ලීම වැදගත් වේ. අනාගතයේදී භෞතික මෙන්ම සමාජීය අවශ්‍යතා වලින් පරිපූර්ණ නගරයක් බවට පත් කිරීමේ අරමුණින් මෙම ප්‍රදේශය හඳුනා ගෙන ඇති අතර අනාගතයේදී ආකර්ෂණය වන ජනතාවට මෙන්ම, ප්‍රදේශයේ ජනතාවට නිස්කලංක පරිසරයක, තම යටිතල පහසුකම් වලින් සුරක්ෂිත

නේවාසික අත්දැකීමක් ලබා ගැනීමට අවස්ථාව සැලසෙන බැවින් මෙම ව්‍යාපෘතියේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

මධ්‍ය අදායම් ලාභී නේවාසිකයන් සඳහා සියළු මූලික අවශ්‍යතා සපිරි නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- මධ්‍ය අදායම් ලාභීන් සඳහා නිවාස පහසුකම් සැපයීම
- නිවාස පහසුකම් හා සම්බන්ධ අනෙකුත් යටිතල පහසුකම් සම්පාදනය කිරීම
- සුදුසුකම් සහිත සේවකයන් ආදී ජන කොටස් ප්‍රදේශයට ආකර්ෂණය වීම.
- ප්‍රදේශයේ ආර්ථිකය සෘජු වක්‍ර ප්‍රතිලාභ හිමි වීම
- ඉඩම් වටිනාකම ඉහළ නැඟීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	රු. මිලියන
මධ්‍ය අදායම් නිවාස ව්‍යාපෘතිය - පැරඩයිස්	1000

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව සහ පවත්වාගෙන යාම කුරුවිට නගර සභාව විසින් සිදු කෙරේ.

06 වන පරිච්ඡේදය
සැලැස්ම

ව්‍යාපෘතිය 05

<table>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="4">ආසන පහසුකම් සහිත නාගරික උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">ප්‍රදේශයේ ජනතාවට, සංසරණය වන ජනතවට සහ සංචාරකයන්ට තම විවේක සහ විනෝද කටයුතු සපුරා ගැනීමට අවකාශයක් නිර්මාණය කිරීම</td></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>දිස්ත්‍රික්කය</td><td>ප්‍රා. ලේ. කොට්ඨාසය</td><td>පළාත් පාලන ආයතනය</td></tr>
<tr><td>සබරගමුව</td><td>රත්නපුර</td><td>කුරුවිට</td><td>කුරුවිට නගර සභාව</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය)</td></tr>
<tr><td>පිහිටීම් සිතියම</td><td colspan="4">
</td></tr>
<tr><td>දැනට පවතින භාවිතය</td><td colspan="4">මහජන පොළ ලෙස භාවිත කෙරේ. නිවාස කිහිපයක් ද පිහිටා ඇත.</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය</td><td colspan="4">දුම්රිය දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>භූමි ප්‍රමාණය</td><td colspan="4">පර්. 40</td></tr>
</table>

ව්‍යාපෘතියේ අදාළත්වය

කුරුවිට නගරයට දැනට විවේක සහ විනෝද කටයුතු සඳහා වෙන් වූ උද්‍යාන පරිශයක් නොමැති වීම විශාල අඩුපාඩුවක් වන අතර ජනතාවට නිදහසේ කාලය ගත කිරීමට, විනෝද වීමට, රැඳී සිටීමට නිශ්චිත ස්ථානයක් නොමැත. භෞතික මෙන්ම සමාජීය අවශ්‍යතා වලින් පරිපූර්ණ නගරයක් බවට පත් කිරීමේ අරමුණින් දැනට පොළ පවත්වාගෙන යන ස්ථානය ආසන පහසුකම්, ළමා ක්‍රීඩා පහසුකම්, භූමි අලංකරණය මෙන්ම සුළු ගංවතුර තත්වයන්ට ඔරොත්තු දෙන ආකාරයේ ආකෘතියකට පරිවර්තනය කිරීමට හඳුනා ගෙන ඇත. ඒ අනුව

කොළඹ - රත්නපුර මාර්ගය ඔස්සේ ගමන් කරන ජනතාවට මෙන්ම, ප්‍රදේශයේ ජනතාවට, සංචාරකයන්ට කුරු ගංගාවේ දර්ශනීය පරිසරය වින්දනය කරමින් නාගරික උද්‍යානය තුළ නතර වී විවේක ගැනීමට හා විනෝද වීමට අවස්ථාව සැලසේ.

මෙමගින් දැනට පවතින අවිධිමත් අවකාශය විධිමත් කරමින් නාගරික ආකර්ෂණය ඉහළ නැංවීම හා ජනතාවට පහසුකම් රාශියක් සැලසෙන බැවින් මෙම ව්‍යාපෘතියේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- නාගරික ජනතාවට හා සංසරණ ජනගහනයට අවශ්‍ය විවේක හා විනෝද කටයුතු පහසුකම් වැඩි දියුණු කිරීම
- කුරු ගංගාව සහ කුරුවිට පාලම අසල අනවසර ඉදිකිරීම් ඇතිවීම වැළැක්වීම
- පවතින කුරු ගංගාව ආශ්‍රිතව සංවර්ධනය කොට නාගරික ආකර්ෂණය වැඩිදියුණු කිරීම
- නගර මධ්‍ය ප්‍රදේශය විධිමත් කිරීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- ආසන පහසුකම් හා ළමා ක්‍රීඩා උපකරණ / අවකාශ සහිත නාගරික උද්‍යාන පහසුකම
- විධිමත් කාණු පද්ධතිය තුළින් විධිමත් ගංවතුර සහ අපජල කළමනාකරණය
- නාගරික ආකර්ෂණය වැඩිවීම
- අනවසර ඉදිකිරීම් වැළැක්වීම
- ආර්ථිකමය, සමාජීය හා භෞතික ප්‍රතිලාභ අත්වීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	රු. මිලියන
ආසන පහසුකම් සහිත නාගරික උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	50

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව සහ පවත්වාගෙන යාම කුරුවිට නගර සභාව විසින් සිදු කෙරේ.

ව්‍යාපෘතිය 06

<table>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="4">වාණිජ ප්‍රදේශය නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">නාගරික ජනතතාවට සහ වෙළඳ ප්‍රජාවට අවශ්‍ය වාණිජමය අවශ්‍යතා සපුරාලීම සහ නගර මධ්‍ය විධිමත් කිරීම</td></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>දිස්ත්‍රික්කය</td><td>ප්‍රා. ලේ. කොට්ඨාසය</td><td>පළාත් පාලන ආයතනය</td></tr>
<tr><td>සබරගමුව</td><td>රත්නපුර</td><td>කුරුවිට</td><td>කුරුවිට නගර සභාව</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය)
එරත්න මාර්ගය</td></tr>
<tr><td>පිහිටීම් සිතියම</td><td colspan="4">
</td></tr>
<tr><td>දැනට පවතින භාවිතය</td><td colspan="4">අවිධිමත් කඩ සාප්පු සහිත වාණිජ අවකාශයක් ලෙස භාවිතා කෙරේ.</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය</td><td colspan="4">දුම්රිය දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>භූමි ප්‍රමාණය</td><td colspan="4">පර්. 15</td></tr>
</table>

ව්‍යාපෘතියේ අදාළත්වය

කුරුවිට නගරය තුළ පවතින වාණිජ ව්‍යාප්තිය හා සංවර්ධන ප්‍රවණතාවය තුළ නගරයේ ජනතාවට පහසුවෙන් තම අවශ්‍යතා ඉටු කර ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩ සපුරා දීමට මෙන්ම දැනට පවතින අවිධිමත් බව හා අවකාශය නිසි ලෙස පරිභෝජනය කර නොතිබීම ආදී තත්වයන් මත මෙම ව්‍යාපෘතිය හඳුනා ගෙන ඇත. වර්ෂ 2033 සඳහා යෝජිත කලපිකරණය අනුව මෙම ව්‍යාපෘතිය සඳහා හඳුනා ගත භූමිය වාණිජ කලාපයට අයත් වන අතර දැනට

පවතින වාණිජ භාවිතයන්ම විධිමත් කිරීමෙන් මහජනතාවට ආකර්ෂණීය නගර ආකෘතියක් බවට පත් කර ගැනීමට අවස්ථාව සැලසේ.

කුරුවිට නගරයේ ප්‍රධාන පිවිසුම් මාර්ගයක් වන එරත්න මාර්ගය සහ කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගයට මුහුණලා නගරයේ මධ්‍ය ප්‍රදේශය තුළ පවතින භාවිතයන් සමග මෙම ව්‍යාපෘතිය සඳහා වඩාත් සුදුසු භූමියක් ලෙස මෙම ඉඩම් කොටස හඳුනාගෙන ඇති අතර විශේෂයෙන් ශ්‍රී පාද සමයේ පැමිණෙන සංචාරකයන්ගේ අවශයතා උපරිම ආකාරයට සපයා දීමටත් අපේක්ෂා කර ඇත.

ව්‍යාපෘති අරමුණු

නාගරික ජනතාවට අවශ්‍ය වාණිජ සේවාවන් ලබා ගැනීමට පවතින අවකාශය විධිමත් කොට නිර්මාණය කිරීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- වෙළඳ කටයුතු සඳහා වෙළඳ අවකාශ විධිමත්ව සංවර්ධනය කිරීම.
- සේවා අවශ්‍යතා සඳහා පැමිණෙන්නන් හට රථ ගාල් පහසුකම් සැපයීම.
- නාගරිකයන් හට නගර අලංකරණය කරන ලද ආසන පහසුකම් සහිත අවකාශයක් ලබා දීම.
- විධිමත් කාණු පද්ධතිය සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම.

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	රු. මිලියන
වාණිජ ප්‍රදේශය නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	350

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව සහ පවත්වාගෙන යාම කුරුවිට නගර සභාව විසින් සිදු කෙරේ.

ව්‍යාපෘතිය 07

ව්‍යාපෘති මාතෘකාව	බෝට්ටු අංගනය ඉදි කිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	ප්‍රදේශයේ ජනතාවට, සංසරණය වන ජනතවට සහ සංචාරකයන්ට තම විවේක සහ විනෝද කටයුතු සපුරා ගැනීමට අවකාශයක් නිර්මාණය කිරීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	කුරුවිට	කුරුවිට නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය)			
පිහිටීම සිතියම				
දැනට පවතින භාවිතය	අබලන් ව අත් හැර දැමූ ඉදි කිරීම් සහ නාන තොටුපළ			
ඉඩමේ අයිතිය	දුම්රිය දෙපාර්තමේන්තුව			
භූමි ප්‍රමාණය				

ව්‍යාපෘතියේ අදාළත්වය

කුරු ගඟ පාදක කොටගෙන බෝපත් ඇල්ල තෙක් හඳුන්වා දීමට බලාපොරොත්තු වන නව අංගයක් වන සංචාරක ගමන් මග ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භක ස්ථානය ලෙස කුරුවිට නගර මධ්‍යයේ දැනට අබලන්ව ඇති නාන තොටුපළ ආශ්‍රිත ස්ථානය හඳුනාගෙන මේ සඳහා හඳුනාගෙන ඇත. දැනට කිසිදු නඩත්තු කිරීමකට හෝ වැඩිදියුණු කිරීමකට ලක් නොවූ ඉදි කිරීම් කිහිපයක් සහිත මෙම ස්ථානය බෝට්ටු අංගනයක් සහිත තොටුපළක් ලෙස දියුණු කර සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව

ආපනශාලා පහසුකම්, සනීපාරක්ෂක පහසුකම් ආදී අතිරේක පහසුකම්ද හඳුන්වා දෙමින් නාගරික ජනතාවට පරිපූර්ණ අත්දැකීමක් ලබා දීමට බලාපොරොත්තු වන අතර සංචාරකයන් සහ සංචරණ ජනතාව වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමට මේ හරහා අපේක්ෂා කෙරේ. එසේම නගරයේ ප්‍රධාන සම්පතක් වන කුරු ගඟ ආශ්‍රිත ප්‍රදේශයේ සිදුවන අනවසර ඉදි කිරීම් සහ ක්‍රියාකාරකම් ආදිය අවම කොට සජීවී අවකාශයක් බවට පත් කිරීමට මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත.

නගර මධ්‍ය තුළ තව දුරටත් භාවිතයට නොගන්නා අවකාශයක් ප්‍රතිලාභ ගෙන එන අවකාශයක් බවට පත් කරමින් ප්‍රාදේශීය ප්‍රවාහන, සංචාරක මෙන්ම ආර්ථික අංශ ශක්තිමත් කිරීම සඳහා වැදගත් වන ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

කුරුවිට නගරයට පැමිණෙන සංචාරකයන් සඳහා බෝපත් ඇල්ල දක්වා ගමන් කිරීමට පහසුකම් සපයමින් සංචාරකයන්ට නව අත්දැකීමක් ලබා කර දීම. මේ අතර සංචාරක ආකර්ෂණය තවත් වර්ධනය කර ගනිමින් ප්‍රදේශයේ ආර්ථිකය දියුණු කිරීමට අරමුණු කොට ඇත.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- බෝට්ටු අංගනය සහිත තොටුපල සංවර්ධනය කිරීම.
- සංචාරකයන් හට ආපනශාලා සහ අවන්හල් පහසුකම් සැපයීම.
- සනීපාරක්ෂක පහසුකම් සහිත ආකර්ශනීය වටපිටාව
- කුරුවිට නගරයේ සිට බෝපත් ඇල්ල දක්වා බෝට්ටු සේවාව ආරම්භ කිරීම.

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	රු. මිලියන
බෝට්ටු අංගනය ඉදි කිරීමේ ව්‍යාපෘතිය	80

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව සහ පවත්වාගෙන යාම කුරුවිට නගර සභාව විසින් සිදු කෙරේ.

දෙවන කොටස

භෞතික සංවර්ධන උපාය මාර්ග හා නියමතා

හත්වන පරිච්ඡේදය

සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

07 වන පරිච්ඡේදය

සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

7.1. හැඳින්වීම

හැඳින්වීම

"සිරිපා නිම්නයේ සුසැදි නවාතැන" යන දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා කුරුවිට නගර සංවර්ධන සැලැස්ම (2023-2033) සකස් කර ඇත. මෙම සංවර්ධන සැලැස්ම තුළින් ඉදිරි වසර 10 තුළ ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු සහ අභිමතාර්ථ හඳුනා ගෙන ඇති අතර ඊට අදාළව උපායමාර්ගික සැලසුම් නිර්මාණය කර ඇත. ඒ අනුව 2033 වර්ෂය ඉලක්ක කර ගනිමින් සකසන ලද යෝජිත ඉඩම් පරිහරණ සැලැස්මට අදාළ භෞතික සංවර්ධන උපායමාර්ග සහ නියාමන මෙම කොටස තුළ අන්තර්ගත වේ. සැලසුම් ප්‍රදේශයට අදාලව සිදු කරන ලද සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණය (**Development Pressure Analysis**), සංවේදී කලාප විශ්ලේෂණය (**Sensitivity Analysis**), මාර්ග සම්බන්ධතා විශ්ලේෂණය (**Connectivity Analysis**), යෝග්‍යතා භූමි විශ්ලේෂණය (**Livability Analysis**) ආදී විශ්ලේෂණයන් කිහිපයක් මත පදනම්ව මෙම කලාපීකරණ සැලැස්ම සකස් කිරීම සහ එහි මායිම් හඳුනා ගැනීම සිදු කර ඇත. මීට අමතරව ස්වාභාවික උපද්‍රව වලට ගොදුරු වීමට ඇති ප්‍රවනතාව, සංවර්ධනය කල හැකි ඉඩම් ප්‍රමාණය, ජනගහනය ව්‍යාප්තිය සහ බලපෑ හැකි අනෙකුත් සාධක සැලකිල්ලට ගන්නා ලදී. ඉහත සඳහන් විශ්ලේෂණයන් සහ උපායමාර්ග පිලිබඳව මෙන්ම එක් එක් ප්‍රදේශයන් හි දක්නට ඇති විභවතාවයන් සහ ප්‍රවර්ධනය කිරීමේ හැකියාව පිලිබඳව සලකා බලා කලාපීකරණය සිදු කර ඇති අතර කලාපවල අනන්‍යතාවයන් ආරක්ෂා වන පරිදි අදාළ කලාපයන් සඳහා භාවිතයන් තීරණය කරන ලදී. මේ අනුව කුරුවිට සංවර්ධන ප්‍රදේශය තුළ ප්‍රධාන කලාප පහක් සහ උප කලාප හතරක් හඳුනාගෙන ඇති අතර ඊට අදාළ විශේෂ නියමතා සහ අනුමත භාවිතයන් ද අන්තර්ගත කර ඇත.

7.2. කලාපීකරණ සැලැස්ම (2023-2033)

සිතියම් අංක 7.1: කුරුවිට නාගරික බලප්‍රදේශයේ කලාපීකරණ සැලැස්ම 2023-2033



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

07 වන පරිච්ඡේදය

සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

7.3. සංවර්ධන කලාප සහ කලාප සංගුණකය

සංවර්ධන කලාප සහ කලාප සංගුණකය

කුරුවිට සංවර්ධන සැලැස්ම මගින් කුරුවිට නාගරික බල ප්‍රදේශය ප්‍රධාන සංවර්ධන කලාප 5 කට බෙදා ඇති අතර එම ප්‍රධාන සංවර්ධන කලාප අපේක්ෂිත සංවර්ධන ඝනත්වය මත පදනම්ව නැවත උප කලාප වලට බෙදා දක්වා ඇත. ඒ අනුව, ඒ ඒ සංවර්ධන කලාප වලට අපේක්ෂිත සංවර්ධන ඝනත්වය හා සංවර්ධනය කල හැකි භූමි ප්‍රමාණය මත පදනම්ව කලාප සංගුණකය නිර්ණය කරනු ඇත. (වගු අංක 7.1)

වගු අංක 7.1: සංවර්ධන කලාප සහ කලාප සංගුණකයන්

සංවර්ධන කලාපය	උප සංවර්ධන කලාපය	කලාප කේතය	කලාප සංගුණකය
නේවාසික කලාපය (Residential Zone)	මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය	R2	1.2
	අඩු ඝනත්ව නේවාසික කලාපය	R3	1.0
අධි ඝනත්ව වාණිජ කලාපය (Commercial Zone)		C1	2.0
මිශ්‍ර සංවර්ධන කලාපය (Mix Development Zone)	මධ්‍යම ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	MD2	1.5
	අඩු ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	MD3	1.0
අඩු ඝනත්ව සංචාරක කලාපය (Tourism Zone)		T3	1.0
කෘෂිකාර්මික කලාපය (Agriculture Zone)		A	0.0

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

7.4. සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

i. වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ අංක 1629/16 හා වර්ෂ 2009 නොවැම්බර් 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිපාලන සීමාවන් තුල පිහිටි සියලුම ප්‍රදේශයන් සඳහා මෙම රෙගුලාසි බල පැවැත්වේ.

ii. කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී, ඊට අදාලවන සැලසුම් හා සංවර්ධන නියමතා සඳහා මෙම කලාපිකරන සැලැස්මේ නියමතාවන්ට අමතරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021 ජූලි මස 08 දිනැති හා අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර සැලසුම් හා ගොඩනැගිලි නියෝග /රෙගුලාසි (පොදු) කුරුවිට ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා බලාත්මක වේ.

iii. **10.03.1986** දිනට පෙර නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ සඳහා **10.03.1986** දිනට පෙර අනුබෙදුම් කර ඇති අවම බිම් ප්‍රමාණය ව.මී. **150**ට අඩු බිම් කොටස්, පවත්නා බිම් කට්ටියක් ලෙස සලකන අතර **10.03.1986** දිනට පසු නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ සඳහා නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති දිනට පෙර අනුබෙදුම් කර ඇති අවම බිම් ප්‍රමාණය ව.මී. **150**ට අඩු බිම් කොටස්, පවත්නා බිම් කට්ටියක් ලෙස සලකනු ලබයි.

iv. සංවර්ධන නියාමන ප්‍රදේශ සඳහා සංවර්ධන නියාමන සැලසුම් මගින් (**Development Guide Plan**) හඳුන්වා දෙනු ලබන රෙගුලාසි අදාළ වේ. එම රෙගුලාසි හඳුන්වාදෙන තෙක් මෙම සැලැස්මේ සඳහන් කලාපීකරන රෙගුලාසි එම ප්‍රදේශ සඳහාද බල පැවැත්වේ. කෙසේවුවද, ඉහත සංවර්ධන නියාමන ප්‍රදේශයන්හි සිදුකිරීමට නියමිත සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය ලබාගත යුතු අතර, අධිකාරිය විසින් සකස් කර ඇති කෙටුම්පත් සංවර්ධන නියාමන සැලැස්ම ප්‍රකාරව සංවර්ධනයන් තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

v. යම් ඉඩමක අයිතිකරුවකු විසින්, වීථි රේඛාවට/යෝජිත මාර්ග පළලට අයත් වන ඉඩම් කොටස මාර්ගය සඳහා වන්දියකින් තොරව ප්‍රදානය කරන්නේ නම්, යෝජිත සංවර්ධන කටයුත්ත සඳහා වන අවසරලත් ගෙබිම් අනුපාතය සඳහා සම්පූර්ණ ඉඩමේ ප්‍රමාණය සලකා බලනු ලබයි. නමුත් බිම් කට්ටි ආවරණ ප්‍රතිශතය ගණනය කිරීමේදී වීථි රේඛාවට/ යෝජිත මාර්ග පළලට අයත් වන කොටස හැර ඉඩමේ ඉතිරි බිම් ප්‍රමාණය සැලකිය යුතුය.

vi. එකිනෙකට ස්වායක්තව ප්‍රධාන මාර්ගයන් හා සම්බන්ධ වන, අවම පළල මීටර් **6**ට හෝ ඊට වැඩි සහ නිත්‍යානුකූල ප්‍රවේශ අයිතිය හිමි මාර්ග එකකට වඩා වැඩි ප්‍රමාණයක් සංවර්ධන පරිශයට මුහුණලා ඇති අවස්ථාවන්හිදී, ප්‍රවේශ මාර්ගයේ පළල ලෙස එකී සියලු මාර්ගවල පළල එකතුව සලකා අවසරලත් සංවර්ධනය ගණනය කිරීම අවස්ථානුකූලව සලකා බැලිය හැකිය.

vii. කිසියම් ඉඩමක් කලාප දෙකකට හෝ වැඩි ගණනකට වැටන සේ පෙන්වා දී ඇති අවස්ථාවන්හිදී, එම බිම් ප්‍රදේශයට හසුවන කලාපය තීරණය කරනු ලබන්නේ, එම බිම් කොටසට ප්‍රවේශය ලබන ප්‍රධාන ප්‍රවේශ මාර්ගය අයත් කලාපය මගිනි.

එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් කලාපය අදාළ කරගත යුතුය.

*සංරක්ෂණ කලාප සඳහා මෙම නියමතාවය අදාළ නොවේ.

07 වන පරිච්ඡේදය

සංවර්ධන කලාප සහ කලාපිකරණ නියමතා

viii. කිසියම් බිම් කොටසක් පළාත් පාලන බල ප්‍රදේශ දෙකක් අතරට හසු වන සේ ඇත්නම්, එම බිම් කොටස එයට ප්‍රධාන ප්‍රවේශය ලබන කලාපයේ භාවිතයන් සඳහා, අදාළ පළාත් පාලන ආයතනවල එකගතාවය මත අධිකාරිය විසින් තීරණය කරනු ලැබේ.

එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් පළාත් පාලන බල ප්‍රදේශය අදාළ කරගත යුතුය.

ix. යම් ප්‍රවේශ මාර්ගයක පළමු බිම් කොටස හරහා කලාප මායිම් වැටී ඇති විටක, එකී බිම් කොටසේ ප්‍රවේශ මාර්ගයට සමාන්තරව ඇතින්ම පිහිටි අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතු වේ.

යම්හෙයකින්, පිටුපස බිම් කොටස් පළමු බිම් කොටසට ඒකාබද්ධ කර තනි ඉඩමක් ලෙස අනුමත කර ඇතිවිටක, එකී තනි ඉඩමේ අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතුය.

x. කලාපිකරණ සැලැස්මේ පෙන්වා දී ඇති මායිම්, භෞතික මායිම් හා භූගෝලීය ඛණ්ඩාංක යන දෙකෙන්ම නිර්වචනය කර ඇති අවස්ථාවකදී මායිම් වෙනසක් සිදු වුවහොත් ඒ පිළිබඳ අවසාන තීරණය නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව සතු වේ.

xi. කලාපිකරණ සැලැස්මේ අවසරලත් භාවිත කාණ්ඩයේ සඳහන් නොවන නමුත් එකී කලාපයේ අවසරලත් භාවිතයන් හා සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබාදීම පිළිබඳ තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

xii. යෝජිත කලාපිකරන සැලැස්ම තුල අනුමත භාවිතයන් නොවන නමුත් දැනට පවත්වාගෙන යන භාවිතයන් තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පමණක් අවසර ලබාදීම සලකා බලනු ලැබේ. නමුත් පවත්නා භාවිතයන් තවදුරටත් පුළුල් කිරීම සඳහා අනුමැතිය ලබා දීම පිලිබඳව සලකා බලනු නොබලන අතර භාවිතය දිගින් දිගටම පවත්වාගෙන යාම අහිතකර යැයි හැඟී යන්නේ නම් එකී භාවිතය නතර කරන ලෙස නියම කරනු ලැබිය හැක.

xiii. ගොඩනැගිලි සීමාව තුල මායිම් තාප්ප ඉදිකිරිම සඳහා මාර්ගය අයත් ආයතනය සමග නිර්වන්දි ගිවිසුමක් අත්සන් කිරීමට යටත්ව අනුමැතිය සඳහා සලකා බැලිය හැක.

xiv. ප්‍රදේශයේ මංසන්ධි, මාර්ග දෙපස ගොඩනැගිලි සීමා, මාර්ග පළල් කිරීමේ සීමා හා රක්ෂිත තුල විවිධ ආගමික ප්‍රතිමා, ආගමික සංකේත, සලකුණු හෝ ඒ සමාන ඉදිකිරීම්

සඳහා අවසර නොදෙන අතර, එවැනි ඉදිකිරීම් ඉවත් කිරීමේදී ඒ සඳහා වන්දි ගෙවීමක් සිදු නොකරනු ලබයි.

xv. සුසාන භූමියක්/ආදාහනාගාරයක් සඳහා යම්කිසි ඉඩමක් වෙන් කරනු ලබන්නේ නම් අදාළ පළාත් පාලන ආයතනයේ නිර්දේශ ලබාගත යුතුය.

xvi. සංවර්ධන සැලැස්ම තුල හඳුනාගෙන නොමැති නමුත් පහත් බිම්, වගුරු බිම්, කුඹුරු, පුරන් කුඹුරු, දෙණිය, ඕවිට හෝ වෙනත් ඊට අනුසාංගික ඉඩම් සඳහා අවසර දීමේදී නාගරික සංවර්ධන අධිකාරියෙහි නිරවුල් සහතිකයක් ලබාගත යුතුය.

xvii. යම් සංවර්ධනයක් සඳහා කුළුණු දොඹකර භාවිතා කරනු ලබන්නේ නම් ඒ සඳහා සුදුසුකම්ලත් ඉංජිනේරුවරයකුගේ නිර්දේශ සහ රක්ෂණාවරණයක් සහිතව අවසර පත්‍රයක් අදාළ සංවර්ධනය සඳහා අනුමැතිය ලබාදීමේදී ඉදිරිපත් කල යුතුය.

xviii. පාසල් හා ළමා නිවාස සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී විවෘත ඉඩකඩ වශයෙන් භූමියෙන් 50%ක ප්‍රමාණයක් විවෘතව තැබිය යුතුය.

xix. රථවාහන නැවතුම් ඉඩකඩ සංවර්ධන භූමිය තුළින්ම සැපයීමට අපොහොසත් වන්නේනම්, උපරිමය මීටර 500ක දුරකින් පවතින භූමියක් ඒ සඳහා යොදා ගැනීම මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සිදුකළ හැකිය.

xx. අධිකාරිය විසින් හඳුනා ගනු ලබන ප්‍රදේශ වල අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි ගෘහ නිර්මාණ/ සැලසුම්කරණ නියමතා පැනවිය හැකිය.

xxi. මෙම සැලසුම් ප්‍රදේශය තුල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වෙරල සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යනාදී රාජ්‍ය ආයතන දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්ට අයත් ඉඩම් හෝ රක්ෂිත කලාපයන්හි සංවර්ධන කටයුතු සිදු කිරීමට ප්‍රථමයෙන් අදාළ ආයතනයන්ගේ නිර්දේශයන් හා සංවර්ධන යෝජනා ලබා ගත යුතු වේ.

xxii. සියලු කැණීම් කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇතුළු අදාළ ආයතනයන්හි නිර්දේශයන්ට අනුව සිදු කල යුතු අතර, එම කටයුත්ත නිම වීමෙන් පසුව එකී ආයතනයේ නිර්දේශයට අනුකූලව කැණීම් කරන ලද ස්ථාන යථා තත්වයට පත් කිරීම හෝ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

xxiii. යම්කිසි නීතිගත සැලසුම්, සංවර්ධන හෝ ගොඩනැගිලි රෙගුලාසියක් සම්බන්ධයෙන් හෝ එහි අර්ථකථනය සම්බන්ධයෙන් හෝ ප්‍රයෝගික භාවිතය සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගෙන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව සතුවේ.

xxiv. සංවර්ධන අනුමැතිය ලබා දීමේදී යම් හේතුවක් නිසා භූමිය සම්බන්ධව රෙගුලාසියක් ලිහිල් කරන්නේ නම් හෝ ඉවත් කරන්නේ නම් සහ එම රෙගුලාසියට අයත් ඉඩමේ ප්‍රමාණය සංඛ්‍යාත්මකව ගණනය කර, ඊට අදාළ වටිනාකම තක්සේරු කර, එම වටිනාකමින් 30% කට නොවැඩි මුදලක් අවස්තානුකූලව අධිකාරියට අය කර ගත යුතුය.

xxv. මෙම නාගරික බල ප්‍රදේශය තුළ සෑම ඉදිකිරීමක් සඳහාම භූමි යෝග්‍යතාව හා ඉදිකිරීම සම්බන්ධව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (**NBRO**) නිර්දේශය ලබා ගත යුතු අතර, මීටර් 1.5 ට වැඩි උස ඉවුරු කැපීම් වලදී හා ආනතියක් සහිත භූමියක ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී පහත රෙගුලාසි බලපැවැත්වේ.

- මීටර් 1.5 ට වැඩි උස ඉවුරු කැපීමකදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ අනුව කටයුතු කිරීම අනිවාර්යය වේ. එසේ වුවද කැපුම් කරනු ලබන ඉවුරේ උස මීටර් 1.5 ට වඩා අඩුවන හා එම කැපුම් තලයට රැඳවුම් බැම් ඉදි නොකරනු ලබන අවස්ථා වල යාබද මායිමේ සිට කැපුම් තලයේ ආරම්භක ස්ථානයට අවම වශයෙන් මීටර් 1 ක දුරක් වෙන්කර තැබීමට කටයුතු කල යුතුය.
- ආනතියක් සහිත භූමියක බිම් කට්ටියක අවම විශාලත්වය සැලකීමේදී කලාපීකරණ රෙගුලාසි වල නියම කර ඇති බිම් කට්ටියක අවම විශාලත්වය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නියම කරනු ලබන බිම් කට්ටියක අවම විශාලත්වය යන දෙකෙන් වඩා වැඩි අගය බලපැවැත්වේ.
- ආනතියක් සහිත භූමියක භූමි ආවරණ ප්‍රතිශතය ගණනය කිරීමේදී අංක **2235/54**-2021 ජුලි මස 03 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් සැලසුම් හා සංවර්ධන නියෝගයන්හි හා කලාපීකරන රෙගුලාසි මගින් නියම කර ඇති භූමි ආවරණ ප්‍රතිශතයකන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නියම කරනු ලබන භූමි ආවරණ ප්‍රතිශතයකන් යන අගයන්ගෙන් වඩා අඩු අගය බල පැවැත්වේ.

xxvi. කිසියම් සංවර්ධන කටයුත්තකට අදාලව අනුමැතිය ලබාදීමේදී කලාපීකරන රෙගුලාසි තුල අවම බිම් ප්‍රමාණය සදහන් කර නොමැති අවස්ථාවලදී බිම් කොටසක අවම විශාලත්වය පර්චස් 6 ක් විය යුතුය. එසේ වුවද පොදු ජල සැපයුමක් නොමැති ප්‍රදේශවල, අනුමැතිය සලකා බැලීම සඳහා අවම බිම් ප්‍රමාණය පර්චස් 10 ක් තැබිය යුතුය.

xxvii. ගංගාවක් හෝ ප්‍රධාන ඇළ මාර්ගයක් නොවන අවස්ථාවකදී අදාළ ආයතනයන්ගේ නිර්දේශයන්ට යටත්ව ඉවුරු බැමි ඉදිකිරිම සඳහා අවසර ලබාදෙනු ලබන අතර එකී බැමි මත මායිම් තාප්ප හෝ වෙනත් එවැනි නිර්මිත ඉදිකරන්නේ නම් ඉවුරු බැම්මේ කෙළවර සිට මීටර් 0.75 ක සීමාවක් පිටුපසට ගෙන ඉදිකිරීම් සිදු කළ යුතුය.

xxviii. කලාපිකරණය තුළින් අවසර ලබා දිය හැකි භාවිතයන් වුවද නේවාසික කලාපයන්හි සිදුකරනු ලබන නේවාසික නොවන සංවර්ධනයක් හේතුවෙන් ශබ්ද දූෂණය/ වායු දූෂණය/ භූගත හෝ මතුපිට ජලය දූෂණය / මාර්ග තදබදයට තුඩු දෙන්නාවූ සංවර්ධන කටයුතු වලදී මෙන්ම සමාජීය තත්ත්වයනට නොගැලපේ යැයි සමාජය තුළින්ම විරෝධතාවයක් මතුවේයැයි හැඟී යනු ලබන සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදීම මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සලකා බලනු ලබන අතර එවැනි සංවර්ධන කටයුතු නියාමනය සඳහා කොන්දේසි පැනවීමේ බලය හා අවසර නොදීමේ බලය අධිකාරිය සතුවේ.

xxix. ජලාභිමුඛව සිදු කෙරෙන සියළු නේවාසික නොවන ඉදි කිරීම් සඳහා අවසර ලබා ගැනීමේදී අපජල කළමනාකරණ සැලැස්මක් ඉදිරිපත් කල යුතු අතර කුරු ගඟ ආශ්‍රිතව සිදුකරන සංවර්ධන කටයුතු වලදී ගඟ ඉවුරේ සිට රක්ෂිත හෝ ගොඩනැගිලි සීමාව වශයෙන් පවත්වාගතයුතු භූමිය සඳහා වන භූ දර්ශන සැලැස්මක් අදාළ ගොඩනැගිලි සැලසුම් සමග ඉදිරිපත් කල යුතුය.

xxx. ප්‍රාදේශීය සභා සීමාව තුළ පවත්නා අඩි පාරවල්, පඩිපෙළ හා සියලුම මාර්ග වලට අදාල වන ගොඩනැගිලි සීමා හා යෝජිත අවම මාර්ග පළල ද ගංගා සහ ඇළ මාර්ග වලට අදාල රක්ෂිත ප්‍රදේශයන් ද 09 වන පරිච්ඡේදයට අනුකූල විය යුතුය. එසේම, ගංගා සහ ඇළ මාර්ග වලට අදාල රක්ෂිත ප්‍රදේශයන් සුදුසු ශාක වගාවන් සහිතව පවත්වා ගත යුතුය.

xxxi. බෑවුම් ආනතියක් සහිත භූමි භාගයක සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී භූ විෂමතාව සලකා බලා මීටර් 1.5 ක පියගටපෙලකින් ප්‍රවේශකත්වය සලකා බලනු ලැබේ.

xxxii. කිසියම් පුද්ගලයකු විසින් මැණික් හා අනෙකුත් සියළු ඛනිජ ද්‍රව්‍ය සඳහා කරනු ලබන කැනීම් කටයුතු වෙනුවෙන් අවසර ලබා දෙනු ලබන කලාපවල කැනීම් කටයුතු පරිච්ඡේදය 09 හි සඳහන් වන රක්ෂිත අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

xxxiii. වාණිජ කලාපය තුළ සිදු කෙරෙන මැණික් පතල් කැනීම් කටයුතු හා සියළු කලාප වල සිදු කෙරෙන අනෙකුත් සියළු ඛනිජ කැනීම් කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයක් ලබා ගත යුතුය.

07 වන පරිච්ඡේදය

සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

xxxiv. යෝජිත කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන, සනීපාරක්ෂක කසල මධ්‍යස්ථාන හෝ වෙනත් ඒ ආශ්‍රිත කාර්යයක් සඳහා යොදාගනු ලබන භූමියක මායිමේ සිට මීටර් **100** ක් දක්වා ප්‍රදේශය හරිත වැටියක් ලෙස පවත්වාගත යුතු අතර එම හරිත වැටිය තුළ කිසිදු නේවාසික භාවිතයක් සඳහා අවසර ලබා නොදිය යුතුය.

xxxv. නාගරික බල ප්‍රදේශය තුළ හඳුනාගෙන ඇති ආකර්ශනීය ස්ථානයන් නැරඹීම සඳහා නම්කර ඇති සිතියම් අංක 6.19 හි දක්වා ඇති ස්ථානයන්හිදී දර්ශන පථය අවහිර වන ආකාරයේ කිසිදු ඉදි කිරීමක් සඳහා අවසර ලබා නොදෙන අතර දර්ශන පථයට බාධාවක් නොවන ඉදි කිරීම් සඳහා මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව අවසර ලබා දීම සලකා බලනු ලැබේ.

ඉහත කරුණු වලට අමතරව ගැසට් පත්‍ර අංක **2235/54** යටතේ **2021.07.08** දින ප්‍රකාශ කරන ලද සැලසුම් හා ගොඩනැගිලි නියෝගයන්හි රෙගුලාසි අංක **55 (3)** සහ **73** රෙගුලාසිය කුරුවිට නාගරික බල ප්‍රදේශයට අදාළ කර ගැනීමේදී පහත පරිදි අදාළ කරගත යුතුයි.

xxxvi. **10** වන උපලේඛනයේ අංක **2** යටතේ වන පළමු, දෙවන භාවිතයන් සඳහා සම්මත වාහන අවශ්‍යතාවය වර්ග මීටර් **100** ක් සඳහා එක් ඉඩකඩක් බැගින් විය යුතුය.

xxxvii. **10** වන උපලේඛනයේ අංක **2** යටතේ 8 වන වාණිජ භාවිතය (සැලුන් / රූපලවන්‍යාගාර / පාරිභෝගික සේවා ස්ථාන / බාබර් සාප්පු) සඳහා සම්මත වාහන අවශ්‍යතාව වර්ග මීටර් **50** ට එක් ඉඩකඩක් බැගින් විය යුතුයි.

xxxviii. වාහන නතර කිරීමේ පහසුකම් යටතේ වන අංක **73** හි අනු අංක **8** හි (ආ) සහ (ඇ) හි සඳහන් ප්‍රවේශ මාර්ගයන්හි ඇලකරණය තැබීමේදී අදාළ දුර ප්‍රමාණයන් යෝජිත මාර්ග පළල හෝ මාර්ග පුළුල් කිරීමේ යෝජනාවෙහි ඇතුළත් මාර්ග පළලෙහි කෙළවර සිට තැබීම සලකා බලනු ලැබේ.

xxxix. වාහන නතර කිරීමේ පහසුකම් යටතේ වන අංක **73** හි අනු අංක **16** (අ) යටතේ වන රථවාහන ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කිරීම, ජාතික මාර්ග පද්ධතියෙන් ප්‍රවේශය ගනු ලබන හෝ එම මාර්ගයන්හි රථවාහන ගමනාගමනයට බලපෑමක් සිදුවිය හැකි යැයි නිරීක්ෂණය වන අවස්ථාවකදී **16** (අ) යටතේ වන සංවර්ධනයන් සඳහා සිදු කල යුතුය.

xl. **10** වන උපලේඛනයේ පරිදි කිසියම් සංවර්ධන කටයුත්තක් සඳහා සැපයිය යුතු වාහන නැවතුම් අවශ්‍යතාවය ගණනය කිරීමේදී ගොඩනැගිල්ලේ ගෙබිම් ප්‍රමාණය හෝ වාහන අවශ්‍යතා ගණනය කිරීමේදී ඉතිරිවන ගෙබිම් ප්‍රමාණය එක වාහන අවශ්‍යතාවක් සඳහා වන ගෙබිම් ප්‍රමාණයෙන් 50% ක් හෝ ඊට අඩු වන අවස්ථාවක එම රථගාල් අවශ්‍යතාව

සඳහා යෝජිත මාර්ග පළල හෝ මාර්ග පුළුල් කිරීමේ යෝජනාව ඇතුලත් වීථි රේඛාව සහ ගොඩනැගිලි සීමාව අතර පවත්නා ඉඩකඩද ඇතුලත්ව එක් වාහන ඉඩකඩක් සැලසුම් කිරීම සලකා බලනු ලැබේ.

xli. විවෘත ඉඩකඩ සහ ගොඩනැගිලි දුරස්ථ කිරීම යටතේ වන රෙගුලාසි අංක 55 හි අනු අංක 03 හි සඳහන් ගොඩනැගිලි දුරස්ථ කිරීම් පහත සඳහන් අවස්ථාවල හැර යම් ගොඩනැගිලි සීමාවක් හෝ වීථි රේඛාවක් හෝ වෙන යම් මාර්ග රක්ෂිතයක් නියම කර නොමැති අවස්ථාවක, මීටර් **1** ක ගොඩනැගිලි දුරස්ථ කිරීමක් එම මාර්ගයට / මාර්ග මායිමේ සිට තැබිය යුතුය.

යම් මාර්ගයක් මීටර් **50** කට අඩු දුරකින් අවසන් වන ආවෘත මාර්ගයක් නම් හෝ එක් බිම් කට්ටියකට පමණක් ප්‍රවේශය ලබා ගනු ලබන අවස්ථාවක සහ අදාල ගොඩනැගිලි සැලසුම් කිරීමේදී ප්‍රවේශ මාර්ගයට අවහිරයක් නොවන ලෙස සහ වැසි ජලය සෘජුව මාර්ගයට නොවැටෙන ලෙස සැලසුම් කරන ගොඩනැගිලි වලදී.

xlii. මෙම නාගරික බල ප්‍රදේශය තුළ විශේෂ ව්‍යාපෘතියක් සඳහා හඳුනා ගනු ලැබූ ඉඩම් හැර වැවිලි සමාගම් සතු අක්කර 5 කට වැඩි ඉඩම් අනුබෙදීමකදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා සලකා බලනු නොලැබේ.

අටවන පරිච්ඡේදය

කලාපීකරණ නියමතා

08 වන පරිච්ඡේදය

කලාපීකරණ නියමතා

8.1. කලාපීකරණ නියමතා

කලාපීකරණ නියමතා

කුරුවිට නගර සංවර්ධන සැලැස්ම මගින් කුරුවිට නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයේ ප්‍රධාන සංවර්ධන කලාප 5 සඳහා බලපැවැත්වෙන කලාපීකරණ නියමතා පහත දක්වා ඇත.

වගු අංකය 8.1: නේවාසික කලාපය

i. ප්‍රධාන කලාපය	නේවාසික කලාපය	
ii. කලාප ලක්ෂණ	**මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය**	
	A 004 මාර්ගයට ආසන්නව පිහිටි අර්ධ නාගරික ලක්ෂණ සහිත ජනාකීර්ණ ප්‍රදේශය මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය ලෙස හඳුනාගෙන ඇත. මෙම කලාපය පිහිටුවීමේ අරමුණ වන්නේ එම කලාපයේ ඉඩම් පරිහරණ ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කලාපය තුළ ජීවත්වීමේ හැකියාව ශක්තිමත් කිරීමයි.	
	අඩු ඝනත්ව නේවාසික කලාපය	
	A 004 මාර්ගයට තරමක් දුරින් පිහිටි ග්‍රාමීය ලක්ෂණ සහිත අඩු ජන ඝනත්වයක් ඇති ප්‍රදේශය අඩු ඝනත්ව නේවාසික කලාපය ලෙස හඳුනා ගැනේ. මෙම කලාපය පිහිටුවීමේ අරමුණ වන්නේ කලාපයේ අනාගත අවශ්‍යතා මෙන්ම නිවාස ප්‍රවණතාවය සපුරාලීම සඳහා කලාපය තුළ ජීවත්වීමේ හැකියාව ශක්තිමත් කිරීමයි.	
iii. කලාප මායිම්	මෙම කලාපයේ මායිම් සඳහා Google Earth හි Decimal Degree X (නැගෙනහිර දේශාංශය) හා Y (උතුරු අක්ෂාංශ) එනම් අක්ෂාංශ, දේශාංශ සහිතව ඛණ්ඩාංක තලයන් (GPS-WGS – 1984) ඇමුණුම් අංක 12 හි සඳහන් කර ඇත.	
iv. උප කලාපය	මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය	අඩු ඝනත්ව නේවාසික කලාපය
v. කලාප අංකය	**R2**	**R3**
vi. කලාප සංගුණකය	**1.2**	**1**
vii. අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	8.3 හි උපලේඛණය **I** සහ **II** හි සඳහන් "අ" සහ "ආ" ආකෘති අනුව විය යුතුය	

<table>
<tr><td>viii. අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය</td><td colspan="2">8.3 හි උපලේඛණය II සහ III හි සදහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව විය යුතුය</td></tr>
<tr><td>ix. විවෘත අවකාශයන් සහ උපරිම උස</td><td colspan="2">8.3 හි උපලේඛණය III හි සදහන් “ඉ” ආකෘතිය අනුව විය යුතුය</td></tr>
<tr><td rowspan="2">x. අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය</td><td>මධ්‍යම සනත්ව නේවාසික කලාපය</td><td>අඩු සනත්ව නේවාසික කලාපය</td></tr>
<tr><td>ව.මීටර් 150</td><td>ව.මීටර් 250</td></tr>
<tr><td>xi. අවසරලත් භාවිතාවන්</td><td colspan="2">8.3 හි උපලේඛණය IV හි සදහන් “ඊ” ආකෘතිය අනුව වියයුතුය</td></tr>
<tr><td rowspan="4">xii. කලාපය සඳහා වන පොදු රෙගුලාසි</td><td colspan="2">මධ්‍යම සනත්ව නේවාසික කලාපය</td></tr>
<tr><td colspan="2">I. මෙම කලාපය තුල පිහිටා ඇති ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමේදී සැලැස්මේ සදහන් භාවිතයන් සදහා පමණක් යොදා ගත යුතු අතර එකී අවස්ථාවන්හිදී සුදුසු යැයි හැඟෙන විධිවිධාන අධිකාරිය විසින් පනවනු ලැබිය හැකිය.
II. මෙම කලාපය තුල ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථාන පිළිබදව සලකා බලනු ලබන්නේ ප්‍රධාන මාර්ගයකට මුහුණලා ඇති අවස්ථාවකදී නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයට යටත්ව වේ.</td></tr>
<tr><td colspan="2">අඩු සනත්ව නේවාසික කලාපය</td></tr>
<tr><td colspan="2">I. කිසියම් ඉඩමක් කෘෂිකාර්මික කලාපයට මායිම්ව පිහිටා ඇති විට සත්ත්ව ගොවිපළවල් පවත්වාගෙන යාම සදහා පහත කොන්දේසියට හා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරකරණයක් ලබා ගැනීමට යටත්ව සලකා බලනු ලැබේ.
• ඉහත සඳහන් කලාප මායිම් හැර අනෙකුත් මායිම් සදහා මීටර 10 ක හරිත වගා බිම් තීරුවක් පවත්වාගෙන යා යුතුය.
II. මෙම කලාපය තුල ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථාන පිළිබදව සලකා බලනු ලබන්නේ ප්‍රධාන මාර්ගයකට මුහුණලා ඇති අවස්ථාවකදී නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයට යටත්ව වේ.</td></tr>
</table>

08 වන පරිච්ඡේදය

කලාපීකරණ නියමතා

වගු අංකය 8.2: වාණිජ කලාපය

i.	**ප්‍රධාන කලාපය**	වාණිජ කලාපය
ii.	**කලාප ලක්ෂණ**	වාණිජ කටයුතු සංකේන්ද්‍රණය වී ඇති නගර ප්‍රදේශය සහ සේවා කටයුතු හා සම්බන්ධ වාණිජ කටයුතු දෙල්ගමුව ප්‍රදේශයට සංකේන්ද්‍රණය වේ. එහිදී කලාප සැලැස්ම තුළ මෙම ප්‍රදේශ දෙක වාණිජ කලාපය යටතේ ඇතුළත් වේ. ඒ අනුව කුරුවිට නගර මධ්‍ය ප්‍රදේශය වාණිජ කලාපයට අයත් වේ. මෙම කලාපය පිහිටුවීමේ අරමුණ වන්නේ ප්‍රකාශිත නාගරික ප්‍රදේශයේ අනෙකුත් ප්‍රදේශවලට අවශ්‍ය වාණිජ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරන අතරම කුරුවිට නගරයේ අනන්‍යතාවය සුරැකීමයි.
iii.	**කලාප මායිම්**	මෙම කලාපයේ මායිම් සඳහා Google Earth හි Decimal Degree X (නැගෙනහිර දේශාංශය) හා Y (උතුරු අක්ෂාංශ) එනම් අක්ෂාංශ, දේශාංශ සහිතව ඛණ්ඩාංක තලයන් (GPS-WGS – 1984) ඇමුණුම් අංක 12 හි සඳහන් කර ඇත.
iv.	**උප කලාපය**	අධි ඝනත්ව වාණිජ කලාපය
v.	**කලාප අංකය**	**C1**
vi.	**කලාප සංගුණකය**	**2**
vii.	**අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය**	8.3 හි **උපලේඛණය I** සහ **II** හි සඳහන් “අ” සහ “ආ” ආකෘති අනුව වියයුතුය
viii.	**අවසරලත් උපරිම බිම් කවරේජ ආවරණය**	8.3 හි **උපලේඛණය II** සහ **III** හි සඳහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය
ix.	**විවෘත අවකාශයන් සහ උපරිම උස**	8.3 හි **උපලේඛණය III** හි සඳහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය
x.	**අනුබෙදීම් කළ හැකි අවම බිම් ප්‍රමාණය**	ව.මීටර් **150**
xi.	**අවසරලත් භාවිතාවන්**	8.3 හි **උපලේඛණය IV** හි සඳහන් “ඊ” ආකෘතිය අනුව වියයුතුය

xii. කලාපය සඳහා වන පොදු රෙගුලාසි	**I.** තිරසාර පරිසර සංවර්ධන සැලැස්මේ හු දර්ශන කළමනාකරණ සැලැස්ම යටතේ වාණිජ කලාපයේ හඳුනාගෙන ඇති ව්‍යාපෘති කටයුතු එම සැලැස්මට අනුකූල විය යුතුය. **II.** මෙම කලාපයේ පිහිටි ඓතිහාසික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීමේදී ඒවා සැලසුමේ සඳහන් භාවිතයන් සඳහා පමණක් භාවිත කළ යුතු අතර එවැනි අවස්ථාවලදී අධිකාරියට සුදුසු යැයි හැඟෙන විධිවිධාන පැනවිය හැක. **III.** සංවර්ධන නියාමන ප්‍රදේශය සඳහා සංවර්ධන නියාමන සැලසුමක් (**Development Guide Plan**) හඳුන්වා දෙන තෙක් මෙම සැලැස්මේ දක්වා ඇති රෙගුලාසි බලපැවැත්වේ.

වගු අංකය 8.3: මිශ්‍ර සංවර්ධන කලාපය

i. ප්‍රධාන කලාපයේ නම	මිශ්‍ර සංවර්ධන කලාපය
ii. කලාප ලක්ෂණ	**මධ්‍යම ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය**
	වාණිජ ප්‍රදේශයට යාබදව ප්‍රධාන මාර්ගයේ රත්නපුර දෙසට සංවර්ධනය වෙමින් පවතින පැරඩයිස් කලාපය සහ කොළඹ දෙසට සංවර්ධනය වන හිග්ගස්හේන මංසන්ධිය මිශ්‍ර සංවර්ධන කලාපයට ඇතුළත් වේ. ආගන්තුක සත්කාර සහ කාර්මික සේවා පැරඩයිස් කලාපයට සංකේන්ද්‍රණය වී ඇති අතර හිග්ගස්හේන කලාපය නැගී එන කලාපය බවට පත් වේ. මේ අනුව, මෙම කලාපය පිහිටුවීමේ අරමුණ වන්නේ පරිධියේ ප්‍රදේශවල මෙන්ම කුරුවිට නගරය හරහා ගමන් කරන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා වෙනත් භාවිතයන් සමඟ වාණිජ සංවර්ධනයට පහසුකම් සැලසීමයි.
	අඩු ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය
	හිග්ගස්හේන මංසන්ධියෙන් ආරම්භ ව ප්‍රධාන මාර්ගය ඔස්සේ ප්‍රකාශිත ප්‍රදේශයේ කොළඹ දෙසට සංවර්ධන බලප්‍රදේශයේ මායිම දක්වා හඳුනාගෙන ඇත. මේ අනුව, මෙම කලාපය පිහිටුවීමේ අරමුණ වන්නේ පරිධියේ ප්‍රදේශවලට මෙන්ම කුරුවිට හරහා ගමන් කරන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අඩු ඝනත්වයකින් වෙනත් භාවිතයන් සමඟ වාණිජ සංවර්ධනයට පහසුකම් සැලසීමයි.
iii. කලාප මායිම්	මෙම කලාපයේ මායිම් සඳහා Google Earth හි Decimal Degree X (නැගෙනහිර දේශාංශය) හා Y (උතුරු අක්ෂාංශ)

	එනම් අක්ෂාංශ, දේශාංශ සහිතව ඛණ්ඩාංක තලයන් (GPS-WGS – 1984) ඇමුණුම් අංක 12 හි සඳහන් කර ඇත.	
iv. උප කලාපයේ නම	මධ්‍යම සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	අඩු සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය
v. කලාප අංකය	**MD2**	**MD3**
vi. කලාප සංගුණකය	1.5	1
vii. අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	8.3 හි **උපලේඛණය I** සහ **II** හි සඳහන් “අ” සහ “ආ” ආකෘති අනුව වියයුතුය	
viii. අවසරලත් උපරිම බිම් කවරේජ් ආවරණය	8.3 හි **උපලේඛණය II** සහ **III** හි සඳහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය	
ix. විවෘත අවකාශයන් සහ උපරිම උස	8.3 හි **උපලේඛණය III** හි සඳහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය	
x. අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	මධ්‍යම සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	අඩු සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය
	ව.මීටර් **150**	ව.මීටර් **250**
xi. අවසරලත් භාවිතාවන්	8.3 හි **උපලේඛණය IV** හි සඳහන් “ඊ” ආකෘතිය අනුව වියයුතුය	
xii. කලාපය සඳහා වන පොදු රෙගුලාසි	**මධ්‍යම සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය**	
	I. මෙම කලාපයේ පිහිටි නාලන්ද එල්ලාවල කර්මාන්ත කලාපය තුළ කර්මාන්ත අමාත්‍යාංශය මගින් නිර්දේශ කරනු ලබන කර්මාන්ත සඳහා අවසර දෙනු ලැබේ.	

i.	ප්‍රධාන කලාපය	සංචාරක කලාපය
ii.	කලාප ලක්ෂණ	බෝපත් ඇල්ල ප්‍රදේශය ,අනෙකුත් ජල මූලාශ්‍ර සහ සංචාරක ආකර්ෂණ ස්ථාන ඇති කඳුකර ප්‍රදේශ පදනම් කරගෙන මෙම විශේෂිත කලාපය හඳුනාගෙන ඇත. එසේම, කුරුවිට ප්‍රදේශයේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා අනෙකුත් ප්‍රවර්ධන කටයුතු සමඟ සංචාරක ව්‍යාපාරයේ දියුණුවට පහසුකම් සැලසීම මෙම කලාපය පිහිටුවීමේ අරමුණයි.
iii.	කලාප මායිම්	මෙම කලාපයේ මායිම් සඳහා Google Earth හි Decimal Degree X (නැගෙනහිර දේශාංශය) හා Y (උතුරු අක්ෂාංශ) එනම් අක්ෂාංශ, දේශාංශ සහිතව ඛණ්ඩාංක තලයන් (GPS-WGS – 1984) ඇමුණුම් අංක 12 හි සඳහන් කර ඇත.
iv.	උප කලාපය	අඩු ඝනත්ව සංචාරක කලාපය
v.	කලාප අංකය	T3
vi.	කලාප සංගුණකය	1
vii.	අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	8.3 හි උපලේඛණය I සහ II හි සඳහන් “අ” සහ “ආ” ආකෘති අනුව වියයුතුය
viii.	අවසරලත් උපරිම බිම් කවරි ආවරණය	8.3 හි උපලේඛණය II සහ III හි සඳහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය
ix.	විවෘත අවකාශයන් සහ උපරිම උස	8.3 හි උපලේඛණය III හි සඳහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය
x.	අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	ව.මීටර් 250
xi.	අවසරලත් භාවිතාවන්	8.3 හි උපලේඛණය IV හි සඳහන් “ඊ” ආකෘතිය අනුව වියයුතුය

08 වන පරිච්ඡේදය

කලාපීකරණ නියමතා

xii. කලාපය සඳහා වන පොදු රෙගුලාසි	**I.** මෙම කලාපයේ ඉදිකරනු ලබන සංචාරක කටයුතුවලට අදාළ ගොඩනැගිලිවල බාහිර වර්ණ පරිසරයට ගැළපෙන අයුරින් යෙදිය යුතු අතර බාහිර බිත්ති සහ වහලය සඳහා පරාවර්තක නොවන ද්‍රව්‍ය ද භාවිත කළ යුතුය. **II.** කලාපය තුල ඉදිකරනු ලබන මායිම් තාප්ප පොළව මට්ටමේ සිට මීටර **0.75**ක උසක් දක්වා පමණක් ඉදි කිරීමට ඉඩ දෙනු ලබන අතර, ඉතිරි උස මට්ටමේ ඉදිකිරීම් ලෙස දැල් වැටක් හෝ වෙනත් විවෘත අවකාශ සහිත ආරක්ෂිත වැටකට අවසර දෙනු ලැබේ . **III.** තිරසාර පරිසර සංවර්ධන සැලැස්මේ භූ දර්ශන කළමනාකරණ සැලැස්ම යටතේ සංචාරක ප්‍රවර්ධන කලාපයේ හඳුනාගෙන ඇති ව්‍යාපෘති එම සැලැස්මට අනුකූල විය යුතුය. **IV.** බෝපත් ඇල්ල පැහැදිලිව දිස්වෙන දර්ශන පථය අවහිර නොවන ලෙස ඉදිකිරීම් සිදුකල යුතු අතර එම ඉදි කිරීම් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් නිරාකරණයට යටත්ව සිදු කළ යුතුය. (සිතියම් අංක 6.19 අධ්‍යනය කරන්න) **V.** බිම් පාදක සන්නිවේදන කුළුණු ඉදි කිරීමේ දී ඒවා පරිසරයට අනුගත වන ලෙස ඉදිකළ යුතුය. **VI.** කිසියම් බිම් කොටසක් දෙවිපහල, උඩකඩ හා එරත්න මාර්ගයන්ට මුහුණලා ඇති විට අනෙකුත් අවශ්‍යතා සපුරන්නේ නම් මධ්‍යම ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය හි භාවිතයන් හා රෙගුලාසි අනුව සලකා බලනු ලැබේ.

වගු අංකය 8.5: කෘෂිකාර්මික කලාපය

i. ප්‍රධාන කලාපය	කෘෂිකාර්මික කලාපය
ii. කලාප ලක්ෂණ	මෙම කලාපය දැනට වගා කර ඇති කුඹුරු, අතහැර දැමූ කුඹුරු සහ දෙනිය. ඕවිට වැනි සම්බන්ධිත ප්‍රදේශ හා තෙත් බිම් කෘෂිකර්මාන්තය සිදු කරන ප්‍රදේශ හා වැව් , ඇළ මාර්ග ඇතුළු ජාල පද්ධති වලින් සමන්විත වේ .
iii. කලාප මායිම්	මෙම කලාපයේ මායිම් සඳහා Google Earth හි Decimal Degree X (නැගෙනහිර දේශාංශය) හා Y (උතුරු අක්ෂාංශ) එනම් අක්ෂාංශ, දේශාංශ සහිතව ඛණ්ඩාංක තලයන් (GPS-WGS – 1984) ඇමුණුම් අංක 12 හි සඳහන් කර ඇත.

iv. **උප කලාපය**	උප කලාප අදාළ නොවේ.
v. **කලාප අංකය**	**A**
vi. **කලාප සංගුණකය**	0
vii. **අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය**	අදාළ නොවේ.
viii. **අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය**	අදාළ නොවේ.
ix. **විවෘත අවකාශයන් සහ උපරිම උස**	අදාළ නොවේ.
x. අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	-
xi. **අවසරලත් භාවිතාවන්**	8.3 හි **උපලේඛණය IV** හි සදහන් **"ඊ"** ආකෘතිය අනුව වියයුතුය
xii. **කලාපය සඳහා වන පොදු රෙගුලාසි**	**i.** මෙම කලාපයේ පවතින ගොඩ ඉඩම් තුළ සිදුකරන ඉදිකිරීම් නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සිදු කළ යුතුය. **ii.** මෙම කලාපයේ සියලු භාවිතයන් සදහා 8.1.1 හා 8.1.2 හි සදහන් මාර්ගෝපදේශ හා කොන්දේසි බල පැවැත්වේ.

08 වන පරිච්ඡේදය

කලාපීකරණ නියමතා

8.1.1. කෘෂිකාර්මික කලාපය සඳහා අනුමත භාවිතයන්

අනුමත භාවිතයන්	
පහත් බිම් / කුඹුරු ඉඩම්	**ගොඩ ඉඩම්**
• කුඹුරු වගා බිම් • තෙත්බිම් සම්බන්ධ අනෙකුත් කෘෂි වගා බිම් • අවිධිමත් භූමිය යථා තත්වයට පත් කිරීමේ කටයුතු වලට යටත්ව භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරියේ හා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ කොන්දේසි වලට යටත්ව සිදුකරනු ලබන කැණීම් කටයුතු (මැණික්,මැටි, වැලි, පස් හා වෙනත් ඛණිජ කැණීම්) • බලපෑම අවම පරිසර හිතකාමී සංචාරක කටයුතු (උදා:- පතල් කර්මාන්තය ආශ්‍රිත) • පාරිසරික අධ්‍යාපන කටයුතු • පර්යේෂණ කටයුතු • පරිසර හිතකාමී ජලජ ජීවී වගා පොකුණු • තෙත්බිම් ස්වභාවික උද්‍යාන • එලිමහන් ශරීර සුවතා ප්‍රදේශ / ශාරීරිකව්‍යායාම් පහසුකම් ඇති ස්ථාන - (අවම භූමි ප්‍රමාණය ව.මී.1000) • ජාතික වැදගත් කමක් සහිත රජයේ අනුමත පොදු අපරව්‍යුහ ව්‍යාපෘති • නව වාරිමාර්ග ඉදිකිරීම /ගංවතුර පාලනය සඳහා වන ආරක්ෂණ ඉදිකිරීම • කුරුවිට නගර සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගෙන ඇති ව්‍යාපෘති	මෙම කලාපය තුළ කිසියම් ගොඩ ඉඩමක් පවතින්නේ නම් පහත සඳහන් භාවිතයන්ට පමණක් බිම් ආවරණය 50 % කට යටත්ව අවසර දෙනු ලැබේ. • උද්‍යාන / විවෘත ක්‍රීඩා පිටි (ව්‍යුහාත්මක ස්ථිර ඉදිකිරීම් නොමැති) • නේවාසික ගොඩනැගිලි - අවම භූමි ප්‍රමාණය ව.මී. 500 (පර්චස් 20) • පරිසර හිතකාමී අවන්හල්, ලැගුම් හල්, උත්සව ශාලා - අවම භූමි ප්‍රමාණය ව.මී. 1000 (පර්චස් 40) • කුඩා පරිමාණයේ සම්මන්ත්‍රණ ශාලා - අවම භූමි ප්‍රමාණය ව.මී. 1000 (පර්චස් 40) • පරිසර හිතකාමී සංචාරක කටයුතු - අවම භූමි ප්‍රමාණය ව.මී. 1000 (පර්චස් 40)

8.1.2. කෘෂිකාර්මික කලාපය සඳහා වූ මාර්ගෝපදේශ

I. දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන ආන්තික කාලගුණික තත්ත්වයන් වල තීව්‍රතාවය වැඩිවීම හා තෙත් බිම් වල සිදු කර ඇති ගොඩ කිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් වැසි ජලය ගලා යන තීව්‍රතාවය සැළකිල්ලට ගනිමින් ගංවතුර ධාරිතාවය නඩත්තු කිරීම සහ අනෙකුත් සංවර්ධන කටයුතු උපලේඛනයේ සඳහන් ආයතන වල සම්බන්ධීකරණය තුළින් ලබා ගන්නා තීරණ අනුව සිදු කළ යුතුය.

II. පුරන්වූ කුඹුරු සහ වගා කුඹුරු සංවර්ධනය කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරියේ සහ උපලේඛනයේ සඳහන් අංක. 01, 03, 05 ,07 දරණ ආයතන වලින් අනුමැතිය ලබා ගත යුතුයි.

III. ජල බැස යාම් හා ගංවතුර රැඳවුම් ධාරිතාවයන්ට බාධා වන කිසිම ඉදිකිරීමක් තෙත් බිමක ජලාශ්‍රීතව හෝ ජල මාර්ග වල සිදු නොකළ යුතුය.නමුත් මහා සැලසුමකට **(Master Plan)** හෝ නිර්මාණ උපදේශක මාර්ගෝපදේශ සැලැස්මකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කරන ලද විශේෂ ව්‍යාපෘතීන්ට හෝ ජල ගැලීම් වලට හා ගංවතුර ඉසිලුම් ධාරිතාවයන්ට බාධා නොවන ලෙස අනුමත ඉදිකිරීම් උපලේඛනයේ සඳහන් අංක. 01 දරණ ආයතනයෙන් හා අංක. 02 සිට 22 දක්වා ඇති අදාළ ආයතනයන් වල නිර්දේශය හා අනුමැතියට යටත්ව සිදු කළ හැකිය.

IV. පාරිසරික සංවේදී වටිනාකම සහිත තෙත් බිම් වල ආගන්තුක ආක්‍රමණශීලී ශාක හා සතුන් හැර වෙනත් ශාක හා සතුන් ඉවත් නොකළ යුතුය. (නව පරිසරයට අනුගත වූ ආක්‍රමණික විශේෂ හැර)

V. ජල රැඳවුම් ධාරිතාවය විශේෂයෙන් වැදගත් වන සෑම තෙත් බිමකම සිදු කරන අනුමත භාවිතයකදී ජල රැඳවුම් ධාරිතාව අඩුවීම සහ (අනෙකුත් බලපෑම් සිදුවන) පාරිසරික සේවාවන්ට සිදුවන බලපෑමට හිලව් වන සේ විකල්ප ස්ථාන සුදුසු ලෙස ස්ථාපනය කල යුතුය. ඒ සඳහා උපලේඛනයේ සඳහන් අදාළ ආයතනවල අනුමැතිය ලබාගත යුතුය.

VI. මෙම කලාපය තුළ අවසර දෙනු ලබන සංවර්ධන කටයුත්තකදී පැහැදිලිව හඳුනාගත හැකි භූ දර්ශන / සංස්කෘතික / පුරා විද්‍යාත්මක / ජෛව විවිධත්වය ඉහල අගයන් ඇති ප්‍රදේශ සංරක්ෂණය කල යුතුය.

VII. මෙම කලාපයේ අනුමත කාර්යයන් වලදී නීත්‍යානුකූල වූ පොදු අඩි පාරවල්, පොදු නාන ස්ථාන සංරක්ෂණය කිරීම හෝ ඒවා සුදුසු ළඟම ස්ථානයක ස්ථාන ගත කල යුතුය.

08 වන පරිච්ඡේදය

කලාපීකරණ නියමතා

VIII. සංවර්ධනකරුවන් විසින් සැලසුම් සකස් කිරීම හා නිර්මාණ සහ අධීක්ෂණ කටයුතු කිරීම සඳහා වෘත්තීය සුදුසුකම්ලත් වෘත්තීයවේදීන්ගේ සේවය ලබා ගත යුතුය.

උපලේඛණය

01. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,
02. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
03. මධ්‍යම පරිසර අධිකාරිය,
04. නාගරික සංවර්ධන අධිකාරිය,
05. අදාළ පළාත් පාලන ආයතනය/ ආයතන
06. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය
07. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
08. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
09. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන අධිකාරිය
10. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
11. සබරගමුව පළාත් සභාව
12. ජල සම්පත් හා ජලප්‍රවාහන මණ්ඩලය
13. ජල ජීවී සංවර්ධන අධිකාරිය
14. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය
15. ශ්‍රී ලංකා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
16. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
17. මාර්ග සංවර්ධන අධිකාරිය
18. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

8.2 සංවර්ධන නියාමන ප්‍රදේශ (Development Guide Planning Areas)

සිතියම් අංක 8.1 : සංවර්ධන නියාමන ප්‍රදේශය - කුරුවිට



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම

8.3 උපලේඛණ

උපලේඛණය I - "අ" ආකෘතිය: නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් ගෙබිම් අනුපාතයන්

ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්)	කලාපිය සංගුණකය = 0.50 - 0.74				කලාපිය සංගුණකය = 0.75-0.99				කලාපිය සංගුණකය = 1.00-1.24				කලාපිය සංගුණකය= 1.25-1.49			
	මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල			
	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි
150 - 250ට අඩු	0.8	0.9	0.9	0.9	1.3	1.3	1.4	1.4	1.6	1.7	1.8	1.9	2.0	2.2	2.3	2.4
250 - 375 ට අඩු	0.9	1.0	1.2	1.3	1.3	1.6	1.8	2.0	1.8	2.2	2.4	2.7	2.2	2.7	3.0	3.3
375 - 500 ට අඩු	0.9	1.0	1.2	1.4	1.3	1.6	1.9	2.1	1.9	2.2	2.5	2.8	2.3	2.8	3.2	3.4
500 - 750 ට අඩු	1.0	1.1	1.3	1.5	1.4	1.7	2.0	2.2	2.0	2.3	2.7	3.0	2.4	3.0	3.4	3.5
750 - 1000 ට අඩු	1.0	1.2	1.4	1.7	1.5	1.8	2.2	2.5	2.1	2.4	2.9	3.3	2.6	3.0	3.6	4.0
1000 - 1500 ට අඩු	1.1	1.3	1.5	1.8	1.6	1.9	2.3	2.7	2.2	2.5	3.0	3.6	2.7	3.1	3.8	4.5
1500 - 2000 ට අඩු	1.1	1.4	1.7	2.0	1.7	2.1	2.5	3.0	2.3	2.7	3.4	4.0	2.9	3.4	4.2	5.0
2000 - 2500 ට අඩු	1.2	1.5	1.8	2.1	1.8	2.3	2.7	3.1	2.4	2.8	3.5	4.2	3.0	3.5	4.4	5.4
2500 - 3000 ට අඩු	1.2	1.6	2.0	2.4	1.9	2.4	3.0	3.6	2.5	3.2	4.0	4.7	3.1	3.8	4.7	5.8
3000 - 3500 ට අඩු	1.3	1.7	2.1	2.5	2.0	2.5	3.1	3.7	2.6	3.4	4.2	5.0	3.2	4.0	5.0	6.2
3500 - 4000 ට අඩු	1.4	1.8	2.2	2.6	2.2	2.6	3.3	3.9	2.8	3.6	4.3	5.3	3.3	4.3	5.5	6.6
4000ට වැඩි	1.5	1.9	2.3	2.8	2.5	2.8	3.5	4.0	3.0	3.8	4.5	5.5	3.5	4.5	6.0	7.0

ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්)	කලාපිය සංගුණකය = 1.50 - 1.74				කලාපිය සංගුණකය = 1.75-1.99				කලාපිය සංගුණකය = 2.00-2.24				කලාපිය සංගුණකය= 2.25-2.49			
	මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල			
	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි
150 - 250ට අඩු	2.4	2.6	2.7	2.8	2.8	3.0	3.2	3.3	3.0	3.4	3.6	3.8	3.0	3.4	3.6	4.0
250 - 375 ට අඩු	2.6	3.2	3.6	4.0	3.0	3.4	4.3	4.7	3.2	3.6	4.5	4.5	3.5	3.8	4.5	5.0
375 - 500 ට අඩු	2.7	3.3	3.8	4.2	3.2	3.5	4.5	5.0	3.4	3.7	4.8	5.2	3.6	4.5	4.7	5.5
500 - 750 ට අඩු	2.8	3.4	4.0	4.5	3.4	3.6	4.7	5.5	3.5	4.0	5.0	6.0	3.7	5.0	5.0	6.0
750 - 1000 ට අඩු	3.1	3.6	4.3	5.0	3.5	3.8	5.1	6.0	3.6	4.5	5.7	6.5	3.8	5.1	6.0	6.5
1000 - 1500 ට අඩු	3.2	3.8	4.6	5.5	3.6	4.0	5.4	6.5	3.7	5.0	6.1	8.0	3.9	5.3	6.5	8.5
1500 - 2000 ට අඩු	3.4	4.0	5.0	6.0	3.7	4.2	5.8	7.0	3.8	5.1	6.7	9.0	4.0	5.4	7.0	*10
2000 - 2500 ට අඩු	3.5	4.2	5.2	6.5	3.8	4.4	6.2	7.5	3.9	5.2	7.1	*10	4.0	5.5	7.5	*10.5
2500 - 3000 ට අඩු	3.6	4.4	5.5	7.0	3.9	4.6	6.5	8.0	4.0	5.3	7.4	*10.5	4.0	5.6	7.5	*11
3000 - 3500 ට අඩු	3.7	4.6	6.0	7.5	4.0	4.8	6.9	8.5	4.0	5.4	7.6	*11	4.0	5.7	8.0	*11.5
3500 - 4000 ට අඩු	3.8	4.8	6.3	7.7	4.0	5.0	7.3	9.0	4.0	5.5	7.8	*11.5	4.0	5.8	8.0	*12
4000ට වැඩි	4.0	5.0	6.5	8.0	4.0	5.2	7.5	9.5	4.0	5.6	8.0	*12	4.0	5.9	8.0	*UL

ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්)	කලාපිය සංගුණකය = 2.50-2.74				කලාපිය සංගුණකය = 2.75-2.99				කලාපිය සංගුණකය = 3.00-3.24				කලාපිය සංගුණකය = 3.25-3.49			
	මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල			
	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි
150 - 250ට අඩු	3.0	3.4	3.6	4.0	3.0	3.4	3.6	4.0	3.0	3.4	3.6	4.0	3.0	3.4	3.6	4.0
250 - 375 ට අඩු	3.5	4.0	5.0	5.5	3.5	4.2	5.0	5.5	3.5	4.4	5.0	5.5	3.5	4.6	5.0	5.5
375 - 500 ට අඩු	3.6	4.6	5.2	6.0	3.6	4.7	5.2	6.0	3.6	4.8	5.2	6.0	3.6	4.9	5.2	6.0
500 - 750 ට අඩු	3.7	5.1	5.5	6.5	3.7	5.2	5.5	6.5	3.7	5.3	5.5	6.5	3.8	5.4	5.5	6.5
750 - 1000 ට අඩු	3.8	5.2	6.5	7.0	3.8	5.3	7.0	7.5	3.8	5.4	7.0	7.5	4.0	5.5	7.5	8.0
1000 - 1500 ට අඩු	3.9	5.4	7.0	9.0	3.9	5.5	7.5	9.0	3.9	5.6	7.5	9.0	4.0	5.7	8.0	9.0
1500 - 2000 ට අඩු	4.0	5.5	7.5	*10.5	4.0	5.6	7.5	*10.5	4.0	5.7	8.0	*10.5	4.0	5.8	8.0	*11
2000 - 2500 ට අඩු	4.0	5.6	7.5	*11	4.0	5.7	8.0	*11	4.0	5.8	8.0	*11	4.0	5.9	8.0	*11.5
2500 - 3000 ට අඩු	4.0	5.7	8.0	*11.5	4.0	5.8	8.0	*11.5	4.0	5.9	8.0	*11.5	4.0	6.0	8.0	*12
3000 - 3500 ට අඩු	4.0	5.8	8.0	*12	4.0	5.9	8.0	*12	4.0	6.0	8.0	*12	4.0	6.0	8.0	*12
3500 - 4000 ට අඩු	4.0	5.9	8.0	*12	4.0	6.0	8.0	*12	4.0	6.0	8.0	*12	4.0	6.0	8.0	*12
4000ට වැඩි	4.0	6.0	8.0	*UL	4.0	6.0	8.0	*UL	4.0	6.0	8.0	*UL	4.0	6.0	8.0	*UL

ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්)	කලාපීය සංගුණකය = 3.50-3.74				කලාපීය සංගුණකය = 3.75-4.00			
	මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල			
	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි
150 - 250ට අඩු	3.0	3.4	3.6	4.0	3.0	3.4	3.6	4.0
250 - 375 ට අඩු	3.5	4.8	5.0	5.5	3.5	5.0	5.0	5.5
375 - 500 ට අඩු	3.6	5.0	5.2	6.0	3.6	5.4	5.2	6.0
500 - 750 ට අඩු	3.8	5.5	5.5	6.5	4.0	5.7	5.5	6.5
750 - 1000 ට අඩු	4.0	5.6	7.5	8.0	4.5	6.0	7.5	8.0
1000 - 1500 ට අඩු	4.2	5.8	8.0	9.0	4.5	6.5	8.0	9.0
1500 - 2000 ට අඩු	4.2	6.0	8.0	*11	4.5	7.0	8.0	*11
2000 - 2500 ට අඩු	4.2	6.2	8.0	*11.5	4.5	7.0	8.0	*12
2500 - 3000 ට අඩු	4.2	6.4	8.0	*12	4.5	7.0	8.0	*12
3000 - 3500 ට අඩු	4.2	6.5	8.0	*12	4.5	7.0	8.0	*12
3500 - 4000 ට අඩු	4.2	6.5	8.0	*12	4.5	7.0	8.0	*12
4000ට වැඩි	4.2	6.5	8.0	*UL	4.5	7.0	8.0	*UL

UL - අසීමිත

නිත්‍යානුකූලව වාහන නැවතුම් සඳහා වෙන්කර ඇති ගෙබිම් ප්‍රමාණයන් ගෙබිම් අනුපාතය සඳහා ගණනය නොකරයි.

කලාපීය රෙගුලාසි යටතේ මහල් ප්‍රමාණය හෝ ගෙබිම් අනුපාතය දක්වා ඇති විටකදී ඉහත ගෙබිම් අනුපාතයන් අදාළ නොවේ.

සංවර්ධන සැලැස්ම යටතේ ඉඩමේ ආනතියට අනුව ඉහත ගෙබිම් අනුපාතයන් වෙනස් විය හැක.

ඉඩමේ ආනතිය අංශක 11ට වඩා වැඩිවනවිට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලබාගත යුතුය

* ගෙබිම් අනුපාතය 10.0 හෝ ඊට වැඩි ප්‍රමාණයක් සඳහා අවසර ලැබෙනුයේ අවම වශයෙන් මීටර් 12ක (මාර්ගයේ මැද සිට) ගොඩනැගිලි සීමාවක් පනවා ඇති ප්‍රවේශ මාර්ගය සඳහා පමණි. එසේ නොවන අවස්ථාවක උපරිම ගෙබිම් අනුපාතය 9.0 ට සීමා විය යුතුය.

** සංවර්ධන සැලැස්මේ මීටර් 7 ක් පළල මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇති මාර්ග සඳහා අවම මාර්ග පළල මීටර් 7 ක් ලෙස සලකනු ලැබේ.

උපලේඛණය II - "ආ" ආකෘතිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් මහල් ප්‍රමාණයන්

මීටර් 3 සහ 4.5 මාර්ග සඳහා මහල් ප්‍රමාණයන්						
මාර්ගයේ අවම පළල	**ඉඩමේ මුහුණතෙහි අවම පළල**	**ගෙබිම් ආවරණ ප්‍රතිශතය***	**උපරිම මහල් ප්‍රමාණය**			
			කලාපිය සංගුණකය 0.5 - 0.74	**කලාපිය සංගුණකය 0.75 - 1.24**	**කලාපිය සංගුණකය 1.25 - 3.49**	**කලාපිය සංගුණකය 3.50 - 4.00**
මීටර් 3.0	මීටර් 6	65%	1 (G)	2 (G+1)	3 (G+2)	3 (G+2)
මීටර් 4.5	මීටර් 6	65%	1 (G)	2 (G+1)	3 (G+2)	4 (G+3)
වාහන නැවතුම් ඉඩකඩද ඇතුලත්ව ඉහත මහල් ප්‍රමාණයන් දක්වා ඇත එක් එක් මාර්ග සඳහා නියමිත නිවාස ඒකක ප්‍රමාණයන් වෙනස් නොවේ * කලාපීය රෙගුලාසි යටතේ ගෙබිම් ආවරණ ප්‍රතිශතයන් දක්වා නොමැති විටකදී						

උපලේඛණය III - "ඉ" ආකෘතිය: නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති විවෘත අවකාශයන්

"ඉ" පෝරමය - විවුර්ත අවකාශයන්									
ගොඩනැගිල්ලේ උස (මීටර්)	ඉඩමේ මුහුණතෙහි අවම පළල (මීටර්)	ගෙබිම් ආවරණ ප්‍රතිශතය*		පසුපස අවකාශය (මීටර්)		පැති අවකාශය (මීටර්)		ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබාගන්නා වාලිං සදහා	
		නේවාසික නොවන	නේවාසික	මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා නොගන්නාවිට	මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගන්නාවිට	මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා නොගන්නාවිට	මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගන්නාවිට	අවම පළල	අවම ගෙබිම් ප්‍රමාණය
7ට අඩු	**6**	80%**	65%	2.3 මීටර්	2.3 මීටර්	-	2.3 මීටර්	2.3 මීටර්	5 ව. මීටර්
7 - 15ට අඩු	**6**	65%	65%	3.0 මීටර්	3.0 මීටර්	-	3.0 මීටර්	3.0 මීටර්	9 ව. මීටර්
15 - 30ට අඩු	**12**	65%	65%	4.0 මීටර්	4.0 මීටර්	1.0 මීටර් සහ 3.0 මීටර්	4.0 මීටර්	4.0 මීටර්	16 ව. මීටර්
30 - 50ට අඩු	**20**	65%	65%	4.0 මීටර්	5.0 මීටර්	3.0 මීටර් දෙපසින්	5.0 මීටර්	5.0 මීටර්	25 ව. මීටර්
50 - 75ට අඩු	**30**	50%***	50%***	5.0 මීටර්	6.0 මීටර්	4.0 මීටර් දෙපසින්	6.0 මීටර්	6.0 මීටර්	36 ව. මීටර්
75 සහ ඊට වැඩි	**40ට වැඩි**	50%***	50%***	5.0 මීටර්	6.0 මීටර්	5.0 මීටර් දෙපසින්	6.0 මීටර්	6.0 මීටර්	****

ගොඩනැගිල්ලේ උස - ප්‍රවේශ මාර්ගය මට්ටමේ සිට ඉහල සදලු තලය හෝ වහලය මට්ටම දක්වා උස (වාහන නැවතුම් මහල්ද ඇතුලත්ව)

* කලාපීය රෙගුලාසි යටතේ ගෙබිම් ආවරණ ප්‍රතිශතයන් දක්වා නොමැති විටකදී

** සම්පූර්ණයෙන්ම නේවාසික නොවන සංවර්ධන කටයුතු සදහා

*** ගොඩනැගිලි උසේන් 20% හෝ මහල් 12 යන දෙකෙන් අවම උසක් සහිත පොඩියම් (Podium) මහල් සදහා 65% ගෙබිම් ආවරණ ප්‍රතිශතයක් ලබා දියහැක

**** අමතර සෑම උස මී 3ක් සදහාම අවම ගෙමිබ් ප්‍රමාණය ව. මීටර් 1 කින් වැඩිවිය යුතුය

උපලේඛණය IV- "ඊ" ආකෘතිය: අනුමත භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණයන්

ප්‍රධාන භාවිතය	අනු අංකය	අනු භාවිතය	අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	අධි සනත්ව වාණිජ කලාපය	මධ්‍ය සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	අඩු සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	අඩු සනත්ව සංචාරක කලාපය	මධ්‍ය සනත්ව නේවාසික කලාපය	අඩු සනත්ව නේවාසික කලාපය	කෘෂිකාර්මික කලාපය
නේවාසික (Residential)	1	නිවාස	150	150	150	250	250	150	250	
	2	සහාධිපත්‍ය නිවාස සංකීර්ණ	150	150	150	250	250	150	250	
	3	නිවාස සංකීර්ණ	500							
	4	නිවාස ව්‍යාපෘති	1000							
	5	නිල නිවාස/සේවක නිවාස	250							
	6	සේවා නිවාස (Service apartments)	500							
	7	ස්ටුඩියෝ නිවාස	500							
	8	ඩෝමේට්‍රි	500							
	9	නේවාසිකාගාර	150	150	150	250	250	150	250	
	10	දිවා සුරැකුම් මධ්‍යස්ථාන	500							
	11	ගිලන් සේවා මධ්‍යස්ථාන	500							
	12	වැඩිහිටි නිවාස	500							
	13	ළමා නිවාස	500							
	14	ආබාධිත පුනරුත්ථාපන නිවාස	500							

	15	පුනරුත්ථාපන නිවාස/ පරිවාස	1000							
	16	ප්‍රජා ශාලා	150	150	150	250	250	150	250	
	17	නිවාඩු නිකේතන/සංචාරක බංගලා	500							
	18	ආගන්තුක නිවාස	250	250	250	500	250	1000	1000	
	19	ලැගුම් හල්	250	250	250	500	250			
	20	තානායම්	1000							
	21	විශ්‍රාම ශාලා	250							
	22	ගෘහාශ්‍රිත සංචාරක කටයුතු	150		150	250	250	150	250	
	23	වතු නිවාස			අ.බි.ප්‍ර. අදාළ නොවේ				අ.බි.ප්‍ර. අදාළ නොවේ	
සෞඛ්‍ය (Health)	1	රෝහල්	1000							
	2	වෛද්‍ය මධ්‍යස්ථාන (එක් වෛද්‍යවරයෙකු පමණක් සිටින)	150	150	150	250	250	150	250	
	3	වෛද්‍ය මධ්‍යස්ථාන (වෛද්‍යවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු සිටින)	500							
	4	සාම්පල් එකතු කිරීමේ මධ්‍යස්ථාන	150	150	150	250	250	150	250	
	5	රසායනාගාර	150	150	150	250				

	6	ඔසුසල්	150	150	150	250	250	150		
	7	පශු වෛද්‍ය සායන	150	150	150	250		150	250	
	8	පශු වෛද්‍ය රෝහල්	500							
	9	නිරෝධායන මධ්‍යස්ථාන	500							
	10	ළමා හා මාතෘ /පවුල් සායන මධ්‍යස්ථාන	250							
	11	අනෙකුත් වෛද්‍ය ආයතන	250							
	12	වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන	500							
	13	සත්ත්ව සුරුකුම් මධ්‍යස්ථානය	500							
	14	වතු රෝහල්	1000							
	15	ආයුර්වේද රෝහල්	1000							
කාර්යාල සහ ආයතනික (Office & Institution)	1	කාර්යාල	150	150	150	250				
	2	වෘත්තිය කාර්යාල	150	150	150	250	250	150*	250*	
	3	කාර්යාල සංකීර්ණ (වර්ග මීටර් 5000 වැඩි)	1000							
	4	බැංකු/රක්ෂණ මුල්‍ය ආයතන	150	150	150	250		150*		
	5	වෙනත්	150	150	150	250	250	150*	250*	

වාණිජ (Commercial and services)	1	සාප්පු සංකීර්ණ	500							
	2	සිල්ලර වෙළඳසැල්	150	150	150	250	250	150*	250*	
	3	තොග වෙළඳසැල්	250							
	4	ආංශික වෙළඳසැල්/සුපිරි වෙළඳ සැල්	500					**	**	
	5	විවෘත වෙළඳ සැල්	150	150	150	250	250	150	250	
	6	ප්‍රදර්ශනාගාර	500							
	7	අවන්හල්/ ආපනශාලා (Take Away only)	150	150	150	250	250	150*	250*	
	8	අවන්හල්/ආපනශාලා	250							
	9	උත්සව ශාලා	1000							
	10	තරු පන්ති හෝටල්	2000							
	11	හෝටල්	500	500	500	500	500	1000	1000	
	12	නාගරික හෝටල්	500							
	13	සමාජ ශාලා	500							
	14	මොටෙල්	250	250	250	250	250	1000	1000	
	15	කබානා හෝටල්	500		500	500	500	1000	1000	
	16	විකාශනාගාර	500							
	17	ශබ්දාගාර (විකාශනාගාර නොවන)	150	150	150	250	250			

	18	රූපලාවන්‍ය මධ්‍යස්ථාන / බාබර් සාප්පු	150	150	150	250	250	150	250	
	19	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	150	150	150	250	250	150*	250*	
	20	සම්භාහන මධ්‍යස්ථාන	150	150	150	250	250			
	21	ටේලර් සාප්පු	150	150	150	250	250	150*	250*	
	22	අවමංගල්‍ය ශාලා	500							
	23	මල් ශාලා	150	150	150	250				
	24	ලොන්ඩ්‍රි/ ඇඳුම් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථාන	150	150	150	250	250	150	250	
	25	හාඩ්වෙයාර්/ ගොඩනැගිලි ද්‍රව්‍ය විකුණුම් වෙළඳසැල්	250	250	250	500		500**	500**	
	26	මත්පැන් අලෙවිසැල්	150	150	150	250	250			
	27	වාහන අමතර කොටස් වෙළඳසැල්	150	150	150	250				
	28	කුලී රථ සේවා මධ්‍යස්ථාන	250							
	29	වාහන සේවා මධ්‍යස්ථාන බයිසිකල් / ත්‍රීවීල්	375							
	30	වාහන සේවා මධ්‍යස්ථාන සැහැල්ලු වාහන	500							
	31	වාහන සේවා මධ්‍යස්ථාන බර වාහන	1000							
	32	වාහන අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන (ගරාජ්) බයිසිකල් / ත්‍රීවීල්	375							

	33	වාහන අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන (ගරාජ්) සැහැල්ලු වාහන	500							
	34	වාහන අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන (ගරාජ්) බර වාහන	1000							
	35	වාහන ඉන්ධන පිරවුම්හල්	1000							
	36	දුම්පරික්ෂණ මධ්‍යස්ථාන	500							
	37	ඔට්ටු ඇල්ලීමේ මධ්‍යස්ථාන	150	150	150	250	250			
	38	බස් පර්යන්ත	1000							
	39	මුද්‍රණාල	150	150	150	250				
	40	වාහන ටයර් අලෙවිය හා සේවා කටයුතු මධ්‍යස්ථාන	1000							
අධ්‍යාපනික (Educational)	1	පෙර පාසල් / පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	500							
	2	ප්‍රාථමික පාසල්	4000							
	3	ද්විතික පාසල්	8000							
	4	තෘතික පාසල්	8000							
	5	පෞද්ගලික පාසල් / ජාත්‍යන්තර පාසල්	4000							
	6	උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන	2000							
	7	රාජ්‍ය / පෞද්ගලික විශ්ව විද්‍යාල	4000							
	8	කාර්මික විද්‍යාල / වෘතියය පුහුණු මධ්‍යස්ථාන / පුහුණු මධ්‍යස්ථාන	1000							

	9	පෞද්ගලික උපකාරක පන්ති- වර්ග මීටර 50ට අඩු	150	150	150	250	250	150	250	
	10	පෞද්ගලික උපකාරක පන්ති- වර්ග මීටර 50 හා වර්ග මීටර 500 අතර	500							
	11	පෞද්ගලික උපකාරක පන්ති වර්ග මීටර 500ට වැඩි	1000							
	12	කලායතන/ රංගායතන	1000							
	13	අනෙකුත් අධ්‍යාපන ආයතන	250					**	**	
	14	පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන	250					**	**	
සමාජ හා ආගමික (Social & Religious)	1	ආගමික ස්ථාන	500							
	2	ආගමික අධ්‍යාපන මධ්‍යස්ථාන	500							
	3	කෞතුකාගාර	250							
	4	සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	500							
	5	සුසාන භූමි / ආදාහනාගාර	2000							
	6	ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	150	150	150	250	250	150	250	
	7	ශ්‍රවනාගාර	500							
	8	සමන්ත්‍රණ ශාලා	1000							
	9	සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	150	150	150	250	250	150	250	

කර්මාන්ත සහ ගබඩා (Industrial)	1	වාහන එකලස්/ උපාංග ගබඩා කිරීමේ මධ්‍යස්ථාන	500							
	2	බෙදා හැරීමේ කටයුතු සඳහා වන ගබඩා	500							
	3	ගබඩා/ ගුදම්	1000							
	4	සේවා කර්මාන්ත	1000							
	5	ගෘහස්ත කර්මාන්ත	150	150*	150*	250*	250*	150*	250*	
	6	ඇසුරුම් කර්මාන්ත	500					1000**	1000**	
	7	ප්‍රතිචක්‍රීකරන කර්මාන්ත	1000							
	8	අගය එකතු කිරීමේ කර්මාන්ත	500					**	**	
	9	අබලි දෑ එකතු කිරීමේ මධ්‍යස්ථාන	1000							
	10	බේකරි නිෂ්පාදන දර පෝරණු	500							
	11	බේකරි නිෂ්පාදන විදුලි	250							
	12	කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත	500							
	13	උළු සහ ගඩොල් කර්මාන්ත	1000							
	14	ලී බඩු නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත	500	500	500			1000*	1000*	
	15	අඹරුම්හල්	150	150	150			250*	250*	
	16	ලියවන පට්ටල්, වෑල්ඩින් වැඩපොලවල්	500							

	17	දූෂ්‍ය කාරක නොවන අනෙකුත් කර්මාන්ත (මධ්‍යම පරිසර අධිකාරියේ නිර්ණායක අනුව)	500						1000	
	18	දූෂ්‍ය කාරක අනෙකුත් කර්මාන්ත (මධ්‍යම පරිසර අධිකාරියේ නිර්ණායක අනුව)	1000							
	19	තේ හා රබර් කර්මාන්තශාලා	2000							
	20	වී මෝල්	500							
විනෝදාත්මක (Leisure)	1	ගෘහස්ත ක්‍රීඩාගාර	1000							
	2	විවෘත රංග භූමි	1000							
	3	පුස්තකාල	250							
	4	කාය වර්ධන මධ්‍යස්ථාන	150	150	150	250	250	150	250	
	5	ළමා උද්‍යාන	500							
	6	විවෘත පිට්ටනි	1000							
	7	සිනමා ශාලා	500							
	8	පිහිනුම් තටාක	1000							
	9	උද්‍යාන	-							
	10	විනෝදාත්මක උද්‍යාන	-							
	11	ශරීර සුවතා ප්‍රදේශ / ව්‍යායාම් ප්‍රදේශ	250							
	12	සංචාරක කඳවුරු බිම්	-							

කෘෂිකාර්මික හා ධීවර කර්මාන්තය	1	බෝට්ටු ජැටි/පාරු නවාතැන්	-							
	2	නැංගුරම් තොටුපළවල්	-							
	3	ධීවර තොටුපළවල්								
	4	ඉදිකිරීම් සහිත මාදැල් පාඩු								
	5	සත්ත්ව හා වගා ගොවිපලවල්	2000							
	6	කෘෂි නිෂ්පාදන එකතු කිරීමේ මධ්‍යස්ථාන	500							
	7	සත්ත්ව හා බීජ අභිජනන මධ්‍යස්ථාන	1000							
	8	හරිතාගාර	150	150	150	250	250	150	250	
	9	කෘෂිකර්මාන්තය ආශ්‍රිත පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථාන								
වෙනත් (Other)	1	වහලය මත සන්නිවේදන කුළුණු	150	150	150	250	250	150	250	
	2	බිම් පාදක සන්නිවේදන කුළුණු	250							
	3	වාහන රථගාල්	250							
	4	විදුලි උප පොලවල්	-							
	5	වැලි කැණීම්/ ඛනිජ කැණීම් /සේදීම	-							
	6	ගල් කැඩීම	-							
	7	පස් කැපීම / මැටි කැපීම	-							
	8	සනීපාරක්ෂක කටයුතු ගොඩනැගිලි	-							
	9	A.T.M මධ්‍යස්ථාන	අදාළ නොවේ							

	10	විදුලි ආරෝපණ මධ්‍යස්ථාන	අදාළ නොවේ							
	11	කොම්පෝස්ට් ව්‍යුහය /කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන	2000							

සුචිය

	අනුමත භාවිතයන්
	අනුමත නොවන භාවිතයන්
*	උපරිම ගෙබිම් ප්‍රමාණය වර්ග මීටර 50 යි
**	උපරිම ගෙබිම් ප්‍රමාණය වර්ග මීටර 100 යි
අ.බි.ප්‍ර.	අවම බිම් ප්‍රමාණය

සැ.යු. - විශේෂයෙන් කලාප තුළ අවම බිම් ප්‍රමාණය සඳහන් කර නොමැති අවස්ථාවල වගුවේ 4 වන තීරුවේ සඳහන් අවම බිම් ප්‍රමාණය අදාල වේ

නමවන පරිච්ඡේදය

යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත

09 වන පරිච්ඡේදය

යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත

9.1. ගොඩනැගිලි සීමා සහ යෝජිත මාර්ග පළල

9.1.1. ප්‍රධාන මාර්ග

ගොඩනැගිලි සීමා සහ යෝජිත මාර්ග පළල

වගු අංක 9.1 : ප්‍රධාන මාර්ග

අංකය	මාර්ගයේ නම	මාර්ග වර්ගීකරණය	යෝජිත මාර්ග පළල (මි.)	යෝජිත ගොඩනැගිලි සීමාව (මි.)
1	කොළඹ - මඩකලපුව A 4 මාර්ගය	A		15

9.1.2. පළාත් පාලන ආයතනයන්ට අයත් මාර්ග

වගු අංක 9.2 : පළාත්බද මාර්ග

අංකය	මාර්ගයේ නම	යෝජිත මාර්ග පළල	ගොඩනැගිලි සීමාව මාර්ගයේ මධයේ සිට දෙපසට (මීටර්)
1	කුරුවිට - එරත්න පාර	9	7.6
2	කුරුවිට - පාතගම පාර	9	7.6
3	කුරුවිට - කඳන්ගොඩ පාර	9	7.6
4	වළදුර - බන්ධනාගාර පාර	9	7.6
5	කුරුවිට - ගොනපිටිය - ගොරකඇළ දක්වා මාර්ගය	9	7.6
6	කුරුවිට - හිග්ගස්හේන - දෙවිපහල දක්වා මාර්ගය	9	7.6
7	කුරුවිට - උඩකඩ - බෝපත් ඇල්ල දක්වා මාර්ගය	9	7.6
8	ඒදණ්ඩවල - කාහේන්ගම මාර්ගය	9	7.6
9	පැරඩයිස් ඉසුරු පෙදෙස මාර්ගය	9	7.6
10	කාහේන්ගම - කරපිංච දක්වා මාර්ගය	9	7.6
11	මිල්ලවිටිය - ලෙල්ලගොඩ මාර්ගය	9	7.6
12	එක්නැලිගොඩ ගුරුළුවාන මාර්ගය	9	7.6
13	පැරඩයිස් - මෝලකලේ මාර්ගය	9	7.6

වගු අංක 9.3 : කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග

අංකය	මාර්ගයේ නම	යෝජිත මාර්ග පළල	ගොඩනැගිලි සීමාව මාර්ගයේ මධ්‍යයේ සිට දෙපසට (මීටර්)
1	බටුහේන - කොස්ගොඩ මාර්ගය	9	7.6
2	කඹුරාව පාර	9	7.6
3	විලකොලදෙනිය මාර්ගය	9	7.6
4	කාහෙන්ගම - වැලිහිඳ මාර්ගය	9	7.6
5	මාරගහයට - වැලිහිඳ දක්වා මාර්ගය	9	7.6
6	ඉසුරු පෙදෙස 1 පටුමග	-	4.5
7	ඉසුරු පෙදෙස 2 පටුමග	-	4.5
8	ඉසුරු පෙදෙස 3 පටුමග	-	4.5
9	ඉසුරු පෙදෙස 4 පටුමග	-	4.5
10	ඉසුරු පෙදෙස 5 පටුමග	-	4.5
11	ඉසුරු පෙදෙස 6 පටුමග	-	4.5
12	පැරඩයිස් වතු මාර්ගය හරහා පාතගම දක්වා මාර්ගය	9	7.6
13	පැරඩයිස් බටේ මාර්ගය	9	7.6
14	මලව - ශාන්තිපුර මාර්ගය	-	6
15	සරත් මුත්තෙට්ටුවගම මාර්ගය	9	7.6
16	එක්නැලිගොඩ අත්වැල්පිටිය මාර්ගය	9	7.6
17	තැඹිලියෙන මාර්ගය	6	6
18	දෙල්ගමුව මාර්ගය (දළදා මාවත)	9	7.6
19	බටුහේන - බටුහේනවත්ත මාර්ගය	6	6
20	නඩුකාරදෙණිය - වලදූර මාර්ගය	9	7.6
21	නඩුකාරදෙණිය - මලංගම මාර්ගය	9	7.6
22	මල්වත්තෝවිට මාර්ගය	9	7.6
23	සද්ධාතිස්ස මාවත	9	7.6
24	කීරගල වතු මාර්ගය	9	7.6
25	සිනමාහල පාර	9	7.6
26	ගැමුණු මාවත	6	6
27	සමාධි මාවත	6	6
28	හිග්ගස්හේන පන්සල පාර	-	6
29	වලදූර - මලංගම මාර්ගය	6	6
30	නඩුකාරදෙණිය මාරගහයට පාර	9	7.6

31	තැඹිලියෙන දෙවන පටුමග	-	4.5
32	ගෝනපිටිය පාර		7.6
33	වළදූර යහලකොටුන්න පාර	9	7.6
34	මලව තැපැල් පෙට්ටිය හන්දිය වළදූර විද්‍යාලය දක්වා පාර	9	7.6
35	මලව - වළදූර - විලකොලදෙනිය පාර	9	7.6
36	පිටකඩමුල්ල - පරගලතැන්න පාර	6	6
37	වළදූර - බෝගොඩැල්ල එක්නැලිගොඩ පාර	-	6
38	තැඹිලියෙන - ගල්ලැලිංගොඩ මාලාව පාර	6	6
39	ගුරුබැල්කඩ - එක්නැලිගොඩ පාර	-	6
40	කුරුවිට තැඹිලියෙන කකුලන්ගොඩ පාර	6	6
41	තැඹිලියෙන - ඉහල ගංගොඩ පාර	6	6
42	කදන්ගොඩ - ලෙල්ලගොඩ පාර	9	7.6
43	දෙල්ගමුව - එරත්නමංකඩ පාර	9	7.6
44	උඩකඩ - අගලවත්ත - දෙවිපහල පාර	9	7.6
45	උඩකඩ - වතුයාය පාර	9	7.6
46	දෙල්ගමුව - ඔසුහල පාර	9	7.6
47	කොටුවත්ත කඩේ - ගෝනපිටිය පාර	9	7.6
48	ඕවිටිගම - මුදුන්කොටුව පාර	9	7.6
49	එක්නැලිගොඩ - අත්වල්පිටිය එරත්නංගොඩ පාර	9	7.6
50	එක්නැලිගොඩ ගුරුළුවාන පාර	9	7.6
51	මලව තැපැල්පෙට්ටිය හන්දිය - වළදූර විද්‍යාල පාරෙන් ඇලපලාව මහදෙනිය වෙල්යාය දක්වා පාර	-	6
52	මලව හන්දියේ සිට ධූහලෝ වත්ත හරහා බබිගේ කැල්ල නමැති ස්ථානයෙන් හැරි වැවේදෙනිය පාර	9	7.6
53	පැරඩයිස් හන්දිය - ගෙවල් දහය පාර	-	6
54	මං ගෙදර - කාහෙන්ගම පාර	-	6
55	පැරඩයිස් වළදූර පාර	6	6
56	තෙප්පනාව - ඉහලගම මල්ගහපිටිය පාර	9	7.6
57	මිල්ලවිටිය - කොක්ඔවිට පාර	9	7.6
58	කොක්ඔවිට පාර - ඉන්දොළ පාර	-	6
59	ගොනපිටිය - ඌරුපැලව්ව - කරපිංච පාර	9	7.6
60	ගෝනපිටිය- දහනක්ගෙවත්ත පාර	-	6

61	කිරගල උඩවත්ත ආනන්දපුර පාර	9	7.6
62	දෙව්පහල වැලිහිඳ ඉඳුර පාර	9	7.6
63	දෙව්පහල ඉහලගම ආනන්දපුර පාර	9	7.6
64	මොරමුල්ල බෝපත්පිටිය පාර	-	6
65	මන්ගෙදර - ගබ්බෙල පාර	6	6
66	කඳන්ගොඩ කිරගල හේන් යාය පාර	6	6
67	හිග්ගස්හේන බඩහල්ගොඩ පාර	-	6
68	එක්නැලිගොඩ - සුදාගල පාර	6	6

සැලකිය යුතුය :

1. ඉහත ලේඛනයේ සඳහන් නොකරන ලද නමුත් කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් ගැසට් කරන ලද අනෙකුත් මාර්ග සඳහා මාර්ග මධ්‍යයේ සිට මීටර් 6 ක ගොඩනැගිලි සීමාවක් තැබිය යුතුය.

2. ඉහත ලේඛනයට අයත් නොවන, කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරනු ලබන අනෙකුත් පොදු මාර්ග, වතු මාර්ග සඳහා ගොඩනැගිලි සීමාව ප්‍රවේශ මාර්ගයේ මධ්‍යයේ සිට මීටර 4.5 ක් පවත්වාගෙන යා යුතුය.

3. කිසියම් පොදු අඩි පාරකට පියගැටපෙලකට යාබදව පිහිටා ඇති ස්ථානයක් සඳහා ගොඩනැගිලි රේඛාව අඩිපාර මධ්‍යයේ සිට මීටර් 2.0 ට නොඅඩු විය යුතුය.

4. යෝජිත දුම්රිය මාර්ග සඳහා අදාළ වන මාර්ග රක්ෂිත දුම්රිය දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව තීරණය කරනු ලබන අතර ගොඩනැගිලි සීමාව දුම්රිය මාර්ගයේ මායිමේ සිට මීටර 9 ක් පවත්වාගෙන යා යුතුය.

5. කිසියම් සංවර්ධන කටයුත්තකදී යෝජිත මාර්ග පළලට අනුව ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩකඩ වෙන් කිරීම අත්‍යවශ්‍ය වන්නේ වාණිජ පරමාර්ථයෙන් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු වලදී පමණි.

09 වන පරිච්ඡේදය

යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත

9.1.3. යෝජිත මාර්ග සඳහා යෝජිත මාර්ග පළල සහ ගොඩනැගිලි සීමා

වගු අංක 9.4 : යෝජිත මාර්ග

අංකය	මාර්ගයේ නම	යෝජිත මාර්ග පළල	ගොඩනැගිලි සීමාව මාර්ගයේ මධ්‍යයේ සිට දෙපසට (මීටර්)
1	යෝජිත විකල්ප මාර්ගය (මලව හන්දියේ සිට දූහලෝ කලාපය හරහා පාතගම, දෙල්ගමුව දක්වා)	9	7.6

ඇළ මාර්ග, ගංගා හා ජලාශ සඳහා ගොඩනැගිලි සීමා \ ගඟ රක්ෂිත

9.2. ඇළ මාර්ග, ගංගා හා ජලාශ සඳහා ගොඩනැගිලි සීමා \ ගඟ රක්ෂිත

කුරුවිට නගර සංවර්ධන සැලැස්මේ සඳහන් කර ඇති ගංගා, ඇළ මාර්ග සඳහා පහත ගොඩනැගිලි සීමාවන් අදාල වේ.

වගු අංක 9.5 : ගංගා සහ ඇළ මාර්ග සඳහා ගොඩනැගිලි සීමා

ජල මාර්ගය	ගොඩනැගිලි සීමාව (මීටර්)
කුරු ගඟ	**15**

ඊට අමතරව ප්‍රදේශයේ ජලය බැස යන හෝ බැස යාමට සලස්වා ඇති හෝ ජලය බැස යාමේ අරමුණින් නිර්මාණය කර ඇති හෝ ස්වභාවික සියළු ප්‍රධාන ඇළ මාර්ග, සියළු අතුරු ඇළ මාර්ග හා සියළු පෝෂක ඇළ මාර්ගයන්හි මතුපිට පළලට අනුරූපිව පහත ලේඛනයේ දක්වා ඇති පරිදි ඇළ ඉවුරු දෙකෙහිම මායිමේ සිට දුර ප්‍රමාණයන් ඇළ රක්ෂිත / ගොඩනැගිලි සීමාවන් වශයෙන් පවත්වාගෙන යා යුතුය.

වගු අංක 9.6 : ගංගා සහ ඇළ මාර්ග රක්ෂිත

යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත

ඇළෙහි මතුපිට පළල (මීටර්)	ඇළ ඉවුරේ මායිමේ සිට රක්ෂිත \ ගොඩනැගිලි සීමා	
	විවෘත ඇළ සඳහා (මීටර්)	මතුපිට ආවරණය කරන ලද ඇළ සඳහා (මීටර්)
1. 0 - 1. 2	1.0	0.3
1. 3 – 3. 0	2.0	1.0
3 .5 – 4. 5	2.75	1.0
4 .6 – 6. 0	3.5	1.5
6 .1 - 9.0	4.5	1.5
9 .0 ට වැඩි	පළලින් භාගයක්	2.0

සැලකිය යුතුය :

1. ඉහත වගුවේ සඳහන් වන රක්ෂිත සීමාවන් තුල කිසිදු ගොඩනැගිලි ඉදි කිරීමකට අවසර ලබා නොදෙන අතර පොදු විනෝදාස්වාද කටයුතු උදෙසා සිදු කරනු ලබන ව්‍යාපෘති සඳහා පමණක් කොන්දේසි වලට යටත්ව අවසර දෙනු ලැබේ. (තොටුපල සංවර්ධන ව්‍යාපෘති, රේඛිය උද්‍යාන ව්‍යාපෘති, ඇවිදන මංතීරු ආදී)

2. කිසියම් ආයතනයක් ජල මූලාශ්‍රයක් සඳහා රක්ෂිතයක් ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද අවස්ථාවක එම රක්ෂිත සීමාව මෙම ගොඩනැගිලි සීමාව අභිබවා යන්නේ නම්, එම සිමාව බලාත්මකවේ.

9.3. කැණීම් සඳහා රක්ෂිත අවශ්‍යතා

කැණීම් සඳහා රක්ෂිත අවශ්‍යතා

වගු අංක 9.7 : කැණීම් සඳහා රක්ෂිත අවශ්‍යතා

වර්ගීකරණය	රක්ෂිත සීමා	
	මීටර්	අඩි
මාර්ග (මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට)		
A ශ්‍රේණියේ මාර්ග	45	150
B ශ්‍රේණියේ මාර්ග	20	66
C ශ්‍රේණියේ මාර්ග	13	44
සෙසු මාර්ග	7	22
පෞද්ගලික මාර්ග	3	11
ජල මාර්ග (ඉවුරේ සිට)		
ගංගා	10	33

ඇළ	7	22
ඉදි කිරීම්		
පාලම් බෝක්කු	10	33
මහල් ගොඩනැගිලි	20	66
වෙනත් ගොඩනැගිලි	10	33
ක්‍රීඩා පිටි	10	33
වෙනත් ඉදි කිරීම්	3	10

සැලකිය යුතුය :

ඉහත මාර්ග, ජල මාර්ග, ගොඩනැගිලි සඳහා අදාල වෙනත් ආයතනයක් විසින් තීරණය කර ඇති රක්ෂිත සීමාවන්, මෙම රක්ෂිත සීමාවන්ට වඩා වැඩි වන්නේ නම් වඩා වැඩි රක්ෂිතය අදාල වේ.

තෙවන කොටස

ඇමුණුම්

රූප සටහන් ලැයිස්තුව

රූප සටහන් අංක 1.1 : සැලසුම් ක්‍රියාවලිය	06
රූප සටහන් අංක 2.1 : කුරුවිට ක්‍රියාකාරී සීමාව හඳුනාගැනීම - අදියර 01	12
රූප සටහන් අංක 2.2 : කුරුවිට ක්‍රියාකාරී සීමාව හඳුනාගැනීම - අදියර 02	12
රූප සටහන් අංක 2.3 : කුරුවිට ක්‍රියාකාරී සීමාව හඳුනාගැනීම - අදියර 03	13
රූප සටහන් අංක 2.4 : කුරුවිට නගරයේ භූගෝලීය පසුබිම	14
රූප සටහන් අංක 2.5 : නාගරික ප්‍රදේශ වල ජනගහන (2018)	20
රූප සටහන් අංක 2.6 : වයස අනුව ජනගහනය (2018)	23
රූප සටහන් අංක 2.7 : ජාතීන් අනුව ජනගහනය (2018)	24
රූප සටහන් අංක 2.8 : නිවාස වර්ගීකරණය 2018	30
රූප සටහන් අංක 2.9 : ආර්ථික ව්‍යුහය	30
රූප සටහන් අංක 2.10 : සේවා නියුක්තිය 2018	32
රූප සටහන් අංක 2.11: විදුලි බල ව්‍යාප්තිය 2018	33
රූප සටහන් අංක 3.1 : කුරුවිට නගරයේ වාණිජ ව්‍යාප්තිය	40
රූප සටහන් අංක 3.2 : කුරුවිට නගරයේ පවත්නා දුම්රිය ඉඩම්	41
රූප සටහන් අංක 3.3 : සංචාරක කර්මාන්තය පදනම් කරගත් භාණ්ඩ හා සේවා	43
රූප සටහන් අංක 3.4 : ශ්‍රී පාදස්ථාන පුදබිමට පිවිසෙන ප්‍රධාන මාර්ග	44
රූප සටහන් අංක 3.5 : ඓතිහාසික දෙල්ගමු රජමහා විහාරය	44
රූප සටහන් අංක 3.6 : පළාත් අග නගරයට (රත්නපුර) පවත්නා දුර	45
රූප සටහන් අංක 5.1 : දුම්රිය ඉඩම් වල ව්‍යාප්තිය	67
රූප සටහන් අංක 5.2 : නගරයේ රේඛිය ව්‍යාප්තිය	69
රූප සටහන් අංක 5.3 : ජාතික භෞතික සැලැස්ම-2050, රට හදන සෞභාග්‍යයේ දැක්ම	72
රූප සටහන් අංක 5.4 : යුධ හමුදා කඳවුර සහ බන්ධනාගාරය	78
රූප සටහන් අංක 5.5 : නගර මධ්‍යයේ පිහිටි පැරණි ගොඩනැගිලි	82
රූප සටහන් අංක 5.6 : මිණිපුර සංචාරක කලාපය	83
රූප සටහන් අංක 5.7 : සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ	86
රූප සටහන් අංක 5.8 : සංචාරක සැලැස්ම සහ රුවන්පුර අධිවේගී මාර්ග පිහිටීම	87
රූප සටහන් අංක 5.9 : මිණිපුර කලාපය	88
රූප සටහන් අංක 6.1 : සංකල්පිත සැලැස්ම සහ බෝපත් ඇල්ල	90
රූප සටහන් අංක 6.2 : සංකල්පිත සැලැස්ම උප නාගරික ප්‍රදේශ අනුව ක්‍රියා කරන ආකාරය	91
රූප සටහන් අංක 6.3 : යෝජිත අහස් රේඛාව 2033 - දෙල්ගමුව කලාපය	96
රූප සටහන් අංක 6.4 : යෝජිත අහස් රේඛාව 2033 - බෝපත් ඇල්ල සංචාරක කලාපය	96
රූප සටහන් අංක 6.5 : යෝජිත අහස් රේඛාව 2033 - පැරඩයිස් කලාපය	97
රූප සටහන් අංක 6.6 : යෝජිත අහස් රේඛාව 2033 - නගර මධ්‍ය කලාපය	98

රූප සටහන් අංක 6.7 : අධ්‍යාපන මට්ටම අනුව ජනගහනය 109
රූප සටහන් අංක 6.8 : දෙල්ගමුව රජ මහා විහාරය හා කුරහන් ගල 114
රූප සටහන් අංක 6.9 : එක්නැලිගොඩ වලව්ව 115
රූප සටහන් අංක 6.10 : නැවත ප්‍රතිසංස්කරණය කරන ලද පැරණි දුම්රිය ගොඩනැගිල්ල 120
රූප සටහන් අංක 6.11 : යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය 121
රූප සටහන් අංක 6.12 : යෝජිත දුම්රිය මාර්ගය 122
රූප සටහන් අංක 6.13 : නාගරික ප්‍රදේශ වල බැහැර වන ජල කළමනාකරණය - කාණු පද්ධතිය 132
රූප සටහන් අංක 6.14 : යෝජිත පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානය - නගර මධ්‍ය 134
රූප සටහන් අංක 6.15 : කුරුවිට නගරයේ ආර්ථික ව්‍යුහය 137
රූප සටහන් අංක 6.16 : සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් 142
රූප සටහන් අංක 6.17 : යෝජිත සංචාරක ගමන් මාර්ගය 142
රූප සටහන් අංක 6.18 : යෝජිත නැරඹුම් මැදිරිය 143
රූප සටහන් අංක 6.19 : ආයතන ජාලකරණය 148
රූප සටහන් අංක 6.20 : රාගා නිෂ්පාදනය 149
රූප සටහන් අංක 6.21 : නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘති 151
රූප සටහන් අංක 6.22 : මාර්ගෝපදේශ සැලැස්ම සඳහා හඳුනා ගන්නා ලද ප්‍රදේශය 152
රූප සටහන් අංක 6.23 : හිග්ගස්හේන කලාපය තුළ විවිධ ක්‍රියාකාරකම් ව්‍යාප්තව ඇති ආකාරය 154
රූප සටහන් අංක 6.24 : දෙල්ගමුව කලාපය තුළ විවිධ ක්‍රියාකාරකම් ව්‍යාප්තව ඇති ආකාරය 155
රූප සටහන් අංක 6.25 : කුරුවිට නගර මධ්‍ය කලාපය තුළ විවිධ ක්‍රියාකාරකම් ව්‍යාප්තව ඇති ආකාරය 156
රූප සටහන් අංක 6.26 : පැරඩයිස් කලාපය තුළ විවිධ ක්‍රියාකාරකම් ව්‍යාප්තව ඇති ආකාරය 157

සිතියම් ලැයිස්තුව

සිතියම් අංක 2.1 : නාගරික ප්‍රවණතා විශ්ලේෂණය	15
සිතියම් අංක 2.2 : නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රදේශය	18
සිතියම් අංක 2.3 : කුරුවිට නාගරික බල ප්‍රදේශය තුළ පවත්නා සංවේදී කලාප	28
සිතියම් අංක 5.1 : නේවාසික ප්‍රදේශවල ව්‍යාප්තිය	55
සිතියම් අංක 5.2 : ඉඩමේ වටිනාකම	56
සිතියම් අංක 5.3 : ගංවතුර පවතින ප්‍රදේශ	58
සිතියම් අංක 5.4 : ජල මූලාශ්‍ර වල ව්‍යාප්තිය	60
සිතියම් අංක 5.5 : කෘෂිකාර්මික ප්‍රදේශ වල ව්‍යාප්තිය	62
සිතියම් අංක 5.6 : මැණික් පතල් ප්‍රමාණය	64
සිතියම් අංක 5.7 : කර්මාන්තපුරයේ පිහිටීම	66
සිතියම් අංක 5.8 : පවතින පාසල් වල ව්‍යාප්තිය	68
සිතියම් අංක 5.9 : සෞඛ්‍ය පහසුකම් වල ව්‍යාප්තිය	71
සිතියම් අංක 5.10 : නගර අතර ඇති සම්බන්ධතාවය	73
සිතියම් අංක 5.11 : කුරුවිට නගරයේ පෙර කරන ලද සැලසුම්	75
සිතියම් අංක 5.12 : කුරුවිට ප්‍රදේශයේ වැදගත් ස්ථාන	77
සිතියම් අංක 5.13 : නේවාසික ප්‍රදේශ වල ව්‍යාප්තිය	79
සිතියම් අංක 5.14 : කලාපිය සම්බන්ධතාවය	80
සිතියම් අංක 5.15 : සංචාරක ස්ථාන	85
සිතියම් අංක 6.1 : පවත්නා භූමි පරිහරණ රටාව	93
සිතියම් අංක 6.2 : යෝජිත භූමි පරිහරණ රටාව	100
සිතියම් අංක 6.3 : නිවාස ඝනත්වය	103
සිතියම් අංක 6.4 : වාසයට වඩාත් සුදුසු ප්‍රදේශ	105
සිතියම් අංක 6.5 : යෝජිත නිවාස සංවර්ධනය සඳහා හඳුනා ගත් ස්ථාන	107
සිතියම් අංක 6.6 : පවත්නා සහ යෝජිත පාසල් මගින් ආවරණය වන ප්‍රදේශ	110
සිතියම් අංක 6.7 : ආගමික ස්ථාන	113
සිතියම් අංක 6.8 : යෝජිත සහ පවතින සංචාරක ස්ථාන	118
සිතියම් අංක 6.9 : මාර්ග පද්ධතිය	125
සිතියම් අංක 6.10 : සංවර්ධනය කිරීමට හඳුනා ගත් මාර්ග	126
සිතියම් අංක 6.11 : යෝජිත ජල සැපයුම් පද්ධතියෙන් ආවරණය වන කලාපය	129
සිතියම් අංක 6.12 : පවත්නා විදුලිබල සැපයුම	131
සිතියම් අංක 6.13 : කසළ බැහැර කිරීම සඳහා හඳුනා ගන්නා ලද ස්ථානය	136
සිතියම් අංක 6.14 : වාණිජ කටයුතු වල ව්‍යාප්තිය	138
සිතියම් අංක 6.15 : යෝජිත හා පවතින සංචාරක ස්ථාන	146
සිතියම් අංක 6.16 : ජල සංරක්ෂණ කලාප සිතියම	160

සිතියම් අංක 6.17 : කුඹුරු හා තෙත් බිම් කලාප සිතියම 161
සිතියම් අංක 6.18 : පවතින උද්‍යාන සහ ක්‍රීඩා පිටි 164
සිතියම් අංක 6.19 : යෝජිත විනෝදාත්මක කටයුතු 165
සිතියම් අංක 7.1 : කුරුවිට නාගරික බලප්‍රදේශයේ කලාපිකරණ සැලැස්ම 2023-2033 185
සිතියම් අංක 8.1 : සංවර්ධන නියාමන ප්‍රදේශය - කුරුවිට 207

වගු ලැයිස්තුව

වගු අංක 2.1 : සැලසුම් ප්‍රදේශය පිළිබඳ තොරතුරු සාරාංශය 16
වගු අංක 2.2 : වසම් මට්ටමින් ජනගහනය සහ භූමි ප්‍රමාණය 21
වගු අංක 2.3 : ජන ඝනත්වය ග්‍රාම නිලධාරී වසම් අනුව කුරුවිට නාගරික බල ප්‍රදේශය 22
වගු අංක 2.4 : පුරෝකථන ජනගහනය (2018 – 2030) 25
වගු අංක 2.5 : පවත්නා භූමි පරිභෝග රටාව - 2018 25
වගු අංක 2.6 : ඉඩම් වටිනාකම් වල ව්‍යාප්තිය - 2018 29
වගු අංක 2.7 : සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම භාවිතය- 2018 34
වගු අංක 2.8 : දූරකථන සම්බන්ධතා ව්‍යාප්තිය - 2018 35
වගු අංක 3.1 : කුරුවිට නාගරික බල ප්‍රදේශය තුල පවතින ක්‍රීඩා පිටි, උද්‍යාන සහ පොදු එළිමහන් විනෝද පහසුකම් සහිත ස්ථාන 42
වගු අංක 3.2 : කුරුවිට නාගරික බල ප්‍රදේශය තුල පවතින වක්‍ර විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන 42
වගු අංක 5.1 : පළමු අරමුණ සඳහා වූ ශුද්‍ධත විශ්ලේෂණය 52
වගු අංක 5.2 : දෙවන අරමුණ සඳහා වූ ශුද්‍ධත විශ්ලේෂණය 53
වගු අංක 6.1 : පුහුණු මධ්‍යස්ථාන සහ පාඨමාලා විස්තර 109
වගු අංක 6.2 : මධ්‍යම බෙහෙත් ශාලාව කුරුවිට - පහසුකම් හා කාර්ය මණ්ඩලය 111
වගු අංක 6.3 : නගරය තුළ සාමාන්‍ය දෛනික මගී ගමනාගමනය 123
වගු අංක 6.4 : ජල අවශ්‍යතාවය 127
වගු අංක 6.5 : විදුලි පරිභෝජනය 130
වගු අංක 6.6 : වැසිදිය බැසයන කාණු පද්ධතිය 133
වගු අංක 7.1 : සංවර්ධන කලාප සහ කලාප සංගුණකයන් 186
වගු අංක 8.1 : නේවාසික කලාපය 196
වගු අංක 8.2 : වාණිජ කලාපය 198
වගු අංක 8.3 : මිශ්‍ර සංවර්ධන කලාපය 199
වගු අංක 8.4 : සංචාරක කලාපය 201
වගු අංක 8.5 : කෘෂිකාර්මික කලාපය 202
වගු අංක 8.1.1 : කෘෂිකාර්මික කලාපය සඳහා අනුමත භාවිතයන් 204
වගු අංක 9.1 : ප්‍රධාන මාර්ග 226
වගු අංක 9.2 : පළාත්බද මාර්ග 226

වගු අංක 9.3 : කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග 227
වගු අංක 9.4 : යෝජිත මාර්ග 230
වගු අංක 9.5 : ගංගා සහ ඇළ මාර්ග සඳහා ගොඩනැගිලි සීමා 230
වගු අංක 9.6 : ගංගා සහ ඇළ මාර්ග රක්ෂිත 231
වගු අංක 9.7 : කැණීම් සඳහා රක්ෂිත අවශ්‍යතා 231

කෙටි යෙදුම්

නා. සං. අධි. : නාගරික සංවර්ධන අධිකාරිය

කු. ප්‍රා. ස. : කුරුවිට ප්‍රාදේශීය සභාව

ග්‍රා. නි. ව. : ග්‍රාම නිලධාරී වසම

ඇමුණුම 01 : පවත්නා භූමි පරිහරණ රටාව - 2020

අනු අංකය	භාවිතය	ඉඩම් ප්‍රමාණය (වර්ග කි.මී)	භූමි ප්‍රතිශතය %
1	නේවාසික	9.687	42.8
2	වාණිජ	0.226	1.0
3	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය	0.46	2.0
4	කර්මාන්ත	0.462	2.0
5	කුඹුරු ඉඩම්	5.82	25.7
6	මිශ්‍ර භෝග	1.232	5.5
7	කෘෂිකාර්මික	3.422	15.1
8	ආගමික	0.045	0.2
9	උද්‍යාන හා ක්‍රීඩා පිටි	0.026	0.1
10	සුසාන භූමි	0.023	0.1
11	මාර්ග	0.747	3.5
12	ජල මූලාශ්‍ර	0.49	2.0
	එකතුව	**22.64**	**100**

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2020 - නාගරික සංවර්ධන අධිකාරිය

ඇමුණුම 02 : කුඹුරු ප්‍රදේශ වල ව්‍යාප්තිය



මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහ සම්පත් පැතිකඩ 2019 දත්ත මත පදනම්ව

ඇමුණුම 03 : කුරුවිට, ඇඹිලිපිටිය සහ ගලිගමුව කර්මාන්ත කලාප අතර සංසන්දනාත්මක විශ්ලේෂණය

	කුරුවිට	ඇඹිලිපිටිය	ගලිගමුව	ඇඹිලිපිටිය කර්මාන්තපුරය සමග සංසන්දනය කල විට	ගලිගමුව කර්මාන්තපුරය සමග සංසන්දනය කල විට
ස්ථාපනය කරන ලද වර්ෂය	1992	2007	2008		
භූමි ප්‍රමාණය (අක්කර)	83.3	22.8	22.4		
හිස් ඉඩම් ප්‍රමාණය (අක්කර)	5.5	4	-		
හිස් ඉඩම් කැබලි ප්‍රමාණය	04	07	-		
සක්‍රිය කර්මාන්ත ප්‍රමාණය	42	4	10		
උත්පාදනය කිරීමට බලාපොරොත්තු වන රැකියා ප්‍රමාණය	1, 010	831	791		
දැනට පවතින රැකියා ප්‍රමාණය	305	225	478		
මුළු ආයෝජනය (මිලියන)	1027.81	151.95	674.40		

